# වාර්ෂික වාර්තාව

# 2016

ශ්‍රී ලංකා තේ මණ්ඩලය

තැපැල් ලිපිනය:
ශ්‍රී ලංකා තේ මණ්ඩලය
574, ගාලු පාර,
කොළඹ 03,
ශ්‍රී ලංකාව.

දුරකථන:
+94-11-2587814
+94-11-2582121
+94-11-2583687

ෆැක්ස්:
+94 112587341
+94 112589132

විද්‍යුත් තැපැල:
teaboard@pureceylontea.com

වෙබ් අඩවිය:
www.pureceylontea.com

# පටුන


| | |
|---|---|
| දැක්ම සහ මෙහෙවර | 04 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින් | 05 |
| විගණන කමිටුවේ සාමාජිකයින් | 06 |
| අලෙවි සහ ප්‍රවර්ධන කමිටුවේ සාමාජිකයින් | 07 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය | 08 |
| සභාපතිගේ පණිවුඩය | 09 |
| මූලික සංසන්දනාත්මක දර්ශක | 12 |
| සංස්ථාපිත පසුබිම | 13 |
| කර්මාන්ත පැතිකඩ | 15 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉටුකරන ලද කාර්යයන් | |
| තේ කොමසාරිස් අංශය | 37 |
| තේ අපනයන අංශය | 42 |
| තේ ප්‍රචාරණ අංශය | 44 |
| තේ රස පිරික්සීමේ ඒකකය | 55 |
| විශ්ලේෂණ රසායනාගාරය | 58 |
| පරිපාලන අංශය | 61 |
| අභ්‍යන්තර විගණන අංශය | 62 |
| තොරතුරු තාක්ෂණ අංශය | 62 |
| මූල්‍ය සමාලෝචනය | 63 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල | 81 |
| විගණකාධිපතිගේ වාර්තාව | 84 |

# දැක්ම

ගෝලීය වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකීය තේ "වඩාත් ආකර්ශනීය පානය" බවට පත්කිරීම.

# මෙහෙවර

කර්මාන්තයේ තිරසාර සංවර්ධනය මගින් රටට ලැබෙන විදේශ විනිමය ඉපයීම් වැඩිකරගැනීම සහ එමගින් වැවිලි කර්මාන්තයේ නියැලි ප්‍රජාවගේ ආර්ථික සංවර්ධනය සුරක්ෂිත කිරීම.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සාමාජිකයින්

| | |
|---|---|
| **සභාපති** | **රොහාන් පෙතියගොඩ මහතා** |
| **මණ්ඩලයේ ලේකම්** | **එස්.ඒ. සිරිවර්ධන මහතා** |

**මණ්ඩලයේ සාමාජිකයින්:**

| | |
|---|---|
| **සාමාජික** | අතිරේක ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>**එන්.ඒ.යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා** |
| **සාමාජික** | අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව<br>**ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා** |
| **සාමාජික** | කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යාංශය, නියෝජනය<br>**ආර්. එස්.කේ. දුලවලගේ මහතා** |
| **සාමාජික** | සභාපති, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය<br>**ඩී.එම්. විජේරත්න මහතා** |
| **සාමාජික** | සභාපති, කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය<br>**ඇන්ස්ලම් පෙරේරා මහතා** |
| **සාමාජික** | කොළඹ තැරැව්කරුවන්ගේ සංගමය<br>**අනිල් කුක් මහතා** (2016 මාර්තු දක්වා)<br>**දීපාල් ජයමාන්න මහතා** (2016 අප්‍රේල් සිට) |
| **සාමාජික** | සභාපති, තේ අපනයනකරුවන්ගේ සංගමය<br>**රොහාන් ප්‍රනාන්දු මහතා** (2016 නොවැම්බර් දක්වා)<br>**ජයන්ත කරුණාරත්න මහතා** (2016 දෙසැම්බර් සිට) |
| **සාමාජික** | සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය<br>**නෙවිල් රත්නායක මහතා** |
| **සාමාජික** | සභාපති, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය<br>**රොෂාන් රාජදුරෛයි මහතා** (2016 සැප්තැම්බර් දක්වා)<br>**සුනිල් පොහොලියද්ද මහතා** (2016 ඔක්තෝබර් සිට) |
| **සාමාජික** | සභාපති, ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමයේ නියෝජනය<br>**අනිල් පෙරේරා මහතා** (2016 සැප්තැම්බර් දක්වා)<br>**අනිල් අල්විස් මහතා** (2016 ඔක්තෝබර් සිට) |
| **සාමාජික** | වැවිලි කර්මාන්ත ඇමතිතුමා විසින් නම් කරන ලද සාමාජිකයන්<br>**බී.බී. ගමගේ මහත්මිය**<br>**එස්. අජිත් එන්. සිල්වා මහතා**<br>**බී.ඩබ්. හැරිසන් සිල්වා මහතා** |
| **නිරීක්ෂක** | **ආචාර්ය එම්.එම්.ජේ.පී.ගවරම්මන මහතා**<br>**නිරාජ් ඩි මෙල් මහතා**<br>**අනිල් පෙරේරා මහතා**<br>**එච්.ඩී.හේමරත්න මහතා**<br>**අනිල් අල්විස් මහතා** |

# විගණන කමිටුවේ සාමාජිකයන් සහ නිරීක්ෂකයන්

| | | |
|---|---|---|
| **ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා,**<br>අධ්‍යක්ෂ ජනරාල්,<br>සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව,<br>මුදල් අමාත්‍යාංශය | - | සභාපති |
| **වී.ඒ.ඒ. පෙරේරා මහතා,**<br>සභාපති විසින් නම් කළ නියෝජිත<br>ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය | - | සාමාජික |
| **යූ.කේ.එස්. මිහිඳුකුලසූරිය මහතා,**<br>අතිරේක ලේකම්, (සංවර්ධන)<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | - | සාමාජික |
| **එච්.ඩී. හේමරත්න මහතා,**<br>උපදේශක,<br>කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය | - | නිරීක්ෂක |
| **එස්. ඩී. කටුවාවල මහත්මිය,**<br>විගණන අධිකාරී<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව | - | නිරීක්ෂක |
| **එස්.ඒ. සිරිවර්ධන මහතා,**<br>අධ්‍යක්ෂ ජනරාල්,<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය | - | කැඳවුම්කරු |

# ප්‍රවර්ධන සහ අලෙවි කමිටුවේ සාමාජිකයන්

**ලංකා තේ ප්‍රවර්ධන සහ අලෙවි කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට මගපෙන්වීම සඳහා පත්කළ උප කමිටුවකි.**

**රොහාන් පෙතියගොඩ මහතා**
සභාපති, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**එස්.ඒ. සිරිවර්ධන මහතා**
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ප්‍රමිලා ශ්‍රීකාන්තා මහත්මිය**
අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), ශ්‍රී ලංකා තේ මණ්ඩලය

**ආචාර්ය එම්.එම්.ජේ.පී. ගවරම්මන මහතා**
සභාපති, තේ පර්යේෂණ මණ්ඩලය

**එස්.එන්.අයි. විජේරත්න මහත්මිය**
වානිජ අධ්‍යක්ෂ ජනරාල්, වානිජ දෙපාර්තමේන්තුව

**පෞද්ගලික අංශය**

**රොහාන් ප්‍රනාන්දු මහතා** (2016 අගෝස්තු දක්වා)
සභාපති, තේ අපනයන කරුවන්ගේ සංගමය

**ජයන්ත කරුණාරත්න මහතා** (2016 නොවැම්බර් සිට)
සභාපති, තේ අපනයන කරුවන්ගේ සංගමය

**මුෆාඩල් ජෆර්ජී මහතා**
නියෝජනය, තේ අපනයන කරුවන්ගේ සංගමය

**අවි ද සිල්වා මහතා**
නියෝජනය, තේ අපනයන කරුවන්ගේ සංගමය

**අනිල් කුක් මහතා**
සභාපති, ඒසියා සියක කොමොඩිටීස් (පෞද්.) සමාගම

**මලින් ගුණතිලක මහතා**
මහලේකම්, ලංකා වැවිලිකරුවන්ගේ සංගමය

**සුරේශ් ගලබොඩ මහතා**
නියෝජනය, ශ්‍රී ලංකා තේ කර්මාන්තශාලා හිමියන්ගේ සංගමය

**නෙවිල් රත්නායක මහතා**
සභාපති, ශ්‍රී ලංකා කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය

**ටයාබ් අක්බරාලි මහතා**
අධ්‍යක්ෂ, අක්බාර් බ්‍රදර්ස්

**මලික් ප්‍රනාන්දු මහතා**
අධ්‍යක්ෂ-මෙහෙයුම් එම්.ජේ.එෆ්. ගෲප්

**ආචාර්ය ගාමිණී අබේවික්‍රම මහතා**
කළමණාකාර අධ්‍යක්ෂ, බැසිලර් ටී

**විග් ගෝවින්දසාමි මහතා**
කළමනාකරණ අධ්‍යක්ෂ, සන්ශයින් හෝල්ඩින්ස් පෞද්ගලික සමාගම

**චමින්ද ජයවර්ධන මහතා**
කළමනාකරණ අධ්‍යක්ෂ, ලුම්බිණි තේ කර්මාන්තශාලා (පෞද්) සමාගම

**බිරේන්ද්‍ර පෙරේරා මහතා**
අධ්‍යක්ෂ, යුරෝ -ස්කෑන් අපනයන පෞද්ගලික සමාගම

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | එස්.ඒ. සිරිවර්ධන මහතා |
| තේ කොමසාරිස් | ඊ.ඒ.ජේ.කේ. එදිරිසිංහ මහතා |
| අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) | ප්‍රමිලා ශ්‍රීකාන්තා මහත්මිය |
| අධ්‍යක්ෂ (විශ්ලේෂණ සේවා) | ආචාර්ය එම්.ඒ.එන්. ජයතිලක මහතා |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් (පාලන) | එස්.අයි.සී. පෙරේරා මහතා |
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය) | ඒ.ඩී.ඩබ්. බණ්ඩාරගේ මහත්මිය |
| ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණක | එච්.ඩී.කේ. ජයසිංහ මහතා |

# සභාපතිතුමාගේ පණිවුඩය



2016 වර්ෂය සඳහා වන සමාලෝචනය ඔබ වෙත ඉදිරිපත් කර සිටින්නේ ඉමහත් සතුටිනි.

**පෙරවදන**

2016 වසරේදී ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය කිසියම් අසීරුතාවයකට පත්වීම සඳහා මගපෑදු කරුණු කිහිපයක් වේ. නිෂ්පාදන වියදම ඉහළ දමන භෞතිකව කරන වල් විනාශය හැර වෙනත් ප්‍රයෝගික විකල්ප නොමැතිව ග්ලයිෆොසේට් සහ ග්ලුෆෝසිනේට් - ඇමෝනියම් වල්නාශක පිළිබඳ රජයේ තහනම විසින් ඇතිකළ බලපෑම ද ඒ අතර වේ. බොහෝ වගාවන්වල වල් පාලන කටයුතු සිදුනොවුනි. එමෙන්ම වසරේ පළමු භාගයේදී ඇතිවූ පොහොර හිගය ද ඒ අතරට එකතුවුනි.

පසුගිය වසර හා සැසඳීමේදී 11% සහ 2014 වසරට සාපේක්ෂව 13.5% ක නිෂ්පාදනය පහළ වැටීම ට (වාදයට තුඩුදුන් ගුනාත්මයෙහි පහළ වැටීමට ද) සම්බන්ධ මෙම පීඩාකාරී තත්වය සඳහා තේ වගා කෙරෙන දිස්ත්‍රික්ක බොහෝමයක දීර්ග කාලීනව පැවති වියලි දේශගුනික තත්වය ද හේතුවිය.

වසර මුලදී සිදු වූ තේ මිල පහත වැටීම නිසා ඉල්ලුම ඉහළ දැමීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට වෙන්දේසියට මැදිහත්වීම පිණිස රජයේ අවසරය ඉල්ලා සිටීමට පවා සිදු විය. කෙසේ වුවද, තේ මණ්ඩලයේ අදහස වූයේ එවැනි මැදිහත්වීමකින් එතරම් පලදායිතාවයක් නොලැබෙන බවයි.

ඒ අතරම, රූබලය දිගින් දිගටම දුර්වලව පැවතීම නිසා අපගේ විශාලතම ගැනුම්කරුවන රුසියාවේ ඉල්ලුම පහළවැටීම ද අපට මුහුණ පෑමට සිදු වූ තවත් බාධකයකි. අපගේ මිලඟට වැදගත්වන වෙළඳපොළ වන ඉරානයට එක්සත් ජාතීන් සහ ඇමරිකාව විසින් වෙළඳ සම්බාධක පැනවීම, එහි තේවල ට ඇති ඉල්ලුම වෙනස්වීම සඳහා හේතු විය.
තේ නිශ්පාදනය හීනවීම වෙන්දේසියට තේ පැමිණීම අඩාල වීමට හේතුවිය. ඒ අතර 2016 ජනවාරි මස සාමාන්‍ය අළෙවිය වු කි.ග්‍රෑ. 412, දෙසැම්බර් වනවිට කි.ග්‍රෑ. 578 දක්වා නැගීමක් සිදුවිය.

**තේ නිෂ්පාදනය**

කිලෝ ග්‍රෑම් මිලියන 292.6 ලෙස වාර්තා වන 2016 වසරේ දී ශ්‍රී ලංකා තේ නිෂ්පාදනය පසුගිය වසරේ නිෂ්පාදිත ප්‍රමාණය හා සැසඳීමේදී කිලෝ ග්‍රෑම් මිලියන 36 ක හෝ 11% ක ප්‍රමාණයකින් පහත බැසීමකි. මෙම වසරේ තේ නිෂ්පාදනය සඳහා පහත රට තේ කිලෝ ග්‍රෑම් මිලියන 183.6 ක් ලෙස ඉහළම ප්‍රමාණයකින් සහ ඉන්පසුව පිළිවෙලින් උඩරට තේ කිලෝ ග්‍රෑම් මිලියන 64.4 කින් ද මැදරට තේ කිලෝ ග්‍රෑම් මිලියන 44.6 කින් ද වශයෙන් දායක විය.
2016 වසරේ දී කිලෝ ග්‍රෑම් මිලියන 2.4 ක් වන හරිත තේ නිෂ්පාදනය 2015 වසරේ නිෂ්පාදිත කිලෝ ග්‍රෑම් මිලියන 2.9 හා සැසඳීමේදී 10% පහත බැසීමක් වාර්තා කරයි. එමෙන්ම 2015 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 19.5 ක් වූ සී.ටී.සී තේ නිෂ්පාදනය 2016 වසරේ දී කිලෝ ග්‍රෑම් මිලියන 18.3 ක් ලෙස වාර්තා විය. එය 4.3% ක පහළ වැටීමකි.
ජාතික තේ නිෂ්පාදනයෙන් 74% ක් සඳහා දායක වු කුඩා තේ වතු හිමියන් මේ වසරේ දී ද තේ නිෂ්පාදකයන් අතර ප්‍රමුඛ තැන හිමිකර ගැනීමට සමත්විය.

**කොළඹ තේ වෙන්දේසි සහ නැ.වි.ස. (F.O.B.) මිල ගණන්**

2016 වසරේ දී කොළඹ තේ වෙන්දේසිය හරහා තේ අලෙවිය, 2015 වසර හා සැසදීමේදී 12.2% ප්‍රමාණයකින් පහළ බැසීමක් වාර්තා වේ. උඩරට, මැදරට සහ පහතරට වශයෙන් වූ තේ වගා භූමි පිහිටීම් ත්‍රිත්වයම වෙන්දේසියට ඉදිරිපත් කර තිබූ ප්‍රමාණයන් පහළ අගයක් ගනී.

2015 වසරේදී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 402.14 ක් වූ තේ වෙන්දේසියේ සමස්ත සාමානය අගය 2016 වසරේදී කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 467.45ක් විය. පසුගිය වසර හා සැසඳීමේදී මෙම අගය 16% ක වර්ධනයක් පෙන්නුම් කරයි.

කොළඹ තේ වෙන්දේසියේදී තේ කිලෝ ග්‍රෑමයක් සඳහා එ.ජ.ඩොලර් 3.22 ක සාමාන්‍ය අගයක් ලබාගත් අතර එය ලොව වෙනත් වෙන්දේසි මධ්‍යස්ථාන සහ පසුගිය වසරේ කොළඹ වෙන්දේසියේදී ලැබූ එ.ජ.ඩොලර් 2.99 අගය හා සැසඳීමේදී ප්‍රමාණවත් වර්ධනයක් වේ. 2015 වසරේදී සාමාන්‍ය අපනයන මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 593.11 ක් ව තිබී 2016 වසරේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 639.88 ක් දක්වා 7.89% කින් ඉහළ ගියේය.

### තේ අපනයනය

ශ්‍රී ලංකා තේ අපනයනය 2015 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 306.9 ක් ව තිබී 2016 වසරේදී කිලෝ ග්‍රෑම් මිලියන 288.7 දක්වා පහළ බැස ඇත. එය 5.9% ක පහත වැටීමකි. 2016 වසරේදී තේ මළු වශයෙන් අපනයනය කළ කිලෝ ග්‍රෑම් මිලියන 24.8 ක් වූ සමස්ත ප්‍රමාණය 2015 වසරේදී වාර්තා වූ කිලෝ ග්‍රෑම් මිලියන 23.9 ක ප්‍රමාණය හා සැසඳීමේදී කිලෝ ග්‍රෑම් මිලියන 3.5 ක වර්ධනයක් දක්නට ලැබේ. අනෙකුත් සියළුම වර්ග වල අපනයනයන් 2015 වසර හා සැසඳීමේදී පහළ අගයන්ගෙන් යුතුවිය.

2015 වසරේදී සමස්ත තේ අපනයනයෙන් රුපියල් බිලියන 182 ක ඉපයීමක් වාර්තා වූ අතර 2016 වසරේදී එය රුපියල් බිලියන 185 ක් විය. මෙය බිලියන 2.7 ක හෝ 1.5% වර්ධනයකි. මෙම වසරේදී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය 3.7% කින් අඩුවුව ද මෙය පැහැදිලි වාසිසහගත තත්වයකි.

පිළිවෙලින් කිලෝ ග්‍රෑම් මිලියන 34.4, 33.9 සහ 32.5 ක් ආනයනය කරමින් ශ්‍රී ලංකා තේ ප්‍රධාන ගැනුම් කරුවා ලෙස තවදුරටත් රුසියාව රැඳී සිටින අතර ඉරානය සහ ඉරාකය ඊට පිටුපසින් වේ.

### තේ නැවත වගාකිරීම සහ කර්මාන්ත ශාලා නවීකරණය

සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක වුවද තේ නැවත වගාකිරීම සහ කර්මාන්ත ශාලා නවීකරණය සම්බන්ධව සංවර්ධන කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් වාර්තා නොවුනි. නිෂ්පාදනය පහළ යාමේ නැඹුරුතාවය හේතුකොටගෙන ප්‍රමාණවත් තරමින් ප්‍රාග්ධන සංවර්ධනයන් සඳහා අරමුදල් යෙදවීම සඳහා වූ කර්මාන්ත කරුවන් සතු හැකියාව සීමා විය. නැවත වගාකිරීමේ කටයුතුවල මන්දගාමී ස්වභාවය කර්මාන්තයේ තිරසාරබව ගැටළුකාරී තත්වයකට ඇද දමයි. නැවත වගාකිරීම සඳහා නව දිරිගැන්වීම් වැඩසටහන් හඳුනා නොගතහොත් තේ නිෂ්පාදනයේ පහළ වැටීම ක්‍රමයෙන් වැඩි වීමක් බලාපොරොත්තු විය හැකි වේ.

නිෂ්පාදනයෙන් 2/3 කට වැඩි ප්‍රමාණයකට දායක වී ඇත්තේ කුඩා තේ වතු හිමියන්ය වන අතර මූල්‍යමය අනුබලයන් වල හෝ නැවත වගාකිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වන යාන්ත්‍රනයන්හි අල්ප බව බරපතල කාරණයක් සේ සැලකිය යුතුවේ. මේ වන විට නැවත වගාකිරීම සඳහා වන වියදම හෙක්ටයාරයකට මිලියන දෙකකට ආසන්න වේ. තේ වතුවලින් 2.5 % ක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා යන වියදම වශයෙන් වාර්ෂිකව රුපියල් බිලියන 9 ක් ආයෝජනය කිරීමට අවශ්‍යව ඇත. දැනට කර්මාන්තයේ පවත්නා ව්‍යුහය අනුව එවැන්නක් සිදුවන බවක් සඳහන් කළ නොහැක.

### ගෝලීය ප්‍රවර්ධනය

විමසුමට බඳුන්වන වසර තුළදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය “ලංකා තේ / (සිලෝන් ටී) සන්නම”ය තම වෙළෙඳපොලවල් පුරා තවදුරටත් ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ගෝලීය අලෙවිකරණ ව්‍යාපාරයක් සඳහා වූ සැලසුම් ප්‍රමාණවත් තරමින් වර්ධනය කිරීමට කටයුතු කළා. කෙසේවෙතත් ඵලදායි මාධ්‍ය ප්‍රචාරණයක් මගින් පාරිභෝගිකයා වෙත ළඟාවීමට වඩා වෙළෙඳ ප්‍රදර්ශන ආදියට සහභාගි වීම ප්‍රධාන ප්‍රචාරණ ක්‍රියාකාරකම් විය. එවැනි ප්‍රචාරණ ව්‍යාපාරයක් සැලසුම් කර තිබියදීත් පරිපාලනමය අකාර්යක්ෂමතාවයන් සහ දැන්වීම් ප්‍රචාරණය වැනි අස්පෘශ්‍ය සේවාවන් ලබාගැනීම හා සම්බන්ධ කල්ගතවන ක්‍රියාපටිපාටි නිසා 2016 වසරේදී ලබාගෙන ඇත්තේ සුළු වර්ධනයක් පමණි. උපරිම වශයෙන් විනිවිදභාවය තහවුරුකර ගැනීම සඳහා, අවම අවදානමක් සහිත උපායමාර්ග දෙසට යොමුවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අරමුණ විය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා ඉහත සඳහන් ක්‍රියාපටිපාටිය දියත්කිරීමට හැකිවුයේ ද අල්ප වශයෙනි.

## ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ ආස්ථානය

උසස් තත්වයේ තේ නිපදවන ප්‍රධාන පෙළේ නිෂ්පාදකයෙකු ලෙස ශ්‍රී ලංකාව ගෝලීය තේ වෙළඳපොළ තුළ නම් දරා සිටින නමුත් එහි තරඟකාරී ස්වභාවය ක්‍රමයෙන් බාදනයට ලක්වෙමින් පවතින බව දක්නට ලැබේ. මෙම තත්වය විසඳාගැනීමේ අරමුණ ඇතිව පිරිසිදු ලංකා තේ වල පවතින අසහාය ගුණය, එහි පිරිසිදු බව සහ නිෂ්පාදන ආචාරධර්ම පිළිබඳව අවධාරණය කරමින් පාරිභෝගිකයන් දැනුවත් කිරීමට තේ මණ්ඩලය කටයුතු කර ඇත.

කළු තේ අපනයනය කරන රටවල් අතර ශ්‍රී ලංකාව දෙවන සථානයේ (ප්‍රමාණය අතින්) සිටින අතර තේ කර්මාන්තය දිවයිනේ ප්‍රධානතම අපනයන ආදායම් උපයන මාර්ගය වේ. මෙම ජයග්‍රහනය සඳහා දායක වන්නාවූ තවත් කාරණයක් වනුයේ අපනයනයේ දී අගය එකතුකිරීම යි. අගය එකතුකිරීම් සඳහා පාරිභෝගික රටවල් ආකර්ශනීය දිරිගැන්වීම් ලබා දෙන බැවින් ඒ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් තිබේ.

## අභියෝග

දළු තේ වල මෙන්ම නිමි තේ වල තත්වය වර්ධනය කිරීම, අස්වැන්න වැඩිකිරීම, ශ්‍රී ලංකා තේ වල කීර්ති නාමය තවදුරටත් නන්වාලීම, නිෂ්පාදන වියදම ඉහළ යාම පාලනය කිරීම, දේශගුණික විපර්යාස වලට මුහුණ දීම සඳහා ඵලදායි උපාය මාර්ගයක් සොයාගැනීම මත කර්මාන්තයේ අනාගත තිරසාරබව රඳාපවතී. විශේෂයෙන් අවසානයට සඳහන් අභියෝගය ජයගැනීම සඳහා බාධාවක් ව ඇත්තේ පර්යේෂණ සඳහා වියදම් කිරිම අවම මට්ටමක පැවතීමයි. අදාළ ක්‍රියාපටිපාටි වලට අනුව කටයුතුකිරීමේ දුෂ්කරතාවයන් විසින් ඉලක්කගත වෙළඳපොළ හා ඩිජිටල් මාධ්‍ය තුළ දක්නට ලැබෙන සීඝ්‍ර වෙනස්වීම් වලට අනුගතවිය හැකි කාර්යක්ෂම ගෝලීය ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට තේ මණ්ඩලයට ඇති හැකියාව ගැටළුකාරි තත්වයකට ඇද දමා ඇත.

මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ආයතනයක් වශයෙන් ක්‍රියාකළ හැකි වපසරිය පිළිබඳව නැවත විමසා බැලිය යුතු වේ. අමාත්‍යංශය සහ භාණ්ඩාගාරයේ විවිධ අංශ විසින් ඇති කළ නිලධාරිවාදි පාලනයේ දුර්වල තත්වයන් මතින් ගොඩනැගුණු ප්‍රමාණවත් තරමින් දිරිගැන්වූ කාර්යමණ්ඩලයක් නොවීම නිසා මතුවී ඇති පරිපාලනමය අකාර්යක්ෂමතාවයන් මගින් මණ්ඩලය පීඩාවට පත්ව ඇත. නුවමනා රෙගුලාසි බහුලවීම නිසා පවත්නා ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා වන ඇබෑර්තු පවා පුරවා ගැනීමට මාස ගණනාවක් තිස්සේ නොහැකි වී ඇත. නිසිකළට ප්‍රසම්පාදනයන් සපුරාගැනීමට නොහැකි වී ඇත. කර්මාන්තයේ පවතින නොයෙකුත් අවශ්‍යතා සඳහා යෝග්‍ය ප්‍රතිචාරයන් දැක්වීමට ද අසමත්වී ඇත. ප්‍රතිපලය වශයෙන් ඉලක්ක වෙත ළඟාවීම සඳහා දීර්ගකාලීනව අසමත්වි ඇත. එමෙන්ම පාර්ශවකරුවන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීමේදි දක්වන අකාර්යක්ෂමතාවය ඊටත් වඩා අහිතකර වී ඇත. මණ්ඩලය පරිපාලනය කිරීම සඳහා ක්‍රමවත් වෙනස්වීම් සිදුනොවුනහොත් තේ කර්මාන්තය සඳහා එමගින් ඇති ප්‍රයෝජනය පිළිබඳව ප්‍රශ්නාර්තයක් පවතී.

## ස්තුතිය පළකිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය හා තේ මණ්ඩලීය කාර්ය මණ්ඩලය සහ ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමා, නියෝජ්‍ය ඇමතිතුමා සහ අමාත්‍යංශ ලේකම්තුමා ලබාදුන් මගපෙන්වීම සහ සහයෝගය ඇගයීම සඳහා මෙය අවස්ථාව කරගනිමි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සගයන්ගේ අනර්ඝ දායකත්වය වෙනුවෙන් මාගේ ස්තුතිය පුදකර සිටින අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සෑම තරාතිරමකම සේවානියුක්තිකයන් ගේ කැපවීම සහ අවනතභාවය වෙනුවෙන් ස්තුතිකිරීමට ද මෙය අවස්ථාවක් කරගනිමි. ඉදිරි වසරේදී ද සියළුම පාර්ශවකරුවන් සමග සුහදව කටයුතුකිරීමට අපේක්ෂාකරමි.



රොහාන් පෙතියාගොඩ
සභාපති
ශ්‍රී ලංකා තේ මණ්ඩලය

# මූලික සංසන්දනාත්මක දර්ශක

| ප්‍රවර්ගය | ඒකක | 2014 | 2015 | 2016 | 2014 සහ 2015 සැසඳීම (%) |
|---|---|---|---|---|---|
| | | තේ නිෂ්පාදනය | | | |
| සමස්ථ තේ නිෂ්පාදනය | (කි.ග්‍රෑ. මිලි.) | 338.0 | 328.8 | 292.6 | (11.02) |
| උන්නතාංශය අනුව වර්ගීකරණය | | | | | |
| උඩරට | (කි.ග්‍රෑ. මිලි.) | 78.8 | 75.4 | 64.4 | (14.56) |
| මැදරට | (කි.ග්‍රෑ. මිලි.) | 49.2 | 51 | 44.5 | (12.73) |
| පහතරට | (කි.ග්‍රෑ. මිලි.) | 210.0 | 202.4 | 183.6 | (9.27) |
| සැකසුම් ක්‍රමය අනුව වර්ගීකරණය | | | | | |
| සාම්ප්‍රදායික තේ (ජෛව, ක්ෂණික, නිස්සාරිත ) | (කි.ග්‍රෑ. මිලි.) | 314.5 | 306.4 | 271.9 | (11.27) |
| සී.ටී.සී. තේ | (කි.ග්‍රෑ. මිලි.) | 20.3 | 19.5 | 18.3 | (6.02) |
| හරිත තේ | (කි.ග්‍රෑ. මිලි.) | 3.2 | 2.9 | 2.4 | (18.14) |
| තේ අලෙවිය | | | | | |
| තේ අලෙවිය - ප්‍රමාණාත්මකව | (කි.ග්‍රෑ. මිලි.) | 333.5 | 306.0 | 276.3 | (9.72) |
| උඩරට | (කි.ග්‍රෑ. මිලි.) | 69.8 | 67.1 | 55.8 | (16.77) |
| මැදරට | (කි.ග්‍රෑ. මිලි.) | 51.3 | 48.1 | 43.9 | (8.73) |
| පහතරට | (කි.ග්‍රෑ. මිලි.) | 212.5 | 190.8 | 176.5 | (7.49) |
| තේ අලෙවිය - මිල | (රු/කි.ග්‍රෑ.) | 465.01 | 403.8 | 466.4 | 15.51 |
| උඩරට | (රු/කි.ග්‍රෑ.) | 430.06 | 396.3 | 442.7 | 11.72 |
| මැදරට | (රු/කි.ග්‍රෑ.) | 414.04 | 360.0 | 414.9 | 15.24 |
| පහතරට | (රු/කි.ග්‍රෑ.) | 488.06 | 417.5 | 486.8 | 16.59 |
| තේ අපනයන | | | | | |
| තේ අපනයන – ප්‍රමාණාත්මකව (ප්‍රති අපනයනය හැර) | (කි.ග්‍රෑ. මිලි.) | 317.9 | 298.9 | 280.9 | (6.03) |
| ප්‍රවර්ග අනුව වර්ගීකරණය | | | | | |
| කළු තේ | (කි.ග්‍රෑ. මිලි.) | 312.7 | 294.4 | 276.4 | (6.11) |
| හරිත තේ | (කි.ග්‍රෑ. මිලි.) | 2.9 | 2.4 | 2.4 | 1.80 |
| ක්ෂණික තේ | (කි.ග්‍රෑ. මිලි.) | 2.2 | 2.1 | 2.0 | (4.30) |
| තේ අපනයනය - වටිනාකම අනුව (ප්‍රති අපනයනය හැර) | (රු.බිලි.) | 203.5 | 174.3 | 176.2 | 1.11 |
| සමස්ත තේ අපනයන - ප්‍රමාණාත්මකව | (කි.ග්‍රෑ. මිලි.) | 327.3 | 306.9 | 288.8 | (5.91) |
| සමස්ත තේ අපනයන - වටිනාකම අනුව | (රු.බිලි.) | 212.6 | 182.0 | 184.8 | 1.53 |

# 01 සංස්ථාපිත පසුබිම

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 සහ 2006 අංක 44 දරන පනත් මගින් සංශෝධනය වූ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත මගින් 1976 ජනවාරි 01 වැනි දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය පිහිටුවනු ලැබිය. මේ පනත යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අරමුණු වන්නේ ශ්‍රී ලංකාව තුළ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම සහ නියාමනය කිරීමත් ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාවේ තේ(සිලෝන් ටී) ප්‍රවර්ධනය කිරීමත් ය. තේ මණ්ඩලය ස්ථාපිත කිරීමට පෙර පුද්ගලික අංශය මගින් පවත්වාගෙන ගිය තේ ප්‍රචාරණ මණ්ඩලය විය. 1976 දී පාර්ලිමේන්තුව මගින් තේ ප්‍රචාරණ මණ්ඩලය අහෝසි කර තේ කර්මාන්තයට අදාළ බලතල සහිතව ශ්‍රී ලංකා තේ මණඩලය පිහිටුවනු ලැබිය.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය තේ කර්මාන්තයට අදාළව, නිෂ්පාදනය, අළුතින් වගා කිරීම, නැවත වගාව, පැරණි වතු පුනරුත්තාපනය, කර්මාන්ත ශාලා පිහිටුවීම සහ ඒවායෙහි මෙහෙයවීම් යන කාර්යයන් නියාමනය කිරීම වගකිම කරගත් අධිකාරිය වේ.

විකුණුම් අවස්ථාවේදී තේ වල ගුණාත්මක තත්වය අධීක්ෂණය, නැව්ගතකිරීමට පෙර තේ වල තත්ත්වය අධීක්ෂනය, තැරැව්කරුවන්ගේ මිශ්‍රකරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ තේ ගුදම් පරික්ෂාව සහ සෞඛ්‍යාරක්ෂිත ලෙස තේ මිශ්‍ර කිරීම සහ ගබඩා කිරීම පිළිබඳව උපදේශන සේවා සැපයීම ආදි කාර්යයන් තියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය කටයුතු කරයි. අමතරව තේ වතු කළමනාකරණයෙහි සහ තේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයෙහි නියෙලෙන සියළුම ආයතන සහ සංවිධාන නියාමනය, පාලනය සහ මෙහෙයවීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරයි.

ගෝලීය අවශ්‍යතා සපුරාලනු වස් පවත්නා නීති සහ රෙගුලාසි පෙළගැස්වීම සඳහා කර්මාන්ත අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි කටයුතු ආරම්භ කිරීමට නියමිතය. නියාමන කාර්යයන්, සංවර්ධන කටයුතු, ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) දේශීය සහ විදේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීමට අදාළ සියලු කරුණු සම්බන්ධව පාලනය තේ මණ්ඩලය සතුව පවතී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විශේෂයෙන් ම නිෂ්පාදනය සහ තත්ත්ව සහතිකකරණය, තේ දේශීය වශයෙන් බෙදාහැරීම සහ අපනයනය මෙන්ම විදේශීය ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් වන තම නියාමන කාර්යයන් අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම සඳහා සහනාධාර ලබාදීම අධීක්ෂණය කිරීම සහ තේ වල තත්ත්ව සහතිකකරණය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සංවර්ධන කාර්යයන්ට ඇතුළත් වේ. ප්‍රවර්ධන කටයුතු වශයෙන්, තේ අලෙවි සහ ප්‍රවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම, තේ සම්බන්ධව සංඛ්‍යා ලේඛන රැස්කිරීම සහ අර්ථකථනය කිරීම පිළිබඳව වගකියනු ලැබේ.

## ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ව්‍යුහය

### 1.1. ප්‍රධාන ලේකම් කාර්යාලය

තේ කර්මාන්තය නියාමනය කිරීම, සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීමට අදාළ සියලු කටයුතු සහ මණ්ඩලයේ පරිපාලන සහ මූල්‍ය කටයුතු පිළිබඳ සමස්ත අධීක්ෂණය සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලය වගකීම දරයි. පාලන, මූල්‍ය මෙහෙයුම්, නියාමන, ප්‍රවර්ධන, සංවර්ධන, සංඛ්‍යාලේඛන, අභ්‍යන්තර විගණන, ලේකම් කාර්යාලය, තේ රස පිරික්සුම් සහ විශ්ලේෂණ රසායනාගාර, තොරතුරු තාක්ෂණ සහ පුස්තකාල යන විවිධ අංශ මගින් සහායක සේවාවන් වශයෙන් කළමනාකරණ කාර්යයන් ඉටු කරනු ලැබේ.

## 1.2.පරිපාලන අංශය

මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය, ප්‍රසම්පාදනය සහ ගබඩා, නඩත්තු, යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රවාහන කටයුතු සම්බන්ධයෙන් සමස්ත වගකීම සහකාර අධ්‍යක්ෂ ජනරාල් (පාලන) යටතේ පරිපාලන අංශය විසින් දරනු ලබයි.

## 1.3. මූල්‍ය අංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සමස්ත මූල්‍ය පාලනය සහ කළමනාකරණය පිළිබඳ වගකීම දරනුයේ මූල්‍ය අංශයයි. මණ්ඩලය සඳහා මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම, වාර්ෂික අයවැය, වාර්ෂික මූල්‍ය වාර්තා, මාසික ගිණුම් සහ අතුරු වාර්තා සකස් කිරීම, ඉන්වෙන්ටරි සහ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා පවත්වාගෙන යාම සහ වාර්ෂික ගිණුම් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම මූල්‍ය අංශයේ අනෙකුත් ප්‍රධාන කටයුතු වේ.

## 1.4. තේ කොමසාරිස්වරයාගේ අංශය

තේ වගා කිරීම, නිෂ්පාදනය සහ ගුණාත්මක සංවර්ධනයට අදාළ නියාමන කාර්යයන් හා සම්බන්ධ සියලු කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. ප්‍රාදේශීය කාර්යාල හයක ජාලයක් මගින් මෙම අංශය ක්‍රියාත්මක වේ.

ඊට අමතරව නිමි තේ අපහරණය කිරීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම, තේ අපනයනය සහ ආනයනයට අදාල නියාමන කාර්යයන් හා සම්බන්ධ සියලු කටයුතු සම්බන්ධයෙන් තේ කොමසාරිස්වරයාගේ අංශය යටතේ තේ අපනයන අංශය විසින් වගකියනු ලැබේ.

## 1.5. තේ ප්‍රවර්ධන අංශය

විදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව ශ්‍රී ලංකා තේ දේශීය වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම හා සම්බන්ධ සියලුම කටයුතු මෙම අංශය විසින් සිදුකරනු ලැබේ. තවද කර්මාන්තයේ ඉල්ලුම පරිදි විටින්විට වෙළඳපොල පිළිබඳ දැනුම ලබාදීමද මෙම අංශය විසින් සිදුකරනු ලබයි. දේශීය ගැනුම්කරුවන්ට මෙන්ම විදේශිකයන්ටද ප්‍රයෝජනවත් වන තේ අලෙවි කුටියක්ද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

තේ රස පරීක්ෂකයන්ගෙන් සැදුම්ලත් ස්වාධීන මණ්ඩලයක් මගින් තේ වල අවම ගුණාත්මක තත්ත්වය, සිංහ ලාංඡනය යටතේ නියමිත තත්ත්වය පිළිබඳව පරීක්ෂා කිරීම මෙන්ම අනෙකුත් තේ ප්‍රභවයන් පිළිබඳ පරීක්ෂා කිරීම හා සම්බන්ධ වගකීම තේ ප්‍රවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන තේ රස පිරික්සුම් ඒකකය විසින් දරනු ලබයි. එමෙන්ම මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම, විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සේවාවන්ට අනුයුක්ත තේ ප්‍රවර්ධන කාර්යාලවල සහ වාණිජ කාර්යාලවල සහාය ඇතිව ජාත්‍යන්තර ආහාර පාන වෙළඳපොළවල් සඳහා සහභාගිවීම, සන්නම් නාම ප්‍රවර්ධනය සහ වර්ග ප්‍රවර්ධන වැඩසටහන්වලට සහභාගිවීම මෙම අංශය විසින් සිදුකරනු ලබයි. ජාත්‍යන්තර තේ සංගම් සහ තේ පිළිබද අන්තර් රාජ්‍ය කණ්ඩායම් සමග සම්බන්ධ වී කටයුතු කිරීමද මෙම අංශය විසින් සිදුකරයි.

## 1.6. විශ්ලේෂණ රසායනාගාරය

තේ වල තත්ත්වය පවත්වාගෙන යාම පිණිස උසස් තාක්ෂණික උපකරණ භාවිතකොට තේවල රසායනික, ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක සහ පළිබෝධනාශක ශේෂ තත්ත්ව ප්‍රමිතීන් පිළිබඳ පරීක්ෂා කිරීම සහ තත්ත්ව සහතික නිකුත්කිරීම මෙම අංශයේ වගකීම වේ. ඒ අනුව, සෑම ඒකකයක් විසින්ම ගුණාත්මක තත්ත්ව සහතිකකරණ කාරණය සම්බන්ධයෙන් කේවල වශයෙන් සිය දායකත්වය ලබා දෙනු ලබන අතර එමඟින් "ලංකා තේ" නාමය සුරැකීම සඳහා සහාය ලැබෙනු ඇත.

# 02 කර්මාන්ත පැතිකඩ

2016 වසර තේ කර්මාන්තයට අශුභ කාල වකවානුවක් බව සඳහන් කළ හැකිවේ. මෙම වසර තුළදී අහිතකර ප්‍රතිඵල ගෙනදුන් ස්වභාවික හේතු, කම්කරු සටන් සහ කෘෂිකාර්මික හේතු මාලාවකට මුහුණ දීමට ශ්‍රී ලංකා තේ කර්මාන්තයට සිදුවිය. 2015 වසරේ වාර්තා වු කිලෝ මිලියන 328.7 ක ප්‍රමාණයට වඩා කිලෝ මිලියන 36 ක අඩුවීමක් සහිතව 2016 වසරේ දී ජාතික තේ නිෂ්පාදනය කිලෝ මිලියන 292.6 ක් විය. කෙසේවෙතත් පසුගිය වසරට වඩා මෙම වසරේදී විකුණුම් මිල ඉහළ අගයක් ගැනිය. කොළඹ තේ වෙන්දේසියේ විකුණුම් මිල ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ අතර එය අවම සාමාන්‍යය අගය රුපියල් 402.31 ක් සහ උපරිම සාමාන්‍ය අගය රුපියල් 580.92ක් ලෙස පැවතුණි. 2015 වසර හා සැසඳීමේදී අපනයන ආදායම ඉහළ යාමේ ප්‍රවනතාවයක් (1.5%) දිස්විය.

## 2.1. තේ ඉඩම් ව්‍යාප්තිය

වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත තේ වගා ව්‍යාප්තිය හෙක්ටයාර් 202,022 කි.(තාවකාලිකයි). මෙම තේ වතු ඒවායෙහි කළමනාකාරිත්වයේ ස්වභාවය අනුව පෞද්ගලික අංශය (61%) සහ රාජ්‍ය, අංශය(39%) යනුවෙන් බෙදාවෙන්කළ හැකිවේ. ශ්‍රී ලංකාව තුළ තේ වගාව ව්‍යාප්තව ඇත්තේ දිස්ත්‍රික්ක කිහිපයක් තුළය. ප්‍රධාන වශයෙන් තේ වගාව සඳහා හිතකර දේශගුණික තත්වයන් හේතුකොටගෙන තෙත් කලාපයේය.

## 2.2. ජාතික තේ නිෂ්පාදනය

වගුව 2.1: සමස්ත තේ නිෂ්පාදනය-භූමියේ උස අනුව 2016

| උන්නතාංශය | නිෂ්පාදනය (කි.ග්‍රෑ.) |
|---|---|
| උඩරට | 64,424,744 |
| මැදරට | 44,510,198 |
| පහතරට | 183,638,644 |
| එකතුව | **292,573,586** |

අහිතකර කාලගුණික තත්වයන් විසින් ඇතිකළ අභියෝගයන් හමුවේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 36 ක් පමණ ප්‍රමාණයකින් පහත වැටීමක් ඇතිව කිලෝ ග්‍රෑම් මිලියන 292.6 ක් ලෙස වාර්තා විය. එය 2015 වසරේදී වාර්තා වු ප්‍රමාණයට වඩා 11.01% කින් අඩුවිය.

මුහුදු මට්ටමේ සිට භූමියේ විවිධ වු උස් මට්ටම් වල තේ වගාකරන ශ්‍රී ලංකාව, වැඩි වශයෙන් නිපදවනු ලබන්නේ පහත රට තේ ය. මුහුදු මට්ටමේ සිට මීටර් 600 දක්වා පරාසය තුළ වු උස් භූමි මට්ටම් වල වගාකරන මෙම තේ ප්‍රධාන වශයෙන් සැර රසකින් හා තද වර්ණයකින් යුතු වේ.


උඩරට තේ මීටර් 1,200 වැඩි උසකින් යුත් භූමිවල වගාකරන අතර සාමාන්‍යයෙන් ඒවා අද්විතිය රසකින් හා සුවඳකින් යුත් උසස්ම තත්වයේ තේ ලෙස පිළිගැනේ.

ඉහළ ආදායම් මට්ටම් සහ ඉල්ලුම ඉහළ යාම හේතු කොටගෙන පහත රට තේ නිෂ්පාදනයේ වැඩිවීමක් සිදුවී ඇත. ජාතික තේ නිෂ්පාදනයෙන් තුනෙන් දෙකකට (63%) වඩා වැඩි ප්‍රමාණයකට පහත රට තේ නිෂ්පාදනය දායක වී ඇත. උඩ රට සහ මැද රට තේ නිෂ්පාදනයන් පිළිවෙලින් 22% කින් සහ 15% කින් දායක වී ඇත.

### 2.2.1. මාසික තේ නිෂ්පාදනය

ජාතික තේ නිෂ්පාදනය සඳහා වසර පුරාම සෑම මාසයකම පහතරට තේ නිෂ්පාදනය මගින් සැලකිය යුතු දායකත්වයක් ලැබුණි. මෙම වසරේදී ඉහළම මාසික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 30.8 ලෙස මැයි මාසය තුළදී වාර්තා වු අතර අවමය ඔක්තෝබර් මාසයේදී කිලෝ ග්‍රෑම් මිලියන 18.7 ලෙස වාර්තා විය. පසුගිය වසරේදී ද ඉහළම මාසික තේ නිෂ්පාදනය වාර්තා වුයේ මැයි මාසය තුළදී ය. පසුගිය වසරේ අවම මාසික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 23 ඉක්මවිය. මෙම වසරේදී එය කිලෝ ග්‍රෑම් මිලියන 18 ක් විය. කෙසේ වුවද 2016 වසරේ සමුච්චිත තේ නිෂ්පාදනය 2015 වසර හා සැසඳීමේදි 11.0% ක පහත වැටීමක් වාර්තා වේ.

ප්‍රස්තාරය 2.1: මාසික තේ නිෂ්පාදනය-භූමියේ උස අනුව




### 2.2.2. කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව විශ්ලේෂණය

රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්ක දෙක පිළිවෙළින් කිලෝ ග්‍රෑම් මිලියන 52 සහ කිලෝ ග්‍රෑම් මිලියන 43 ක් නිෂ්පාදනය කරමින් කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදන ලැයිස්තුවේ ඉහළම තැන රැක ගැනිමට තවදුරටත් සමත් විය. අනෙකුත් කෘෂි කලාප වලට වඩා පහතරට සියළුම උප දිස්ත්‍රික්කවල ඉහළ නිෂ්පාදනයක් 2016 වසරේ දි වාර්තා කර ඇත. 2015 වසර ට සාපේක්ෂව සියළුම කලාප වල සමස්ත නිෂ්පාදනයේ පහත වැටීමක් සිදු වී ඇත.

වගුව 2.2: කෘෂි දේශගුණික දිස්ත්‍රික්ක අනුව තේ නිෂ්පාදනය

| කෘෂි දේශගුණික දිස්ත්‍රික්කය | ජනවාරි සිට දෙසැම්බර් (ප්‍රමාණය - මෙ.ටො.) | | | |
|---|---|---|---|---|
| | **2015*** | **2016*** | **Change** | **%** |
| **නුවරඑළිය** | **3,854** | **5,076** | **1,222** | **31.70** |
| **බටහිර** | | | | |
| **1. රම්බොඩ** | 2,017 | 1,625 | **(392)** | **(19.46)** |
| **2. පුඩලූ ඔය** | 3,222 | 3,426 | 204 | 6.34 |
| **3. ආගරපතන** | 9,760 | 5,948 | **(3,812)** | **(39.06)** |
| **4. නානුඔය/ ලිඳුල/ තලවකැලේ** | 9,814 | 8,295 | (1,519) | (15.48) |
| **5. පතන / කොටගල** | 5,736 | 4,513 | **(1,223)** | **(21.32)** |
| **6. හැටන් / දික්ඔය** | 8,730 | 7,004 | (1,726) | (19.77) |
| **7. බොගවන්තලාව** | 6,846 | 5,912 | **(934)** | **(13.64)** |
| **8. අප් කොට් / මස්කෙළිය** | 7,478 | 5,808 | (1,670) | (22.33) |
| බටහිර–එකතුව | **53,604** | **42,531** | **(11,073)** | **(20.66)** |
| **මධ්‍යම** | | | | |
| **1. වටවල / ගිනිගත්හේන/ නෝට්‍රන් බ්‍රිජ්** | 1,674 | 1,829 | **155** | **9.27** |
| **2. පුස්සැල්ලාව / හේවාහැට** | 7,217 | 6,299 | (918) | (12.72) |
| **3. කොත්මලේ** | 2,435 | 841 | **(1,594)** | **(65.47)** |
| **4. ගම්පොළ / නාවලපිටිය / දොළොස්බාගේ** | 13,494 | 14,603 | 1,109 | 8.22 |
| **5. නිලඹෙ / හන්තාන / ගලහ** | 2,292 | 1,387 | **(905)** | **(39.49)** |
| **6. කඩුගන්නාව** | 7,629 | 6,776 | (853) | (11.18) |
| **7. මඩුල්කැලේ / නකල්ස් / රන්ගල** | 3,021 | 3,940 | **919** | **30.43** |
| **8. හුන්නස්ගිරිය / මාතලේ / යක්දෙස්ස** | 1,908 | 1,257 | (651) | (34.10) |
| **9. බලංගොඩ / රක්වාන** | 8,155 | 7,369 | **(786)** | **(9.64)** |
| මධ්‍යම එකතුව | **47,825** | **44,301** | **(3,524)** | **(7.37)** |
| **උඩපුස්සැල්ලාව** | | | | |
| **1. උඩපුස්සැල්ලාව/ හල්ග්‍රාන්ඔය** | 4,603 | 4,186 | **(417)** | **(9.06)** |
| **2. මතුරට** | 1,696 | 1,519 | **(177)** | **(10.46)** |
| උඩපුස්සැල්ලාව-එකතුව | **6,299** | **5,705** | **(594)** | **(9.44)** |
| **ඌව** | | | | |
| **1. කොස්ලන්ද/ හල්දුමුල්ල** | 575 | 747.18 | 172.18 | 29.94 |
| **2. හපුතලේ** | 4,139 | 3,424 | **(715)** | **(17.26)** |
| **3. බණ්ඩාරවෙල/ පූනාගල** | 3,499 | 2,823 | (676) | (19.31) |
| **4. මල්වත්ත/ වැලිමඩ** | 2,888 | 1,887 | **(1,001)** | **(34.67)** |
| **5. දෙමෝදර/ හාළිඇල/ බදුල්ල** | 8,430 | 8,055 | (375) | (4.45) |
| **6. ඇල්ල/නමුනුකුළ** | 1,832 | 1,459 | **(373)** | **(20.35)** |
| **7. පස්සර/ ලුනුගල** | 3,413 | 2,795 | (618) | (18.11) |
| **8. මඩුල්සීම** | 3,084 | 2,852 | **(232)** | **(7.53)** |
| ඌව එකතුව | **27,859** | **24,042** | (3,817) | (13.70) |
| **පහතරට** | | | | |
| **1. දෙනියාය** | 16,185 | 13,498 | (2,687) | (16.60) |
| **2. ගාල්ල** | 50,201 | 43,396 | **(6,805)** | **(13.56)** |
| **3. කළුතර** | 19,217 | 19,926 | 709 | 3.69 |
| **4. කෑගල්ල** | 6,219 | 4,895 | **(1,324)** | **(21.28)** |
| **5. කැලණිවැලි** | 7,289 | 7,176 | (113) | (1.55) |
| **6. මහනුවර/ මාතලේ/ කුරුණෑගල** | 4,432 | 5,238 | **806** | **18.18** |
| **7. මාතර** | 17,246 | 13,894 | (3,352) | (19.43) |
| **8. මොරවක** | 7,452 | 6,260 | **(1,192)** | **(16.00)** |
| **9. රත්නපුර** | 55,625 | 51,958 | (3,667) | (6.59) |
| **10. බලන්ගොඩ** | 5,466 | 4,677 | **(789)** | **(14.43)** |
| පහතරට එකතුව | **189,331** | **170,919** | (18,412) | (9.72) |
| **එකතුව** | **328,771** | **292,574** | **(36,197)** | **(11.01)** |

ප්‍රතිශෝධනය කර ඇත.(මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.2.3. තේ නිෂ්පාදනය - දිස්ත්‍රික්ක අනුව

විමසුමට ලක් කෙරෙන වසර තුළදී ඉහළම උඩරට තේ නිෂ්පාදනය නුවර එළිය දිස්ත්‍රික්කයෙන් ද ඉහළම පහත රට තේ නිෂ්පාදනය රත්නපුර දිස්ත්‍රික්කයෙන් ද වාර්තා විය.

වගුව 2.3: තේ නිෂ්පාදනය - දිස්ත්‍රික්ක අනුව (කිලෝග්‍රෑම්)

| දිස්ත්‍රික්කය | උඩරට | මධ්‍යම | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 13,905,758 | 10,633,952 | - | 24,539,710 |
| කොළඹ | | | 603,278 | 603,278 |
| ගාල්ල | - | - | 42,799,277 | 42,799,277 |
| හම්බන්තොට | - | - | 220,411 | 220,411 |
| කළුතර | - | - | 18,486,774 | 18,486,774 |
| මහනුවර | 823,053.5 | 20,408,962 | 12,520,727 | 33,752,743 |
| කෑගල්ල | 584,663 | - | 7,731,959 | 8,316,622 |
| මාතලේ | - | 1,050,591 | 398,126 | 1,448,717 |
| මාතර | - | - | 34,182,674 | 34,182,674 |
| නුවරඑළිය | 49,007,880 | 10,424,289 | 793,864 | 60,226,032 |
| රත්නපුර | 103,389 | 1,992,404 | 65,901,555 | 67,997,348 |
| එකතුව | **64,424,744** | **44,510,198** | **183,638,644** | **292,573,586** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.2.4. අමු තේ දළු රැස්කිරීමේ ක්‍රමවේදය අනුව නිෂ්පාදනය විශ්ලේෂණය කිරීම

තේ කර්මාන්ත ශාලාවක සමස්ත තේ නිෂ්පාදනය ඔවුන්ගේම වතු වලින් හෝ වෙනත් වතුවලින් ලබාගත් දළු මෙන්ම සැපයුම් කරුවන් මගින් මිලදී ගත් තේ දළු මගින් නිපදවූ ඒවා වේ.

2016 වසරේ සමස්ත තේ නිෂ්පාදනය සඳහා යොදාගත් අමු තේ දළු ප්‍රමාණයන්, එක් එක් දිස්ත්‍රික්ක වශයෙන් රැස් කිරීමේ ක්‍රම වේදයන් අනුව පහත සඳහන් වගුව මගින් නිරූපනය කරයි.

වගුව 2.4: දිස්ත්‍රික්ක අනුව අමු තේ දළු නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

| පරිපාලන දිස්ත්‍රික්කය | තම වතුවලින් ලබාගත් දළු | වෙනත් වතුවලින් ලබාගත් දළු | මිලදී ගත් දළු | එකතුව |
|---|---|---|---|---|
| බදුල්ල | 45,158,388 | 27,292,103 | 41,659,161 | 114,109,652 |
| කොළඹ | - | - | 2,805,243 | 2,805,243 |
| ගාල්ල | 3,301,858 | 1,773,422 | 193,941,358 | 199,016,637 |
| හම්බන්තොට | - | - | 1,024,911 | 1,024,911 |
| කළුතර | 2,057,427 | 853,684 | 83,052,388 | 85,963,499 |
| මහනුවර | 22,841,811 | 4,969,776 | 129,138,665 | 156,950,253 |
| කෑගල්ල | 3,985,531 | 1,292,535 | 33,394,226 | 38,672,292 |
| මාතලේ | 1,160,724 | 301,613 | 5,274,199 | 6,736,535 |
| මාතර | 7,239,350 | 1,309,751 | 150,400,332 | 158,949,433 |
| මොණරාගල | - | - | - | - |
| නුවරඑළිය | 182,081,855 | 39,414,869 | 58,554,326 | 280,051,050 |
| රත්නපුරය | 20,003,086 | 6,274,181 | 289,910,401 | 316,187,668 |
| එකතුව | **287,830,031** | **83,481,934** | **989,155,209** | **1,360,467,174** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.2.5 තේ නිපැයුම් ක්‍රමවේද අනුව නිෂ්පාදන විශ්ලේෂණය කිරීම

### 2.2.5.1. කළු තේ සහ හරිත තේ නිෂ්පාදනය

2015 වසරට සාපේක්ෂව 2016 වසරේදී සම්ප්‍රදායික තේ නිෂ්පාදනය 11.27% (34,548,233 කි.ග්‍රෑ.) කින් පහත වැටීමක් වාර්තා වන අතර සී.ටී.සී. තේ නිෂ්පාදනයන් ද 5.88% කින් පහතවැටී ඇත. විමසුමට ලක් කෙරෙන වසර තුළදී සමස්ත කළු තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 35.7 කින් ( 10.95%) පහතවැටී ඇත. හරිත තේ නිෂ්පාදනය ද කිලෝ ග්‍රෑම් 505, 049 ක පහත වැටීමක් පෙන්නුම් කරන අතර පෙර වර්ෂය හා සැසඳීමේදී එය 17.54% ක පසුබෑමකි.

වගුව 2.5: නිපැයුම් ක්‍රමවේද අනුව තේ නිෂ්පාදනය

| පිරිසැකසුම් ක්‍රමවේදය | 2015 | 2016 | 2015 සහ 2016 | |
|---|---|---|---|---|
| | ප්‍රමා.(කි.ග්‍රෑ.) | ප්‍රමා.(කි.ග්‍රෑ.) | වෙනස(කි.ග්‍රෑ.) | වර්ධනය (%) |
| සාම්ප්‍රදායික | 306,422,077 | 271,873,844 | (34,548,233) | (11.27) |
| සී.ටී.සී. | 19,469,857 | 18,325,660 | (1,144,198) | (5.88) |
| හරිත | 2,879,132 | 2,374,083 | (505,049) | (17.54) |
| එකතුව | **328,771,066** | **292,573,586** | **(36,197,480)** | **(11.01)** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.2.5.2. ක්ෂණික තේ සහ ජෛව තේ නිෂ්පාදනය


2015 වසර හා සැසඳීමේ දී ක්ෂණික තේ නිෂ්පාදනය සුළු වශයෙන්(මෙ.ටො.230) පහළවැටීමක් පෙන්නුම් කරයි. ඒ අතරතුර ජෛව තේ නිෂ්පාදනයේ වැඩිවීමක් (මෙ.ටො. 7) පෙන්නුම් කරයි.

## 2.2.6 තේ නිෂ්පාදන වියදම

ඵලදායිතාවය සහ නිෂ්පාදන වියදම අතර සබඳතාවක් පවතී. නිරන්තරව නිෂ්පාදන වියදම ඉහළයාම වැවිලිකරණ අංශය තුළ කණගාටුදායක සිද්ධියක් බවට පත්ව ඇත. තේ නිෂ්පාදනයේ දී විශාල ප්‍රමාණයක ශ්‍රම අවශ්‍යතාවයක් පවතින බැවින් ශ්‍රම ඵලදායිතාව හා නිෂ්පාදන වියදම අතර විශාල සම්බන්ධතාවයක් පවතී. තේ නිපදවන ප්‍රධාන පෙලේ රටවල් අතර ශ්‍රී ලංකාව නිෂ්පාදන වියදම ඉහළින් පවතින රටකි. ගෝලීය වෙළෙඳපොළ තුළ රටවල් අතර පවතින තරඟකාරීත්වය හමුවේ මෙම තත්වය වඩාත් බලපෑමක් වී ඇත.

තේ කිලෝ ග්‍රෑමයක් නිෂ්පාදනය කිරීම සඳහා වන වියදම පසුගිය දශකය තුළදී සීඝ්‍රලෙස ඉහළ ගොස් තිබේ. මේ සඳහා කම්කරු වියදම් සහ යෙදවුම් මිල ගණන් ඉහළ යාම විශේෂයෙන් බලපෑම් කර තිබුණි. 2015/16 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදිත කිලෝ ග්‍රෑමයක් සඳහා රැපියල් 466.98 වන වාර්ෂික තේ නිෂ්පාදන වියදම 2014/15 හා සැසඳීමේදී 1.77% ක වර්ධනයකි.

සටහන 2.2: නිමි තේ කිලෝවක් සඳහා සමස්ත වියදම




(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

## 2.3 තේ අලෙවිය

විමසිමට බඳුන් වන වසරේදී පහළ විකුණුම් ප්‍රමාණයක් සහ තරමක ඉහළ මිල ගණන් වාර්තා විය. සාමාන්‍ය මිල ගණන් පරාසය උපරිමව කිලෝ ග්‍රෑමයකට රුපියල් 583.97 ක සිට අවමවශයෙන් කිලෝ ග්‍රෑමයකට රුපියල් 404.05 දක්වා වර්ෂය මුළුල්ලේ විචලනය වෙමින් පැවතුනි. වාර්ෂිකව සාමාන්‍ය තේ මිල කිලෝ ග්‍රෑමයකට රුපියල් 468.62 ක් විය. 2015 වසරේ රුපියල් 403.01 හා සැසඳීමේදී එය වර්ධනයකි. ප්‍රසිද්ධ වෙන්දේසියේ, පෞද්ගලික සහ සෘජු විකුණුම් මගින් 2015 වසරේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 403.1 වූ සාමාන්‍ය මිලක් ඇතිව කිලෝ ගෑම් මිලියන 319.4 ක ප්‍රමාණයක් අලෙවි කෙරුණු අතර 2016 වසරේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 468.62 ක සාමාන්‍ය මිලක් සහිතව තේ කිලෝ ග්‍රෑම් මිලියන 280.85 ක ප්‍රමාණයක් අලෙවිකර ඇත.

මෙමගින් පැහැදිලිවනුයේ 2015 වසර හා සැසඳීමේදී තේ අලෙවිය 12.07 % කින් පහළ ගොස් ඇති අතර 16.25 % කින් මිල ඉහළ ගොස් ඇති බවයි.

### 2.3.1 අලෙවි ක්‍රම

ප්‍රධාන අලෙවි ක්‍රමය වනුයේ ප්‍රසිද්ධ වෙන්දේසියයි. 2016 වසරේදී තේ කිලෝ ග්‍රෑම් මිලියන 272.5ක ප්‍රමාණයක් කොළඹ තේ වෙන්දේසියේ අලෙවි කෙරුනි. පෞද්ගලික විකුණුම් ලෙස කිලෝ ග්‍රෑම් මිලියන 2.7 සහ සෘජු විකුණුම් ලෙස කිලෝ ග්‍රෑම් මිලියන 1.8 පමණ විය.

### 2.3.2 කොළඹ තේ වෙන්දේසිය

කොළඹ තේ වෙළෙඳුන්ගේ සංගමය යටතේ ලංකා වානිජ මණ්ඩලය මගින් මෙහෙයවන කොළඹ තේ වෙන්දේසිය 2016 වසර තුළදී වෙන්දේසි 50 ක් පවත්වන ලදී. ප්‍රසිද්ධ වෙන්දේසියේදී කිලෝ ග්‍රෑම් මිලියන 3.7(1.37%) ක අඩුවීමක් වාර්තා විය. කෙසේ නමුත් 2016 වසර තුළදී කොළඹ තේ වෙන්දේසිය මගින් උපයාදුන් සාමාන්‍ය මිල සාපේක්ෂව ඉහළ අගයක් ගනී. එමෙන්ම කිලෝ ග්‍රෑමයකට රුපියල් 402.14 සිට කිලෝ ග්‍රෑමයකට රුපියල් 468.66 දක්වා වාර්ෂික වැඩිවීමක් දකින්නට තිබේ.

### 2.3.3. භූමියේ පිහිටීම අනුව අලෙවිය

2.6 වගුව මගින් භූමියේ පිහිටීම අනුව තේ අලෙවිය පිළිබඳව විශ්ලේෂණය කෙරේ. පසුගිය වසර හා සැසඳීමේදී උඩ රට, මධ්‍යම සහ පහත රට තේ මගින් උපයාගත් ඒකක මිල ගණන් ඉහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2016 වසරේදී ධනාත්මක පිරිවැටුමක් වාර්තා විය.

වගුව 2.6: භූමියේ පිහිටීම අනුව තේ අලෙවිය

| | ප්‍රමාණය (කි.ග්‍රෑ. මිලියන) | | | | ඒකක මිල (කි.ග්‍රෑ/ රු.) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පිහිටීම | 2015 | 2016 | වෙනස | % | 2015 | 2016 | වෙනස | % |
| උඩරට | 71.0 | 58.4 | (12.58) | (17.71) | 392.47 | 449.43 | 56.96 | 14.51 |
| මැදරට | 49.1 | 45.5 | (3.64) | (7.41) | 362.11 | 420.79 | 58.68 | 16.21 |
| පහතරට | 199.3 | 177.0 | (22.34) | (11.21) | 416.98 | 487.24 | 70.26 | 16.85 |
| මුළු විකුණුම් | 319.4 | 280.8 | (38.55) | (12.07) | 403.10 | 468.62 | 65.52 | 16.25 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## 2.4 තේ අපනයනය

රුපියල් බිලියන 184.7 ක ආදායමක් උපයාගනිමින් ශ්‍රී ලංකාවේ තේ අපනයනය (ප්‍රති අපනයනයන් සහිතව) 2016 වසර සඳහා කිලෝ ග්‍රෑම් මිලියන 288.7 ක් විය. තේ කිලෝ ග්‍රෑමයක් සඳහා සාමාන්‍ය ඒකක FOB මිල රුපියල් 639.88 ක් විය. මෙම වසරේ ද අපනයන ආදායම රුපියල් බිලියන 150 ඉලක්කය ඉක්මවා ඇත. ලෝක තේ වෙළෙඳපොළ තුළ අපනයන ප්‍රමාණය අනුව ශ්‍රී ලංකාව තුන්වන අපනය කරුවා බවට පත්ව ඇත. එමෙන්ම ලෝක තේ වෙළෙඳපොළ තුළ අපනයන මගින් උපයාගත් ආදායම අනුව ශ්‍රී ලංකාව දෙවන තැන හිමිකරගෙන ඇත.


තරඟකරුවන් විසින් එල්ල කර ඇති දැඩි තරඟකාරිත්වය අපිට හිමි තත්වය කෙරෙහි අයහපත් ලෙස බලපෑම් කර ඇත. මෙම තත්වය වඩාත් තිව්‍ර කිරීම සඳහා ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදන වියදම අධික වීම සහ තේ අස්වැන්න පහළ මට්ටමක පැවතීම හේතුවිය. ඊට අමතරව ගෝලීය තේ පරිභෝජකයන් ගේ වෙනස්වන රුචිකත්වයන් හමුවේ ශ්‍රී ලංකාව තවදුරටත් සම්ප්‍රධායික තේ මත ම රැඳීසිටීම තම වෙළෙඳපොළ කොටස තවතවත් අහිමි වී යාමට ඉඩතිබේ.

### 2.4.1 තේ වර්ග අනුව අපනයන විශ්ලේෂණය

සාමාන්‍යයෙන් තේ සඳහා පරිභෝජකයන් තුළ ඇති අභිරුචිය දළු වල ප්‍රභවය සහ ගුණාත්මක බව අනුව වෙනස් වේ. උදාහරණයක් වශයෙන් මැද පෙර දිග සහ පොදු රාජ්‍ය මණ්ඩලිය ස්වාධීන රාජ්‍යයන් (CIS) වල මූලික වශයෙන් ශ්‍රී ලංකා වේ පහත රට, සම්ප්‍රධායික, කහට රසැති තේ සඳහා ඉල්ලුමක් ඇත.

2016 වසරේදී, ප්‍රති අපනයනයන් ද සහිතව සමස්ත කළු, හරිත සහ ක්ෂණික තේ අපනයනය ප්‍රමාණාත්මකව පහත වැටීමක් පෙන්නුම් කරන අතර ආදායම ඉහළ ගොස් ඇත. කිලෝ ග්‍රෑම් මිලියන 18.2 ක ප්‍රමාණාත්මක වෙනසක් සහිතව සමස්ත තේ අපනයනය 5.92% කින් පහත වැටී ඇත. වෙන් වෙන්ව අපනයන සහ ප්‍රති අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් 6.03% සහ 1.66% වන අතර ඉපයීම් පිළිවෙලින් 1.11% සහ 10.24% වේ. කෙසේ වෙතත් 2016 වසරේදී සමුච්චිත අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 1269.0 ක් විය. 2015 වසරේදී එය ඇමරිකානු ඩොලර් මිලියන 1339.1 ක් වූ අතර 5.24% ක වර්ධනයකි.

සටහන2.3 මාසික තේ අපනයනය - 2016, ප්‍රමාණය සහ ඒකක අගය



## 2.4.2. වාර්ෂික තේ අපනයන

2016 වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා තේ අපනයන පිළිබඳ වර්ග අනුව විස්තරාත්මක නිරූපනයක් (ප්‍රමාණය, වටිනාකම සහ නැ.වි.ස.(FOB) ඇතුළත්ව) 2.7 වගුව මගින් ලබා දේ.

වගුව 2.7 : වාර්ෂික තේ අපනයනය

| ඇසුරුම | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රුපියල්) | නැ.වි.ස. (රු./කි.ග්‍රෑ) |
|---|---|---|---|
| **අපනයන** | 280,874,277 | 176,232,229,182 | 627.44 |
| **කළු තේ** | 276,421,378 | 170,401,573,947 | 616.46 |
| මළු | 19,622,961 | 23,530,481,587 | 1,199.13 |
| තොග | 124,389,398 | 68,584,643,026 | 551.37 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 1,886,986 | 1,159,204,870 | 614.32 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 14,552,853 | 8,075,638,163 | 554.92 |
| ඇසුරුම් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 83,132,078 | 52,312,188,923 | 629.27 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 32,837,102 | 16,739,417,378 | 509.77 |
| **හරිත තේ** | 2,443,129 | 3,387,643,777 | 1,386.60 |
| මළු | 749,707 | 1,778,599,549 | 2,372.39 |
| තොග | 1,007,496 | 661,650,841 | 656.73 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 53 | 65,365 | 1,233.30 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 5,789 | 10,554,831 | 1,823.41 |
| ඇසුරුම් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 657,996 | 907,471,652 | 1,379.15 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 22,089 | 29,301,540 | 1,326.52 |
| **ක්ෂණික තේ** | 2,009,770 | 2,443,011,458 | 1,215.57 |
| මළු | 1 | 2,784 | 3,093.33 |
| ඇසුරුම් (> - කි.ග්‍රෑ.3)) | 2,009,330 | 2,441,824,415 | 1,215.24 |
| ඇසුරුම් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 439 | 1,184,259 | 2,695.17 |
| **ප්‍රති අපනයනය** | 7,896,404 | 8,545,736,706 | 1,082.23 |
| **කළු තේ** | 6,113,128 | 5,556,362,190 | 908.92 |
| මළු | 3,388,183 | 3,888,288,318 | 1,147.60 |
| තොග | 810,115 | 368,677,400 | 455.09 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 48 | 20,395 | 429.37 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 21,883 | 10,741,421 | 490.85 |
| ඇසුරුම් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 1,838,954 | 1,245,265,187 | 677.16 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 53,946 | 43,369,469 | 803.95 |
| **හරිත තේ** | 1,782,193 | 2,987,229,198 | 1,676.15 |
| මළු | 1,055,655 | 2,218,269,265 | 2,101.32 |
| තොග | 81,459 | 42,486,151 | 521.56 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.1 - කි.ග්‍රෑ.3) | 5,713 | 3,386,980 | 592.84 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.3 - කි.ග්‍රෑ.5) | 247 | 186,617 | 755.53 |
| ඇසුරුම් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 638,770 | 722,357,641 | 1,130.86 |
| ඇසුරුම් (කි.ග්‍රෑ.5 - කි.ග්‍රෑ.10) | 349 | 542,544 | 1,554.57 |
| **ක්ෂණික තේ** | 1,082 | 2,145,318 | 1,982.00 |
| ඇසුරුම් (> කි.ග්‍රෑ.3)) | 24 | 18,448 | 768.67 |
| ඇසුරුම් (ග්‍රෑම්4 - කි.ග්‍රෑ.1) | 1,058 | 2,126,870 | 2,009.51 |
| **මුළු එකතුව (අපනයන සහ ප්‍රති අපනයන)** | **288,770,681** | **184,777,965,888** | **639.88** |
| **පානය සඳහා සැකසූ තේ (ලීටර)** | **19,823,771** | **1,991,541,236** | **100.46** |
| අපනයන | **12,143** | **6,645,068** | **547.22** |
| ප්‍රති අපනයන | **19,811,628** | **1,984,896,168** | **100.19** |

### 2.4.3. අගය එකතු කළ තේ අපනයන

ගෝලීය පරිභෝජකයන්ගේ තේ කෙරෙහි ඇති කැමැත්ත ඉතාමත් වේගයෙන් අගය එකතුකළ තේ වෙත යොමුවෙමින් පවතී. එවන් අවස්ථාවකදී මෙතෙක් ගෝලීය වෙළෙඳපොළ තුළ තමන්ට හිමි ආස්ථානය රැක ගැනීම සඳහා ශ්‍රී ලංකාව මෙම වෙළෙඳපොළ වෙනස් වීම් වලට අනුගත වියයුතුයි. අගය එකතු කළ තේ එනම් කි. ග්‍රෑම්. 03 වඩා අඩු ඇසුරුම්, තේ මළු සහ ක්ෂණික තේ අපනයනය 2016 වසරේ සමස්ත තේ අපනයනයෙන් 39.82% ක් විය. එමගින් උපයාගත් ආදායම රුපියල් බිලියන 90.2 ක් වු අතර එය සමස්ත අපනයන ආදායමෙන් 48.82% ක් විය.

වගුව 2.8: වාර්ෂික තේ අපනයනය - 2016


| අපනයනය ස්රූපය | සැකසුම් ක්‍රම වෙදය | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | වටිනාකම (රු.) | නැ.වි.ස. (රු/ කි.ග්‍රෑ.) |
|---|---|---|---|---|
| අපනයනය | කළු | 104,642,025 | 77,001,875,380 | 735.86 |
| | හරිත | 1,407,756 | 2,686,136,565 | 1,908.10 |
| | ක්ෂණික | 2,009,770 | 2,443,011,458 | 1,215.57 |
| | උප එකතුව | **108,059,551** | **82,131,023,403** | **760.05** |
| ප්‍රති අපනයනය | කළු | 5,227,185 | 5,133,573,900 | 982.09 |
| | හරිත | 1,700,138 | 2,944,013,886 | 1,731.63 |
| | ක්ෂණික | 1,082 | 2,145,318 | 1,982.00 |
| | උප එකතුව | **6,928,405** | **8,079,733,104** | **1,166.18** |
| **එකතුව** | | **114,987,955** | **90,210,756,507** | **784.52** |

* පානය සඳහා සැකසූ තේ (RTD) අපනයන රහිතව මෙම වගුව සකස් කරන ලද අතර මුළු RTD අපනයන, අගය එකතුකළ තේ අපනයන ලෙස සලකනු ලැබේ.

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

තොග තේ සහ අගය එකතු කළ තේ සඳහා නැ.වි.ස. මිල(FOB price) පහත සටහන මගින් පෙන්නුම් කරයි. අගය එකතු කළ තේ සඳහා නැ.වි.ස. මිල තොග තේ මිල ට වඩා ඉහළ අගයක් ගනී. එබැවින් තොග තේ වලට වඩා අගය එකතු කළ තේ අපනයනය සඳහා වන ප්‍රවර්ධන කටයුතු ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා ධනාත්මක බලපෑමක් ඇති කරයි.

සටහන 2.4 : අගය එකතුකළ තේ සහ තේ තොග අපනයනය




### 2.4.4. ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල්

අතිතයේ පටන් යුරෝපය සහ එක්සත් රාජධානිය ලංකා තේ සඳහා ප්‍රබල වෙළෙඳපොළක් ව පැවතුනි. 2016 වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 11.92% ක ප්‍රමාණයක් ආනයනය කරමින් රුසියාව, ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් අතර ප්‍රථම ස්ථානයට පත්විය.

2015 වසරේ දීද වැඩිම ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කළේ රුසියාව වෙතටයි. එම වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයනයෙන් 11.97% ක ප්‍රමාණයක් රුසියාව විසින් ආනයනය කරන ලදී. නමුත් 2015 වසර හා සැසඳීමේදී මෙම වසරේ ප්‍රමාණාත්මකව 6.29% ක පහත වැටීමක් වාර්තා වේ.

2013 වසර දක්වා ලංකා තේ අපනයනය කරන ප්‍රධාන රටවල් අතර පළමු ස්ථානය රැක ගැනීම ට රුසියාව සමත් විය. නමුත් තුර්කියේ ලංකා තේ සඳහා ඉල්ලුම සහ රුසියාවේ දේශපාලන සහ ආර්ථික අස්ථාවරත්වය යනාදි කරුණු හේතුකොටගෙන 2014 වසරේදී රුසියාව, ලංකාවේ තේ අපනයන ප්‍රමාණය අනුව දෙවන ස්ථානයට පත්විය. 2015 වසරේදී නැවතත් රුසියාව පළමු ස්ථානයට පත්විය. 2016 වසරේදී ද එම ස්ථානය රැකගැනීමට සමත්විය. ශ්‍රී ලංකාව තේ අපනයනයෙන් උපයන සමස්ත ආදායම ට 11.23% ක දායකත්වයක් ලබාදෙමින් තේ අපනයනයෙන් දෙවැනියට ඇදායම් උපයාදෙන රට බවට රුසියාව පත්ව ඇත.

2016 වසරේදී ඉරාකයට 11.27% ක ප්‍රමාණයකින් තේ අපනයනය කළ අතර එමගින් ඉරාකය ශ්‍රී ලංකාවෙන් තුන් වෙනියට තේ අපනයනය කරන රට බවට පත්විය. එම ප්‍රමාණය 2015 වසර හා සැසඳීමේදී 3.80% ක වර්ධනයකි. ජපානය සඳහා සාමාන්‍ය නැ.වි.ස. මිල(FOB prices) 2016 වසරේ දි ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කළ ප්‍රධාන රටවල් දහය අතුරින් ඉහළ මිලක් විය. 2016 වසරේදී ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන පස් වෙනි රට බවට පත් වු එක්සත් අරාබි එමීර් රාජ්‍ය වෙත අපනයනය 21.57% කින් පහළ බැස ඇත. එමෙන්ම රුසියාව, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, අසර්බයිජානය සහ ජපානය යන රටවල් සම්බන්දයෙන්ද 2015 වසර හා සැසඳීමේදී තේ අපනයනයේ පහත බැසීමක් දක්නට ලැබේ. මේ අනුව 2015 වසර ට සාපේක්ෂව ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන පළමු රටවල් දහය වෙත මුළු අපනයන ප්‍රමාණය 3.16% කින් පහත වැටී ඇත.

වගුව 2.9 : 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරනලද ප්‍රධාන රටවල්

| රට | 2016 | | | 2015 | | | |
|---|---|---|---|---|---|---|---|
| | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ. | අපනයන කොටස % | ස්ථානය | ප්‍රමාණය කි.ග්‍රෑ. | අපනයන කොටස % | වර්ධනය % |
| රුසියාව | 1 | 34,432,859 | 11.92 | 1 | 36,743,776 | 11.97 | (6.29) |
| ඉරානය | 2 | 33,928,612 | 11.75 | 4 | 30,047,558 | 9.79 | 12.92 |
| ඉරාකය | 3 | 32,557,218 | 11.27 | 3 | 31,364,833 | 10.22 | 3.80 |
| තුර්කිය | 4 | 27,068,973 | 9.37 | 2 | 33,705,653 | 10.98 | (19.69) |
| එ.අ.එ.රාජ්‍ය | 5 | 18,381,410 | 6.37 | 5 | 23,438,174 | 7.64 | (21.57) |
| ලිබියාව | 6 | 12,645,055 | 4.38 | 8 | 9,983,880 | 3.25 | 26.65 |
| සිරියාව | 7 | 12,107,279 | 4.19 | 7 | 11,091,074 | 3.61 | 9.16 |
| අසර්බයිජා. | 8 | 10,556,896 | 3.66 | 6 | 11,176,815 | 3.64 | (5.55) |
| ජපානය | 9 | 7,763,607 | 2.69 | 10 | 8,462,172 | 2.76 | (8.26) |
| චීනය | 10 | 7,603,870 | 2.63 | 11 | 7,455,396 | 2.43 | 1.99 |
| ප්‍රධාන රටවල් 10 එකතුව | | 197,045,778 | 68.24 | | 203,469,330 | 66.29 | (3.16) |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ ඉරානයට දෙවැනි තැන හිමිවී ඇත. ඉරාකය 11.27% ක ප්‍රමාණයකින් දායක වෙමින් තම ස්ථානය රැක ගැනීමට සමත්වී ඇත. කලාප වශයෙන් ගෙන බැලුවිට මැද පෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම් කරුවා වේ. තෙල් වල මිල ගණන් ඉහළ තලයක පැවතීම මේ සඳහා හේතුවේ. පළමු රටවල් දහය සඳහා ශ්‍රී ලංකාවෙන් 68.24% ක ප්‍රමාණයක් තේ අපනයනය කර ඇත. කෙසේ වෙතත් රුසියාව, ඉරානය, සිරියාව, අසර්බයිජානය, ජර්මනිය, චීනය සහ ජපානය යන රටවල් සම්බන්ධයෙන් පමණක් සැලකිය යුතු ඉහළ සාමාන්‍ය නැ.වි.ස. මිල ගණන් (FOBs) වාර්තා විය. තවදුරටත් ඇමරිකා එක්සත් ජනපදය සම්බන්ධයෙන් පැවති අයහපත් ආර්ථික තත්වය සහ යුරෝපයේ පැවති ණය අර්බුදය හේතුවෙන් අපනයනයෙන් උපයාගත හැකිව තිබූ ආදායම අහිමිවිය. කෙසේ වෙතත් තේ මළු භාවිතය ඉහළ යාම නිසා ශ්‍රී ලංකා තොග තේ අපනයනය මැද පෙරදිග දෙසට නැඹුරු වී ඇත.

වගුව 2.10: ප්‍රධාන රටවල් 20 වෙත තේ අපනයනය සහ හිමි ස්ථානය ඇසුරුම් ක්‍රමය අනුව

| රට | අපනයන ප්‍රමානය (කි.ග්‍රෑ.) | | | | | | | රටවල් අනුව හිමි ස්ථානය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මළු | තොග | ඇසුරුම් (කි.ග්‍රෑ.>3 | ඇසුරුම් (කි.ග්‍රෑ.1-කි.ග්‍රෑ.3) | ඇසුරුම් (කි.ග්‍රෑ.3 -කි.ග්‍රෑ.5) | ඇසුරුම් ග්‍රෑ.4 - කි.ග්‍රෑ.1) | ඇසුරුම් කි.ග්‍රෑ.5 -කි.ග්‍රෑ.10) | මළු | තොග | ඇසුරුම් (කි.ග්‍රෑ.>3 | ඇසුරුම් (කි.ග්‍රෑ.1-කි.ග්‍රෑ.3) | ඇසුරුම් (කි.ග්‍රෑ.3 -කි.ග්‍රෑ.5) | ඇසුරුම් ග්‍රෑ.4 - කි.ග්‍රෑ.1) | ඇසුරුම් කි.ග්‍රෑ.5 -කි.ග්‍රෑ.10) |
| රුසියාව | 1,303,745 | 27,775,158 | - | 630 | 4,345 | 5,308,788 | 40,194 | 3 | 13 | - | 1 | 3 | 1 | 1 |
| ඉරානය | 146,368 | 16,747,049 | - | 309,367 | 538,180 | 5,150,075 | 11,037,573 | 17 | - | - | - | 11 | 12 | - |
| ඉරාකය | 334,775 | 2,060,338 | - | 833,985 | 1,467,070 | 16,624,023 | 11,237,028 | 10 | 5 | - | 5 | 13 | 17 | 10 |
| තුර්කිය | 297,636 | 9,691,182 | - | 118,900 | 4,559,600 | 9,388,326 | 3,013,330 | 11 | 9 | - | - | 14 | 9 | 13 |
| එ.අ.එ.රාජ්‍ය | 634,390 | 6,574,482 | 22.8 | 52,472 | 1,245,540 | 5,101,713 | 4,772,790 | 7 | 16 | - | 8 | 1 | 7 | 5 |
| ලිබියාව | 20,261 | - | - | - | - | 12,624,794 | - | 19 | 18 | - | - | - | 8 | 8 |
| සිරියාව | 909,444 | 318,911 | - | 15,750 | 5,830,090 | 4,351,685 | 681,400 | 5 | 7 | 5 | 6 | 4 | 6 | 3 |
| අසර්බයිජානය | 3,673 | 10,029,604.5 | - | - | 11,330 | 495,238 | 17,050 | 20 | 12 | 2 | 11 | 16 | 20 | 12 |
| ජපානය | 673,746 | 6,717,011 | 74.5 | 1,100 | 69,858 | 161,574 | 140,244 | 6 | - | - | - | - | 2 | - |
| චීනය | 240,790 | 7,005,512 | - | 90,083.9 | 6,372 | 226,711 | 34,401 | 12 | 8 | 3 | - | - | 19 | - |
| ජර්මනිය | 223,159 | 4,285,119 | - | - | 4,677 | 2,322,724 | 18,152 | 14 | 10 | - | - | - | 14 | 11 |
| චිලි | 371,880 | 6,146,979 | 558 | - | - | 152,125 | - | 9 | 6 | 4 | 10 | 9 | 18 | 7 |
| ඇ.එ.ජ. | 1,356,462 | 1,335,638 | 177,940 | 1,582 | 52,739.5 | 2,288,307 | 5,290 | 2 | 2 | - | 3 | 5 | 5 | 2 |
| යුක්රේනය | 228,651 | 3,845,739 | - | - | - | 824,952 | 31,040 | 13 | 15 | 1 | 9 | 10 | 10 | 16 |
| හොංකොං | 57,165 | 3,550,899 | - | 396,220 | 214,377 | 383,996 | 17,394 | 18 | 17 | - | 7 | 6 | 11 | 6 |
| සෞදි අරාබිය | 1,169,978 | 1,684,795 | - | - | 159,836 | 1,498,968 | - | 4 | 4 | - | 4 | 2 | 3 | 4 |
| ජෝර්දානය | 2,304,483 | - | - | - | 15,500 | 1,676,239 | - | 1 | 1 | - | 12 | 15 | 4 | 9 |
| කුවේට් | 522,945 | 174,012 | - | 25,750 | 257,800 | 1,943,215 | 603,333 | 8 | 3 | - | - | 12 | 15 | 15 |
| ලෙබනන් | 149,221 | 2,608 | - | - | - | 3,218,136 | 97,850 | 16 | 14 | - | - | 8 | 13 | - |
| තායිවානය | 154,460 | 2,845,082 | 9,000 | 913 | 1,484 | 46,928 | 19,180 | 15 | 11 | - | 2 | 7 | 16 | 14 |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.4.4.1 කළු තේ අපනයනය

2016 වසරේදී සමස්ත තේ අපනයන ආදායමෙන් 95.23% (රුපියල් බිලියන 176) ක් උපයා දෙමින් සමස්ත තේ අපනයෙන් 97.84%(කි.ග්‍රෑ. මි.282.5) ක ප්‍රමාණයක් කළු තේ අපනයනය කර ඇත. ශ්‍රී ලංකාවෙන් කළු තේ අපනයනය කරන රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස 85.34% ප්‍රමාණයක් නියෝජනය කරයි. 2013 දක්වා ශ්‍රී ලාංකිය කළු තේ ආනයනයෙන් රුසියාව ප්‍රමුඛ විය. 2014 දි තුර්කිය පළමු ස්ථානයට පත්විය. 2015 වසරේදී රුසියාව(11.9%) නැවතත් ශ්‍රී ලාංකිය කළු තේ කි.ග්‍රෑ. මි.35.74 ආනයනය කරමින් මුල් තැනට පත්විය. 2016 වසරේදී ඉරානය ශ්‍රී ලාංකිය කළු තේ කි.ග්‍රෑ. මි.33.90 (12%) ක් ආනයනය කරමින් පළමුතැනට පත්විය. මෙම වසරේදී රුසියාවට සහ ඉරාකයට කළු තේ අපනයන ප්‍රමාණයන් පිළිවෙලින් කි.ග්‍රෑ. මි.33.78 සහ 32.51 විය.

වගුව 2.11: කළු තේ අපනයනය කරන පළමු රටවල් 20 සහ වෙළඳපොළ කොටස් (ප්‍රති අපනයනය සමග)

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.මි.) | වටිනාකම (රු. බි.) | නෑ.වි.ස (කි.ග්‍රෑ. /රු.) | ප්‍රමාණය (%) | වටිනාකම් කොටස (%) | ප්‍රමාණාත්මක වෙනස ('14 සාපේක්ෂව '15) |
|---|---|---|---|---|---|---|
| ඉරානය | 33.90 | 22.43 | 661.82 | 12.00 | 12.75 | 12.89 |
| රුසියාව | 33.78 | 20.03 | 592.83 | 11.96 | 11.38 | (5.47) |
| ඉරාකය | 32.51 | 15.06 | 463.16 | 11.51 | 8.56 | 3.68 |
| තුර්කිය | 27.05 | 14.42 | 532.96 | 9.57 | 8.19 | (19.68) |
| එ.අ.එ.රා. | 17.82 | 10.36 | 581.21 | 6.31 | 5.89 | (22.25) |
| ලිබියාව | 12.62 | 6.60 | 523.52 | 4.47 | 3.75 | 27.40 |
| සිරියාව | 12.10 | 7.86 | 648.93 | 4.28 | 4.46 | 9.16 |
| අසර්බයිජානය | 10.54 | 6.51 | 617.18 | 3.73 | 3.70 | (5.57) |
| ජපානය | 7.76 | 6.20 | 799.28 | 2.75 | 3.52 | (8.22) |
| චීනය | 7.55 | 4.55 | 601.99 | 2.67 | 2.58 | 2.07 |
| ජර්මනිය | 6.67 | 4.01 | 600.59 | 2.36 | 2.28 | (2.62) |
| චිලි | 6.61 | 3.50 | 528.95 | 2.34 | 1.99 | (4.26) |
| යුක්රේනය | 4.62 | 3.14 | 679.93 | 1.64 | 1.79 | 17.47 |
| හොංකොං | 4.60 | 2.68 | 581.45 | 1.63 | 1.52 | (4.87) |
| ඇ.එ.ජ. | 4.59 | 3.61 | 786.81 | 1.62 | 2.05 | 17.33 |
| සෞදි අරාබිය | 4.43 | 3.36 | 758.01 | 1.57 | 1.91 | (7.96) |
| ජෝර්දානය | 3.97 | 3.16 | 795.45 | 1.40 | 1.79 | (29.43) |
| කුවේටය | 3.49 | 2.23 | 636.87 | 1.24 | 1.26 | (59.85) |
| ලෙබනනය | 3.45 | 2.48 | 718.69 | 1.22 | 1.41 | 40.48 |
| ඊජිප්තුව | 3.03 | 1.56 | 515.35 | 1.07 | 0.89 | (26.98) |
| එකතුව | **241.12** | **143.73** | **596.09** | **85.34** | **81.68** | **(5.05)** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.4.4.2 හරිත තේ අපනයනය

2016 වසරේදී සමස්ත තේ අපනයන ආදායමෙන් 3.5% (රුපියල් බිලියන 6.3) ක් උපයා දෙමින් සමස්ත තේ අපනයෙන් 1.5%( කි.ග්‍රෑ. මි.4.2) ක ප්‍රමාණයක් හරිත තේ අපනයනය කර ඇත. ශ්‍රී ලංකාවෙන් හරිත තේ අපනයනය කරන රටවල් අතුරින් ඉහළින්ම සිටින ප්‍රධාන රටවල් විස්ස 81.07% ප්‍රමාණයක් නියෝජනය කරයි. ශ්‍රී ලාංකිය හරිත තේ ආනයනය කරණ ප්‍රධාන රටවල් අතුරින් රුසියාව සැලකියයුතු ප්‍රමාණයක් එනම් කි.ග්‍රෑ. මි.0.64 ක් මෙම වසරේදී ආනයනය කර ඇත. සමස්ත හරිත තේ අපනයනය කි.ග්‍රෑ.3,365 දහසකි.

වගුව 2.12: හරිත තේ අපනයනය කරණ ප්‍රධාන රටවල් 20

| රට | ප්‍රමාණය ('000 කි.ග්‍රෑ.) | වටිනාකම (රු.මි.) | නැ.වි.ස (රු./කි.ග්‍රෑ) | ප්‍රමාණය (%) | වටිනාකම (%) | ප්‍රමාණාත්මක වෙනස ('15 සාපේක්ෂව '16) |
|---|---|---|---|---|---|---|
| රුසියාව | 649.93 | 727.79 | 1,119.80 | 15.38 | 11.42 | (35.42) |
| එ.අ.එ.රා. | 558.11 | 396.94 | 711.23 | 13.21 | 6.23 | 8.80 |
| ඇ.එ.ජ. | 450.86 | 798.01 | 1,769.94 | 10.67 | 12.52 | 33.74 |
| යුක්රේනය | 310.41 | 335.17 | 1,079.74 | 7.35 | 5.26 | 12.63 |
| නෙදර්ලන්තය | 194.48 | 496.60 | 2,553.43 | 4.60 | 7.79 | 18.52 |
| ජර්මනිය | 178.85 | 145.14 | 811.50 | 4.23 | 2.28 | 24.62 |
| ඕස්ට්‍රේලියාව | 132.45 | 380.11 | 2,869.85 | 3.13 | 5.96 | (26.60) |
| ප්‍රංශය | 104.72 | 207.85 | 1,984.81 | 2.48 | 3.26 | (13.09) |
| නයිජීරියාව | 93.46 | 166.81 | 1,784.78 | 2.21 | 2.62 | 14.53 |
| තායිවානය | 86.89 | 92.32 | 1,062.45 | 2.06 | 1.45 | 18.19 |
| සවුදි අරාබිය | 86.85 | 139.91 | 1610.99 | 2.06 | 2.19 | (10.41) |
| එක්සත් රාජධානිය | 82.20 | 247.54 | 3,011.41 | 1.95 | 3.88 | 7.65 |
| පෝලන්තය | 76.92 | 129.92 | 1,689.06 | 1.82 | 2.04 | (41.40) |
| චිලි | 60.40 | 100.72 | 1,667.47 | 1.43 | 1.58 | 3.70 |
| උස්බෙකිස්ථානය | 57.99 | 57.95 | 999.26 | 1.37 | 0.91 | (20.23) |
| බෙලාරුස් | 53.09 | 64.02 | 1,205.91 | 1.26 | 1.00 | (18.36) |
| චීනය | 49.86 | 109.12 | 2,188.60 | 1.18 | 1.71 | (5.00) |
| චෙක් ජනරජය | 47.47 | 118.25 | 2,490.927 | 1.12 | 1.85 | 11.68 |
| මලයාසියාව | 46.57 | 56.04 | 1,203.26 | 1.10 | 0.88 | 14.26 |
| නවසීලන්තය | 43.47 | 89.31 | 2,054.54 | 1.03 | 1.40 | (14.00) |
| **එකතුව** | **3,365** | **4,860** | **1,444.13** | **79.64** | **76.23** | **(6.07)** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

### 2.4.4.3 ක්ෂණික තේ අපනයනය

ශ්‍රී ලංකා වේ ක්ෂණික තේ ආනයනය කරන ප්‍රධාන රට වන අයර්ලන්තය කි.ග්‍රෑ. මි. 1.8(90.33%) ක ප්‍රමාණයක් ආනයනය කරමින් ශ්‍රී ලංකා වේ ක්ෂණික තේ වෙළෙඳ පොළ තුළ ප්‍රධාන භූමිකාවක් උසුලයි. ශ්‍රී ලංකාවෙන් ක්ෂණික තේ අපනයනය කරන ප්‍රධාන රටවල් ලැයිස්තුවේ අයර්ලන්තය ට පසුව පිළිවෙලින් ඇමරිකා එක්සත් ජනපදය, තායිවානය සහ ඕස්ට්‍රේලියාව යන රටවල් වේ. මෙම වසරේදි ක්ෂණික තේ අලෙවිය 2015 වසරට සාපේක්ෂව ප්‍රමාණාත්මකව 5.62 % කින් පහළ බැස ඇති නමුත් ආදායම 12.2% කින් ඉහළ ගොස් ඇත.

### 2.4.4.4 ආර්.ටී.ඩී (පානය සඳහා පිළියෙල කළ) තේ අපනයනය

ශ්‍රී. ලංකාවේ බීමට සූදානම් කළ තේ (RTD) සඳහා හොඳ වෙළඳපොලක් ගොඩනැගෙමින් තිබේ.

2016 වසරේදි බීමට සූදානම් කළ තේ (RTD) ලීටර් මිලියන 19.8 අපනයනය කිරීම මගින් රුපියල් මිලියන 1,991.5 ක අපනයන ආදායමක් ලැබීය. 2015 වසර හා සැසඳීමේදි බීමට සූදානම් කළ තේ (RTD) අපනයනය 9.36% ක වර්ධනයක් දක්නට ලැබේ. රුපියල් මිලියන 1,892 ක ආදායමක් ලබා දෙමින් ඉන්දියාව ලීටර් මිලියන 19.3 ක් ශ්‍රී ලංකාවෙන් ආනයනය කර ඇත. කැනඩාව, ඕස්ට්‍රේලියාව, ඇමරිකාව සහ මාලදිවයින සෙසු ගැනුම් කරුවන් වේ.

## 2.5. ගෝලීය තේ කර්මාන්තයේ පසුබිම

ලොව වඩාත් ජනප්‍රිය එමෙන්ම විශාල වශයෙන් පරිභෝජනය කරන උණුසුම් පාන අතරින් එකක්වන තේ, ශ්‍රී ලංකාවේ අපනයන අතුරින් විශේෂ වේ.එමගින් ජාතික ආර්ථිකයට සහ සමාජ සංවර්ධනයට විශේෂ මෙහෙයක් සිදුකරනුයේ එම කර්මාන්තයේ ආරම්භයේ සිටමය. දිවයිනේ විශාලතම ආයෝජකයන් අතර ද රඳාපවතින මෙම කර්මාන්තය ශ්‍රී ලංකාවේ අපනයන ආදායම් අතර වැදගත් තැනක් හිමිකර ගනී.

ගෝලීය තේ නිෂ්පාදනයෙන් 82% ක ප්‍රමාණයක් නිපදවනු ලබන්නේ ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව, කෙන්යාව සහ ඉන්දුනීසියාව යන ලොව ප්‍රධාන තේ නිපදවන රටවල් පහ විසින්ය.මෙම රටවල් විසින් සිදුකරනුලබන අපනයනයන් සමස්ත ගෝලීය අපනයනයන්ගෙන් 76% ක් වේ. චීනය ලෝක තේ වගාවේ නැග්ම සඳහා හේතු වී ඇති අතර අප්‍රිකා මහද්වීපය විශේෂයෙන්ම කෙන්යාව ද විශාල අස්වැන්නකට හිමිකම් කියයි. වෙනත් තේ නිෂ්පාදකයන් හා සසඳමින් ගෝලීය තේ කර්මාන්තය තුළ ශ්‍රී ලංකාව ට හිමි තැන පිළිබඳව සලකා බැලීමේදි 2016 වසර ආරම්භ වන බව දක්නට ලැබෙන්නේ සාමානය ඒකක මිල (වෙන්දේසිය) සහ අපනයන ආදායම බොහෝ සෙයින් පහළ අගයක් ගනිමිනුයි.

## 2.5.1 ගෝලීය තේ වගාව

2016 වසර අවසන් වනවිට දී ලොව තේ වගාව හෙක්ටයාර් මිලියන 04 කට වඩා ප්‍රමාණයක ව්‍යාප්තව ඇතැයි තක්සේරු කර ඇත.

වගුව 2.13: විශාලතම තේ වගාබිම්

| රට | 2010 (හෙක්.) | 2011 (හෙක්.) | 2012 (හෙක්.) | 2013 (හෙක්.) | 2014 (හෙක්.) | 2015 (හෙක්.) | 2016 (හෙක්.) |
|---|---|---|---|---|---|---|---|
| චීනය | 1,970,200 | 2,112,510 | 2,279,940 | 2,468,840 | 2,649,840 | 2,810,000 | 2,920,000 |
| ඉන්දියාව | 560, 609 | 579,350 | 563,980 | 563,980 | 566,660 | 566,660 | 577,480 |
| **ශ්‍රී ලංකාව*** | **188,007** | **187,860** | **187,000** | **187,000** | **187,935** | **188,000** | **202,839** |
| කෙන්යාව | 171,916 | 187,855 | 190,717 | 198,657 | 203,006 | 209,426 | 218,538 |
| වියට්නාමය | 129,000 | 127,000 | 124,027 | 124,000 | 125,000 | 125,000 | 134,000 |
| ඉන්දුනීසියාව | 122,796 | 122,764 | 121,076 | 122,546 | 121,000 | 119,361 | 118,100 |
| මියන්මාරය | 78,400 | 78,500 | 78,500 | 78,700 | 78,700 | 79,000 | 80,000 |
| තුර්කිය | 77,500 | 77,700 | 77,800 | 77,000 | 77,400 | 77,500 | 77,000 |
| බංගලිදේශය | 54,900 | 54,400 | 54,500 | 54,000 | 53,700 | 53,500 | 59,000 |
| ජපානය | 46,800 | 46,200 | 45,900 | 44,800 | 44,800 | 39,300 | 43,100 |

මූලාශ්‍රය ජාත්‍යයන්තර වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශනය - 2017
*ඇස්තමේන්තුගත ප්‍රදේශ

ජාත්‍යාන්තර තේ කමිටුවේ වාර්තාවට අනුව වැඩිම තේ වගා ව්‍යාප්තියක් දකින්නට ලැබෙන්නේ චීනයෙනි. එය 61% ක ප්‍රමාණයකි. වාර්ෂිකව එහි වගා ව්‍යාප්තියේ සීඝ්‍ර වර්ධනයක් දකින්නට ලැබේ. කෙන්යාව ද 2010 -2016 කාලය තුළදී තේ වගාවේ ඉහළ ව්‍යාප්තියක් කරා ලඟාවිය. ලොව සමස්ත තේ වගා ව්‍යාප්තියෙන් 98% ක ප්‍රමාණයකට හිමිකම් කියනුයේ තේ වගාකරන ප්‍රධාන රටවල් 10 යි.

## 2.5.2 ගෝලීය තේ පරිභෝජනය

2014 -2016 වසර තුන තුළ දී වාර්ෂික තේ පරිභෝජනය සහ ත්‍රෛවාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල තේ පරිභෝජනය සලකා බැලීමේදී, වාර්ෂික තේ පරිභෝජනය ඉහළින්ම පවතින්නේ චීනයේය. එය කි.ග්‍රෑ. මිලියන 1,791.33 ලෙස වාර්තාවී ඇත. නමුත් ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 1.31 ලෙස පහළ අගයක් ගනී. වාර්ෂික තේ පරිභෝජනය කි.ග්‍රෑ.මිලියන 247.33 ක් වන තුර්කිය ඉහළම ඒක පුද්ගල තේ පරිභෝජනය වන කි.ග්‍රෑ. 3.20 ක ප්‍රමාණය වාර්තා කරයි.

වගුව 2.14: රටවල් අනුව තේ පරිභෝජනය

| රට | 2010-12 | | 2011-13 | | 2012-14 | | 2013-15 | | 2014-16 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල | එකතුව | ඒක පුද්ගල |
| ලිබියාව | 13.6 | 2.39 | 13.23 | 2.34 | 15.27 | 2.7 | 13.37 | 2.19 | 14.77 | 2.4 |
| ඇෆ්ගනිස්ථානය | 49.27 | 1.97 | 55.9 | 2.19 | 63.03 | 2.73 | 64.77 | 2.44 | 59.4 | 2.2 |
| තුර්කිය | 240.8 | 3.24 | 242 | 3.22 | 236.81 | 3.18 | 241.67 | 3.14 | 247.33 | 3.2 |
| එක්සත් රාජධානිය | 123.51 | 1.97 | 122.21 | 1.91 | 114.97 | 1.81 | 111.64 | 1.74 | 109.49 | 1.68 |
| මොරොක්කෝව | 56.17 | 1.74 | 56.5 | 1.73 | 55.1 | 1.74 | 58.53 | 1.73 | 63.58 | 1.86 |
| අයර්ලන්ත ජනරජය | 8.51 | 1.9 | 7.44 | 1.62 | 7.18 | 1.56 | 7.39 | 1.6 | 7.7 | 1.66 |
| තායිවානය | 44 | 1.64 | 42.53 | 1.59 | 42.1 | 1.56 | 41.5 | 1.53 | 39.01 | 1.44 |
| කටාර් | 2.53 | 1.46 | 2.67 | 1.45 | 2.73 | 1.61 | 3.08 | 1.81 | 3.34 | 1.51 |
| ශ්‍රී ලංකාව | 27.79 | 1.33 | 27.49 | 1.35 | 27.47 | 1.36 | 27.91 | 1.35 | 28.07 | 1.34 |
| හොංකොං | 9.48 | 1.34 | 9.52 | 1.33 | 9.73 | 1.38 | 10.1 | 1.39 | 10.71 | 1.46 |
| චිලි | 21.4 | 1.24 | 21.13 | 1.21 | 20.87 | 1.22 | 20.96 | 1.18 | 21.11 | 1.17 |
| සිරියාව | 26.5 | 1.25 | 24.13 | 1.14 | 19.03 | 0.96 | 17.92 | 0.86 | 13.1 | 0.78 |
| ඊජිප්තුව | 91.63 | 1.14 | 94.37 | 1.14 | 100.78 | 1.22 | 96.65 | 1.11 | 93.22 | 1.05 |
| ඉරාකය | 40.35 | 1.21 | 37.65 | 1.11 | 34.52 | 1.18 | 33.88 | 0.95 | 35.87 | 0.98 |
| ඉරානය | 74.7 | 0.99 | 82.8 | 1.07 | 79 | 1.05 | 74.27 | 0.95 | 70.93 | 0.9 |
| චීනය | 1279.33 | 0.95 | 1408.67 | 1.04 | 1537 | 1.14 | 1665.33 | 1.22 | 1791.33 | 1.31 |
| ඉන්දියාව | 871.67 | 0.73 | 889.67 | 0.73 | 908 | 0.74 | 927 | 0.75 | 946.67 | 0.78 |
| පොදු රාජ්‍ය මණ්ඩලිය ස්වාධීන රාජ්‍ය (CIS) | 275.29 | 0.99 | 279.84 | 0.96 | 275.75 | 0.94 | 251.67 | 0.88 | 256.73 | 0.9 |
| පාකිස්ථානය | 125.92 | 0.74 | 128.02 | 0.72 | 131.92 | 0.73 | 138.79 | 0.74 | 154.5 | 0.81 |
| ඇ.එ.ජ. | 126.65 | 0.41 | 127.76 | 0.41 | 128.33 | 0.41 | 129.67 | 0.41 | 129.67 | 0.41 |
| ජපානය | 122.29 | 0.96 | 120.23 | 0.94 | 116.93 | 0.91 | 112.63 | 0.89 | 107.41 | 0.84 |
| ඉන්දුනීසියාව | 75 | 0.32 | 84.67 | 0.34 | 84 | 0.34 | 81 | 0.32 | 86 | 0.34 |
| බංගලිදේශය | 68.4 | 0.45 | 71.07 | 0.47 | 71.1 | 0.48 | 73.4 | 0.47 | 76.33 | 0.49 |
| පෝලන්තය | 30.95 | 0.8 | 31.95 | 0.83 | 32.51 | 0.85 | 34.27 | 0.89 | 35.3 | 0.93 |
| ජර්මනිය | 26.9 | 0.33 | 28.17 | 0.34 | 29.95 | 0.37 | 30.93 | 0.38 | 32.1 | 0.39 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශනය - 2017
එකතුව : කිලෝ ග්‍රෑම් මිලියන
ඒක පුද්ගල : කිලෝ ග්‍රෑම්


## 2.5.3. ගෝලීය තේ නිෂ්පාදනය

2016 වසරේ දී ගෝලීය තේ නිෂ්පාදනය කි.ග්‍රෑ . බිලියන 05 දක්වා ලඟාවී ඇත. 2015 වසර හා සැසඳීමේදී 3.43% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2016 වසර සඳහා චීනය, ඉන්දියාව,කෙන්යාව,ශ්‍රී ලංකාව, තුර්කිය,වියට්නාමය සහ ඉන්දුනීසියාව එකතුව සමස්ත ගෝලීය තේ නිෂ්පාදනයෙන් 90% පමණ නිෂ්පාදනය කර ඇත.ඉන්දියාව සහ චීනය විශාලතම තේ නිෂ්පාදකයන් වන නමුත් ඔවුන් රට තුළදී ම සැලකියයුතු ප්‍රමාණයකින් තේ පරිභෝජනය කරන නිසා ලොව විශාලතම තේ අපනයන කරු බව ට කෙන්යාව පත්ව ඇත. චීනය තේ අපනයනයේ දි දෙවන තැන හිමිකරගෙන ඇති අතර ශ්‍රී ලංකාව තුන් වන ස්ථානයේ පසුවේ.

සිව් වැනි විශාලතම නිෂ්පාදකයා ලෙස තම ස්ථානය රැක ගැනීම ට ශ්‍රී ලංකාව සමත් වී ඇති අතර පස් වැනි, සය වැනි සහ සත් වැනි තේ නිෂ්පාදකයන්ගේ නිෂ්පාදනයන් ඉහළ යාමේ ප්‍රවනතාවයක් පෙන්නුම් නොකරන අතර මෑතකදී ශ්‍රී ලංකාව ට අභියෝගයක් වන තරමේ නැගී ඒමක් දක්නට නොලැබේ.

කි.ග්‍රෑ. මිලියන 2,350 ක් නිපදවමින් චීනය ඉහළ ම තැන හිමිකරගෙන සිටින අතර ඉන්දියාව මෙම වසරේදී වාර්ෂික නිෂ්පාදනය කි.ග්‍රෑ. මිලියන 1,267 ක් නිපදවමින් දෙවැනි ස්ථානයෙහි පසුවෙයි. කෙන්යාව කි.ග්‍රෑ. මිලියන 473 ක් නිපදවමින් තුන්වන තැනෙහි පසු වෙයි.

සටහන 2.5: ගෝලීය තේ නිෂ්පාදනය




| Countrty | China | India | Kenya | Sri Lanka | Vietnam | Turkey | Indonesia |
|---|---|---|---|---|---|---|---|
| 2014 | 2,096 | 1,207 | 445 | 338 | 175 | 246 | 136 |
| 2015 | 2,249 | 1,209 | 399 | 329 | 170 | 259 | 129 |
| 2016 | 2,350 | 1,267 | 473 | 293 | 180 | 253 | 126 |

මූලාශ්‍රය: අතිරේකය, ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශනය - 2017

### 2.5.4 ගෝලීය තේ අලෙවිය

2016 වසරේ දී කොළඹ තේ වෙන්දේසිය මගින් කි.ග්‍රෑ. 01 ක් සඳහා සාමාන්‍ය මිල ඇ.ඩො. 3.22 සහිතව කි.ග්‍රෑ. මිලියන 277.06 ක ප්‍රමාණයක් වෙන්දේසි කර ඇත. කෙසේ නමුත් මුම්බාසා වෙන්දේසියේ කි.ග්‍රෑ. මිලියන 400 ට වැඩි ප්‍රමාණයක් වෙන්දේසි කර ඇති අතර කල්කටා වෙන්දේසියේ දී කි.ග්‍රෑ. මිලියන 142 ක ප්‍රමාණයක් විය.

වගුව 2.15: ප්‍රධාන තේ වෙන්දේසි සංඛ්‍යාලේඛන
(ප්‍රමාණය - කි.ග්‍රෑ. මිලියන,/ සාමාන්‍ය ඒකක මිල ඇ.එ.ඩො./කි.ග්‍රෑ.)


| වෙන්දේසි මධ්‍යස්ථානය | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල | ප්‍රමාණය | මිල |
| චිතගොං | 67 | 2.19 | 63.53 | 2.41 | 72.02 | 2.55 |
| කොචින් | 53 | 1.66 | 54.79 | 1.55 | 46.75 | 1.74 |
| **කොළඹ** | **334** | **3.56** | **315.51** | **2.99** | **277.06** | **3.22** |
| ගුවාහාති | 129 | 2.32 | 145.43 | 2.16 | 138.65 | 2.05 |
| ජකර්තා | 26 | 1.66 | 20.12 | 1.56 | 27.00 | 1.62 |
| කල්කටා | 142 | 2.65 | 143.42 | 2.47 | 142.24 | 2.41 |
| ලිම්බෙ | 9 | 1.43 | 8.41 | 1.56 | 8.75 | 1.55 |
| මොම්බාසා | 390 | 2.03 | 359.39 | 2.73 | 400.92 | 2.29 |

(මූලාශ්‍රය ජාත්‍යන්තර තේ කමිටුවේ වෙබ් අඩවිය)

පසුගිය වසර තුන තුළදී කොළඹ තේ වෙන්දේසිය ඉහළම සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළා. 2015 වසර හැරුනුකොට, කි.ග්‍රෑ. 01 ක් සඳහා ඇ.ඩො. 3.00 ඉක්මවූ එකම වෙන්දේසි පොළ වූයේ ද කොළඹ තේ වෙන්දේසියයි. අවධානයට යොමු වන කාලපරාසය තුළදී චිතගොන්,කොචින් සහ ජකර්තා වෙන්දේසි වල සාමාන්‍ය මිල 2015 වසර හා සැසඳීමේදී ඉහළ අගයක් ගැනිය. 2016 වසරේ දී චිතගොන් දෙවැනියට ඉහළ සාමාන්‍ය වෙන්දේසි මිල වාර්තා කළ අතර කල්කටා තුන්වෙනි තැනට පත්විය.

### 2.5.5 ගෝලීය තේ අපනයනය

සටහන 2.6. ප්‍රධාන තේ අපනයනකරුවන්




| | Kenya | China | Sri lanka | India | Vietnam |
|---|---|---|---|---|---|
| 2013 | 494.3 | 332.4 | 317.7 | 215.5 | 140.3 |
| 2014 | 499.4 | 301.5 | 317.8 | 204.6 | 132.0 |
| 2015 | 443.5 | 325.0 | 301.4 | 225.2 | 133.5 |
| 2016 | 480.3 | 328.7 | 280.9 | 218.4 | 142.0 |

මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශයේ අතිරේකය - 2017
සැ.යු. ශ්‍රී ලංකාවට අදාළ ප්‍රමානයන් තුල ප්‍රති අපනයනයන් ඇතුළත් නොවේ

පසුගිය වසර හා සැසඳීමේදි 2016 වසරේ ගෝලීය තේ අපනයනය කි.ග්‍රෑ. මිලියන 22 (1.21%) කින් පහළ වැටුනි. තේ අපනයනය කරන වෙනත් රටවල් හා සැසඳීමේදි කෙන්යාව සහ චීනය සිය අපනයන ප්‍රමාණය වැඩි කරගත් අතර එය 8.3% සහ 1.1% ක වර්ධනයකි. විශාලතම තේ අපනයන කරුවන් තිදෙනා වන කෙන්යාව,චීනය සහ ශ්‍රී ලංකාව ගෝලීය තේ අපනයනයෙන් 61% කට වඩා වැඩි කොටසකට දායක වී ඇත.

2016 වසරේ පළමු පෙළේ තේ අපනයන කරුවන් සහ ඔවුන්ගේ අපනයන ආදායම් පහත වගුව මගින් අනාවරණය කෙරේ. තේ අපනයන මගින් වැඩිම ආදායමක් උපයාගනු ලැබූයේ චීනය බව එමගින් හෙලිවේ. දෙවැනි තැන ශ්‍රී ලංකාව ට හිමිවන අතර කෙන්යාව තම තේ අපනයනය මගින් තුන්වෙනියට ආදායම් උපයාගැනිමට සමත් වී ඇති බව දක්නට ලැබේ.

වගුව 2.16: ඉහළම අපනයන ආදායම් (2016)

| රට | අපනයන ආදායම |
|---|---|
| | (ඇ.එ.ජ.ඩො. මිලියන) |
| ශ්‍රී ලංකාව | 1,210.53 |
| කෙන්යාව | 1,189.74 |
| චීනය | 1,484.91 |
| ඉන්දියාව | 634.82 |
| වියට්නාමය | 236.32 |
| ඉන්දුනීසියාව | 113.36 |

(මූලාශ්‍රය: ජාත්‍යන්තර තේ කමිටුවේ වාර්ෂික සංඛ්‍යාලේඛන ප්‍රකාශය - 2017)

### 2.6 ශ්‍රී ලංකා තේ පිළිබඳ අපනයන වෙළඳපොල විශ්ලේෂණය

පසුගිය වසරට වඩා අසීරුතා පැවති නමුත් ශ්‍රී ලංකා තේ කර්මාන්තය 2016 වසරේදී එහි තවත් දුෂ්කර වසරක් පසුකිරීමට සමත් විය. 2009 වසරේ සිට තේ අස්වැන්න පහළම අඩියට වැටුනි. 2002 වසරේන් පසු අපනයන ප්‍රමාණයන් පහළ වැටුනි. 2015 වසරේ සිට තේ මළු අපනයනය පමණක් යම් ආදායමක් උපයාගත් නමුත් එය සෑහීමකට පත්වීමට තරම් නොවේ.පසුගිය අවුරුදු වලට වඩා විශාල නැග්මක් එහි දක්නට නොවේ.

දේශීය ව්‍යාවහාරික මුදලින් බැලූ විට 1.5% ක් වූ අපනයන ආදායමේ ඉහළ යාම කළු වලාවක රිදී රේඛාවක් පමණක් විය. කෙසේවුවද 2015 වසරේ දී ඇ.ඩො. බිලියන 1.33 සිට 2016 වසරේ ඇ.ඩො. බිලියන 1.26 දක්වා ආදායම පහළ වැටීමක් සිදුවී තිබේ. කර්මාන්තය ඉහළම අපනයන ආදායම වන ඇ.ඩො. බිලියන 1.63 උපයාගනු ලැබූයේ 2014 වසරේදීය.( ඉහළම අපනයන ආදායම උපයාගනු ලැබූ වසරට සාපේක්ෂව 2016 වසරේ දී 23% තරම් සැලකියයුතු පසුබෑමක් සිදුවී ඇත.)

## 2.6.1 රුසියාව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) කලාපය

රුසියානු සමූහාණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) කලාපයේ ජනරජයන් විසින් කි.ග්‍රෑ. මිලියන 260 - 285 අතර ප්‍රමාණයක් වාර්ෂිකව ආනයනය කරනු ලබයි.2016 වසරේදී මෙම කලාපය ට ආනයනය කළ කි.ග්‍රෑ. මිලියන 251 ක ප්‍රමාණය පසුගිය වසරට සාපේක්ෂව මෙ.ටො. 14,467 ක අඩුවීමකි. 5.4% පහළ වැටීමකි.

2016 වසරේදී පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍යය (CIS) කලාපය ට ශ්‍රී ලංකාව තේ මෙ.ටො. 52,018 ක් අපනයනය කර ඇත. එය 2015 හා සැසඳීමේදී මෙ.ටො. 2,146 ක අඩුවීමක් පෙන්නුම් කරයි. 2016 වසරේදී ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන පමාණයෙන් 18.5% ක් පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) කලාපය ට ආනයනය කර ඇත. 2015 සහ 2016 වසරවලදී රුසියානු සමූහාණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය (CIS) කලාපය ට ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණයන් පහත වගුව මගින් දිස් වේ.

වගුව 2.17: රුසියාව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය කලාපය ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණය

| රට | 2016 (කි.ග්‍රෑ) | 2015 (කි.ග්‍රෑ) | වෙනස (කි.ග්‍රෑ) | වර්ධනය (%) |
|---|---|---|---|---|
| රුසියාව | 34,079,116 | 36,099,034 | -2,019,918 | -5.60 |
| යුක්රේනය | 4,634,113 | 3,966,958 | 667,155 | 16.82 |
| අසර්බයිජානය | 10,543,827 | 11,156,134 | -612,307 | -5.49 |
| කසකස්ථානය | 463,810 | 729,845 | -266,035 | -36.45 |
| උස්බෙකිස්ථානය | 510,012 | 487,359 | 22,653 | 4.65 |
| කිර්ගිස්ථානය | 912,068 | 835,130 | 76,938 | 9.21 |
| බෙලරුසියාව | 273,697 | 330,388 | -56,691 | -17.16 |
| මෝල්දෝවා | 130,556 | 195,737 | -65,181 | -33.30 |
| ජෝර්ජියාව | 312,118 | 241,537 | 70,581 | 29.22 |
| ටජිකිස්ථානය | 82,721 | 30,392 | 52,329 | 172.18 |
| ටර්ක්මෙනිස්ථානය | 55,210 | 37,827 | 17,383 | 45.95 |
| ආර්මේනියාව | 20,832 | 53,366 | -32,534 | -60.96 |

### 2.6.1.1 රුසියාව



පරිභෝජනය සඳහා තේ ආනයනය කරන ලොව විශාලතම ආනයන කරු වන රුසියානු සමූහාණ්ඩුව ඇ.ඩො. මිලියන 600 ක වටිනාකමකින් යුතු තේ කි.ග්‍රෑ. මිලියන 175 ක් පමණ වාර්ෂිකව ආනයනය කරනු ලබයි. ප්‍රධාන වශයෙන් කළු තේ පරිභොජනය කරන රුසියාවේ ඒක පුද්ගල පරිභෝජනය කි.ග්‍රෑ. 1.2 ක් පමණ වේ.

2015 වසරේ මෙ.ටො. 173 973 ක් වශයෙන් වු තේ ආනයනය 2016 වසරේදී මෙ.ටො. 164 459 ක් ලෙස සංඛ්‍යා ලේඛන මගින් පෙන්වා දෙයි. ඒ අනුව රුසියාවට තේ ආනයනය 5.47% ක පහතවැටීමක් දක්නට ලැබේ. එමෙන්ම වටිනාකම අනුව ඇ.ඩො. මිලියන 644 සිට ඇ.ඩො. මිලියන 549 දක්වා 14.8% ක පහත වැටීමක් දක්නට ලැබේ.

හරිත තේ තොග වශයෙන් හැරුනු විට වෙනත් ප්‍රවර්ග රුසියාවට ආනයනය කිරීම මෙම වසර තුළදී පහත වැටී ඇතිබව දක්නට ලැබේ. හරිත තේ තොග වශයෙන් ආනයනය කිරීම පමණක් 5.3% කින් ඉහළ ගොස් ඇත.

රුසියානු ආනයන කරුවන් කළු හා හරිත තේ යන දෙවර්ගයෙන්ම පූර්ව ඇසුරුම් තේ ආනයනය සැලකිය යුතු තරමකින් 2016 වසරේ දි අඩුකර ඇති බව දක්නට ලැබේ. පූර්ව ඇසුරුම් කළු තේ ආනයනය 2015 වසරේදී මෙ.ටො. 14,012 ක් ව තිබී 2016 වසරේදී මෙ.ටො. 10,538 දක්වා පහළ බැස ඇති බව දක්නට ලැබේ. එමෙන්ම පූර්ව ඇසුරුම් හරිත තේ ආනයනය ද 2015 වසරේදී මෙ.ටො. 3,223 ක් ව තිබී 2016 වසරේදී මෙ.ටො. 1,402 දක්වා පහළ බැස ඇති බව දක්නට ලැබේ

රුසියානු රේගු තොරතුරු ඒජන්සියට අනුව එම රට 2016 වසරේදී ඇ.ඩො. මිලියන 548 ක වටිනාකමකින් යුතු තේ මෙ.ටො. 164,459 ආනයනය කර ඇත. 2016 වසරට අදාළ සංඛ්‍යාලේඛන වලට අනුව ප්‍රමාණාත්මකව මෙ.ටො. 9,514 (-5.4%) ද වටිනාකම අනුව ඇ.ඩො. මිලියන 90 (-14%) ද වශයෙන් 2015 වසරට වඩා අඩුවීමක් පෙන්නුම් කරයි.

රුසියාවට අපනයනය කරන තේ ප්‍රමාණය අනුව පෙනියන්නේ පසුගිය අවුරුදු දෙක තුළදී ශ්‍රී ලංකා තේ වලට එහි තිබූ ප්‍රමුඛතාවය බිඳවැටී ඇතිබවයි. අපනයනය කළ තේ ප්‍රමාණයෙන් 26.6% ක වෙළෙඳපොල කොටසක් සහිතව ඉන්දියාව 2015 වසරේදී රුසියාවේ ප්‍රධානතම තේ අපනයනයකරුවා විය. නමුත් වටිනාකම අතින් ලංකාව තවදුරටත් 29.27% ක කොටසක් සහිතව ප්‍රමුඛ තැනෙහි පසුවේ. රුසියාවට තේ අපනයනයකරන රටවල් අතුරින් ශ්‍රී ලංකාවේ සෙසු තරඟකරුවන් වන්නේ කෙන්යාව, වියට්නාමය,චීනය සහ ඉන්දුනීසියාව යන රටවල් ය.

අගය එකතුකළ තේ රුසියාව වෙත අපනයනය කිරීම පසුගිය වසර 05 ක කාලය තුළ ක්‍රමානුකූලව පහත වැටීමක් සිදුවී ඇත. 2012 වසරේදී 22.2% ක් ව පැවති අතර 2016 වසර වනවිට එය 18.9% ක් ලෙස වාර්තා වේ.

ශ්‍රී ලංකාවෙන් රුසියාවට තොග වශයෙන් තේ ආනයනය සම්බන්ධයෙන් විශාල කොටසක්, එනම් 2016 වසරේදී 81.1% ප්‍රමාණයක් පැවති බව දක්නට ලැබේ. මෙලෙසින් තොග වශයෙන් තේ ආනයනය ඉහළ අගයක් ගැනීමට හේතුවනුයේ රුසියාවේ තේ ආනයන බදු ව්‍යුහයේ ස්භාවයයි. ඒ අනුව තොග තේ සඳහා 0% සහ පූර්ව ඇසුරුම් තේ සඳහා 12.5% ක් වශයෙන් වේ. රුසියාව තුළ තේ ඇසුරුම් කර්මාන්තය ව්‍යාප්ත කිරීමේ උවමනාව මේ සඳහා විශේෂයෙන් හේතුවී ඇත.

ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව 2012 වසරේ දි මෙ.ටො.47,295 සිට 2016 වසරේදී මෙ.ටො. 34,079 දක්වා රුසියානු සමූහාණ්ඩුව වෙත අපනයනය කළ ලංකා තේ ප්‍රමාණය 28% (මෙ.ටො.13,216) ප්‍රමාණයකින් පහත වැටී ඇත. ඇසුරුම් කළ තේ ප්‍රමාණය 2012 වසරේදී මෙ.ටො.7,230 ක් වූ අතර 2016 වසරේදී මෙ.ටො. 4,928 ක් වශයෙන් 32% (මෙ.ටො. 2,302)ආසන්න අනුපාතයකින් පහත වැටී ඇත. එමෙන්ම තේ මළු ක්ෂේත්‍රය ද අඩකින් පමණ සැලකිය යුතු තරමේ බිඳවැටීමකට ලක්ව ඇත.

සමස්ත තේ අපනයන ආදායම 2015 වසරේ දි රුපියල් මිලියන 20,652 ක් ව තිබූ අතර 2016 වසරේදී එය රුපියල් මිලියන 20,403 ක් දක්වා සුළු වශයෙන් පහත වැටීමක් සිදුවී ඇත. 2016 වසරේදී ප්‍රමාණාත්මකව සිදුවී ඇති බිඳවැටීම හා සැසඳීමේදී තේ වෙළෙඳපොල මිල ගණන් ඉහළ යාම නිසා රුසියාවට තේ අපනයනයෙන් ආදායම් ඉපයීමේදී සිදුවී ඇත්තේ සුළු පහතවැටීමකි.

### 2.6.1.2 යුක්රේනය



ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව යුක්රේනය වෙත අපනයනය කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය මෙ.ටො. 4,635 කි. එහි වටිනාකම රුපියල් මිලියන 3,203 ක් වේ. යුක්රේනය වෙත අපනයනය කළ තේ ප්‍රමාණයෙන් 81% පමණ තොග වශයෙන් වූ අතර 15% ක් ඇසුරුම් වශයෙන් සහ 04 % පමණ තේ මළු වශයෙන් විය. 2015 වසරේදී වටිනාකම රුපියල් මිලියන 2,491 කින් යුතු තේ මෙ.ටො.3,967 ක ප්‍රමාණයක් 2015 වසරේදී යුක්රේනයට අපනයනය කර ඇත. ඒ අනුව 2016 වසරේදී වටිනාකම අනුව 29% කින් ද ප්‍රමාණාත්මකව 17% කින් ද ඉහළ යාමක් දක්නට ලැබේ. වාර්ෂිකව එක් යුක්රේනියානු වැසියෙකු තේ ග්‍රෑම් 500 -600 අතර ප්‍රමාණයක් පරිභෝජනය කරයි. වෙළෙඳ පොල තුළ වාර්ෂිකව ටොන් 22-24 දහසක ධාරිතාවයක් පවතී.

### 2.6.1.3 අසර්බයිජානය



අසර්බයිජානයේ වඩාත් ප්‍රචලිත පානය වනුයේ තේ.

අසර්බයිජානය ලෝකයේ වැඩිම ඒක පුද්ගල තේ පරිභෝජනය වාර්තා වන රටකි. අසර්බයිජානයේ තේ සංස්කෘතිය බොහෝ කාලයක සිට පැවතගෙන එන්නකි. මෙම රටේ ජනයාගේ දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට තේ පත්ව ඇත.

2016 වසරේදී අසර්බයිජානයේ ප්‍රධානම තේ සැපයුම් කරු බවට පත්වෙමින් 91.52% ක වෙළෙඳපොල කොටසකට හිමිකම් පෑමට ශ්‍රී ලංකාව සමත්විය. ඊට අමතරව ඉන්දියාව(1.1%) ඉරානය(1.34%) සහ රුසියාව(1.87%) ආදි රටවල් ද අසර්බයිජානය ට තේ සපයනු ලබයි. 2016 වසරේ දී මෙ.ටො. 113 ක ප්‍රමාණයක් අපනයනය කරමින් කෙන්යාව ද මෙම වෙළෙඳපොළට ඇතුල් විය.

2015 වසරේදී මෙ.ටො.59 ක් අසර්බයිජානය ට අපනයනය කළ රුසියාව 2016 වසරේදී මෙ.ටො. 236 ක් දක්වා වැඩිකර ගැනීමට සමත්විය.

2015 වසරේදී ශ්‍රී ලංකාවෙන් අසර්බයිජානය ට තේ මෙ.ටො. 11,156 ක් අපනයනය කළ නමුත් 2016 වසරේදී එය මෙ.ටො.10,020 ක් විය. ඒ අනුව 5% (මෙ.ටො.612)ක අඩුවීමක් දක්නට ලැබේ.

කෙසේ නමුත් උපයාගත් ආදායමේ වැඩිවීමක් දකින්නට ලැබේ. 2015 වසරේදී ආදායම වූ රුපියල් මිලියන 6,103 සිට රුපියල් මිලියන 6,512 ක් දක්වා වැඩිවීමක් සිදුවී ඇත. කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ඉහළයාම මෙ සඳහා හේතුවන්නට ඇත.

අසර්බයිජානය වෙත අපනයනය කළ ඇසුරුම් කළ තේ ප්‍රමාණයෙහි වැඩිවීමක් 2016 වසරේදී දක්නට ලැබේ. 2015 වසරට වඩා මෙ.ටො.128 ක වැඩිවීමක් ඇතිව මෙ.ටො. 521 ක ප්‍රමාණයක් අපනයනය කර ඇත. 95% ක් තරම් වූ තේ ප්‍රමාණයක් තොග වශයෙන් ශ්‍රී ලංකාවෙන් අසර්බයිජානය වෙත අපනයනය කරයි. මෙම තේ එහි පවතින තේ ඇසුරුම් කර්මාන්තය සඳහා යොදාගනී.

### 2.6.1.4 කසකස්ථානය



කසකස්තානයේ වඩාත් සම්ප්‍රදායික පානය වන තේ එහි සියළුම වයස් කාණ්ඩ වල සහ සියළුම ආදායම් මට්ටම් වල සිටින ජනයා දවස පුරා පරිභෝජනය කරයි.

ඊට අමතරව, සෙම්ප්‍රතිශ්‍යා ව සහ බඩේ කැක්කුම වැනි රෝග ශණනාවක සුවතාවය සඳහා උපකාරී වන ස්වභාවික සහ සෞඛ්‍යමය උණුසුම් පානයක් ලෙස කසකස්තානය තුළ තේ වලට පිළිගැනීමක් තිබේ. පාරිභෝගිකයාගේ සෞඛ්‍යමය අවබෝධය ඉහළයාම අලෙවිය වැඩිවීමට හේතුවේ.

ශ්‍රී ලංකාවෙන් කසකස්තානය ට අපනයනය කළ තේ ප්‍රමාණය 2016 වසරේදී විශාල ලෙස පහත වැටී ඇත. ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව 2015 දි අපනයන ප්‍රමාණය වූ මෙ.ටො. 730 න් 2016 වසරේදී මෙ.ටො. 266 ක පහත වැටීමක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා තේ අපනයනයෙන් උපයාගත් ආදායම රුපියල් මිලියන 540 සිට රුපියල් මිලියන 286 දක්වා පහත වැටී ඇත.

### 2.6.1.5 උස්බෙකිස්ථානය



උස්බෙකිස්තානුවන් අතර තේ පරිභෝජනය සම්බන්ධයෙන් ස්ථාවර විරාගත සම්ප්‍රදායක් පවතී. තේ වගාකරන්නේවත් නිෂ්පාදනය කරන්නේවත් නොවන නමුත් උස්බෙකිස්තානය තුළ මද්‍යසාර විරහිත ප්‍රධාන පානය ලෙස තේ ඓතිහාසිකව පැවතේ. මෙම තත්වය පසුගිය දශක දෙක තුළ යම් පමණකින් අඩුවීමක් දක්නට ලැබේ. මේ සඳහා හේතු වනුයේ දරාගත හැකි මිල ගණන් යටතේ මද්‍යසාර විරහිත වෙනත් විවිධ පාන වර්ග ප්‍රචලිත වීමයි. උස්බෙකිස්තානය ට ශ්‍රී ලංකා තේ අපනයනය 2015 වසරේදී මෙ.ටො. 487 ක් විය. 2016 දී එය මෙ.ටො. 510 දක්වා 4.7% කින් වර්ධනය වීමක් දක්නට ලැබේ. කෙසේ වෙතත් 2015 වසර සමග සැසඳීමේදී ආදායම රුපියල් මිලියන 06 කින් අඩුවී ඇත.

### 2.6.1.6 කිර්ගිස්ථානය



කිර්ගිස්තානය ප්‍රමුඛ පෙළේ කළු තේ පානය කරන රටකි. වෙළෙඳ පොල මූලාශ්‍ර පෙන්වා දෙන පරිදි එම රටේ වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 4000 ක් ලෙස ගණන් බලා ඇත. ජනගහනය මිලියන 5.7 ක් වන මෙහි වාර්ෂික ඒක පුද්ගල තේ පරිභෝජනය ග්‍රෑ මි 700 පමණ වේ. සමස්ත වෙළෙඳපොළෙන් 90%ක ප්‍ර මාණයක් සහිතව කළු තේ වඩාත් ප්‍රචලිතව පවතී.
කිර්ගිස්තානය සඳහා ප්‍රධාන තේ අපනයන කරුවා වන ශ්‍රී ලංකාව 2016 වසරේදී 25% ආසන්න වෙළෙඳ පොළ කොටසකට හිමිකම් කියයි.
ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව කිර්ගිස්තානය වෙත සෘජු අපනයනය කළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය 2015 වසරේදී මෙ.ටො. 835 ක් වූ අතර 2016 වසරේදී මෙ.ටො. 912 ක් විය. ඒ අනුව 2016 වසරේදී තේ අපනයනයේ 9% ක වර්ධනයක් සිදුව ඇත. ආසන්න වශයෙන් 90% ක් ම තේ තොග ස්වරූපයෙන් අපනයනය කර ඇති අතර තේ ඇසුරුම් ලෙස අපනයනය පසුගිය වසරට වඩා වැඩි වී ඇත. ඒ අනුව ආදායම ද වැඩිවී ඇත. 2015 වසරේදී රුපියල් මිලියන 472 ක් ව තිබූ අතර 2016 වසරේදී රුපියල් මිලියන 555 ක් විය.

### 2.6.1.7 බෙලාරුස්



මිලියන 9.5 ක ජනගහනයක් වසන බෙලාරුස් හි සමස්ත තේ වෙළෙඳපොළ වාර්ෂිකව මෙ.ටො. 5000 -7000 අතර ප්‍රමාණයක් වේ. 2016 දී 70% පමණ තේ රුසියානු දේශසීමා හරහා ලැබී තිබේ. බෙලාරුස් හි ජාතික සංඛ්‍යාලේඛන කමිටුවේ තොරතුරුවලට අනුව 2016 වසර තුළදී ආනයනය කළ තේ මෙ.ටො. 4 824 ක ප්‍රමාණය 2015 වසර හා සැසඳීමේදී මෙ.ටො. 1,208 (20%) ක අඩුවීමකි. ආනයනය කළ තේ වල අගය 2015 වසරේ ඇ.ඩො.මිලියන 47.2 වූ අතර 2016 වසරේදී ඇ.ඩො.මිලියන 31.6 වශයෙන් සටහන් වී ඇත.
බෙලාරුස් රාජ්‍ය ට තේ අපනයනය කිරීමේ මූලිකත්වය හිමිවන්නේ 80% ක තරමේ වෙළෙඳපොළ කොටසකට හිමිකම් කියන රුසියාවට යි. ශ්‍රී ලංකාව ප්‍රධාන අනුපූරක සැපයුම් කරු ලෙස 7.4% කොටසකට හිමිකම් කියයි. සෙසු අනුපූරක සැපයුම් කරුවන් වන එ.අ.එ.රාජ්‍ය, පෝලන්තය සහ වියට්නාමය පිළිවෙලින් 1.5%,1.9% සහ 5.2% වශයෙන් වෙළෙඳපොළ කොටස් සඳහා හිමිකම් කියයි.

2016 වසරේදී ශ්‍රී ලංකාව රුපියල් මිලියන 297 ක වටිනාකමකින් යුතු මෙ.ටො. 273 ක තේ ප්‍රමාණයක් බෙලාරුස් රාජ්‍ය ට අපනයනය කර ඇත. එය 2015 වසර සමග සැසඳීමේදී වටිනාකම අනුව රුපියල් මිලියන 56 ක සහ ප්‍රමාණාත්මකව මෙ.ටො. 57 ක පහත වැටීමක් වේ. බෙලාරුස් රාජ්‍ය ට ලංකා තේ සෘජු අපනයනය අඩුවීම සඳහා ශ්‍රී ලංකාවේ තේ වල මිල ඉහළයාම මෙන්ම ඔවුන්ගේ ප්‍රධාන වෙළෙඳ සහකරු වන රුසියාවෙ හි පවතින ආර්ථික අර්බුදය හේතුකොටගෙන ගොඩනැගී ඇති දුර්වල ආර්ථික තත්වය හේතු වී ඇත.

### 2.6.1.8 මෝල්දෝවා



මෝල්දෝවාවේ පාරිභෝගිකයන් අතර වඩාත් ප්‍රචලිත පානයක් ලෙස තේ හඳුනාගතහැකිවේ. මෝල්දෝවා TNS වෙළෙඳපොළ පර්යේෂණ සමාගමට අනුව මෝල්දෝවා ජනගහනයෙන් 68.7% ක් දිනකට එක්වරක් හෝ තේ පානය කරනු ලබයි. ලොව ඒක පුද්ගල තේ පරිභෝජනය ඉහළින්ම පවතිනුයේ මෝල්දෝවාවෙහි ය. එය වසරකට කි.ග්‍රෑ. 1.40 වේ.
මෝල්දෝවාව ට ලංකා තේ වසරකට මෙ.ටො. 250-350 පමණ අපනයන කරනු ඇත.කෙසේ වුවත් පසුගිය වසර කිහිපය තුළදී ශ්‍රී ලංකා තේ මෝල්දෝවාව ට අපනයනය කිරීම ප්‍රභල ලෙස පහත වැටී තිබේ. ශ්‍රී ලංකා රේගුව මගින් නිකුත්කර ඇති සංඛ්‍යාලේඛන වලට අනුව, 2016 වසරේ දී මෝල්දෝවාව ට අපනයනය කළ තේ ලංකා ප්‍රමාණය 2015 වසර හා සැසඳීමේ දී මෙ.ටො. 65(33.2%) කින් අඩු වී ඇත. 2015 වසරේ දී මෙ.ටො. 195.56 ක් ව තිබී 2016 වසර වනවිට මෙ.ටො. 130.5 දක්වා පහත වැටී ඇත. උපයාගත් ආදායම ද 2015 වසරේ දී රුපියල් මිලියන 204 ක් වූ අතර 2016 වසරේදී රුපියල් මිලියන 136.4 දක්වා පහත වැටුනි. එය 33.2% ක පහතවැටීමකි.

### 2.6.2 මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු වෙළෙඳපොළ

2016 වසරේ ශ්‍රී ලංකාවෙන් මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය(MENA) ට රටවල් අනුව තේ අපනයන සංඛ්‍යාලේඛන 2015 වසර සමග සසඳමින් පහතින් ඉදිරිපත් කර ඇත.

වගුව 2.18: මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවෙන් කළ අපනයනයන් රටවල් අනුව

| රට | 2015 (මෙ.ටො) | වටිනාකම (රු.බිලියන) | 2016 (මෙ.ටො) | වටිනාකම (රු.බිලියන) |
|---|---|---|---|---|
| ඉරානය | 29,564 | 17.7 | 33,598 | 22.2 |
| ඉරාකය | 31,038 | 13.3 | 32,410 | 15.0 |
| තුර්කිය | 33,685 | 18.7 | 27,060 | 14.4 |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | 22,925 | 12.8 | 17,830 | 10.3 |
| සිරියාව | 10,942 | 6.4 | 11,963 | 7.8 |
| ලිබියාව | 9,903 | 4.5 | 12,617 | 6.6 |
| කුවේටය | 8,677 | 4.1 | 3,486 | 2.2 |
| ජෝර්දානය | 5,573 | 4.0 | 3,877 | 3.1 |
| සෞදි අරාබිය | 4,357 | 3.1 | 3,989 | 3.1 |
| ලෙබනනය | 2,450 | 1.8 | 3,447 | 2.5 |
| ඊජිප්තුව | 4,175 | 2.0 | 3,048 | 1.6 |
| උප එකතුව | 163,289 | 88.4 | 153,325 | 88.8 |
| මුළු ශ්‍රී ලංකා අපනයන් / වටිනාකම | **298900** | **174.3** | **280,874** | **176.2** |
| මුළු ශ්‍රී ලංකා අපනයනයන්ගෙන් මැදපෙරදිග හා උතුරු අප්‍රිකානු කලාපයේ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය | **54.60%** | **50.70%** | **54.60%** | **50.4%** |

(මූලාශ්‍රය: ශ්‍රී ලංකා තේ මණ්ඩලය)

ඉහත වගුවෙහි තේ ප්‍රති අපනයනයට අදාළ දත්ත ඇතුළත්ව නැත. තවද ටියුනීසියාව, කටාර්, ඕමානය, බහරේනය, සහ යේමනය වෙත යවන ලද තොග සැලකිය යුතු ප්‍රමාණයක් නොවන නිසා මෙහි දී නොසලකා ඇත.

2016 වසර තුළදී මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපය (MENA) තුළ පැවති ව්‍යාකූලතාවයන් සහ කැළඹීම් නොසලකා ලෝකයේ සියළු රටවල් වෙත කළ සමස්ත ශ්‍රී ලංකා තේ අපනයනයෙන් 55% ක් පමණ ප්‍රමාණයක් සඳහා මෙම කලාපය දායකත්වය සපයා ඇත. වටිනාකම අතින්ද 51% ක දායකත්වයක් වාර්තා වන අතර එය කාර්ය සාධන වටිනාකමක් ඇති ආදර්ශයකි. ප්‍රති අපනයනය නොසලකා හරින තත්වයකදී 2016 වසර තුළ සියළු රටවල් වෙත යවන ලද තේ මෙ.ටො. 280,874 ප්‍රමාණයෙන් ඉරානය, ඉරාකය, තුර්කිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය ,සිරියාව, ලිබියාව, කුවේටය, ජෝර්දානය, සව්දි අරාබිය, ලෙබනනය සහ ඊජිප්තුව තේ මෙ.ටො. 153,325 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. එමගින් ප්‍රමාණය අනුව 54.6% ක් ද වටිනාකම අනුව 50.4% ක්ද වශයෙන් දායක වී ඇත.

2015 වසරේදි මෙ.ටො. 30,066 ක් මිලදීගත් ඉරානය මෙම වසරේදි මෙ.ටො.33,930 ක් (ප්‍රති අපනයන ද සහිතව)

මිල දී ගනිමින් ටොන් 3,850(13%) ක වාර්ෂික වර්ධනයක් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම් කරුවා වන රුසියාවට වඩා ඉරානය දෙවැනිවන්නේ සුළු ප්‍රමාණයකිනි.(ටොන් 500 ක අඩුවක්)

ඉරාන රියාලය ඉතාමත්ම පහළට වැටී තිබේ. ගැනුම් කරුවන් / විකුණුම් කරුවන් අතර කුඩා කැලඹීම් ඇතිවන්නට විය. කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් ක්‍රමයෙන් ඉහළ යාම නිසා ඉරාන වෙළෙඳපොළ තුළ ලංකා තේ වලට හිමි තැන ක්‍රමයෙන් ඉන්දියානු තේ වලට හිමි වන ප්‍රවනතාවයක් 2016 වසර අවසන් කාර්තුවේ සිට දක්නට ලැබේ.

ඉරාකය ලංකා තේ වල තුන්වැනියට විශාලම ගැනුම්කරුවා වන අතර 2016 වසරේ අවසානය වනවිට මෙ.ටො. 32,550 අපනයනය කර ඇත. 2015 වසරේ එම කාලවකවානුවේදි ම මෙ.ටො.31,365 ක් අපනයනය කර ඇත. ඒ අනුව ටොන් 1,200(3.8%) වැඩිවීමක් දක්නට ලැබේ.

2016 වසරේදි ලංකා තේ සඳහා සාමාන්‍ය නැ.වි.ස. මිල කිලෝවකට රුපියල් 627 ක් වු අතර පසුගිය වසරේ ඉරාකයට අපනයනය කළ ලංකා තේ සඳහා නැ.වි.ස. මිල කිලෝවකට රුපියල් 462 ක් විය. තුර්කිය තුළ රෝගී වෙළෙඳ වාතාවරනයක් ගොඩනැගීම සඳහා බොහෝ හේතු බලපෑම් කළා. ඒවා අතර දේශපාලනික පිපිරීම්,දේශසීමා බද නොසන්සුන්තාවයන්, අභ්‍යන්තරික විරෝධතා, අසල්වැසි යුද්ධ වලට සහභාගිවීම, තුර්කි ලීරාව පහත වැටීම සහ සරණාගතයන් රට තුළට ආගමනය වීම වැනි හේතු දක්නට ලැබේ. එබැවින්, තේ සඳහා තුර්කිය සතු වූ කේන්ද්‍රී ය තත්වය සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ දැඩි ලෙස අවපාතයකට ලක්විය. ශ්‍රී ලංකා තේ මිලදී ගනුලබන හතරවෙනි විශාලතම රාජ්‍ය වශයෙන් තුර්කිය 2015 වසරේ මිලදී ගනුලැබූ මෙට්‍රික්ටොන් 33,700 ක ප්‍රමාණය 2016 වසරේ දී මෙට්‍රික්ටොන් 27,070 දක්වා අඩුවිය. ඒ අනුව ඔවුන් මිල දී ගනුලැබූ තේ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 6625 කින් අඩුවිය.

විශේෂයෙන්ම ඉරානය සමඟ සිදුකරනු ලබන වෙළඳාම් කටයුතු වලදී ඇති වූ දුෂ්කරතා කරුණුකොට ගෙන එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි කාර්යභාරයට ද බලපෑම් ඇතිවිය. එහි ප්‍රථිඵලයක් වශයෙන් ප්‍රති අපනයන වෙළඳ කටයුතු හීනවිය. දැනට පවතින සංඛ්‍යා ලේඛන අනුව 2015 වසරේ එක්සත් අරාබි එමීර් රාජ්‍ය ආනයනය කරනු ලැබූ තේ මෙට්‍රික්ටොන් 23,440 ට සාපේක්ෂව 2016 වසරේ දී ආනයනය කර ඇත්තේ මෙට්‍රික්ටොන් 18,400 ක් පමණි. එය මෙට්‍රික්ටොන් 5055 (21.5%) ක අඩු වීමකි. කෙසේ වුව ද ශ්‍රී ලංකා තේ ආනයනය කරනු ලබන පස්වෙනි විශාලතම ආනයනකරු ලෙස එක්සත් අරාබි එමීර් රාජ්‍ය පැවතුනි. තව ද රුසියාවට අමතරව ශ්‍රී ලංකාවේ හරිත තේ මිලදී ගනුලබන දෙවෙනි විශාලතම ආනයනකරු වන්නේද එක්සත් අරාබි එමීර් රාජ්‍ය යි. එමෙන්ම ශ්‍රී ලංකාවට තිබෙන්නා වූ පස්වෙනි විශාලතම පෙර ඇසුරුම් තේ වෙළඳ මධ්‍යස්ථානය වන්නේ ද එක්සත් අරාබි එමීර් රාජ්‍ය යි.


සිරියාව සහ ලිබියාව යන රටවල් දෙකම දැඩි ලෙස අභ්‍යන්තර ගැටුම් වලට මැදිහත්වී ඇත. මෙම රටවල් දෙකම අපගේ තේ සඳහා ඉල්ලුමක් ඇති රටවල් දෙකකි. කෙසේ වුව ද මෙම රටවල් දෙකම ප්‍රමිතියෙන් පහළ තේ මිලදී ගැනීම වැඩිකර ඇත. 2015 වසරේ ලිබියාව මිලදී ගත් මෙට්‍රික්ටොන් 9984 ට සාපේක්ෂව 2016 වසරේ මෙට්‍රික්ටොන් 12645 ක් මිල දී ගෙන ඇත. එය මෙට්‍රික්ටොන් 2660 (22.5%) ක වැඩි වීමකි. එමෙන්ම 2016 වසරේ දී සිරියාව මෙට්‍රික්ටොන් 12100 ක් ආනයනය කර ඇති අතර 2015 වසරේ දී මිලදී ගත් ප්‍රමාණය වන මෙට්‍රික්ටොන් 11090 ට සාපේක්ෂව මෙට්‍රික්ටොන් 1000 ක වැඩි වීමකි.

2016 වසරේ කුවේටය මිලදී ගත් තේ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 3527 කි. පසුගිය වසරේ දී මිල දී ගත් තේ ප්‍රමාණය වන මෙට්‍රික්ටොන් 8730 ට සාපේක්ෂව විශාල අඩු වීමක් පෙන්වයි. අඩු වූ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 5200 (60%) කි. එයට ප්‍රධාන හේතුව වූයේ ඉරානය හා ඉරාකය සමඟ පැවති දේශසීමා අර්බුදය යි. ජෝර්දානය හා කුවේටය යන රටවල් දෙකම 2016 වසරේ දී තේ මිලදී ගැනීම ඔවුන්ගේ දේශීය පරිභෝජනයට පමණක් සීමාකරන ලදී. ඒ අනුව ජෝර්දානය 2015 දී මිලදී ගත් මෙට්‍රික්ටොන් 5650 ට සාපේක්ෂව 2016 වසරේ දී මිලදී ගෙන ඇත්තේ මෙට්‍රික්ටොන් 3996 කි. එනම් මෙට්‍රික්ටොන් 1654 ක අඩු වීමකි.

2012 වසරේ දී ලෙබනනය ආනයනය කරනු ලැබූ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 2.1 කි. එකී ප්‍රමාණය 2013 වසරේ දී මිලියන 2.8 දක්වා වැඩිවිය. 2014 වසරේ දී එය මිලියන 3.4 දක්වා වැඩිවිය. නමුත් 2015 වසරේ දී මිලියන 2.5 දක්වා අඩුවිය. 2016 දී කිලෝග්රෑම් මිලියන 3.5 දක්වා වැඩිවිය. යම් ප්‍රමාණයක් සිරියාවට යවනු ලැබුවේ පොදු දේශසීමාව ඔස්සේය. අප්‍රිකානු සී.ටී.සී තේ (විශේෂයෙන් කෙන්යාවේ) බලපෑමට හසුවූ, තේ මිල පිළිබඳ දැඩි ලෙස සංවේදීව කටයුතු කරන ඊජිප්තු තේ වෙළඳපොළ 2012 වසරේ දී ලංකා තේ කිලෝග්‍රෑම් මිලියන 3.6 ක් මිලදී ගෙන ඇත. 2013 සහ 2014 වසර වල දී පිළිවෙලින් ලංකා තේ කිලෝග්‍රෑම් මිලියන 2 ක් සහ කිලෝග්‍රෑම් මිලියන 2.8 ක් මිලදීගෙන ඇත. නමුත් ප්‍රමිතියෙන් පහළ තේ කිලෝග්‍රෑම් මිලියන 4.2 ක් 2015 වසරේ දී මිලදී ගෙන තිබූ අතර 2016 වසරේ දී එම ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 3.1 ක් දක්වා අඩුවිය. මොම්බාසා තේ වෙන්දේසියේ මිල වැඩි වූ අවස්ථා වලදී එම හිඟය පියවාගැනීම සඳහා ශ්‍රී ලංකා හා ඉන්දියා තේ මිලදී ගැනීම සඳහා ඊජිප්තුව යොමු විය. කෙසේ වුවද 2016 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ ද මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. ලිබියාවට ප්‍රතිඅපනයනය කිරීම සඳහා ද ඊජිප්තුව ලංකා තේ ආනයනය කරයි.

## 2.6.3 ඈත පෙරදිග

### 2.6.3.1 ජපානය



ලෝකයේ අතිශය සංකීර්ණ හා තරඟකාරී තේ වෙළඳපොළ ලෙස ජපානය ඔවුන් විසින් ම ස්ථාපිත කරගෙන ඇත. නිෂ්පාදන තත්වය නිෂ්පාදනයේ ආරක්ෂිත බව හා පවිත්‍රතාව, ඇසුරුමෙහි නව ආකාරයන්, තාක්ෂණික ප්‍රගතිය, සැපයුම් ජාලයෙහි විනිවිදබව, පරිසර හිතකාමී බව සාමාජීය වගකීම හා කර්මාන්තයේ තිරසාර සංවර්ධනය අතින් බලන කළ ලෝක වෙළඳපොළෙහි ඉහළම ස්ථානයේ ජපානය වැජඹේ. ජපන් තේ වෙළඳපොළට පිවිසීම දුෂ්කර වුවද ඇසුරුම් හා යාන්ත්‍රිකරණයේ පවිත්‍රතාව ආහාර ආරක්ෂණ ප්‍රමිතීන් හා නිෂ්පාදන නව්‍යතාවන්ට ආදාළව අවශ්‍ය වන්නා වූ ආයෝජනයන් සිදුකිරීමට කැමැත්ත දක්වන්නා වූ තේ අපනයනකරුවන්ට හා සැපයුම්කරුවන්ට ප්‍රතිඵලදායි වෙළඳපොළක් ලෙස ජපානය හඳුනාගත හැකිය. ජපානයේ තේ පරිභෝජනය වසරකට මෙට්‍රික්ටොන් 112,630 කි.පෙර වර්ෂයන්ට සාපේක්ෂව එම ප්‍රමාණය සුළු අඩුවීමකි. කෙසේ වුවද හරිත තේ පරිභෝජනය ඉහළ මට්ටමක පවතින අතර කළු තේ ඉල්ලුම ද ස්ථාවරව පවතී. ඌලෝං තේ වෙළඳපොළ හීන වෙමින් පවතී. ජපානයෙහි වත්මන් නැඹුරුව වී ඇත්තේ ක්ෂණික හා පානයට සූදානම් කළ තේ වර්ග යි. එම තේ වර්ග ආනයනය 40% කින් වැඩි වී ඇත.


ජපානය ශ්‍රී ලාංකා තේ සඳහා වන විශාලතම තේ වෙළඳපොළ 10 අතර වේ. ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් ජපානයට අපනයනය කරනු ලබන්නේ සම්ප්‍රදායික කළු තේ වන අතර 60% වශයෙන් කළු තේ එහි පෙරමුණ ගනී. 2016 වසරේ දී ශ්‍රී ලංකාවෙන් ජපානයට අපනයනය කළ තේ ප්‍රමාණය මෙට්‍රික්ටොන් 7665 කි. එහි වටිනාකම ඇ.ඩො මිලියන 37.2 කි.

### 2.6.3.2 චීනය



චීනය තේ සංස්කෘතියක් ඇත්තා වු රටකි. හරිත තේ, ඌලෝං තේ, ජැස්මින් තේ සහ පු අර් තේ (Pu'er)නිෂ්පාදනය කරනු ලබන ලොව විශාලතම නිෂ්පාදකයා යි. චීනය විශාල වශයෙන් හරිත තේ නිෂ්පාදනය කරනු ලැබුව ද කළු තේ ද ඔවුන් නිෂ්පාදනය කරනු ලබයි. චීනය ලෝකයේ විශාලතම තේ නිෂ්පාදකයා මෙන්ම පරිභෝජකයා ද වේ. එමෙන් ම ලොව දෙවෙනියට විශාලතම තේ අපනයනකරු ද වේ. එහි අපනයන ප්‍රමාණය 2016 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 328 කි.
2016 වසරේ දී සම්පූර්ණ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් බිලියන 2.35 කි. 2015 හා සසඳන විට 4.5% ක වර්ධනයකි. තේ නිෂ්පාදනයෙන් 66% ක් හරිත තේ වන අතර ඉතිරිය කළු තේ හා අනෙකුත් තේ වර්ග වේ. ලෝක තේ නිෂ්පාදනයෙන් 43% ක් චීනය නිෂ්පාදනය කරන අතර ඉන්දියාව 22.7% ක්, කෙන්යාව 8.7% ක් සහ ශ්‍රී ලංකාව 5.4% ක් වශයෙන් තේ නිෂ්පාදනයේ යෙදේ.
චීනයේ වාර්ෂික තේ පරිභෝජනය කිලෝග්‍රෑම් මිලියන 1665 ක් වශයෙන් ඇස්තමේන්තු ගතකර ඇත. ඒක පුද්ගල පරිභෝජනය ග්‍රෑම් 1220 (2015) ක් වේ. 2016 වසරේ දී චීනය තේ මෙට්‍රික්ටොන් 328,692 ක් අපනයනය කරනුලැබූ අතර කෙන්යාවට පසුව ලොව විශාලතම අපනයනකරුවා විය. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අනුව 2015 වසරේ දී ශ්‍රී ලංකාවෙන් තේ සෘජු අපනයනය මෙට්‍රික්ටොන් 7,198 ක් විය. එය ආසන්න වශයෙන් ඇ.ඩො මිලියන 32.97 ක වටිනාකමකින් යුතු වේ. එමෙන්ම ඇ.ඩො මිලියන 30.98 ක වටිනාකමකින් යුතු ලංකා තේ මෙට්රි,ක්ටොන් 7,463 ක ප්‍රමාණයක් 2016 වසරේ දී චීනයට අපනයනය කරඇත. එයින් 93% ක් තොග වශයෙන් ද, 4.1% ක් ඇසුරුම් වශයෙන් ද සහ 2.9% ක් තේ මළු වශයෙන් ද විය. 2015 වසර හා සසඳන විට ප්‍රමාණාත්මකව 3.7% ක වර්ධනයක් පෙන්වයි.

### 2.6.3.3 තායිවානය




මෙට්‍රික්ටොන් 14,400 ක් පමණ තේ තායිවානය විසින් නිෂ්පාදනය කරයි. එයින් 95% ක් උසස් තත්වයේ හරිත තේ වේ. තායිවානය කැපීපෙනෙන තේ වෙළඳපොළකි. එහි ඒකපුද්ගල පරිභෝජනය කිලෝග්‍රෑම් 1.53 කි. වසරක සම්පූර්ණ තායිවාන තේ ආනයනය මෙට්‍රික්ටොන් 24,321 කි. එයින් 66% ක් කළු තේ සහ ඌලෝං තේ වේ. තායිවානයට තේ අපනයනය කරන ප්‍රධාන රටක් වන්නේ වියට්නාමය යි. ඔවුන් 57%ක ප්‍රමාණයක් තායිවානයට තේ අපනයනය කරනු ලබයි. ශ්‍රී ලංකාව සහ ඉන්දියාව පිළිවෙලින් 13% ක් සහ 11% ක් වශයෙන් තායිවානයට තේ අපනයනය කරයි. තායිවානයේ වාර්ෂික තේ පරිභෝජනය මෙට්‍රික්ටොන් 41,000 ක් පමණ වේ. තායිවානයට වැඩිවශයෙන් ආසියාවෙන් පැමිණෙන සංචාරකයන්ගේ තේ පරිභොජනය හේතුවෙන් ප්‍රමාණය මෙසේ වැඩි වී ඇත. ආසියානුවන් වැඩිවශයෙන් තේ පරිභෝජනය කරයි.
ශ්‍රී ලංකාවේ තේ සඳහා තායිවානය වැදගත් වෙළඳපොළක් වන අතරම එම තත්වය වර්ධනය වීමේ ඉඩකඩ බොහෝ යි. නමුත් 2015 වසරට සාපේක්ෂව තායිවානයට ලංකා තේ අපනයනය 2016 වසරේ දී ප්‍රමාණාත්මකව 13% ක පහත වැටීමක් සිදුවී ඇත. එමෙන්ම ඇ.ඩො මිලියන 12.11 ක සිට ඇ.ඩො මිලියන 10.98 දක්වා වටිනාකම අතින් ද පහළවැටීමක් සිදු වී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 9.3% ක පහත වැටීමකි.

### 2.6.34. ඕස්ට්‍රේලියාව



ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන වශයෙන් පරිභෝජනය වන්නේ කළු තේ වන අතර ඉතා සුළු වශයෙන් පවතින හරිත තේ පරිභෝජනයෙහි (ආසන්න වශයෙන 3% ක්) කිසියම් වර්ධනයක් දක්නට ලැබේ. ප්‍රමුඛ තේ සපයන්නා වශයෙන් ඉන්දියාව 25% ක ප්‍රමාණයක් ද ශ්‍රී ලංකාව 19.6% ක ප්‍රමාණයක් ද, ඉන්දුනීසියාව 16.1% ක් ද, චීනය 17.9% ක් ද වශයෙන් 2015 හා 2016 වසර වල දී අපනයනය කරඇත. උසස් තත්වයේ කළු තේ වල සාමාන්‍ය ඒකක මිළ 1.5% කින් අඩු වී ඇත. විශේෂිත තේ හා පිරමීඩ තේ මළු සඳහා ඉහළ ඒකක මිලක් වේ. එය සාමාන්‍ය ඒකක මිල වැඩි වීම සඳහා හේතුවිය. ඉහළ තත්වයේ තේ සඳහා ඕස්ට්‍රේලියානුවන් වැඩි මිලක් ගෙවීමට කැමැත්තක් දක්වයි. එබැවින් නිත්‍යානුකූල නොවන මාර්ගවලින් ලැබෙන තේ ඒකක මිළ 3% කින් වැඩි වී ඇත. ඕස්ට්‍රේලියාවට අපනයනය කරනු ලැබූ තේ ප්‍රමාණය 2015 වසරේ මෙට්‍රික්ටොන් 2336 ක්ව තිබී 2016 වසරේ දී මෙට්‍රික්ටොන් 2371 ක ප්‍රමාණයක් දක්වා වැඩි වී ඇත. එය 1.5% ක වර්ධනයකි. ඕස්ට්‍රේලියාවට අපනයනය කරනු ලැබූ සමස්ත තේ ප්‍රමාණයෙන් 86% ක් අගය එකතු කළ තේ වන අතර එය 67% ක් තේ මළු සහ 19% ක් තේ ඇසුරුම් වශයෙන් වේ.

### 2.6.3.5 සිංගප්පූරුව



සිංගප්පූරුව වෙත ශ්‍රී ලංකා තේ අපනයනය වසරකට මෙ.ටො. 475 - 625 දක්වා ප්‍රමාණයක් වේ. 2016 වසරේ සම්පූර්ණ තේ අපනයනය මෙ.ටො. 597 කි. 2015 වසරේ සංඛ්‍යාලේඛන අනුව මෙ.ටො. 505 ක් වේ. ශ්‍රී ලංකා තේ සඳහා ප්‍රධාන තරඟකරුවන් වන්නේ චීනය, ඉන්දුනීසියාව, කෙන්යාව, ඉන්දියාව, ජපානය හා තායිවානය යන රටවල් වේ. චීනය හා තායිවානය ප්‍රධාන වශයෙන් සපයනු ලබන්නේ ඌලෝං තේ සහ හරිත තේ ය. කළු තේ අපනයනයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන තරඟකරුවන් වන්නේ ඉන්දියාව හා කෙන්යාව යි.

### 2.6.4. උතුරු සහ දකුණු ඇමරිකානු කලාපය

වගුව 2.19: උතුරු සහ දකුණු ඇමරිකානු කලාපය වෙත ශ්‍රී ලංකා තේ අපනයනය කිරීම්

| රට | 2016 ප්‍රමාණය (කි.ග්‍රෑ.) | 2015 ප්‍රමාණය (කි.ග්‍රෑ.) | ප්‍රමාණයේ වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| චිලි | 6,543,574 | 6,864,828 | -321,254 | -4.68 |
| ඇ.එ.ජ. | 4,519,463 | 3,781,497 | 737,966 | 19.52 |
| කැනඩාව | 416,486 | 579,153 | -162,667 | -28.09 |
| වෙනිසියුලාව | 44,785 | 36,150 | 8,635 | 23.89 |
| බ්‍රසීලය | 3,488 | 1,960 | 1,528 | 77.96 |
| මෙක්සිකෝව | 18,109 | 22,075 | -3,966 | -17.97 |
| පැනමා | 194 | 5,858 | -5,664 | -96.69 |
| ආජන්ටිනාව | 29,120 | 39,200 | -10,080 | -25.71 |
| කොලොම්බියාව | 508 | 235 | 273 | 116.17 |
| **එකතුව** | 11,575,727 | 11,330,956 | 244,771 | 2.16 |

### 2.6.4.1. ඇමරිකා එක්සත් ජනපදය



2016 වසරේ දී ඇමරිකානුවන්, බිලියන 84 වාරයක් හෝ ගැලුම් බිලියන 3.8 කට වඩා තේ පරිභෝජනය කර ඇත. 80% ක් කළු තේ වන අතර 16% ක් හරිත තේ සහ ඉතිරිය ඌලෝං තේ, සුදු තේ සහ තද පැහැති තේ වශයෙන් වේ.

ඇමරිකා එක්සත් ජනපදය ලොව තේ ආනයනය කරනු ලබන රටවල් අතර ප්‍රධාන තුන්වැනි රටයි. රුසියාව සහ පකිස්ථානය අනෙකුත් රටවල් වේ. තවද 2016 වසරේ දී තේ ආනයනය හා පරිභෝජනය යන අංශයන් දෙකෙන්ම වර්ධනයක් සිදු වු එකම බටහිර රට වනුයේ ද ඇමරිකා එක්සත් ජනපදය යි. ඇමරිකාවට තේ සපයන ප්‍රධාන රට ආජන්ටිනාවයි. එය 43% ක ප්‍රමාණයක් වේ.

චීනය( 15.5%), ඉන්දියාව (12.1%), වියට්නාමය (4.8%) ශ්‍රී ලංකාව (4.4%) සහ ඉන්දුනීසියාව (3.3%) ආදි රටවල් පසුපසින් වේ. වටිනාකම අනුව බැලුවිට 2016 වසරේ දි චීනය ඉදිරියෙන් සිටින අතර ආජන්ටිනාව සහ ඉන්දියාව පසුපසින් වේ.

සෑම වසරකම ශ්‍රී ලංකාවෙන් ආනයනය කරනුලබන තේ වලින් 90% -95% ප්‍රමාණයක් කළු තේ වන අතර ඉතිරිය හරිත තේ වේ. කළු තේ වලින් 55% - 60% අතර ප්‍රමාණයක් තොග වශයෙන් වන අතර ඉතිරි ප්‍රමාණය තේ මළු සහ ඇසුරුම් ( කි.ග්‍රෑ. 3 ට අඩු) වශයෙන් වේ. 2016 වසරේ දී ශ්‍රී ලංකාවෙන් අපනයනය මෙ.ටො. 5,458 වන අතර වටිනාකම අතින් එ.ජ.ඩො. මිලියන 35 කි. 2015 වසරේ දී එ.ජ.ඩො. මිලියන 33 පමණ වටිනා තේ මෙ.ටො.4941 අපනයනය කර ඇත.

### 2.6.4.2. කැනඩාව



“Canadian Food Trends to 2020” වාර්තාවට අනුව 2020 වනවිට තේ පරිභෝජනය 40% දක්වා වැඩිවීමක් අපේක්ෂා කරයි. සෞඛ්‍ය හා යහගුණය පිළිබඳ පාරිභෝගික උනන්දුව වැඩිවීමත් සමග තේ පරිභෝජනයෙන් ඇතිවන්නා වූ ප්‍රතිලාභයන් ගැන ද වැඩි අවධානයක් යොමුකර ඇත. 35,749,600 ජනගහනයක් වසන කැනඩාවේ වසරකට තේ කෝප්ප බිලියන 10 කට වඩා ප්‍රමාණයක් පානයකරනු ඇත. වැඩි වශයෙන් පානය කරනු ලබන්නේ කළු තේ වන අතර නිත්‍යානුකූල නොවන මාර්ග වලින් ලැබෙන තේ අලවිය 84% ක පමන වේ.

2015 වසරේදි කැනඩාව මෙ.ටො. 14,659 ක ප්‍රමාණයක් කළු තේ පරිභෝජනය කර ඇත. එම ප්‍රමාණය පහත සඳහන් අයුරින් ආනයනය කර ඇත. එක්සත් රාජධානිය (22%), ඉන්දියාව(17%), ඇ.එ.ජ.(33%), ශ්‍රී ලංකාව (5.5%) සහ චීනය (7.6%). 2016 වසරේ දී ශ්‍රී ලංකාව තේ කි.ග්‍රෑ. 416,486 ක් අපනයනය කර ඇත. 2015 වසර හා සැසඳීමේ දි 28% ක පහත වැටීමක් වාර්තා විය. නමුත් 2016 වසරේ දී සාමාන්‍ය FOB මිල සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. එමෙන්ම 2016 වසරේ දී අපනයනයන්ගෙන් 60% ක් ම අගය එකතු කළ තේ වශයෙන් විය.

## 2.6.4.3 චිලි රාජ්‍යය



වාර්ෂිකව මෙ.ටො.20,000 ඉක්ම වූ තේ ප්‍රමාණයක් ආනයනය කරන චිලි රාජ්‍ය දකුණු ඇමරිකාවේ විශාලතම තේ වෙළඳපොළ වේ.

ආර්ජන්ටිනාව ප්‍රධාන සැපයුම් කරු ලෙස 47% ක ප්‍රමාණයක් තේ සපයනු ලබයි. 32% ක ප්‍රමාණයක් සපයන ශ්‍රී ලංකාව සහායක සැපයුම් කරු ලෙස හඳුනාගත හැකි වේ. 2016 වසර සඳහා ශ්‍රී ලංකාව තේ සපයා ඇත්තේ කි.ග්‍රෑ. 6,543,574 කි. එය 2015 වසරේ දී අපනයනය කළ කි.ග්‍රෑ. 6,864,827 හා සැසඳීමේ දී 4.68% ක පහත වැටීමකි. නමුත් 2016 වසරේ අපනයන ආදායම රුපියල් මිලියන 3,425 දක්වා හෝ 3.6% ක වැඩිවීමක් වී ඇත.

## 2.6.5. යුරෝපියානු කලාපය

වගුව 2.20: යුරෝපීය කලාපය වෙත ශ්‍රී ලංකා තේ අපනයනය රටවල් අනුව

| රට | 2016 - (කි.ග්‍රෑ.) | 2015 - (කි.ග්‍රෑ.) | වෙනස (කි.ග්‍රෑ.) | වර්ධනය % |
|---|---|---|---|---|
| ජර්මනිය | 6,525,210 | 6,852,378 | -327,168 | -4.77 |
| පෝලන්තය | 2,173,286 | 2,373,281 | -199,995 | -8.43 |
| බෙල්ජියම | 2,833,547 | 2,356,975 | 476,572 | 20.22 |
| නෙදර්ලන්තය(ඕලන්දය) | 2,570,845 | 1,536,999 | 1,033,846 | 67.26 |
| අයර්ලන්තය | 1,817,673 | 1,987,202 | -169,529 | -8.53 |
| ඊශ්‍රායලය | 1,378,427 | 1,417,706 | -39,279 | -2.77 |
| ඉතාලිය | 956,297 | 1,513,441 | -557,144 | -36.81 |
| ෆින්ලන්තය | 1,212,724 | 1,141,530 | 71,194 | 6.24 |
| ප්‍රංශය | 663,088 | 764,086 | -100,998 | -13.22 |
| එක්සත් රාජධානිය | 957,050 | 1,154,346 | -197,296 | -17.09 |

## 2.6.5.1. එක්සත් රාජධානිය



එක්සත් රාජධානියෙහි වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 114,473 ක් පමණ වන අතර ඒක පුද්ගල පරිභෝජනය කි.ග්‍රෑ. 1.78 (ITC 2016) ලෙස වාර්තා වේ. හරිත හා පළතුරු තේ පරිභෝජනය වැඩිවෙමින් පවතී. කළු තේ පරිභෝජනය 95% ක ප්‍රමාණයකින් යුතු වේ. අමතරව කැෆෙන් රහිත සහ අර්ධ වශයෙන් පවතින තේ සඳහා ඉල්ලුම ඉහළ යමින් පවතී. ඖෂධීය, හරිත සහ කැෆෙන් රහිත තේ වර්ග එක්සත් රාජධානියෙහි සුපිරි වෙළඳපොළවල් වල වැඩිවශයෙන් දක්නට ඇත. එමෙන්ම, එක්සත් රාජධානිය පානයට සූදානම් කළ තේ (කෝපි) සඳහා වන යුරෝපා සංගම් ප්‍රධාන වෙළඳපොළ ද වන්නේය. කෙසේ වෙතත් සාමාන්‍ය කළු තේ වලට සාපේක්ෂව මෙකී තේ වර්ග ඉතාමත් සීමිත වන්නා සේම සමස්ත තේ පරිභෝජනය ට සුළු බලපෑමක් පමණක් සිදුකරනු ඇත.

එක්සත් රාජධානි වෙළඳපොළට තේ සපයන ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ තේ වගාකරන රටවල් ය. ඒ අනුව 2015 වසරේ දී කෙන්යාව මෙ.ටො.62,864(46%) සපයමින් ඉදිරියෙන්ම සිටින අතර ඉන්දියාව මෙ.ටො.21,817(16%) සහ මලාවි මෙ.ටො. 7,003(5%) වශයෙන් පසුපසින් සිටී.

මෙම වෙළඳපොළ ට ශ්‍රී ලංකාවෙන් තේ අපනයනය සම්බන්ධව පසුගිය වසර 05 තුළ දී උච්චාවචන ප්‍රවනතාවයක් දක්නට ලැබුනි. ශ්‍රී ලංකා රේගු වාර්තා අනුව 2015 වසර තුළ දී සෘජු අපනයනය මෙ.ටො. 1,154 ක් වන අතර වටිනාකම ආසන්න වශයෙන් රුපියල් මිලියන 1,229 ක් වේ. 2016 වසරේ දී මෙ.ටො. 957 අපනයනය කර ඇති අතර එහි වටිනාකම රුපියල් මිලියන 1,168 ක් විය. මෙහිදී තේ තොග වශයෙන් 64.2% ක් ද ඇසුරුම් 16.1% සහ තේ මළු 19.6% ක් ලෙස අපනයනය කර ඇත.

## 2.6.5.2. පෝලන්තය



ජනගහනය මිලියන 38 පමණ වන පෝලන්තය යුරෝපය තුළ තුන්වෙනියට විශාලතම තේ පරිභෝජකයා වේ. වාර්ෂික තේ පරිභෝජනය මෙ.ටො. 34,787 ක් ලෙස ගණන් බලා ඇත. ඒක පුද්ගල තේ පරිභෝජනය කි.ග්‍රෑ. 0.89 ක් වේ. 2015 වසරේ දී යුරෝපා කලාපයට ආනයනය කළ සමස්ත තේ ප්‍රමාණයෙන් 26.72% ක් පෝලන්තයට ආනයනය කර ඇත. 2015 වසරේ දී තේ මෙ.ටො. 34,787 ක් පෝලන්තයට ආනයනය කර ඇති බව ජාත්‍යන්තර තේ කමිටු වේ සංඛ්‍යා ලේඛන වලට අනුව දක්නට ලැබේ. පෝලන්ත වාසීන් කළු තේ පරිභෝජකයන් වන අතර ආනයනික තේ වලින් 87% ක් කළු තේ වන අතර හරිත තේ 13% කි.

පෝලන්ත වෙළඳපොළට තේ සපයන ප්‍රධාන සැපයුම්කරුවන් වන්නේ තේ වගාකරන රටවල් ය. ඒ අනුව 2015 වසරේ දී කෙන්යාව මෙ.ටො.7,032(20%) සපයමින් ඉදිරියෙන්ම සිටින අතර වියට්නාමය මෙ.ටො.1,779(5%) ඉන්දියාව මෙ.ටො. 4,785 (13%), ඉන්දුනීසියාව මෙ.ටො. 2,749 (8.0%), ජර්මනිය මෙ.ටො. 4,398(12.64%), චීනය මෙ.ටො. 1,882(5%) සහ ශ්‍රී ලංකාව මෙ.ටො. 1,807 (5%) වශයෙන් තේ සපයා ඇත.

ශ්‍රී ලංකා රේගු වාර්තා අනුව 2016 වසර තුළ දී ශ්‍රී ලංකාවෙන් සෘජු අපනයනය මෙ.ටො. 2,173 ක් වන අතර එහි වටිනාකම රුපියල් මිලියන 1,898 ක් වේ. 2015 වසරේදී ශ්‍රී ලංකා තේ මෙ.ටො. 2,373 ක් අපනයනය කර ඇත. එහි වටිනාකම රුපියල් මිලියන 1,915 ක් වේ. ඒ අනුව ප්‍රමාණාත්මකව 8.4% ක් සහ වටිනාකම අනුව 0.89% කින් පහතවැටී ඇත.

### 2.6.5.3. ජර්මනිය




යුරෝපා සංගමය තුළ දෙවැනියට තේ ආනයනය කරන රට වනුයේ ජර්මනියයි. නමුත් තේ පරිභෝජනය එක්සත් රාජධානියට සහ පෝලන්තයට පසුපසින් වේ. 2015 වසර තුළ දී ජර්මනිය තේ මෙ.ටො. 57,178 ක් ආනයනය කර ඇත. එම ප්‍රමාණයෙන් 44% (මෙ.ටො. 25, 094) ප්‍රතිඅපනයනය කර ඇත. ඒ අනුව දේශීය පරිභෝජනය සඳහා වු ආනයන ප්‍රමාණය මෙ.ටො. 32,084 ක් විය.

2010 සිට 2015 දක්වා වසර හයක කාලය තුළ ජර්මනියට තේ ආනයනය මෙ.ටො. 6,331 ක එනම් 12% ක වැඩිවීමක් වාර්තා වේ. 2010 වසරේ දි මෙ.ටො. 50,847 ක් වු අතර 2015 වසරේදි 57,178 ක් විය. මෙ.ටො.13,799 (24%) ක් චීනය විසින් තේ සපයනු ලබයි. ඉන්පසුව ඉන්දියාව (17%), ශ්‍රී ලංකාව (13%), නෙදර්ලන්තය (7%) සහ ඉන්දුනීසියාව (7%) වශයෙන් තේ සපයනු ලබයි.
චීනයෙන් ආනයනය කරන තේ වලින් හරිත තේ ප්‍රමුඛ වේ.(සම්පූර්ණ ආනයනයන්ගෙන් 75% වඩා) කළු තේ සැපයුම්කරුවන් වන, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව තම ප්‍රමුඛතාවය රැකගැනීමට සමත් වී ඇත.

තේ ප්‍රතිඅපනයනයේ දි ජර්මනිය තවත් වාර්තාවක් හිමිකරගෙන ඇත. ජර්මනිය තුළ දී සැකසු තේ මෙ.ටො. 25,094 ක් රටවල් 96 කට අපනයනය කර ඇත. පරිභෝජකයන්ගේ රුචි අරුචිකම් හඳුනාගැනීම හා වෙනස් වු නව නිෂ්පාදනයන් හඳුනාගැනීම නිසා ජර්මන් තේ විශේෂඥයින්ගේ හැකියාව ලොව පුරා පිළිගෙන ඇත. මුළු යුරෝපය පුරා වෙළඳාම් වන තේ වලින් 70% ක් පමණ තේ නගරය වන හැම්බර්ග් නගරය හරහා සංසරණය වේ. යුරෝපා තේ වෙළඳාමේ ප්‍රධාන කේන්ද්‍රය වනුයේ මෙම නගරයයි. එමෙන්ම තේ සම්බන්ධයෙන් වන බොහෝ සේවාවන් මෙම නගරයේ ක්‍රියාත්මක වේ.

ජර්මනිය වෙත සම්ප්‍රදායික කළු තේ සඳහා වන ප්‍රධාන සැපයුම් කරුවා වුයේ ශ්‍රී ලංකාවයි. තම තේ වැඩි ප්‍රමාණයක් තොග වශයෙන් අපනයනය කරන ශ්‍රී ලංකාව අගය එකතු කළ තේ 36% ප්‍රමාණයක් අපනයනය කරයි. 2016 වසරේ දි ශ්‍රී ලංකාව මෙ.ටො. 6,525 ක් අපනයනය කර ඇති අතර ලංකා තේ සඳහා වන 12 වැනියට විශාල ආනයන කරුවන්නේ ජර්මනියයි. පසුගිය වසර තුළ අපනයනය කළ මෙ.ටො. 6,852 හා සැසඳීමේදි මෙ.ටො. 327 (-4.77%) ක පහළ වැටීමක් වාර්තා වේ.

### 2.6.5.4. ප්‍රංශය



එක්සත් රාජධානිය, පෝලන්තය සහ ජර්මනිය ට පසුව යුරෝපා සංගමය තුළ හතර වැනි ශුද්ධ තේ ආනයනකරු වන්නේ ප්‍රංශය යි. එහි වෙළඳපොළ කොටස වන්නේ 9.3% ක ප්‍රමාණයකි. 2015 වසරේ දි තේ මෙ.ටො. 14,833 ක් ආනයනය කර ඇති නමුත් 2016 වසරේදි එය මෙ.ටො. 12,501 දක්වා 16% කින් පහත වැටී ඇත. 38% ක වෙළඳපොළ කොටසක් ඇතිව චීනය ප්‍රධාන තේ සැපයුම්කරුවා වන අතර බෙල්ජියම (15%), ජර්මනිය (11%) සහ ශ්‍රී ලංකාව (5.5%) යන රටවල් ද තේ සැපයුම්කරුවන් වේ. ප්‍රංශය ආනයනය කරන තේ වලින් 22% ක ප්‍රමාණයක් ප්‍රති අපනයනය කරන අතර ඉතිරිය දේශීයව පරිභෝජනය කරනු ලබයි.
සමස්ත තේ ආනයනයෙන් 51% ලෙස කළු තේ මෙ.ටො. 9,804 ක ප්‍රමාණයක් ද හරිත තේ 49% ලෙස මෙ.ටො. 9,266 ක ප්‍රමාණයක් ද ආනයනය කරන අතර 76% ක ප්‍රමාණයක් පූර්ව ඇසුරුම් ලෙස සහ 24% ක ප්‍රමාණයක් තොග වශයෙන් ආනයනය කරනුලබයි. ප්‍රධාන කළු තේ සැපයුම්කරු වන්නේ බෙල්ජියම යි. ප්‍රමාණය 23% කි. අනතරුව චීනය (17%), ශ්‍රී ලංකාව (11%), ජර්මනිය (10%) සහ වෙනත් රටවල් (39%) වේ. හරිත තේ සපයනු ලබන ප්‍රමුඛයා වනුයේ චීනය යි. එම ප්‍රමාණය 61% කි. අනතුරුව ජර්මනිය (12%) සහ බෙල්ජියම (4.5%) කි.

ශ්‍රී ලංකා රේගු වාර්තා වලට අනුව 2016 වසරේ දි ශ්‍රී ලංකාව මෙ.ටො. 663 ක ප්‍රමාණයක් අපනයනය කර ඇත. 2015 වසරේ දි මෙ.ටො. 764 ක් අපනයනය කර ඇත. නමුත් ප්‍රංශ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකා තේ ප්‍රමාණය ඉහළයි. බෙල්ජියමෙන්, එක්සත් රාජධානියෙන් සහ ජර්මනියෙන් පැමිණෙන තේ වල සැලකිය යුතු ප්‍රමාණයක් ලංකා තේ අඩංගුවීම එයට හේතුවයි.

## 2.6.6. දකුණු ආසියා කලාපය

වගුව 2.21: දකුණු ආසියා කලාපයට ලංකා තේ අපනයනය

| රට | ප්‍රමාණය (කි.ග්‍රෑ.) | | වෙනස | වර්ධනය % |
|---|---|---|---|---|
| | 2015 | 2016 | | |
| ඉන්දියාව | 3,446,787 | 1,081,718 | -2,365,069 | -68.62 |
| පාකිස්තානය | 3,281,954 | 956,242 | -2,325,712 | -70.86 |
| බංගලාදේශය | 516 | 0 | -516 | -100.00 |
| මාලදිවයින | 175,279 | 194,184 | 18,905 | 10.79 |
| ඇෆ්ගනිස්ථානය | 1656 | 278 | -1,378 | -83.21 |
| නේපාලය | 3,297 | 2,693 | -604 | -18.32 |
| **එකතුව** | **6,909,489** | **2,235,115** | **-4,674,374** | **-67.65** |

මෙම කලාපය තුළ රටවල් 08 ක් ඇත. ඒ අතුරින් රටවල් තුනක් තේ නිපදවනු ලබන්නේ නැත. ලෝක තේ පරිභෝජනය පිළිබඳ සංඛ්‍යා ලේඛන පෙන්වා දෙන පරිදි මෙම කලාපය සමස්ත ලෝක තේ නිෂ්පාදනයෙන් 20% කට ආසන්න ප්‍රමාණයක් පරිභෝජනය කරනු ලබයි. විශේෂයෙන්ම කළු තේ.

ඉහත සඳහන් රටවල් හය 2016 වසර තුළදී ලංකා තේ කි.ග්‍රෑ. මිලියන 2.2 ක ප්‍රමාණයක් ආනයනය කර ඇත. 2015 වසරේ ආනයනය කළ කි.ග්‍රෑ. මිලියන 6.9 සමග සැසඳීමේදී එය සැලකිය යුතු පහත වැටීමකි.

මෙම කලාපය තුළ ඉන්දියාව ලංකා තේ කි.ග්‍රෑ. මිලියන 1.08 ක් ආනයනය කරමින් පළමු තැන හිමිකරගනී. පකිස්තානයට ආනයනය කරනු ලැබූ කළු තේ සාමාන්‍ය මිල එකී තේ වල තත්වය හා නිෂ්පාදිත රට අනුව වෙනස් වෙයි. කෙන්යාව පකිස්තාන තේ වෙළඳපොළෙහි ප්‍රමුඛස්ථානයට පත්ව ඇත. ආනයනය කළ කෙන්යා තේ වල සාමාන්‍ය මිල 30% කින් වැඩි වී ඇත. 2016 වසරේ දී කිලෝ එකක මිල ඇ.ඩො. 3 ඉක්මවීය. පකිස්තාන තේ පරිභෝජකයන් කෙන්යන් තේ රසට හුරු වී ඇත.

අනෙකුත් රටවල් වලින් සපයනු ලබන තේ වල මිල හා සැසඳීමේ දී ශ්‍රී ලංකා තේ වල සාමාන්‍ය මිල ඉහළ මට්ටමක පවතී. ලංකා තේ ආනයනය සම්බන්ධව මාලදිවයින සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කරයි. නමුත් නේපාලය, බංගලිදේශය සහ ඇෆ්ගනිස්තානය ලංකා තේ ආනයනය අඩුකර ඇත.

# 03 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ එක් එක් අංශ මගින් ඉටුකරනු ලබන කාර්යයන්

## 3.1 තේ කොමසාරිස්වරයාගේ අංශය

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ ප්‍රතිපාදන යටතේ පත් කර ඇති තේ කොමසාරිස් වරයා ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක වන තේ කොමසාරිස් වරයාගේ අංශය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන අංශ අතුරින් එකකි. තේ කොමසාරිස් අංශය විසින් 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත සහ 1957 අංක 51 දරණ තේ පාලන පනත අනුව තේ කර්මාන්තයේ සංවර්ධනය, නිෂ්පාදනය, අපහරණය, නියාමනය හා අදාළ නියාමන සහ පාලන කාර්යයන් සම්බන්ධයෙන් වන සියලු කටයුතු පාලනය කරයි.

ගාල්ල, මාතර, රත්නපුර, ගම්පොල, හැටන්, බණ්ඩාරවෙල සහ බදුරලිය යන ප්‍රදේශ වල පිහිටුවා ඇති ප්‍රාදේශිය කාර්යාල 06 ට තේ කොමසාරිස් වරයාගේ අංශයේ කාර්යයන් විමධ්‍යගත කර ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් වරයාගේ අංශය තේ කර්මාන්තයේ චිරස්ථිතිය සඳහා පහත සඳහන් කටයුතුවල නිරත වේ.

තේ නිෂ්පාදකයන් සහ කර්මාන්ත ශාලා ලියාපදිංචිය/බලපත්‍ර ලබාදීම සහ දීර්ඝ කිරීම

තේ දළු වෙළෙන්ඳන් ලියාපදිංචිය සහ අධීක්ෂණය

කසළ තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සහ වෙළෙන්ඳන් ලියාපදිංචිය සහ අධීක්ෂණය

තේ දළු වල තත්වය ඉහළ දැමීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

කර්මාන්තශාලා නවීකරණය සහ නැවත වගාව සඳහා සහනාධාර ලබාදීම

කර්මාන්ත ශාලා සහ වෙළෙන්ඳන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම අධීක්ෂණය කිරීම.

යහපත් නිෂ්පාදන ක්‍රම පිළිබඳව විශේෂ අධීක්ෂණය (GMP)

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ඒකාබද්ධව නිෂ්පාදන තත්ව සහතික වැඩසටහන් පවත්වාගෙන යාම.

තේ න්ෂ්පාදනයට අදාළ සංඛ්‍යා දත්ත ඒකරාශි කිරීම.

තේ ක්ෂෙත්‍රයේ අවභාවිතයන් පිළිබඳව විශේෂ විමර්ශනයන් වල නියැලීම.

1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වගන්තිය යටතේ සාදන ලද තේ කොමසාරිස් වරයා වෙත පවරන නියෝග පහතින් සඳහන්වේ.

(අ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නිමි තේ පිරිසැකසුම සහ සනීපාරක්ෂක තත්ත්ව) නියෝගය 1986.

(ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩල (නැවත වගාව සහ කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර ක්‍රමය)

### 3.1.1. ප්‍රධාන ජයග්‍රහණ

2016 වසරේ දී කොමසාරිස් අංශය දිවයින පුරා තේ ඉඩම් ලියාපදිංචිකිරීමේ කටයුතු ආරම්භ කළා.

2016 දක්වා කොළඹ තේ වෙන්දේසිය ඔස්සේ නිස්සාරක කළු තේ අලවිය සඳහා අවසරය තිබුනේ ප්‍රාදේශිය වැවිලි සමාගම්වලට පමණි. නමුත් දැන් පුද්ගලික ක්ෂේත්‍රයට ද වෙන්දේසිය ඔස්සේ නිස්සාරක කළු තේ අලවිය සඳහා අවසරය ලබා දී ඇත.

ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා වැටුප් වර්ධක ණය සහ උත්සව ණය පිරිනැමීම තේ කොමසාරිස් අංශය විසින් මෙහෙයවනු ලැබිය.

### 3.1.2. නිෂ්පාදකයින් සහ කර්මාන්තශාලා ලියාපදිංචි කිරීම


1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස් ගේ අංශය තේ නිෂ්පාදකයන් සහ තේ කර්මාන්ත ශාලා වලට අදාළ කරුණු වලින් සමන්විත ලේඛනයක් නඩත්තු කරනු ලබයි. පනතට අනුව නිෂ්පාදකයකු ලෙස ලියාපදිංචි වීමට කිසියම් අයෙකු හිමිකම් ලබන්නේ ද යනවග තිරණය කිරීමට කොමසාරිස් අංශය ට බලය තිබේ. සෑම නිෂ්පාදකයෙකුම තේ නිෂ්පාදනය සඳහා මෙන්ම කොළඹ වෙන්දේසිය ඔස්සේ තේ විකිණීම සඳහා තේ මණ්ඩලයෙ හි ලියාපදිංචි විය යුතුයි. ගුණාත්මක තත්වයේ තේ නිෂ්පාදනය ට සුදුසු වන පරිදි තම ගොඩනැගිලි, උපකරණ සහ මෙහෙයුම් ක්‍රම පවතින්නේ ද යනවග සහතික කරලිම සඳහා මෙන්ම කර්මාන්ත ශාලාව විසින් නිපදවන තේ වල ගුණාත්මක බව අධීක්ෂණය කිරීමේදි සහාය වීම, කසල තේ බැහැර කිරීම පාලනය කිරීම සහ සාධාරණ මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසාදි ම සඳහා සියලුම තේ නිෂ්පාදන කර්මාන්ත ශාලා තේ මණ්ඩලයෙහි ලියාපදිංචි වීම අවශ්‍ය වේ.


භූමියේ උස ප්‍රමාණය අනුව සහ මිල දී ගන්නා දළු නිෂ්පාදනය අනුව තේ කර්මාන්ත ශාලා වර්ගකිරීම පහත 3.1 වගුව මගින් දිස්වේ.

වගුව 3.1 මෙහෙයුම් අනුව තේ කර්මාන්තශාලා වර්ගීකරණය

| තත්ත්වය | උඩරට | මැදරට | පහතරට | එකතුව |
|---|---|---|---|---|
| 1. තම තේ දළු වලට පමණක් සීමාවූ | 80 | 16 | 04 | **100** |
| 2. තම තේ දළු සහ මිලදීගත් තේ දළු:- | | | | |
| (අ) තම තේ දළු මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා අඩු | 15 | 32 | 82 | **129** |
| ආ) තම තේ දළු මුළු නිෂ්පාදනයෙන් 50%කට වඩා වැඩි | 54 | 29 | 23 | **106** |
| 3. මිලදීගත් තේ දළු පමණක් | 09 | 35 | 304 | **348** |
| 4. ක්‍රියාත්මක වන ලියාපදිංචි තේ කර්මාන්තශාලා | 167 | 122 | 418 | **707** |
| 5. ක්‍රියාත්මක නොවන ලියාපදිංචි තේ කර්මාන්තශාලා | 30 | 75 | 94 | **199** |
| 6. මුළු ලියාපදිංචි තේ කර්මාන්තශාලා සංඛ්‍යාව | 197 | 197 | 512 | **906** |

වගුව 3.1 කර්මාන්තශාලා වර්ගීකරණය




### 3.1.3 මිලදී ගන්නා තේ දළු සඳහා සාධාරණ මිල ගණන් ගෙවීම

තේ පාලන පනතේ විධිවිධාන වලට අනුව මිලදී ගන්නා තේ දළු වලින් නිෂ්පාදනය කරන කර්මාන්තශාලා තේ කොමසාරිස් විසින් නිර්දේශිත මිල ගණන් මත පදනම්ව එම මිලදී ගන්නා තේ දළු සඳහා ගෙවීම් කිරීමට සිදුවේ. මෙහිදී එම කර්මාන්ත ශාලා විසින් නිපදවන තේ වල නියමිත මිල පිළිබඳව අවධානය යොමුකරමින් කටයුතු කළයුතුයි. කර්මාන්ත ශාලා මගින් අමු තේ දළු වෙළෙන්ඳන් සඳහා සාධාරණ මිල ගණන් ගෙවීමේදී එක් එක් කර්මාන්තශාලා වල මාසික ශුද්ධ විකුණුම් සාමාන්‍යය මත පදනම් ව තීරණය කරනු ලබයි.

නිමි තේ වලින් උපයන මුදල දළු සැපයුම් කරුවන් සහ කර්මාන්ත ශාලා අතර 68:32 අනුපාතය ට අනුව බෙදිය යුතුයි.

කර්මාන්තශාලා විකුණුම් සාමාන්‍ය ය මාසික භූමි පිහිටීම අනුව සාමාන්‍ය ය ඉක්මවන්නේ නම් එම වර්ධනය වූ ආදායම 50:50 අනුපාතයට අනුව දෙපාර්ශවය අතර බෙදනු ලබයි.නිමි තේ වලට අමු දළු වලින් 21.5% ක නිෂ්පාදන අනුපාතයක් මත පදනම් ව මිල සූත්‍රය ගොඩ නගනු ඇත.

### 3.1.3.1 පැහැරහරිනු ලැබූ ගෙවීම්

විමසීමට භාජනය වන වසර තුළදී දෙසැම්බර් 31 දින වනවිට තේ දළු වෙළෙන්ඳන් සඳහා ගෙවීම් පැහැරහරිනු ලැබූ ප්‍රමාණය රුපියල් මිලියන 109 ක් ලෙස ගණන් බලා ඇත. 2016 වසර තුළදී අප විසින් ද රුපියල් මිලියන 18 ක මුදලක් අයකර ගනු ලැබීය. එමෙන්ම ගෙවීම් පැහැර හරින්නන් ගේ ලියාපදිංචිය අත්හිටුවීම මගින් පැහැර හැරෙන මුදල තවදුරටත් එකතු විම වළක්වාලනු ලැබිය. එවැනි කර්මාන්තශාලා වල නැවත ලියාපදිංචිය සලකා බලනු ලබන්නේ සියලුම පැහැර හැරුනු ගෙවීම් පියවීමෙන් පසුව පමණි.

3.2 වගුව පැහැරහරිනු ලැබූ ගෙවීම්

| ප්‍රදේශය | 2016"01.01 දිනට මුදල | 2016 වර්ෂයේදී එකතුවූ මුදල | පියවාගත් සහ ගෙවන ලද මුදල | 2016.12.31 දිනට කුඩා තේ වතු හිමියන්ට ගෙවිය යුතු ශේෂය | වසා දමන ලද කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල | දැනට ක්‍රියාත්මක කර්මාන්තශාලා වලින් ගෙවිය යුතු මුදල |
|---|---|---|---|---|---|---|
| රත්නපුරය | 21638472.34 | - | 11890441.99 | 3781978.21 | 2837256.06 | 944722.15 |
| මාතර | 16972112.35 | 180974.31 | 593622.00 | 16559464.66 | 2532641.60 | 14026823.06 |
| ගම්පොල | 6989306.77 | - | - | 6989306.77 | 2695302.14 | 4294004.63 |
| ගාල්ල | 17005062.48 | 5634070.28 | 1300000.00 | 21339132.76 | 16954671.25 | 4384461.51 |
| බදුරලිය | 26408034.97 | 11029716.10 | 1154453.56 | 36283297.51 | 21544697.07 | 14738600.44 |
| හැටන් | 7487282.59 | - | 2041138.52 | 5446144.07 | 4866803.69 | 579340.38 |
| බණ්ඩාරවෙල | 1003982.42 | 18836697.81 | 1012956.38 | 18827723.85 | 135865.97 | 18691857.88 |
| **එකතුව** | **91538201.78** | **35681458.5** | **18076494.89** | **109143165.4** | **51567237.8** | **57575927.61** |

### 3.1.4. තේ දළුවල තත්ත්ව පාලනය

ගොඩනැගිලි, උපකරණ, යන්ත්‍රසූත්‍ර සහ මෙහෙයුම් ශෛලිය ආදී යෝග්‍ය තත්ත්වයන් වල පැවතිම නිමි තේ වල උසස් තත්ත්වය පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වේ. උසස් තත්ත්වයේ නිමි තේ නිෂ්පාදනය සඳහා ඉහලින් සඳහන් තත්ත්වයන් හේතු නොවන්නේ නම් එවැනි කර්මාන්තශාලා ලියාපදිංචිය අත්හිටුවීමට මෙන්ම අවලංගුකිරීමට 1957 අංක 51 දරණ තේ පාලන පනතට අනුව තේ කොමසාරිස් වරයාට බලය ඇත.

දළු මිල දී ගෙන තේ නිපදවනවිටදී තේ දළු වල තත්ත්ව පාලනය ඉතාමත් වැදගත් වේ. උසස් තත්වයේ තේ දළු යොදාගනිමින් තේ නිපදවන්නේනම් නිමි තේ වල තත්ත්වය උසස්වන අතර කුඩා තේ වතු හිමියන් සහ තේ නිෂ්පාදකයන් යන දෙපාර්ෂවයටම ඉහළ ප්‍රතිලාබ ලැබිය හැකිය. කිසියම් කර්මාන්ත ශාලාවක් ගෙවීම් පැහැරහරින බවට අනාවරණය වන්නේ නම් එම කර්මාන්තශාලාව ට අවවාද කරන අතර පැහැරහරින ලද ගෙවීම් නොගෙවන්නේ නම් කර්මාන්තශාලාවෙහි ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම සිදුකරයි.

අමු තේ දළුවල තත්ත්වය හා අදාළව ගැසට් නිවේදනයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් 2010 දෙසැම්බර් 14 වැනි දින පළකර තිබේ.

### 3.1.4.1 ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාකාරකම්

තේ නිෂ්පාදනයේ ගුණාත්මක බව අධීක්ෂණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා තේ පාලන පනත මගින් තේ කොමසාරිස් අංශය ට බලය ලබාදෙනු ඇත. ඒ අනුව නිමි තේ වල සහ දළු වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති නිර්මාණය කර පවත්වාගෙන යනු ලබයි.

- අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන තත්ත්ව සහතික
- ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා “B leaf 60” වැඩසටහන
- ඇ) උත්සව සමයේදී වැඩිවන අස්වැන්න කළමනාකරණය කිරීමේ වැඩසටහන
- ඈ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය (Low NSA )
- ඉ) තත්ත්ව අධීක්ෂණ ක්‍රම (කාර්ය කණ්ඩායම් මෙහෙයුම්)
- ඊ) කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය
- උ) තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය
- ඌ) කර්මාන්තශාලා පාදක තේ සංවර්ධනය වැඩසටහන
- එ) තේ කර්මාන්තශාලා සහ ගුදම් වල යහපත් පිළිවෙත් ස්ථාපිතකිරීම.
- ඒ) තේ දළු වෙළඳුන් පුහුණු කිරීමේ වැඩසටහන (NIPM මගින්)

### අ) ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය හා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන තත්ත්ව සහතිකය

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කර්මාන්තශාලාවල නිෂ්පාදන ක්‍රියාවලිය සහ අවසන් නිෂ්පාදනය එනම් කළු තේ සහතික කරණය සඳහා තේ කර්මාන්තශාලා සඳහා නිෂ්පාදන සහතික කරණ ක්‍රමයක් ක්‍රියාත්මක කරයි.
භාවිත නීතිමය අවශ්‍යතාවයන් සමග අදාළ ප්‍රමිති තුළ නිශ්චිත කර ඇති පරිදි සැකසුම් පාලන සහ නිෂ්පාදන පරීක්ෂණ පිළිබඳ අමතර අවශ්‍යතා සමග බැඳුනු ගුණාත්මක කළමනාකරණ පද්ධතියක අත්‍යාවශ්‍ය මූලිකාංග ඒකරාශි කරගනිමින් මෙම සහතික කරණ ක්‍රමය ක්‍රියාත්මක වේ.
පාරිභෝගිකයාට කළු තේ වල ගුණාත්මක බව සඳහා තුන්වන පාර්ෂවීය සහතික කරණයක් ලබා දීම සඳහා අපක්ෂපාතිව, විෂමතාවයකින් තොරව සහ විනිවිද බාවයකින් යුක්තව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන සහ ශ්‍රී ලංකා තේ මණ්ඩල නිෂ්පාදන සහතික කරණ ක්‍රමය ක්‍රියාත්මක වේ.

### ආ) තේ දළුවල ප්‍රමිතිය වැඩිදියුණු කිරීම සඳහා “B Leaf 60”වැඩසටහන

පසු අස්වනු හානි අවමකරගැනීම සහ දළු නෙළීමේ ප්‍රමිති වැඩිදියුණු කිරීම මගින් දළුවල ගුණාත්මක බව ඉහළනැන්වීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්ම කෙරුණි. ක්ෂේත්‍රය තුළ මෙම වැඩසටහන තවදුරටත් සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී. එහි විශාල අභිවෘද්ධියක් දක්නට ලැබේ. වැඩසටහන ආරම්භයේදී තේ දළු වල ප්‍රමිතිය, පැවතියේ හොඳම දළු 33% , හොඳම තත්ත්වයට වඩා අඩු 32% සහ බාල තේ දළු 35% ආදී වශයෙනි. නමුත් මේ වනවිට තේ දළු වල තත්ත්වය හොඳම දළු 42% , හොඳම තත්ත්වයට වඩා අඩු 24% සහ බාල තේ දළු 34% ආදී වශයෙන් වේ.

“B Leaf 60” වැඩසටහන ක්‍රියාත්මක කළේ අවමවශයෙන් 60% ක මට්ටමක හොඳම අමු තේ දළු වල තත්ත්වය පවත්වාගෙන යාමේ ඉලක්කය ඇතිවයි. මෙම ඉලක්කය දිනා ගැනීම සඳහා මේවන විටත් පහත සඳහන් උපාය මාර්ග ක්‍රියාත්මකකර තිබේ.

1. පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්
2. දළු භාවිතයේදී යොදාගත හැකි නියෝග පැනවීම
3. පසු අස්වනු තාක්ෂනය වැඩිදියුණු කිරීම පිණිස මූලාධාර ලබාදීම
4. පසු අස්වනු හානි අවම කිරීම සඳහා සහනාධාර ක්‍රමය

## ඇ) උත්සව සමයේ අස්වනු හානිය වැලැක්වීම සඳහා වැඩසටහන

උත්සව සමයේ දි දීර්ග කාලයක් තේ කර්මාන්ත ශාලා වසා තැබීමෙන් සිදුවන අස්වනු හානිය අවම කරගැනීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙම වැඩසටහන 2005 වසරේ සිට ක්‍රියාත්මක වන අතර ඒ යටතේ නොයෙකුත් ක්‍රියාකාරකම් හඳුන්වා දෙමින් අස්වනු හානිය මුළුමනින්ම පාහේ පාලනය කිරීමට තේ කොමසාරිස් අංශයට හැකි වී ඇත.

## ඈ) පහළ ශුද්ධ විකුණුම් සාමාන්‍ය උපාය මාර්ගය (Low NSA Strategy)

ශුද්ධ විකුණුම් සාමාන්‍යය හිනිපෙතේ පහළින්ම සිටින තේ කර්මාන්ත ශාලා සඳහා මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි අරමුණ වන්නේ තේ දළු වල ප්‍රමිතිය සහ තේ නිෂ්පාදනයේ ප්‍රමිතිය වැඩිකිරීම මගින් එවැනි කර්මාන්තශාලා වල ශුද්ධ විකුණුම් සාමාන්‍ය මට්ටම ඉහළට ගැනිමයි.

## ඉ) ගුණාත්මක බව අධීක්ෂණ ක්‍රමය (කාර්ය කණ්ඩායම් මෙහෙයුම)

2016 වසර තුළදී තේ කොමසාරිස් අංශයේ නිලධාරීන් විසින් තේ කර්මාන්තශාලා හදිසි පිරික්සීම් 178 වාරයක් සිදුකර ඇත.

වගුව 3.3: කාර්ය කණ්ඩායම් මෙහෙයුම්

| ප්‍රදේශය | පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| බණ්ඩාරවෙල | 17 |
| ගම්පොල/ හැටන් | 43 |
| රත්නපුරය | 12 |
| මාතර | 52 |
| ගාල්ල | 38 |
| මතුගම | 16 |
| **එකතුව** | **178** |

## ඊ) කර්මාන්තශාලා නවීකරණය කිරීම සහ තේ නැවත වගාකිරීම සඳහා සහනාධාර ලබාදීම

දේශීය අරමුදල් යටතේ රාජ්‍ය භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අයවැය මගින් තේ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කර ඇත. මෙම වෙන්කළ මුදල් වසර තුළ දී කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගා සහනාධාර ක්‍රමය සඳහා උපයෝගි කරගනු ලැබිය. 2016 වසර සඳහා කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගාව පිණිස සමාගම් හා පුද්ගලික අංශය ට අරමුදල් සපයා ඇත.

පහත වගුව මගින් 2016 වසරේදි කර්මාන්තශාලා නවීකරණය සහ තේ නැවත වගා සහනාධාර ක්‍රමය සඳහා ගෙවීම් කර ඇති ආකාරය පෙන්වා දේ.

වගුව 3.4: සහනාධාර ගෙවීම්

| ප්‍රදේශය | නැවත වගා සහනාධාර යෝජනාක්‍රමය | | කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනාක්‍රමය | | |
|---|---|---|---|---|---|
| , | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල | ව්‍යාප්තිය හෙක්. | අයදුම්පත් සංඛ්‍යාව | ගෙවූ මුදල |
| බණ්ඩාරවෙල | 05 | 923750.00 | 4.75 | 0 | 1000000.00 |
| ගම්පොල /හැටන් | 204 | 23028280.00 | 192.45 | 13 | 6653616.31 |
| රත්නපුරය | 25 | 12983534.00 | 57.11 | 13 | 3106650.00 |
| මාතර | 09 | 3226058.50 | 17.72 | 18 | 7682367.76 |
| ගාල්ල | 01 | 2623273.10 | 16.57 | 01 | 6931736.33 |
| මතුගම | 05 | 1832400.00 | 11.88 | 0 | 50534.00 |
| **එකතුව** | **249** | **44,617,295.60** | **300.48** | **45** | **25,424,904.40** |

## උ)කර්මාන්තශාලා පාදක තේ සංවර්ධනය වැඩසටහන

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය එක්ව කුඩා තේ වතු හිමියන්ගේ සහ කර්මාන්තශාලාවල ඵලදායිතාවය නැන්වීමේ අරමුණ ඇතිව මෙම කර්මාන්තශාලා පාදක තේ සංවර්ධන වැඩසටහන සැලසුම් කර ඇත.

මෙම වැඩසටහන යටතේ කුඩා තේ වතු හිමියන්ගේ ඵලදායිතාවය සහ අමු තේ දළු හසුරුවාගැනීම පිළිබඳ අධීක්ෂණය සඳහා ව්‍යාප්ති නිලධාරියෙකු පත්කිරීමට සැලසුම් කර ඇත. තේ වගා කෙරෙන සියළුම ප්‍රදේශවල මෙම වැඩසටහන ව්‍යාප්ත කිරීම සඳහා 2014 වසරේදි සැලසුම්කෙරුනි.

### ඌ) තේ කර්මාන්තශාලාවල යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMPs) ස්ථාපිත කිරීම

මෙම වැඩ සටහන යටතේ තේ කර්මාන්ත ශාලා 1109 ක් ඇගයීමට ලක් කෙරුනු අතර තේ නිෂ්පාදන ක්‍රියාවලිය උසස් තත්ත්වයකට ගෙන ඒමට පියවර ගනුලැබිය.

වගුව 3.5: ප්‍රාදේශිය වශයෙන් යහපත් නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව

| ප්‍රදේශය | යහපත් නිෂ්පාදන පිළිවෙත් තක්සේරුව |
|---|---|
| බණ්ඩාරවෙල | 99 |
| ගම්පොල/ හැටන් | 322 |
| රත්නපුරය | 109 |
| මාතර | 216 |
| ගාල්ල | 207 |
| මතුගම | 156 |
| එකතුව | **1109** |

### එ) කසල තේ පිරිසැකසුම් කිරීම

කසල තේ පිරිසැකසීම යනු විනාශ නොකළ කසල තේ වලින් භාවිතා කළ හැකි තේ වෙන් කර ගැනීමේ ක්‍රියාවලියයි. කසල තේ පිරිසැකසීමේ මධ්‍යස්ථාන වලට බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන 2009 වසරේ සිට ක්‍රියාත්මක වේ. 3.7 වගුව මගින් 2016 වසර තුළදී ප්‍රාදේශිය වශයෙන් නිකුත් කළ සමස්ත බලපත්‍ර සංඛ්‍යා ව පෙන්නුම් කෙරේ.

### ඒ) තේ දළු වෙළෙන්දන් සඳහා බලපත්‍ර ලබාදීම

තේ පාලන පනතට අනුව සියලූ තේ දළු වෙළෙන්දන් තේ කොමසාරිස් අංශයෙන් වාර්ෂිකව බලපත්‍ර ලබාගතයුතු වේ. තේ කොමසාරිස් අංශය මගින් සෑම ලියාපදිංචි තේ දළු වෙළෙන්දෙක්ම අධීක්ෂණය කරනු ලබයි. පහත වගුව මගින් ප්‍රාදේශිය වශයෙන් තේ දළු වෙළෙන්දන් ව්‍යාප්ත වී ඇති ආකාරය පෙන්නුම් කෙරේ.

වගුව 3.6: 2016 වසර තුළදී තේ දළු වෙළඳාම සඳහා ලබා දී ඇති බලපත්‍ර ගණන

| ප්‍රදේශ | 2016.01.01 දිනට ප්‍රකාශිත බලපත්‍ර සංඛ්‍යාව | බලපත්‍ර අලූත් කිරීම | නව බලපත්‍ර නිකුත් කිරීම | 2016.12.31 දිනට තේ දළු වෙළඳාම සඳහා ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 144 | 150 | 29 | 170 |
| ගම්පොල/ හැටන් | 290 | 244 | 36 | 280 |
| මාතර | 349 | 315 | 07 | 322 |
| ගාල්ල | 355 | 306 | 14 | 320 |
| රත්නපුරය | 597 | 486 | 51 | 537 |
| මතුගම | 271 | 203 | 20 | 223 |
| **එකතුව** | **2006** | **1704** | **157** | **1861** |

වගුව 3.7: 2016 වර්ෂයේදී කසල තේ පිරිසැකසුම් මධ්‍යස්ථාන සඳහා බලපත්‍ර නිකුත්කිරීම

| ප්‍රදේශය | **01.01.2016** දින වන විට ලියාපදිංචි සැකසුම්කරුවන් | වර්ෂය තුළ අලූත් කිරීම් | වර්ෂය තුළ අලුතින් නිකුත් කිරීම් | 2016.12.31 දිනට පිරිසැකසුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව | 2016.12.31 දිනට නිකුත්කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| බණ්ඩාරවෙල | 01 | 01 | - | 01 | 175 |
| ගම්පොල/ හැටන් | 249 | 231 | 09 | 240 | 3236 |
| මාතර | 14 | 05 | 01 | 06 | 525 |
| ගාල්ල | 36 | 29 | 01 | 30 | 690 |
| රත්නපුරය | 09 | 04 | 0 | 04 | 992 |
| මතුගම | 03 | 04 | 01 | 05 | 328 |
| **එකතුව** | **312** | **274** | **12** | **286** | **5946** |

වගුව 3.8: ජාත්‍යන්තර සහතිකකරණය

| කලාපය | GMP | වෙනත් ජාත්‍යන්තර සහතිකකරණය |
|---|---|---|
| බණ්ඩාරවෙල | 0 | 23 |
| ගම්පොල/ හැටන් | 1 | 81 |
| රත්නපුරය | 1 | 23 |
| මාතර | 2 | 19 |
| ගාල්ල | 0 | 10 |
| මතුගම | 0 | 9 |
| **එකතුව** | 4 | 165 |

## 3.2 තේ අපනයන අංශය

1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනතේ බලතල හා කාර්යයන් සහ 1975 අංක 14 දරණ ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත ට අනුව පනවන ලද නියෝග තේ අපනයන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. තේ අපනයන අංශය තේ අපනයන කරුවන්, තේ ඇසුරුම් කරුවන්, තේ ගුදම්, තේ ආනයන කරුවන් සහ තේ ඇසුරුම් වර්ග ලියාපදිංචිය මෙන්ම තේ සමුද්ධරණය, තේ වල අවම ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය, තේ අපනයනය පිළිබඳ අධිකාරිත්වය දැරීම, තේ අපනයනය පිළිබඳ සංඛ්‍යා ලේඛන සම්පාදනය සහ ද්විපාර්ශවීය නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තේ අපනයනය අධීක්ෂණය යන කාර්යයන් වලට අදාළව කටයුතු කරයි.

### 3.2.1 ප්‍රධාන කාර්යයන්

#### 3.2.1.1 ඉරාන අපනයන සඳහා යහපත් නිෂ්පාදන ක්‍රමවේද සහතිකකරණය

ඉරානයට අපනයනය කිරීමට සුදානම් කළ තේ තොග ගබඩා කර ඇති ගුදම් වල තත්ත්වය තක්සේරු කිරීම සඳහා 2016 වසරේදී විශේෂ මෙහෙයුමක් සිදුකරනු ලැබීය. තේ මිශ්‍ර කිරීමේ ක්‍රියාවලිය, ඇසුරුම් කිරීම සහ ගබඩා කිරීමේ කටයුතු තක්සේරුකිරීම මගින් මෙන්ම දේශිය සහ ජාත්‍යන්තර තේ ප්‍රමිති වල මගපෙන්වීම යටතේ සිදුකරන සංවේදි විශ්ලේෂණයන් හා විද්‍යාත්මක පරීක්ෂණයන් යොදාගනිමින් අවසන් නිෂ්පාදනයන් ඇගයීම මගින් මෙම ගුදම් වල යහපත් නිෂ්පාදන ක්‍රමවේද තක්සේරුකිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙම සහතික කරණය ආරම්භකරනු ලැබිය.

#### 3.2.1.2 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අපනයන අංශයේ දින 7 පැය 24 මෙහෙයුම් සහ ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් මධ්‍යස්ථානයේ දී තේ තොග පිළිබඳව සිදුකරන ඒකාබද්ධ විමර්ශනය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය දින හතේ ම පැය විසිහතර ම විවෘතව තැබීම කරගෙන යනු ලබයි. මෙම වසරේදි ද මෙහෙයුම් කාලය රාත්‍රි 10.00 දක්වා දීර්ග කරා.

මෙමගින් තේ අපනයන කරුවන්ට තම රේගු නිර්යාත ප්‍රකාශන(Cusdec )ඉදිරිපත් කිරිමත් ප්‍රමාදයකින් තොරව ඒවාට ප්‍රතිචාර ලබාගැනිමටත් පහසුකම් සැපයීම සිදු වේ. තවදුරටත්, ශ්‍රී ලංකා රේගුවේ සහයෝගය ඇතිව අංක 478 /3C, කේ. සිරිල් සී පෙරේරා මාවතෙහි පිහිටි අපනයන පහසුකම් මධ්‍යස්ථානයේ දි තේ වල තත්වය සහතික කිරීම සඳහා වඩාත් විනිවිදභාවයකින් යුතුව, රේගු සීමා ක්‍රියාපටිපාටීන්ට සහ අපනයන නැව් භාණ්ඩ නිශ්කාශනය සඳහා බාධා ඇති නොකර, අපනයනයට සුදානම් තේ තොග පිළිබඳ ඒකාබද්ධ පරික්ෂාව සඳහා විශේෂ විමර්ශන සහ වාණිජ පහසුකම් ඒකකයේ මෙහෙයුම් කටයුතු කරගෙන යනු ලබයි.

### 3.2.2. ලියාපදිංචි කිරීම

අපනයන කරුවන්, ඇසුරුම් කරුවන්, ගුදම් සහ ආනයන කරුවන් ලියාපදිංචිය හා ලියාපදිංචිය අලුත් කිරීම තේ අපනයන අංශයේ ප්‍රධාන කාර්යභාරයන් අතුරින් එකකි.
ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී තිබීම එමෙන්ම තේ ගබඩාකිරීම, මිශ්‍ර කිරීම හා ඇසුරුම් සඳහා ලියාපදිංචි ගබඩාවක් තිබීම, තේ රස බැලීමේ පහසුකම් සහිතව සුදුසුකම් ලත් තේ රස බලන්නෙකු සිටීම සහ අවම වශයෙන් රුපියල් මිලියනයක ප්‍රාග්ධනයක් (ආයෝජනය කළ) තිබීම තේ අපනයනකරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම්කිරීමට සුදුසුකම් වේ.
1986 ජනවාරි 28 දින අංක 386/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කළ 1986 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ඇසුරුම්කරුවන් ලියාපදිංචි කිරීමේ) නියෝගය පරිදි දේශිය පරිභෝජනය සඳහා හෝ වෙනත් යම් ආකාරයක තේ ඇසුරුම් ව්‍යපාර වල යෙදෙන ඕනෑම පුද්ගලයෙකු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි වීම අත්‍යවශ්‍ය වේ. මෙම සෑම ලියාපදිංචියක් ම වසරක කාලයකට සීමා වේ. ලියාපදිංචිය වාර්ෂිකව දීර්ගකර ගතයුතු වේ.
1959 අංක 16 දරණ තේ (බදු හා අපනයන පාලන) පනත යටතේ තේ අපනයන කරුවකු ලෙස ලියාපදිංචි වී ඇති ඕනෑම අයෙකු තේ ආනයන කරුවකු ලෙස ලියාපදිංචි විමට ද සුදුසු කම් ලබයි.

වගුව 3.9: අපනයනකරුවන්, ඇසුරුම්කරුවන්, ගුදම්, තැරැව්කරුවන් සහ ආනයනකරුවන් ලියාපදිංචිය

| ලියාපදිංචි කිරීම් | 2016.01.01 දිනට | 2016 වර්ෂය තුළදී (නව ලියාපදිංචි කිරීම්) | 2016.12.31 දිනට මුළු සංඛ්‍යාව |
|---|---|---|---|
| අපනයනකරුවන් | 347 | 37 | 359 |
| ඇසුරුම්කරුවන් | 451 | 150 | 553 |
| ගුදම් | 262 | 32 | 261 |
| ආනයනකරුවන් | 129 | 08 | 129 |
| තැරැව්කරුවන් | 8 | - | 8 |

මූලාශය ශ්‍රී ලංකා තේ මණ්ඩලය

2003 මාර්තු මස 20 වන දින අංක 1280/8 දරන අති විශේෂ රජයේ ගැසට් පත්‍රය මගින් පළ කළ නියෝග සහ 1986 සැප්තැම්බර් මස 10 වන දින අංක 418/11 දරන අති විශේෂ රජයේ ගැසට් පත්‍රය මගින් පළ කළ නියෝග මගින් සංශෝධිත 1984 දෙසැම්බර් මස 05 වන දින අංක 326/17 දරන අති විශේෂ රජයේ ගැසට් පත්‍රය මගින් පළ කළ 1984 ශ්‍රී ලංකා තේ මණ්ඩල (තේ ගබඩා කිරීමේ) නියෝගය පරිදි එක් අවස්තාවක දී කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ඕනෑම ප්‍රමාණයක් තේ ගබඩා කිරීම සඳහා භාවිතා කළ හැකි එමෙන්ම තේ ගබඩා කිරීම සඳහා සුදුසු යැයි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සෑහීමකට පත්වෙන ගබඩාවලට, ඉහත සඳහන් නියෝග වල සඳහන් විධිවිධාන යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි විය හැකිය.

ශ්‍රී ලංකා තේ සමග කලවම් කළ විදේශීය සම්භවයක් සහිත තේ අඩංගු සිල්ලර බහාලුම් 1981 ශ්‍රී ලංකා තේ මණ්ඩල (ආනයන සහ අපනයන) නියෝග යටතේ අපනයනය කරනු ලබයි. එම බහාලුම් / ඇසුරුම් වල "A Blend of Ceylon and other origin Teas packed in Sri Lanka" (ශ්‍රී. ලංකා වේ අසුරන ලද ලංකා සහ විදේශීය සම්භවයක් සහිත තේ මිශ්‍රණයකි.) යනුවෙන් හෝ "Other Origin Teas packed in Sri Lanka"( ශ්‍රී ලංකා වේ අසුරන ලද විදේශීය සම්භවයක් සහිත තේ) යන පාඨ පමණක් යෙදිය යුතුයි. සියලුම බහාලුම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කළ යුතුයි. සියලුම ලියාපදිංචි තේ අපනයන කරුවන් අපනයනය සඳහා අවසරය ලබාගැනීම පිණිස අවශ්‍ය වෙනත් ලේඛන සමග රේගු නිර්යාත ප්‍රකාශන (CUSDECs) තේ අපනයන අංශය වෙත ඉදිරිපත් කළ යුත්තේ ASYCUDA ක්‍රමය ඔස්සේය. අපනයනයට සූදානම් කළ තේ තොග අපනයනය හා අදාළ ප්‍රමිතීන් වලට යෝග්‍ය වේ දැයි සැකහැර දැනගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිලධාරීන් පිරිසක් එම තේ පරීක්ෂාවට බඳුන් කරයි.

### 3.2.3. තේ ආනයනය කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ කිලෝ ග්‍රෑම් 4,576,048.32 ක ප්‍රමාණයක් ආනයනය කිරීම සඳහා ආනයන බලපත්‍ර 510 ක් නිකුත් කර ඇත. නමුත් 2016 වසරේදී තේ කිලෝ ග්‍රෑම් 4,660,293 ක ප්‍රමාණය ක් ආනයනය කර ඇත.

වගුව 3.10:

| සැබෑ ආනයනයන් - ජනවාරි සිට දෙසැම්බර් 2016 | | | | |
|---|---|---|---|---|
| **රට** | **වර්ගය** | **ආනයනික ප්‍රමාණය (කි.ග්‍රෑ.)** | **මි.ර.ගෑ. අගය (රු.)** | **අගය (රු.)** |
| **චීනය** | හරිත තේ | 1,173,603 | 423.29 | 496,775,853 |
| | විශේෂ තේ | 192,303 | 457.43 | 87,964,538 |
| | සී.ටී.සී. | 14,831 | 221.19 | 3,280,454 |
| | සුදු තේ | 15,838 | 573.99 | 9,090,885 |
| | **උප එකතුව** | **1,396,575** | **427.55** | **597,111,730** |
| **ඉන්දියාව** | සී.ටී.සී. | 2,198,540 | 258.78 | 568,937,393 |
| | විශේෂ (කලු තේ) | 239,143 | 654.94 | 156,624,249 |
| | හරිත තේ | 16,786 | 265.48 | 4,456,316 |
| | කැෆේන් ඉවත් කළ තේ | 12,030 | 864.08 | 10,394,828 |
| | **උප එකතුව** | **2,466,499** | **300.19** | **740,412,786** |
| **කෙන්යාව** | සී.ටී.සී. | **638,618** | **329.42** | **210,375,011** |
| **ඇ.එ.ජ.** | හරිත තේ | 3,383 | 471.72 | 1,595,832 |
| | විශේෂ තේ | 172 | 6,320.73 | 1,087,166 |
| | **උප එකතුව** | **3,555** | **754.71** | **2,682,998** |
| **තායිවානය** | හරිත තේ | 58 | 833.83 | 48,362 |
| | විශේෂ තේ | 100 | 9,106.18 | 910,618 |
| | **උප එකතුව** | **158** | **6,069.49** | **958,980** |
| **ජපානය** | විශේෂ තේ | 883 | 1,634.98 | 1,443,684 |
| | හරිත තේ | 3,625 | 2,378.46 | 8,621,928 |
| | **උප එකතුව** | **4,508** | **2,232.83** | **10,065,612** |
| **එක්සත් රාජධානිය** | විශේෂ තේ | 540 | 4,649.99 | 2,510,994 |
| | කැෆේන් ඉවත් කළ තේ | 300 | 1,351.60 | 405,480 |
| | **උප එකතුව** | **840** | **3,471.99** | **2,916,474** |
| **වියට්නාමය** | හරිත තේ | **115,800** | **309.26** | **35,812,153** |
| **රුවන්ඩාව** | සී.ටී.සී. | **14,000** | **271.04** | **3,794,500** |
| **ඩෙන්මාර්කය** | විශේෂ තේ | **70** | **770.00** | **53,900** |
| **උගන්ඩාව** | සී.ටී.සී. | **13,120** | **308.70** | **4,050,144** |
| **ස්විස්ටර්ලන්තය** | විශේෂ තේ | 2,200 | - | - |
| | කැෆේන් ඉවත් කළ තේ | 2,500 | 1,266.78 | 3,166,950 |
| | **උප එකතුව** | **4,700** | **673.82** | **3,166,950** |
| **හොන්කොන්** | හරිත තේ | **575** | **7,027.80** | **4,040,985** |
| **මියන්මාරය** | සී.ටී.සී. | **1,000** | **542.05** | **542,050** |
| **ජර්මනිය** | කැෆේන් ඉවත් කළ තේ | 125 | 1,485.51 | 185,689 |
| | සුදු තේ | 150 | 4,201.46 | 630,219 |
| | **උප එකතුව** | **275** | **2,966.94** | **815,908** |
| **මුළු එකතුව** | | **4,660,293** | **346.93** | **1,616,800,181** |

### 3.2.4. නිම් තේ සඳහා ISO 3720 අවම ගුණාත්මක තත්ත්වය පවත්වාගෙන යාම

නිම් තේ, අනුමත ප්‍රවර්ග යටතේ පවතී ද යන වගත් ISO 3720 ප්‍රමිතියට අනුකූල වන්නේ ද යන වගත් මෙන්ම කිසියම් හෝ අපවිත්‍ර වීමකින් තොර වූ තේ ද යනවගත් නිර්ණය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සියලුම තේ නියැදි සහ තේ කර්මාන්තශාලා මගින් ගෙන එන, ආනයනය කර මෙ රටට ගොඩ බාන ලද, අපනයනය සඳහා සූදානම් කළ තේ වල නියැදි ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පත් කරන ලද තේ රස බලන්නන් ගේ විශේෂඥ මණ්ඩලය විසින් පරීක්ෂාවට ලක්කරයි. අපනයනය සඳහා සුදුසු නිම් තේ පමණයි මෙමගින් අවසරය ලබන්නේ.

වගුව 3.11 එක් එක් නියැදි පරීක්ෂණ මට්ටම් වලදී අනාවරණය වූ තත්ත්ව ඌනතා සංඛ්‍යාව

| නියැදි කරන ආකාරය | නියැදි සංඛ්‍යාව | ISO මට්ටමට වඩා පහළ බව සහ අපවිත්‍රබව අනාවරණය වූ ගණන |
|---|---|---|
| අපනයන අංශය මගින් ගන්නා ලද පූර්ව වෙන්දේසි නියැදි | 2447 | } 2028 |
| පූර්ව වෙන්දේසි ඉවත්කර ගැනීම් | 1931 | |
| වෙන්දේසියට පසු | 8551 | 39 |

### 3.2.5. පරිභෝජනය සඳහා සුදුසු නොවන තේ විනාශ කිරීම

වෙන්දේසියට පෙර, නැවිගත කිරීමට පෙර සහ විශේෂ විමර්ශන වලදී මිනිස් පරිභෝජනයට සුදුසු නොවන බවට හඳුනා ගන්නා නිම් තේ, අපනයන අංශයේ අධීක්ෂණය යටතේ විනාශකරනු ලබයි. 2016 වසර තුළ දී මෙම අංශය මගින් ඉහත සඳහන් අවස්ථාවන්හි දී හඳුනාගත් මිනිස් පරිභෝජනයට නුසුදුසු වන නිම් තේ කිලෝ ග්‍රෑම් 446,205 ක් විනාශකර ඇත.

### 3.2.6. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයනය

ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම අනුව ශ්‍රී ලංකාව තේ සඳහා වන තීරුබදු අනුපාත සලාකය (TRQ) ප්‍රයෝජනය ට ගනී. කෙසේ නමුත් 2016 වසරේ දී සැලකිය යුතු තරමින් මෙම තීරුබදු අනුපාත සලාකය(TRQ) ප්‍රයෝජනය ට ගෙන ඇති බවක් දක්නට නොලැබේ.

වගුව 3.12: නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු අනුපාත සලාකය භාවිතය (2016)

| නිදහස් වෙළඳ ගිවිසුම | වාර්ෂික සලාකය කි.ග්‍රෑ. | මුළු අපනයන ප්‍රමාණය කි.ග්‍රෑ. |
|---|---|---|
| ඉන්දු-ශ්‍රී ලංකා | 15,000,000 | 888,328.27 |
| පාකිස්තාන-ශ්‍රී ලංකා | 10,000,000 | 72,349.00 |

### 3.2.7. තේ ආපසු ගෙන්වා ගැනීම

පිටත්කර හැරී තේ තොගයක් විදේශීය ගැනුම්කරු විසින් බාර නොගන්නේ නම් දේශීය අපනයනකරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම තේ තොගය ආපසු ගෙන්වා ගතයුතු වේ. මෙම තේ තොගය අපනයනය කිරීම හෝ නැවත භාවිතය සඳහා අවසර ලබා දෙන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් නැවත පරීක්ෂණයක් කිරීමෙන් පසුවයි.

## 3.3. තේ ප්‍රවාරණ අංශය

### 3.3.1. අංශය විසින් නිරතවන මූලික කාර්යයන්

පහත සඳහන් කාර්යයන් ඔස්සේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් දේශියව සහ විදේශීය තේ වෙළඳපොළවල් වල ලංකා තේ ප්‍රවාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තේ ප්‍රවාරණ අංශයේ ප්‍රධාන වගකීම වේ.

1. ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රවාරණය
2. තේ වර්ගීය ප්‍රවර්ධනය
3. ජාත්‍යාන්තර ආහාර සහ පානවර්ග වෙළඳ සල්පිල් සහ ප්‍රදර්ශන සඳහා සහභාගී වීම.
4. සියලුම වැදගත් තේ පරිභෝජන රටවල් පිළිබඳව උපායමාර්ගික වෙළඳපොළ පැතිකඩ සම්පාදනය සහ බෙදාහැරීම
5. තේ ක්ෂේත්‍රය සඳහා ප්‍රතිපත්ති සැකසීමේදී වැවිලි කර්මාන්ත අමාත්‍යාශය ට සහයෝගය දැක්වීම
6. තරඟකරුවන් ගේ ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීම
7. සිංහ ලාංඡනය ලියාපදිංචිය සහ අධීක්ෂණය
8. භූගෝලීයමය සලකුණු ලෙස ලංකා තේ නාමය සහ සෙසු ප්‍රාදේශීය නාමයන්/ ලාංඡන ආරක්ෂා කිරීම
9. ඕසෝන් හිතකර පිරිසිදු ලංකා තේ ලාංඡනය ලියාපදිංචිය සහ පෞද්ගලික අංශයේ ඇසුරුම්කරුවන් හට බලය පැවරීම
10 දේශියව තේ ප්‍රවාරණය කිරීම

### 3.3.2. විදේශ තේ ප්‍රවාරණ කාර්යාල සහ වෙළඳපොල ආවරණය

එ.අ.එ. රාජ්‍ය, රුසියාව සහ චීනය යන රටවල් වල තානාපති සේවාවන් හා සම්බන්ධව, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එම රටවල්වල විදේශීය තේ ප්‍රවාරණ කාර්යාල තුනක් පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව එ.අ.එ. රාජ්‍ය ය කාර්යාලය මැද පෙරදිග/ ගල්ෆ්/උතුරු අප්‍රිකා යන කලාපයන් ආවරණය කරන අතර මොස්කව් වල තිබෙන කාර්යාලය මගින් රුසියානු සමූහාණ්ඩුව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රාජ්‍ය ය (CIS) කලාපයේ ජනරජයන් වල වෙළඳපොළ මෙහෙයවනු ලබයි. චීනයේ ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය සඳහාත් එමෙන්ම ශ්‍රී ලංකා ට හිමි වෙළඳපොළ කොටස තවදුරටත් ඉහළ නන්වා ගැනීම සඳහාත් මෑතදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නියෝජිත කාර්යාලයක් එහි ස්ථාපිත කර ඇත. ඊට අමතරව සෙසු විදේශීය වෙළඳපොළවල් වල ප්‍රවාරණ කටයුතු කොළඹ පිහිටි තේ ප්‍රවාරණ අංශය මගින් ඒ ඒ රටවල්වල වෙළඳ කාර්යාල / විදේශීය තානාපති සේවාවන් වල සහයෝගය ඇතිව කරගෙන යනුලබයි.

### 3.3.3. වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙළඳ සල්පිල් වල ට සහභාගි වන ශ්‍රී ලංකා තේ අපනයන සමාගම් වලට පහසුකම් සපයමින් තෝරාගත් වෙළඳපොළවල් තුළ සන්නාමයක් ලෙස 'Ceylon Tea' නාමය සහ සහභාගි වන සමාගම් වල සන්නාමයන් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරයි.

**2016 වසරේ දී ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් වෙළඳ සල්පිල් වලට සහභාගි විය.**

1. Prodexpo , මොස්කව් - රුසියාව (පෙබ. 8-12)
2. Gulfood, ඩුබායි - එ. අ. එ. රාජ්‍ය (පෙබ. 21-25)
3. Foodex , ටෝකියෝ - ජපානය (මාර්තු 8 - 11 )
4. Expo Pakistan ,කරච්චි - පකිස්ථානය ( මාර්තු 9 -11 )
5. WORLD FOOD Uzbekistan , ටෂ්කන්ට් -උස්බෙකිස්ථානය ( මාර්තු 16 -18 )
6. Cairo Int'l Fair ,කයිරෝ - ඊජිප්තුව (මාර්තු13 -27 )
7. Global Dubai Tea Forum - ඩුබායි (අප්‍රේල් 5 - 7 )
8. Sigapore Expo - සිංගප්පූරුව ( අප්‍රේල් 12 - 15 )
9. Anufood Eurasia - තුර්කිය (අප්‍රේල් 14 - 16)
10. SIAL Canada, මොන්ට්‍රියල් - කැනඩා (අප්‍රේල් 13 - 15 )
11. The Natural Food show , ලන්ඩනය - එ. රාජධානිය (අප්‍රේල් 17 - 18 )
12. World Food Warsaw - පෝලන්තය (අප්‍රේල් 19 -21)
13. SIAL China " Iekayhs- චීනය (මැයි 5 -7)
14. Seoul Food, සෝල් - කොරියා (මැයි 10 -13)
15. Agro Food & Beverage, ටෙහෙරාන් -ඉරානය (මැයි 26 - 29 )
16. World Food Azerbaijan, බකු - අසර්බයිජාන් (මැයි 25 - 27)
17. World Tea Expo. ලාස් වෙගාස් - ඇ.එ.ජ. (ජූනි15-17)
18. Saitex ,ජොහැන්ස්බර්ග් - දකුණු අප්‍රිකාව (ජූනි 19-21)
19. Food Taipei , තායිපේ - තායිවාන් (ජූනි 22-25 )
20. Summer Fancy Food , නිව්යෝක් - ඇ.එ.ජ (ජූනි 26-28)
21. AFRIXIM EXPO Trade exhibition - සීෂෙල්ස් (ජූලි 21 - 23)
22. Malaysia Int' Food & Bev 'Trade Fair - මලයාසියාව (ජූලි 27-29 )
23. Int' Tea Fair, හොංකොං- (අගෝස්තු 11 -13)
24. World Food , ස්ථාන්බුල් - තුරුකිය (1-4 සෙප්.)
25. COTECA , හැම්බර්ග් - ජර්මනිය (සෙප්. 7-9 )
26. Fine Food, මෙල්බර්න් - ඕස්ට්‍රේලියාව (සෙප්. 12-15)
27. World Food, මොස්කව් -රුසියාව (සෙප්. 12-15)
28. World Tea & Coffee Expo, මුම්බායි - ඉන්දියාව (ඔක්. )
29. SIAL France - ප්‍රංශය (ඔක්.16 - 20)
30. Xiamen Tea Fair , සියාමන්- චීනය (ඔක්. 20-24 )
31. World Food, ක්යේයු -යුක්රේන් (ඔක්. 26-28 )
32. FHC Shanghai, ෂැං හයි - චීනය ( නොවැ. 7 - 9 )
33. World Food, අල්මටි - කසකස්ථානය (නොවැ.)
34. Saudi HORECA, රියාධ් - සවුදි අරාබිය (නොවැ. 13 - 18)
35. Int'l Tea & Coffee Festival, ඩුබායි - එ. අ. එ. රාජ්‍ය (නොවැ. 2 - 4 )
36. World of Tea, ටෙහෙරාන් - ඉරානය ( නොවැ.7 - 9 )
37. SIAL Middle East, අබුඩාබි - එ. අ. එ. රාජ්‍ය ( දෙසැ. 5 - 7)

ජායාරූපය 3.1 Expo Pakistan, කරච්චි- පකිස්තානය (9-11 මාර්තු)



ජායාරූපය 3.2 Singapore Expo - සිංගප්පූරුව (12-15 අප්‍රේල්)




ජායාරූපය 3.3 SIAL Canada, මොන්ට්‍රියල් - කැනඩා (අප්‍රේල් 13 - 15 )




ජායාරූපය 3.4 The Natural Food Show, ලන්ඩනය එ. රාජධානිය (අප්‍රේල්“ 17 - 18 )




ජායාරූපය 3.5 World Food Warsaw - පෝලන්තය (අප්‍රේල් 19 -21)




ජායාරූපය 3.6 Seoul Food, සෝල් - කොරියා (මැයි 10 -13)



ඡායාරූපය 3.7 World Food Azerbaijan, බකු අසර්බයිජාන් (මැයි 25 - 27)




ඡායාරූපය 3.8 Turkey Road Show මැයි 27 සිට ජූනි 3



ඡායාරූපය 3.9 World Tea Expo, ලාස් වෙගාස් ඇ.එ.ජ. (ජූනි15-17)




ඡායාරූපය 3.10 Saitex, ජොහැන්ස්බර්ග් දකුණු අප්‍රිකාව (ජූනි 19-21)




ඡායාරූපය 3.11 Food Taipei, තායිපේ තායිවාන් (ජූනි 22-25 )



## Summer Fancy Food නිව්යෝක් - ඇ.එ.ජ (ජුනි 26-28)

ප්‍රධාන පෙළේ ලංකා තේ අපනයන කරුවන් හත් දෙනෙකු සමග ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඇමරිකා එක්සත් ජනපදයේ පැවති Summer Fancy Food - 2016 වෙළඳ ප්‍රදර්ශනයට සහභාගි විය. මෙහිදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වෙළඳ කුටිය විවෘත කිරීමේ උත්සවයට ගරු වැවිලි කර්මාන්ත ඇමති නවීන් දිසානායක මහතා ද සහභාගි විය.

ඡායාරූපය 3.12 Summer Fancy Food - 2016



ඡායාරූපය 3.13 Summer Fancy Food - 2016




ඡායාරූපය 3.14 AFRIXIM EXPO Trade exhibition සීෂෙල්ස් (ජුලි 21 - 23)



ඡායාරූපය 3.15 Malaysia International Food & Beverage Trade Fair - මලයාසියාව(ජුලි 27-29 )




ඡායාරූපය 3.16 Int' Tea Fair" Hong Kong හොංකොං- (අගෝස්තු11 -13)



ජායාරූපය 3.17 COTECA, හැම්බර්ග් - ජර්මනිය (සෙප්. 7-9)




ජායාරූපය 3.18 The 13th China ) ASEAN EXPO (CAEXPO) (සෙප්. 11 - 14)




ජායාරූපය 3.19 Fine Food, මෙල්බර්න් ඕස්ට්‍රේලියාව (සෙප්. 12-15)




ජායාරූපය 3.20 World Food, මොස්කව් -රුසියාව (සෙප්. 12-15)




ජායාරූපය 3.21 World Tea & Coffee Expo, මුම්බායි ඉන්දියාව (ඔක්.)



ජායාරූපය 3.22 SIAL France - ප්‍රංශය (ඔක්.16 - 20)



ඡායාරූපය 3.23 World Food, ක්යේයු -යුක්රේන් (ඔක්. 26-28)




ඡායාරූපය 3.24 Saudi HORECA, රියාධ් සවිදි අරාබිය (නොවැ. 13 - 18)




ඡායාරූපය 3.25 SIAL Middle East, අබුඩාබි එ. අ. එ. රාජ්‍ය ( දෙසැ. 5 - 7)




**නිව්යෝර්ක් සහ වොෂිංටන් වල ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය වොෂින්ටන් නගරයේ පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ද සහයෝගය ඇතිව නිව්යෝර්ක් සහ වොෂින්ටන් නගරයන් හි විශේෂ ලංකා තේ ප්‍රවර්ධන වැඩසටහනක් සංවිධානය කරා. මෙම අවස්ථාවන් සඳහා ද ගරු වැවිලි කර්මාන්ත ඇමති නවීන් දිසානායක මහතා සහභාගි විය.

ඡායාරූපය **3.26**




ඡායාරූපය **3.27**



**ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ලංකා තේ සඳහා ගෝලීය ප්‍රවර්ධන වැඩසටහනක් පිළිබඳ යෝජනාවක් 2011 වසරේ දි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ අතර ජාත්‍යන්තරව ඒ සඳහා ලංසු කැඳවීමක් ද සිදුවිය. මේ සඳහා 2015.03.04 දින ආමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණි.

### නිර්මානාත්මක කාර්ය භාරය

රුසියාව / CIS කලාපය, මැදපෙරදිග / ගල්ෆ් කලාපය, අප්‍රිකානු කලාපය, ඈත පෙරදිග ඕසියානා කලාපය, යුරෝපා කලාපය, ඇමරිකානු කලාපය, දකුණු ආසියා කලාපය යන හඳුනාගත් කලාප හත (07) තුළ සන්නාම ප්‍රවර්ධනය සඳහා විශාල පාරිභෝගික පිරිසක් ආවරණය කෙරෙන මහාපරිමානයේ ජනසංනිවේදන ක්‍රම භාවිතයෙන් සිදුකෙරෙන වෙළඳ දැන්වීම් (ATL) සහ කුඩා පාරිභෝගික කණ්ඩායම් හෝ ඒක පුද්ගල පාරිභෝගිකයන් ඉලක්ක කරගත් වෙළඳ දැන්වීම් (BTL) මෙන්ම සමාජ මාධ්‍ය භාවිතය සඳහා නිර්මාණ කරණය සඳහා ෆීනික්ස් ඕ ඇන්ඩ් එම් පුද්ගලික සමාගමට 2015 නොවැම්බර් 6 වැනි දින සිට 2016 නොවැම්බර් 05 දින දක්වා පළමු මාස 12 වෙනුවෙන් ඇ.එ.ජ. ඩොලර් මිලියන 2.26 ක මුදලකට පැවරුනි.

ෆීනික්ස් සමාගම තත්පර 15,තත්පර 30, සහ තත්පර 60 යන කාලසීමාවන් සඳහා ඉංග්‍රිසි සහ රුසියානු භාෂාවන්ගෙන් රූපවාහිනී දැන්වීම්, ඔස්ට්‍රේලියාව සහ යුක්රේනය සඳහා සිනිවටන දැන්වීම්, වෙළඳ ප්‍රදර්ශන වලදී ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කුටි සඳහා දැන්වීම සහිත පතාක ආදිය නිර්මාණය කර ඇත. සෘජු විද්‍යුත් තැපැල් පණිවිඩ, වෙබ් අඩවි, සහ සමාජ මාධ්‍ය භාවිතය සිදුවිය.

### PR- ප්‍රවර්ධන වැඩසටහන

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව, තේ මණ්ඩලය විසින් මහජන සම්බන්ධතා ක්‍රියාකාරකම් වල යෙදීම සඳහා තේ කර්මාන්තයට වසර 150 ක් පිරීම සැමරීමේ එක් ක්‍රියාකාරකමක් වශයෙන් 2017 වසරේ ආගන්තුක මාධ්‍යවේදි වැඩසටහන යටතේ ප්‍රධාන පෙළේ තේ වෙළඳපොළවල් වල මාධ්‍යවේදීන් සඳහා ආරාධනා කිරීමට සැලසුම්කර තිබුණි.

### 3.3.4. ඒක ජාතික ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය

ඒක ජාතිය ශ්‍රී ලංකා තේ (Ceylon Tea ) ප්‍රවර්ධනය යනු විදේශීය සම්භවයන් ඇති තේ සමග තරඟකාරීව ශ්‍රී ලංකා තේ (Ceylon Tea ) ප්‍රවර්ධනය කිරීම යි. විදේශයන්හි පිහිටුවා තිබෙන ශ්‍රී ලංකා තේ ප්‍රචාරණ ඒකක සහ තානාපති සේවාවන්හි ක්‍රියාත්මක වානිජ අංශ මගින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විදේශීය වෙළඳපොළවල් තුළ ලංකා තේ සඳහා ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන්, එළිමහන් ප්‍රචාරණයන්, තේ පැන් සංග්‍රහ, තේ සම්බන්ධ වැඩමුළු සහ සම්මන්ත්‍රන පැවැත්වීම මෙන්ම වෙනත් පොදු මහජන ක්‍රියාකාරකම් ආදිය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදුකරන ඒක ජාතිය ප්‍රවර්ධන වැඩසටහන් අතුරින් ප්‍රධාන වේ.

### 3.3.5. වර්ගීය තේ ප්‍රවර්ධනය

වෙනත් පාන වර්ග සමග තරඟකාරීව තේ ප්‍රවර්ධනය කිරීම මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් සිදු වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායම, ඇ.එ.ජ. තේ සංගමය, ජාත්‍යන්තර තේ කමිටුව සහ ජපාන තේ සංගමය යනාදියෙහි සාමාජිකත්වය දරයි. මෙම වර්ගීය තේ ප්‍රවර්ධනය කාර්යයන් පවත්වාගෙන යාමේ වගකීම මෙම ආයතන විසින් ඉටුකරනු ලබයි. වර්ගීය තේ ප්‍රවර්ධනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමුකර ඇත්තේ තේ සහ සෞඛ්‍ය යන සංකල්පය කෙරෙහිය. පාරිභෝගික අධ්‍යාපන වැඩසටහන් සහ ප්‍රජා ක්‍රියාකාරකම් ඔස්සේ මෙම සංකල්පය ව්‍යාප්ත කරනු ලබයි. තෝරාගත් රටවල් වල ඉහතින් සඳහන් කළ ආකාරයේ වර්ගීය තේ ප්‍රවර්ධන කටයුතු සඳහා තේ සංගම් ආදියෙහි ප්‍රචාරණ වියදම් වලට 2016 වසරේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ද දායක වි ඇත.

2016 මැයි 23 සිට 27 දක්වා කෙන්යාවේ නිවාෂා හි පැවති ආහාර සහ කෘෂිකාර්මික සංවිධානය / තේ පිළිබඳ අන්තර් රාජ්‍ය සංවිධානය (IGG on Tea) 22 වැනි සැසිය





### 3.3.6. Ceylon Tea නාමය, භූගෝලීය දර්ශක (GIs) යටතේ කලාපීය නාම සහ ලාංඡන ලියාපදිංචිය

Ceylon Tea.නාමය සහ අනෙකුත් කෘෂි දේශගුණික කලාපීය තේ වර්ග හත ( නුවර එළිය, ඌව, දිඹුල, උඩ පුස්සැල්ලාව, නුවර, රුහුණ සහ සබරගමුව) භූගෝලීය දර්ශකයන් ලෙස සුරැකීමට ලෝක වෙළඳ සංවිධානයේ TRIPS ගිවිසුමට අනුව ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් අවශ්‍ය නීති සහ රෙගුලාසි සම්පාදනය කළේය. මෙමගින් විශේෂයෙන්ම විදේශීය කොන්ත්‍රාත් ඇසුරුම් කරුවන් විසින් Ceylon Tea නාමය සහ අනෙකුත් කලාපීය තේ නාම අවභාවිතා කිරීම වැලැක්වීම ට සහායවීම පමණක් නොව භූගෝලීය දර්ශකයන් යටතේ අලෙවි කෙරෙන ලංකා තේ සඳහා අගයක් සහ විශිෂ්ඨත්වයක් එකතු කිරීම ද සිදුකෙරේ. සහතික කරණ සලකුණු ලෙස Ceylon Tea නාමය, කලාපීය තේ නාම සහ ලාංඡන දේශීයව ලියාපදිංචි කිරීම වසර තුළදී සම්පූර්ණ විය.

භූගෝලීය දර්ශකයන් ලෙස හෝ සහතික කරණ සලකුණු ලෙස 'Ceylon Tea' නාමය සහ කලාපීය තේ නාම හත ජාත්‍යන්තර වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් ලබාගැනීම 2012 වසරේදී ආරම්භ කළ අතර ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතී.

'Ceylon Tea' නාමය ලියාපදිංචි කිරීම සඳහා වු අයදුම්පත් යුරෝපා සංගමය, ඇ.එ.ජ., ජපානය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, එ.අ.එ.රාජ්‍ය, ඉරානය, තුර්කිය, ජෝර්දානය, ඉරාකය, ලිබියාව, කුවේටය, සවුදි අරාබිය, සිරියාව, ඊජිප්තුව, ලෙබනනය, ටියුනීසියාව, රුසියාව, යුක්රේනය සහ අසර්බයිජානය නැමති රටවල් 20 තුළ ගොනුකර ඇත. සිරියාව, ලෙබනනය, ටියුනීසියාව සහ ජෝර්දානය තුළ ලියාපදිංචි කිරීම් සම්පූර්ණ කර ඇත.

කලාපීය තේ නාම සහ ලාංඡන (GI) ලියාපදිංචි කිරීම සඳහා වු අයදුම්පත් යුරෝපා සංගමය, ඇ.එ.ජ., ජපානය, කැනඩාව සහ ඕස්ට්‍රේලියාව යන රටවල් වල ගොනුකර ඇති අතර ජපානයේ සහ ඇ.එ.ජ. ලියාපදිංචි කිරීම් සම්පූර්ණ කර ඇත.

### 3.3.7. වෙළඳ සලකුණ ආරක්ෂා

**සිංහ ලාංඡන වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම (712)**

'Ceylon Tea' සිංහ ලාංඡනය වෙළඳ සලකුණෙහි නෛතික හිමිකරුවා වනුයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල් වල 'Ceylon Tea' සිංහ ලාංඡනය ලියාපදිංචි කිරීම / දීර්ග කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රචාරණ අංශය මගින් කරගෙන යනු ලබයි. 2016 වසරේදී මෙම ලාංඡනය රටවල් 98 ක ලියාපදිංචි කර ඇත. සිංහ ලාංඡනය භාවිතා කිරීමේ අධිකාරිය ප්‍රධානය කර ඇත්තේ 100% ක්ම ශ්‍රී ලංකා තේ අඩංගු, ISO 3720 ප්‍රමිතියට අනුකූල, එක් එක් වෙළඳපොළවල් වල අවම ප්‍රමිතියට වඩා ඉහළින් වූ අගය එකතුකළ තේ නිෂ්පාදන (තේ මළු සහ ඇසුරුම්) සන්නාමයන් සඳහා පමණී. එමෙන්ම ඒවා ශ්‍රී ලංකා වේ පෙර ඇසුරුම් කරන ලද ඒවා ද විය යුතුයි. විමසුමට බඳුන්වන වසර තුළදී යුරෝපා සංගමය, බටහිර ඉවුර, ගාසා තීරය සහ ඊශ්‍රායලය තුළ සිංහ ලාංඡන ලියාපදිංචිය දීර්ග කිරීමේ කටයුතු අවසන්කර ඇත.

### 3.3.8 ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සහතිකකරණ සලකුණක් ලෙස ලංකාව තුළ ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය ලියාපදිංචිකර ඇත. මොන්ට්‍රියල් ගිවිසුමට (Montreal Protocol) අනුව නිරෝධායනීය නොවන හා පූර්ව නැව්ගතකිරීමේ අභිමතාර්ථයන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතය නතර කිරීම සඳහා ශ්‍රී ලංකාව ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කළා. තේ වගාවන් සඳහා මීතයිල් බ්‍රෝමයිඩ් භාවිතයෙන් තොරව පරිසර හිතකාමී තාක්ෂණයන් වලට අනුගත වෙමින් තේ ක්ෂේත්‍රයට සම්බන්ධ ව කළ ව්‍යාපෘතිය 2002 වසරේදී සාර්ථකව අවසන් කෙරුනි. මේ වෙනුවෙන් 2007 වසරේදී ශ්‍රී ලංකා ව Montreal Protocol Implementers සම්මානය දිනාගන්නා ලදී. එමෙන්ම ඕසෝන් හිතකාමී තේ නිෂ්පාදනය කරන ලොව පළමු තේ නිෂ්පාදනය කරන රට බවට ශ්‍රී ලංකාව පත්විය. තවමත් මෙම ගෞරවය හිමි එකම තේ නිෂ්පාදිත රට වනුයේ ශ්‍රී ලංකාව යි. මෙම වසර තුළ දී අපනයන කරුවන් නව දෙනෙකු විසින් සන්නම් නාමයන් 13 ක් සඳහා ඕසෝන් හිතකාමී Pure Ceylon Tea ලාංඡනය යෙදීම සඳහා අවැසි බලය හිමිකරගනු ලැබිය.

ඕසෝන් ලාංඡනය ලියාපදිංචි කිරීම සඳහා වු අයදුම්පත් යුරෝපා සංගමය, ඇ.එ.ජ., ජපානය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, රුසියාව, යුක්රේනය, අසර්බයිජානය, වියට්නාමය, දකුණු අප්‍රිකාව, නවසීලන්තය, තායිවානය, චීනය, සිංගප්පූරුව, මලයාසියාව, හොන්කොන්, චිලි, දකුණු කොරියාව, එ.අ.එ.රාජ්‍ය ය, ඉරානය, ඉරාකය, කුවේටය, සිරියාව, ලිබියාව, තුර්කිය, ජෝර්දානය, සවුදි අරාබිය, ඊජිප්තුව, ලෙබනනය සහ ටියුනීසියාව නැමති රටවල් 30 තුළ ගොනුකර ඇත. මේ අතුරින් ඕසෝන් ලාංඡනය ලියාපදිංචි කිරීම ජපානය, යුරෝපා සංගමය, මලයාසියාව, කුවේටය, සිරියාව, එ.අ.එ.රාජ්‍යය, ලෙබනනය, රුසියාව, චිලි සහ ජෝර්දානය තුළ සම්පූර්ණ කර ඇත.

### 3.3.9. ප්‍රචාරණ/ තොරතුරු ප්‍රකාශන

වර්ෂය තුළදී පහත සඳහන් **ප්‍රචාරණ**/ තොරතුරු ප්‍රකාශන නිකුත් කරන ලදි.

i. ද්වි මාසික හසුන්පත (06)
ii.ත්‍රෛයි මාසික තේ අලෙවි සමාලෝචනය (04)

### 3.3.10 දේශීය තේ ප්‍රචාරණය

මෙම වසර තුළදී පහත සඳහන් වෙළඳ ප්‍රදර්ශන සහ අවස්ථා සඳහා සහභාගි වෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය මාධ්‍ය වැඩසටහන්, එළිමහන් වෙළඳ දැන්වීම්, තේ පැන් සංග්‍රහ, ශ්‍රී ලංකා තේ මණ්ඩල ඇසුරුම් තේ පැකට් අලෙවිය සහ ප්‍රචාරණමය ද්‍රව්‍ය බෙදාහැරීම වැනි ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල නිරත විය.

**අනාගත සිහින - 2016 වැඩසටහන**
**Future Dreams 2016**
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය යටතේ වන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග අත්වැල් බැඳගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ විද්‍යා අංශය මගින් ශ්‍රී ලංකාවේ පළාත් මට්ටමින් පැවැත් වූ පළමු විද්‍යා සහ බලශක්ති වැඩසටහන වන අනාගත සිහින - 2016 වැඩසටහන සංවිධානය කරනු ලැබිය. මෙමගින් සුනිත්‍ය බලශක්ති, විද්‍යා සහ පාරිසරික ජාතික න්‍යාය පත්‍රය සඳහා අනුබලයක් විය
පාසැල් ළමුන් සඳහා විශේෂයෙන් රැකියා අපේක්ෂාවෙන් සිටින පාසැල් හැරගිය අය ඉලක්ක කරගෙන රැකියා අවස්ථා සහ අධ්‍යයන පාඨමාලා පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රදර්ශන කුටියක් විවෘතකර තිබුණි.
මෙම ප්‍රදර්ශනය පළාත් නමයෙහි ම පවත්වනු ලැබිය. තේ වර්ග ප්‍රදර්ශනය, ඖෂධ තේ සහ ඒවායෙහි ගුණයන් විස්තරකිරීම, අගය එකතු කළ තේ සහ තේ වල සෞඛ්‍යමය ප්‍රතිලාභ පිළිබඳ දැනුම ලබා දීම හා කෘෂි දේශගුණික කලාප හත පිළිබඳ තොරතුරු ලබා දීම, ශ්‍රී ලංකා තේ සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව දැනුවත් කිරීම ආදි අධ්‍යාපනික ක්‍රියාකාරකම් මෙන්ම තේ ක්ෂේත්‍රයේ පවතින රැකියා අවස්ථා ආදිය පිළිබඳව ද දැනුවත් කිරීමෙ වැඩසටහන් මෙන්ම තේ අලෙවි කටයුතු ද මෙම ප්‍රදර්ශනයේදි සිදුවිය.

පාසැල් ළමුන් දැනුවත් කළ ප්‍රදර්ශන කුටි

ඡායාරූපය 3.30



ඡායාරූපය 3.31



ඡායාරූපය 3.32




**සංචරණයේ රන් පා සටහන 2016 - කැලණිය විශ්ව විද්‍යාලය**
කැලණිය විශ්ව විද්‍යාලයේ සංචාරක සමාජය තුන්වැනි වරටත් සංවිධානය කළ "Golden foot print of tourism 2016" නැමති අධ්‍යාපනික ප්‍රදර්ශනයේ තේමාව වූයේ බහු සංස්කෘතික විවිධතාවය සමග සංචරණය විඳිමු යන්නයි.
ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙම ප්‍රදර්ශන භූමියෙහි විදේශිය ශිෂ්‍යයින් වැනි ආගන්තුකයින් සඳහා ශ්‍රී ලංකා තේ පිළිබඳ තොරතුරු කවුළුවක් විවෘත කළ අතර 2016 නොවැම්බර් 24 වැනි දින තේ පැන් සංග්‍රහයක් ද පැවැත්විය.

**සංචරණයේ රන් පා සටහන 2016 අධ්‍යාපනික ප්‍රදර්ශනයේ ශ්‍රී ලංකා තේ පිළිබඳ තොරතුරු කවුළුව**

ඡායාරූපය 3.34



ඡායාරූපය 3.33




**ටුවරිසම් ෆෙස්ට් 2016**
2016 දෙසැම්බර් 20- 23 වැනි දින දක්වා කොළඹ නිදහස් චතුරස්‍රයේ දී පැවැත් වූ Tourism Fest 2016 ප්‍රදර්ශනය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වෙනම ප්‍රදර්ශන කුටියක් සංවිධානය කළ අතර තේ පැන් සංග්‍රහයක් ද පැවැත්විය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය තේ ආශ්‍රිත තොරතුරු සහ ප්‍රචාරණ ද්‍රව්‍යය බෙදාහැරීම, තේ වර්ග ප්‍රදර්ශනය සහ කලාප හතේ තේ පැන් ප්‍රදර්ශනය, හොඳින් තේ කෝප්පයක් සකසාගන්නේ කෙසේ ද යන්න පිළිබඳව හා වෙළඳපොළෙන් උසස් තත්වයේ තේ තෝරා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳව ජනයා දැනුවත් කිරීම ආදි වැඩසටහන් වල නිරත විය. මෙම ප්‍රදර්ශනයේ ප්‍රධාන ආරාධිතයා වූ ශ්‍රී ලංකා ජනාධිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මහතා සහ මැති ඇමතිවරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රදර්ශන කුටිය වෙත පැමිණියා.

ඡායාරූපය 3.35 ප්‍රදර්ශන කුටි




ඡායාරූපය 3.36 තේ පැන් සංග්‍රහ



ඡායාරූපය 3.37 සහ ඡායාරූපය 3.38 ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ ස්වර්ණමය ජුබිලිය සැමරීම 2016




2016 මැයි 26 සිට 28 දක්වා බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාවේ පැවති සංචරණයේ ස්වර්ණ ජයන්තිය සැමරීමේ උත්සවයට ශ්‍රී ලංකා තේ මණ්ඩලය ද සහභාගිවෙමින් තේ ප්‍රචාරණ මධ්‍යස්ථානයක් සංවිධානය කළේය. මෙම ප්‍රදර්ශනයට පැමිණි අයට තොරතුරු සැපයීම මෙන්ම තේ නියැදි බෙදාහැරීම ද සිදුවිය.

### 3.3.11 විදේශ දූත කණ්ඩායම්

මෙම වසර තුළදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය චීනය, ජපානය, රුසියාව, ඇ. එ. ජ. සහ තුර්කිය යන රටවල්වලින් පැමිණි දූත කණ්ඩායම් සඳහා පහසුකම් සපයමින් ආගන්තුක සත්කාරයෙහි නිරත විය. එකිනෙකාගේ ප්‍රයෝජනය සඳහා අදහස් හා දැනුම හුවමාරු කරගැනීම, වෙළඳ සම්බන්ධතා ගොඩනැගීම ආදිය අරමුණු කරගෙන විදේශීය දූත කණ්ඩායම් සඳහා ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයෙහි නියැලි පුද්ගලයන් සමග ව්‍යාපාරික හමු සංවිධානය කළේය.

මෙම වසර තුළදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය පහත සඳහන් රැස්වීම් වලට සහභාගි විය.

- රුසියාවේ පැවති ශ්‍රී ලංකාව සහ රුසියාව අතර රාජ්‍යාන්තර කොමිසන් රැස්වීම
- කොළඹ දී පැවති ආර්ථික සහයෝගිතාවය සඳහා වන ඉරාන - ශ්‍රී ලංකා 11 වැනි ඒකාබද්ධ කොමිසම (JCEC)
- තේ පිළිබඳ FAO / IGG 22 වැනි සැසිය සහ කෙන්යාවේ පැවති අප්‍රිකානු තේ විද්‍යා සම්මන්ත්‍රණය
- ඇ. එ. ජ. වෙත අමාත්‍ය තේ දූත කණ්ඩායම
- කැනඩාවේ පැවති උතුරු ඇමරිකානු තේ සමුළුව
- තුර්කියේ පැවති ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ පළමුවැනි ඒකාබද්ධ කමිටු රැස්වීම

රුසියාවේ මොස්කව් නගරයේ 2016 පෙබරවාරි මස 10 -12 දක්වා පැවති ශ්‍රී ලංකාව සහ රුසියාව අතර වෙළඳ, ආර්ථික, විද්‍යා සහ තාක්ෂණික සහයෝගිතාවය පිළිබඳ අන්තර් රාජ්‍ය කොමිසමේ පළමු රැස්වීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහභාගි විය.

ඡායාරූපය 3.39 ශ්‍රී ලංකාව සහ රුසියාව අතර අන්තර් රාජ්‍ය කොමිසන් රැස්වීම



ඡායාරූපය 3.40 ආර්ථික සහයෝගිතාවය සඳහා වන ඉරාන ශ්‍රී ලංකා 11 වැනි ඒකාබද්ධ කොමිසම (JCEC)



ජායාරූපය 3.41 හා 3.42 සංවර්ධනය වෙමින් පවතින රටවලින් රාජ්‍ය දූතයන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත පැමිණීම



ජායාරූපය 3.43 හා 3.44 ෂැන්හයි සහ බීජින් වෙත අමාත්‍යාංශ නියෝජිතයින්ගේ සංචාරය



### 3.3.12. තේ අලෙවි මධ්‍යස්ථානය

ශ්‍රී ලංකා තේ මණ්ඩල පරිශ්‍රයේ පිහිටුවා තිබෙන තේ අලෙවි සැල මගින් තේ මණ්ඩල තේ ඇසුරුම් කාණ්ඩය සහ පුද්ගලික තේ සමාගම් 28 කින් තෝරාගත් තේ නිෂ්පාදන අලෙවිකරනු ලබයි. 2016 වසරේදී තේ අලෙවි සැල මගින් තේ විකිණීමෙන් රුපියල් මිලියන 100.9 ක ආදායම ක් උපයා ඇත. පසුගිය වසර සමග සැසඳීමේදී තේ අලවිය 23% කින් වර්ධනය වී ඇත. තේ මණ්ඩල තේ ඇසුරුම් කාණ්ඩය අලෙවිය මගින් රුපියල් මිලියන 26 ක ආදායම ක් උපයා ඇති අතර පුද්ගලික අංශයේ තේ නිෂ්පාදන වලින් රුපියල් මිලියන 74 ක් උපයා ඇත.

### 3.3.13. ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා අනුග්‍රාහකත්වය

සිලෝන් ටී සන්නාමය සහිත ටී ෂර්ට් දේශියව පාසැල් ක්‍රිකට් කණ්ඩායම් අතර බෙදාහැරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය ගත්තා වූ තීරණය අනුව පාසැල් 42 ක් තොරාගනු ලැබිය. ශ්‍රී ලංකා තේ මණ්ඩලය මෙම ප්‍රවර්ධන කටයුත්තේ දි ශ්‍රී ලංකා පාසැල් ක්‍රිකට් සංගමය සහභාගි කරගනු ලැබිය. එමගින් දක්ෂ පාසැල් ක්‍රිකට් ක්‍රිඩකයන් අභිප්‍රේරණය කිරීම බලාපොරොත්තු වේ. පාසැල් ක්‍රිකට් ක්‍රිඩකයන් අතරේ ටී ෂර්ට් 835 ක් බෙදාහරින ලදි. මෙම වැඩසටහන 2016 අප්‍රේල් 7 වැනිදා ක්‍රියාත්මක විය.

ඊට අමතරව 2016 T-20 ලෝක කුසලාන තරඟය අවධියේ දි සිලෝන් ටී ක්‍රිකට් රෙප්ලිකා ටී ෂර්ට් බංගලිදේශය, කැන්බරා, සිඩ්නි, මෙල්බර්න්, එක්සත් රාජධානිය, නවසීලන්තය සහ ජපානය තුළ අලෙවි කළේය.

### 3.3.14 ප්‍රවර්ධන අරමුණ ඇතිව තේ බෙදාහැරීම

"Ceylon Tea" නාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලය රුපියල් මිලියන 5.89 ක වටිනාකමකින් යුතු තේ බෙදාහරිනු ලැබිය.

I. තුටු පඬුරු වශයෙන් තේ විදේශිය ශ්‍රී ලංකා තානාපති කාර්යාල 40 කට ලබාදීම.
II. ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනවලදී තේ පැන් සංග්‍රහ පැවැත්වීම සහ තේ බෙදාහැරීම
III. ප්‍රභූන් ට / නිළධාරින්ට ප්‍රවර්ධන වශයෙන් තේ පිරිනැමීම

## 3.4. තේ රස පිරික්සීමේ ඒකකය

### 3.4.1. ප්‍රධාන කාර්යය/ අරමුණ

ISO 3720 සහ ISO 11287 ප්‍රමිතිවලට අනුව අවම තත්වය පවත්වාගෙන යාම / අධීක්ෂණය කිරීම. පාරිභෝගික ඇසුරුම් සඳහා සන්නම් නාම සහිත තේ නිෂ්පාදනවලට සිංහ ලාංඡන සහතිකය නිකුත්කිරීම, පෞද්ගලික හා සෘජු විකුණුම් සහ ඉදිරි කොන්ත්‍රාත් අධීක්ෂණය කිරීම සහ අපරානුමත කිරීම මෙම අංශය මගින් සිදු වේ.

### 3.4.2 තේ රස පිරික්සුම්කරුවන්ගේ විශේෂඥ මඩුල්ල

මෙම ස්වාධීන මඩුල්ල පහත සඳහන් සාමාජිකයන් දෙදෙනාගෙන් සමන්විත විය.

සී. එන්. පී. ද සිල්වා මහතා ( වසර 40 කට වැඩි තේ රස පිරික්සුම් පළපුරුද්දක් ඇත.)

වී. ඒ. ඒ.පෙරේරා මහතා ( වසර 30 කට වැඩි තේ රසපිරික්සුම් පළපුරුද්දක් ඇත.)

පහත සඳහන් සංගම් වල නියොජිතයන්ගෙන් සමන්විත තේ පාර්ශවකාර නියෝජනයක් මෙම මඩුල්ල මගින් සිදු වේ.

කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය (CTTA)
කොළඹ තැරැව්කරුවරුන්ගේ සංගමය (CBA)
ලංකා වැවිලිකරුවන්ගේ සංගමය (CPA)
ශ්‍රී ලංකා කුඩා තේවතු සංවර්ධන සමිති සම්මේලනය (SLFTSHDS)
තේ අපනයනකරුවන්ගේ සංගමය (TEA)
පෞද්ගලික තේ කම්හල් හිමියන්ගේ සංගමය (PTFOA)

### 3.4.3. තේ රස පිරික්සීමේ ඒකකය විසින් අනුගත තේ රස පිරික්සීමේ ක්‍රමවේද

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ඉන්ද්‍රිය සංවේදී පිරික්සුම් වලදී භාවිත තේ පිළියෙල කිරීමේ ISO3102 ක්‍රමවේදය අනුගමනය කරයි. කළු තේ වල වාග්මාලාව සඳහා ISO 6078 තේ රසපිරික්සුම් පාරිභාෂිකය / ලංකා තේ නිෂ්පාදනය පිළිබඳ විෂය ග්‍රන්ථය - අංක 4 (Monograph on a Production in Ceylon- no : 4 -Tea Manufacture in Ceylon).

### 3.4.4. විශේෂඥ මඩුල්ල විසින් තේ රස පිරික්සුම් සැසි පැවැත්වීම

පහත සඳහන් දෑ සම්බන්ධව ස්වාධීන ඇගයීමක් කිරීම සඳහා විශේෂඥ මඩුල්ල ප්‍රධාන වශයෙන් සඳුදා සහ බ්‍රහස්පතින්දා වශයෙන් සතියකට දෙවරක් රැස් වේ.

- පූර්ව වෙන්දේසි තේ
- විශේෂ මෙහෙයුම් තේ
- පූර්ව ආනයනික නියැදි
- සෘජු විකුණුම්
- නව අපනයන සමාගම් සඳහා තේ රස පිරික්සකයින් ඇගයීම.
- පූර්ව නැව්ගත කිරීම් අධීක්ෂණය දෛනිකව ඇගයීම
- අවශ්‍ය පියවර ගැනීම සඳහා, විශේෂඥ මඩුල්ල විසින් ගන්නා තීරණ අදාළ අංශ, තේ කො. අංශය සහ තේ අ. අංශය වෙත ඉදිරිපත් කිරීම.

### 3.4.5. සිංහ ලාංඡන ඇසුරුම් ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකා තේ මණ්ඩලය පූර්ණ අධිකාරීත්වය දරණ, නිෂ්පාදිත රට සහ ගුණාත්මන බවේ සංකේතයක් වන සිංහ ලාංඡනය සිය සන්නම් යෙදූ පාරිභෝගික ඇසුරුම් මත ප්‍රදර්ශනය කිරීම ට බලාපොරොත්තු වන අපනයන කරුවන් සිය අයදුම් පත සමග වෙළඳපොල අනුව තම නිෂ්පාදන ඇගයුම සඳහා ඉදිරිපත් කළයුතුයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය වසරක කාලයක් සඳහා වලංගු වන සහතිකයක් නිකුත්කරමින් සිංහ ලාංඡනය භාවිතා කිරීම සඳහා ලියාපදිංචි ගාස්තු වශයෙන් සන්නාමයකට රුපියල් 5,000 (අ.එ.බද්ද + ජා.ගො. බද්ද) අයකරනු ලබයි.

සිල්ලර ඇසුරුම් වල සිංහ ලාංඡනය යෙදීමේ බලය ලබාදීම සඳහා 2016 වසරේදී නව සන්නමයන් දීර්ග කිරීම්, අතිරේක ඇසුරුම් සඳහා අයදුම්පත් 851 සම්බන්ධව කටයුතු කෙරුනි.

### 3.4.6 සිංහ ලාංඡනය යොදන ඇසුරුම් වල ගුණාත්මක තත්වය අධීක්ෂණය කිරීම ( දේශිය, විදේශිය, තේ මණ්ඩල ඇසුරුම්)

#### 3.4.6.1 දේශිය

අහඹු ලෙස කොළඹ සුපිරි වෙළඳසැල් වලින් සහ සිල්ලර වෙළඳ සැල් වලින් ලබාගත්, විශේෂයෙන්ම සිංහ ලාංඡනය යොදන නිෂ්පාදන වලින් ලබාගත් තේ නියැදි අධීක්ෂණය කරයි. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි, සැලකිය යුතු වෙළඳපොළ කොටසකට හිමිකම් කියන පිළිගත් ඇසුරුම් කරුවන් වෙත සිංහ ලාංඡනය භාවිතයට අවසර දෙන අතර අධීක්ෂණ කටයුතු ද සිදු කෙරේ.

#### 3.4.6.2. විදේශිය අධීක්ෂණය

මේ යටතේ, සිංහ ලාංඡනය සහිතව නැව්ගත තොග නියැදි ඇතුළුව සියළුම අපනයන නියැදි නැව්ගත කිරීමට පෙර අධීක්ෂණ සඳහා නි. තේ. කො.(අපනයන) විසින් පූර්ව නැව්ගත තොග අධීක්ෂණ ක්‍රියාවලිය යටතේ තේ රස පිරික්සීම් ඒකකය වෙත ඉදිරිපත් කරනු ලබයි.

අපගේ විදේශිය කාර්යාංශ සහ ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිටින වානිජ උපදේශකයන් විසින් විදේශිය වෙළඳ පොළවල්වලින් ලබාගන්නා සිංහ ලාංඡනය යොදා ඇති ඇසුරුම් ද ඇගයීම් කර වාර්තා කිරීම සඳහා තේ රස පිරික්සීම් ඒකකය වෙත ඉදිරිපත් කරනු ලබයි.

### 3.4.6.3. තේ මණ්ඩල ඇසුරුම්

තේ මණ්ඩල ඇසුරුම් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා තේ මණ්ඩල අලෙවි සැලේ අලෙවිකරනු ලබන අතර විදේශ දූත මණ්ඩල, කාර්යාංශ සහ වෙළඳ සල්පිල් වෙතද යවනු ලබයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙනුවෙන් තේ රස පිරික්සීම් ඒකකයේ අනුමැතිය ඇතිව නිල ඇසුරුම්කරුවන් විසින් වෙන්දේසි හෝ පෞද්ගලික විකුණුම් මාර්ගවලින් ලබාගන්නා තේ වල නියැදි අවසන් ඇසුරුමට පෙර තේ රස පිරික්සීමේ ඒකකය විසින් පිරික්සීමට බඳුන්කර අනුමත කරයි.

- එෆ්.එෆ්.සී.ටී. (ග්‍රෑම් 500)
- ප්ලාන්ටර්ස් පන්ච් (ග්‍රෑම් 100 සහ ග්‍රෑම් 250)
- මිස්ටි හිල්ස් (ග්‍රෑම්200)
- රෝයල් සිලෝන් (ලෝහ කෑන්- ග්‍රෑම් 200)
- ෆැමිලි පැක් (ග්‍රෑම් 500 සහ ග්‍රෑම් 250)
- පොලි පැක් (ග්‍රෑම් 250)
- ග්‍රීන් ටී (ග්‍රෑම් 100)
- ටී ජ්ලකර් (ග්‍රෑම් 250 සහ ග්‍රෑම් 100)
- ලක්සරි බ්ලෙන්ඩ් - දැව (ග්‍රෑම් 125)
- ලක්සරි බ්ලෙන්ඩ් -කාර්ටන් (ග්‍රෑම් 125)
- කොනොයිෂර් (ග්‍රෑම් 250, ග්‍රෑම් 200, ග්‍රෑම් 125 සහ ග්‍රෑම් 100)

### 3.4.7. වෙන්දේසියට පෙර තේ තත්ත්ව පාලනය සඳහා රස පරීක්ෂා කිරීම

තැරැව්කරුවන් අට දෙනෙකු විසින් ඔවුන්ගේ වෙන්දේසියට පෙර තේ නියැදි ඇගයීම සඳහා අලෙවියට සති දෙකකට පෙර ඉදිරිපත්කරනු ලබයි. ඒකකය පළමුවෙන්ම ඕෆ් ග්‍රේඩ්, ඩස්ට්, ප්‍රීමියම් ෆ්ලවර්රි සහ බී.ඕ. පී. 1 ඒ, නියැදි දෘශ්‍ය පරීක්ෂාවකට ලක්කරයි. අනතුරුව ජෛවීය පරීක්ෂණය සිදුකරයි. ඇගයීමෙන් පසු තෝරාගත් නියැදි ඊලඟ වෙන්දේසියට ඉදිරිපත් කරන්නේද නැද්ද යන්න පිළිබඳ සාමූහික තීරණයක් ගැනීම සඳහා රස පිරික්සුම් මඩුල්ල වෙත ඉදිරිපත් කරයි. එම තීරණය නි.තේ.කො. (අපනයන) වෙත ඉදිරිපත් කරයි.

දෘශ්‍ය පරීක්ෂාවකට ලක්කරන ලද නියැදි - 147,026
ජෛව පරීක්ෂාව -15,330
රස පිරික්සුම් මඩුල්ල විසින් ප්‍රතික්ෂේපිත වෙන්දේසියට පෙර තේ නියැදි
මධ්‍යසාර මිශ්‍ර වී ඇතැයි සැකකරන- 668
සිලිකාමය ද්‍රවය -237
අමු තන්තු - 1065
නි.තේ.කො. (අපනයන) විසින් අභඹූතාවය මත ඉදිරිපත් කළ වෙන්දේසියට පෙර තේ නියැදි (BSL/ESL)
පිරික්සු නියැදි ප්‍රමාණය - 2,447
සැක සහිත නියැදි ප්‍රමාණය - 97

### 3.4.8. තේ නැව්ගත කිරීමට පෙර තත්ත්ව පාලනය සඳහා තේවල රස පරීක්ෂා කිරීම

තේ නැව්ගත කිරීමට පෙර සිංහ ලාංඡනය භාවිතය, ISO 3720 පරාමිතීන් පිළිබඳ හෝ වෙනත් කිසියම් අපවිත්‍ර වීම් පිළිබඳ පරීක්ෂා කිරීම පිණිස නි.තේ.කො. (අපනයන) විසින් තේ නියැදි උපලේඛනයක්ද සහිතව ඉදිරිපත් කරනු ලැබේ.

නැව්ගත කිරීමට පෙර අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදය යටතේ පරීක්ෂා කරන ලද නියැදි - 8,551

### 3.4.9. ආනයනය කිරීමට පෙර තේ තත්ත්ව පාලනය සඳහා රස පිරික්සීම

ආනයනයට ඇති යෝග්‍ය තාවය විමසා බැලීම සඳහා නි. තේ. කො. (අපනයන) විසින් ආකෘති පත්‍රයක් ද සමග ආනයනය කිරීමට පෙර තේ නියැදි ඉදිරිපත් කරනු ලැබේ. සෑම අයදුම් පතකම නියැදිවල විස්තර සටහන් කරනු ලබයි. රස පිරික්සුම් මඩුල්ල විසින් තේ ඇගයීම කරනු ලබන්නේ ශ්‍රී ලංකා තේ මණ්ඩල චක්‍රලේඛ අංක OR/1/65 හා එහි සංශෝධනවලට අනුවය.

තේ රස බැලීමේ ඒකකය පරීක්ෂා කළ නියැදි ප්‍රමාණය - 1,067

### 3.4.10 පශ්චාත් ආනයන තේ තත්ව පාලනය සඳහා රස පිරික්සීම

ආනයනයකරන ලද තේ තොග ලැබුනු පසු තේ අපනයන අංශය විසින් ඒවායෙහි නියැදි ලබාගෙන අනුමැතිය සඳහා මෙම අංශය වෙත ඉදිරිපත් කරනු ලබයි.

තේ රස බැලීමේ ඒකකය පරීක්ෂා කළ නියැදි ප්‍රමාණය -786

### 3.4.11. විශේෂ විමර්ශණයන් යටතේ රස පිරික්සීම

තේ ශ්‍රේණිය, අපවිත්‍රවීම්, ISO හෝ වෙනත් නොයෙකුත් විශේෂ කාරණා පිළිබඳව ඇගයීම සඳහා තේ කොමසාරිස් හෝ නි. තේ. කො. (අපනයන) විසින් තේ නියැදි අනුමත සැලැස්මක් ඇතිව බ්‍රහස්පතින්දා මඩුල්ල ට ඉදිරිපත් කරනු ලබයි.

### 3.4.12 පෞද්ගලික විකුණුම් ඇගයුම් සහතික අනුමත කිරීම

ස්වාධීන තැරැව් කරුවන්ගේ අනුමැතිය ඇතිව අලෙවි තැරැව්කරු විසින් තේ නියැදි තේ රස බැලීමේ ඒකකය වෙත ඉදිරිපත් කරන අවස්ථා වලදී පෞද්ගලික විකුණුම් අනුමත කිරීම මෙම ඒකකය විසින් සිදුකරනු ලබයි. ඒ සඳහා අනුමත කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 500 + (VAT + NBT) ක් අයකරනු ලබයි. වර්තමානයේ දී ඉහත වැඩසටහන හරිත තේ, කාබනික තේ, විශේෂ තේ සහ කොළඹ වෙන්දේසිය හරහා විකුණනු නොලබන කුඩා කැබලි තේ වලට සීමා කර ඇත.

පිරික්සා අනුමත කළ පෞද්ගලික අලෙවි තේ තොග ප්‍රමාණය - 8,557

### 3.4.13. ඉදිරිපත් කළ කොන්ත්‍රාත්තු අනුමත කිරීම

මිලදී ගන්නන්ගේ අවශ්‍යතා මත තෝරාගත් කිහිපයක් සඳහා පමණක් කිසියම් කාලසීමාවකට අනුමැතිය ලබා දී ඇත. වෙළෙන්ඳා, ගැනුම්කරු, තැරැව්කරු සහ තේ මණ්ඩලය විකුණුම් කොන්ත්‍රාත්තුව අනුමත කර ඇත. අනුමත කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 500 + (VAT + NBT) ක් අයකරනු ලබයි.
අනුමැතිය ලත් සියළු කොන්ත්‍රාත් ප්‍රමාණය - 120

### 3.4.14. සෘජු විකුණුම් අනුමත කිරීම

මෙම යෝජනා ක්‍රමය යටතේ නිෂ්පාදකයාට සහ අපනයන කරුට ඔවුන්ගේ නිෂ්පාදන සෘජුවම විදේශීය ගැනුම්කරුවන්ට අලෙවිකිරීමට අවසරය ලබා දේ. හරිත තේ, කාබනික තේ, විශේෂ තේ දේශීය ගැනුම්කරුවන්ට අලෙවි කළ හැකි වේ. බ්‍රහස්පතින්දා මඩුල්ල මගින් මෙම සෘජු විකුණුම් අනුමත කරනු ලබයි.

අනුමත කළ පෞද්ගලික අලෙවි ප්‍රමාණය - 2,010

## 3.5. විශ්ලේෂණ රසායනාගාරය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විශ්ලේෂණ රසායනාගාරය උසස් තත්වයේ සේවාවන්, නිවැරදි වේලාවේ දී නිවැරදි ප්‍රථිපල සහ පාර්ශවකරුවන් සඳහා විශේෂඥ උපදෙස් සැපයීම සඳහා කැපවී ඇත. දත්ත වල විශ්වසනීයත්වය සහ නිවැරදිබව අපගේ පාරිභෝගිකයන්ට නොයෙකුත් අවදානම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් තීරණ ගැනීම සඳහා මෙන්ම අනුලංඝනීය වූ ගුණාත්මක සහ ආරක්ෂණ ප්‍රමිති සහ ලොව පුරා නියාමන අධිකාරීන්ගේ අවශ්‍යතා මුණගැස්සීම සඳහා උපකාරී වේ.

තේ පරීක්ෂණය සඳහා විශ්ලේෂණ රසායනාගාරය එහි පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය, ක්ෂුද්‍ර ජීව විද්‍යාගාරය හා රසායන විද්‍යාගාරය යන විද්‍යාගාර තුන සඳහා ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය මගින් ISO 17025 ප්‍රතිතනයෙන් පිදුම් ලබා ඇත.
රසායන විද්‍යා, ක්ෂුද්‍රජීව විද්‍යා සහ පළිබෝධනාශක පරාමිතීන් සම්බන්ධයෙන් නිපුන උපාධි සුදුසුකම් සහිත 14 දෙනෙකුගෙන් යුතු තාක්ෂණික කාර්ය මණ්ඩලයක් සමග 04 දෙනෙකුගෙන් යුතු සහායක කාර්ය මණ්ඩලයක් මෙම විශ්ලේෂණ රසායනාගාරයෙහි සේවයෙහි නිරතව ඇත.
සෑම වසරකදීම එක් එක් විද්‍යාගාර ඒකක නිරවද්‍යව පරීක්ෂණ කිරීමේ නිපුනතාවය තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර විද්‍යාගාර අතර ප්‍රවීනතා පරීක්ෂණ වැඩසටහන් වලට සහභාගි වේ.
විද්‍යාගාරය මාර්ග දෙකක් ඔස්සේ නියැදි ලබාගනී. එනම්, අභ්‍යන්තර අධීක්ෂණ සේවා සහ බාහිර සහතිකකරණ සේවා ලෙස.
අභ්‍යන්තර අධීක්ෂණ සේවා ඔස්සේ ලැබෙන නියැදි තේ අපහරණ ස්ථාන, තේ නිෂ්පාදකයන්, තේ තැරැව්කරුවන් ගේ ගබඩා, තේ මිශ්‍ර කරණ හා ඇසුරුම් කරණ සහ අපනයන කරුවන්ගේ ගබඩා ආදියෙන් තේ කොමසාරිස් අංශයේ අහඹු ගුණාත්මක අධීක්ෂණ වැඩසටහන මගින් ලබාගන්නා ඒවා වේ. බාහිර සහතිකකරණ සේවා මගින් ගැනුම්කරුවන් ගේ අවශ්‍යතා පරිදි අපනයන කරුවන්ගේ සහතිකකරණ අවශ්‍යතා ආවරණය කෙරේ.
2016 වසර තුළදී විශ්ලේෂණ රසායනාගාරය තේ නියදි 12188 පරීක්ෂණයට බඳුන් කළ අතර ඉන් පරීක්ෂණ 5698 (46.7%) අභ්‍යන්තර අධීක්ෂණ සේවා ඔස්සේ ලැබෙන නියැදි විය. පරීක්ෂණ 6490 (53.2%) බාහිර සහතිකකරණ සේවා මගින් ලැබුනු නියදි වලින් වේ. රසායන විශ්ලේෂණ ඒකකය පරීක්ෂණ 3203(26.3%) ක් ද ක්ෂුද්‍රජීව විද්‍යා විශ්ලේෂණ ඒකකය පරීක්ෂණ 4002 (32.8%) ක් ද පළිබෝධනාශක විශ්ලේෂණ ඒකකය පරීක්ෂණ 4983 (40.9%) ක් ද සිදුකර ඇත.
විශ්ලේෂණ රසායනාගාරය තම පරීක්ෂණ සේවාවන් සඳහා අයකිරීමේ දි හොඳම තත්වයේ තේ ලෙස හඳුනාගත් තේ නියදි නිදහස්කරනු ලබයි. 2016 වසර තුළදී උපයාගත් මුළු ආදායම රුපියල් 20,143,500.00 ක් විය. අපනයන කරුවන්ගේ දායකත්වය රුපියල් 11,739,500.00 (58.28%) ක් විය. අභ්‍යන්තර අංශවල ආදායම් කොටස රුපියල් 8,404,000 .00 (41.72%) ක් විය.

වගුව 3.13: 2015/2016 වසරේ සිදුකළ පරීක්ෂණ සාරාංශය

| පරීක්ෂණයේ නම | පරීක්ෂණ ගණන | |
|---|---|---|
| | 2015 | 2016 |
| **රසායන විශ්ලේෂණ ඒකකය** | | |
| 1. තේවල තෙතමනය නිර්ණය කිරීම | 356 | 342 |
| 2. තේවල මුළු භෂ්ම ප්‍රමාණය නිර්ණය කිරීම | 342 | 365 |
| 3. තේවල ජලයේ දියවන භෂ්ම ප්‍රමාණය නිර්ණය කිරීම | 335 | 355 |
| 4. තේවල ජලයේ දියවන භෂ්මවල ආම්ලිකතාවය නිර්ණය කිරීම | 336 | 355 |
| 5. තේවල ජල නිස්සාරණය නිර්ණය කිරීම | 340 | 365 |
| 6. තේවල ජලයේ දියවන භෂ්මවල ක්ෂාරීයතාවය නිර්ණය කිරීම | 374 | 387 |
| 7. තේවල අමු තන්තු ප්‍රමාණය නිර්ණය කිරීම | 401 | 858 |
| 8. මූලික විකිරණ නිර්ණය කිරීම | 61 | 116 |
| 9. අනෙකුත් පරීක්ෂණ (එකතුකළ වර්ණ, සීනි, ජෙලි, මධ්‍යසාර, රසකාරක, රසායනික හඳුනාගැනීම් බයිකාබනේට්, භාහිර ද්‍රව්‍ය) | 46 | 11 |
| 10. ශ්‍රේණි හඳුනාගැනීමේ පරීක්ෂණ/ පෙරහුම් විශ්ලේෂණය | 49 | 49 |
| 11. තේවල Fe/ යකඩ ප්‍රමාණය නිර්ණය කිරීම | 16 | - |
| **ක්ෂුද්‍රජීව විද්‍යා විශ්ලේෂණ ඒකකය** | | |
| 01. මුළු පට්ටිකා ප්‍රමාණය නිර්ණය කිරීම | 472 | 780 |
| 02. ඊස්ට් සහ පුස් ප්‍රමාණය නිර්ණය කිරීම | 477 | 783 |
| 03. තේවල අජිවි හෝ ජිවි කෘමීන් සහ අනෙකුත් අපවිත්‍රකාරක/ භාහිර ද්‍රව්‍ය පිළිබඳ අණ්වීක්ෂ පරීක්ෂණ | 49 | 40 |
| 04. තේවල ජානමය වශයෙන් අලුත්කළ ද්‍රව්‍ය පිළිබඳ නිර්ණය කිරීම | 587 | 828 |
| 05. Faecal Coliforms සහ Escherichia coli (E.coli) අනාවරණය සහ ගණනය කිරීම | 472 | 782 |
| 06. මුළු Coliform ප්‍රමාණය අනාවරණය සහ ගණනය කිරීම | 482 | 789 |
| **පළිබෝධ අවශේෂ විශ්ලේෂණ ඒකකය** | | |
| 01. ඊතේන් | 610 | 668 |
| 02. මැලතියන් | 610 | 668 |
| 03. Cypermethrin | 610 | 668 |
| 04. Beta Endosulfan | 352 | 668 |
| 05. Bifenthrin | 352 | 217 |
| 06. Bromopropylate | 610 | 668 |
| 07. Tetradifon | 610 | 668 |
| 08. Endo Sulphan Sulphate | 352 | 668 |
| 09. Bitertanol | - | 90 |
| එකතුව | 8949 | 12188 |

## 3.5.1. පරීක්ෂණ සහතික නිකුත් කිරීම

2016 වසර තුළදී රසායනාගාරය පරීක්ෂණ සහතික 2470 ක් නිකුත් කර ඇති අතර 2015 වසර සමග සැසඳීමේදී එය 64% ක වර්ධනයකි.

### නිකුත් කරන ලද සහතික වර්ග

1. තේ වල තෙතමන විශ්ලේෂණය
2. ISO 3720 අවම තත්ත්ව පරාමිතීන් සහිත තේ වල තත්ත්ව සහතිකකරණය
3. රසායන ද්‍රව්‍යවලට (සහ රසායන ද්‍රව්‍ය මිශ්‍ර කිරීම) අදාළ පරාමිතීන් සඳහා තේ සහතිකකරණය
4. තේ වල සිලිකාමය ද්‍රව්‍ය ප්‍රමාණය, දූවිලි / කුඩු විශ්ලේෂණය සහ තේවල පෙරහුම් විශ්ලේෂණයට අදාළ සහතිකකරණය
5. තේ වල බාහිර ද්‍රව්‍ය/ අජිවි සහ / හෝ සජිවි කෘමීන් සහ වෙනත් අපවිත්‍රකාරක බාහිර ද්‍රව්‍ය තිබේදැයි අණ්වීක්ෂ පරීක්ෂණවලට අදාළ සහතිකකරණය
6. තේ වල ක්ෂුද්‍රජිවිමය දූෂණය වීම් විශේෂයෙන්ම බැක්ටීරියා, පුස් සහ දිලීර වර්ධනය වීම, ඊකොලි, කෝලිෆෝම් සහ සැල්මොනෙල්ලා වර්ධනය වීම ආදියට අදාළව සහතිකකරණය
7. තේවල ජානමය වශයෙන් අළුත් කළ දෑ පිළිබඳ නිර්ණය කිරීම
8. තේවල පළිබෝධනාශක බහු අවශේෂ මට්ටම් පිළිබඳ (Ethion, Malathion, Cypermethrin, Beeta Endosulfan, Bromopropylate, Tetradifon, Endosulphan sulphate)

## 3.5.2. විශ්ලේෂණ රසායනාගාරයේ පරීක්ෂණ සේවා මඟින් උපයාගත් ආදායම්

2010.08.06 දිනැති, OR/1/87 අංක දරන තේ මණ්ඩලයේ චක්‍රලේඛනය පරිදි රසායනාගාරය මගින් සේවාලාභීන් ගේ ඉල්ලීම් පරිදි සිදුකළ පරීක්ෂණ සඳහා ගාස්තු අයකරනු ලබයි. රසායනාගාරයේ සමස්ත ආදායම, අපනයන කරුවන්ගෙන් සෘජුව ලබාගන්නා පරීක්ෂණ ගාස්තු (58.28%) සහ රසායනාගාරය විසින් තහවුරුකරන පරිදි ප්‍රමිතියට පහළ තේ යන බාණ්ඩය යටතේ තේ කොමසාරිස් සහ තේ අපනයන අංශ මගින් අයකරගනු ලැබූ ගාස්තු (41.72%) වල එකතුවකි.

වගුව 3.14: අභ්‍යන්තර අධීක්ෂණය හා බාහිර සහතිකකරණය අතර සමස්ත ආදායමේ පංගු බෙදීයාම

| | 2015 (රු.) | % | 2016 (රු.) | % |
|---|---|---|---|---|
| අභ්‍යන්තර අධීක්ෂණය (IMS) | 4,324,400 | 29.28 | 8,404,000 | 41.72 |
| බාහිර සහතිකකරණය (ECS) | 10,445,900 | 70.72 | 11,739,500 | 58.28 |
| සමස්ත ආදායම (රුපියල්) | 14,770,300 | | 20,143,500 | |

රසායනාගාරයේ විශ්ලේෂණ සේවාවන්වල ප්‍රතිඵල මත, තේ කොමසාරිස් සහ නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන) දූෂ්‍ය හෝ ප්‍රමිතියෙන් පහළ තේ තොග සම්බන්ධයෙන් නිල ක්‍රියාමාර්ග ගනුලබයි. ඒ අනුව, 2016 වසර තුළදී තේ තොග 1636 ක් ප්‍රමිතියෙන් පහළ ලෙස සලකා නිල ක්‍රියාමාර්ග ගෙන ඇත.

වගුව 3.15- 2015/2016 කාලයේ දී රසායනාගාරය විසින් උපයාගත් සමස්ත ආදායමේ සාරාංශය

| | 2015 (රුපියල්) | 2016 (රුපියල්) |
|---|---|---|
| සමස්ත ආදායම | 14,770,300.00 | 20,143,500.00 |

### 3.5.3. විශ්ලේෂණ රසායනාගාරයේ එක් එක් ඒකක විසින් නිරතවන කාර්යයන්

#### 3.5.3.1. තත්ත්ව පරීක්ෂණ සහ නියදි ඒකකය

ජාත්‍යන්තර සහතිකකරණය සඳහා සේවා සපයන ඕනෑම රසායනාගාරයක් විසින් ලේඛන පාලන ක්‍රමවේදයක් පවත්වාගෙන යාම කළයුතු වේ. එමනිසා, මෙම අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ ISO 17025 ප්‍රමිතිය මත විද්‍යාගාර ප්‍රතීතකරණය සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතිවලට අනුව විද්‍යාගාර ලේඛන ක්‍රමවේදයක් පවත්වාගෙන යාමයි.

ඊට අමතරව, මෙම අංශය රසායනාගාර නියදි ලබාගැනීම, සුදානම්කිරීම, සෝදුපත් කියවීම සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම යන කාර්යයන් වල යෙදේ.

#### 3.5.3.2. රසායන විශ්ලේෂණ ඒකකය

රසායන විශ්ලේෂණ ඒකකය පහත සඳහන් කාර්යයන් වල යෙදේ.

1. වෙන්දේසියට හා නැවිගත කිරීමට පෙර තත්ත්වයෙන් පහළ තේ පිළිබඳව රසායනික තක්සේරුවක් කිරීම
2. ISO 3720 ප්‍රමිතියට අනුව රසායනික තක්සේරුවක් කිරීම. එහි අඩංගු වන පරාමිතීන් වන්නේ Total Ash, Water Soluble Ash, Alkalinity, Acid insoluble ash, Water extract, Moisture and Crude Fiber contents
3. පෙරහන් විශ්ලේෂණ තාක්ෂණය අනුව තේ කුඩු සහ පිටි තක්සේරු කිරීම
4. තේවල අඩංගු සිලිකාමය ද්‍රව්‍ය තක්සේරු කිරීම

#### 3.5.3.3. ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක විශ්ලේෂණ ඒකකය

ආහාර නිෂ්පාදනවල තත්ත්වය සහ සුරක්ෂිතබව සහතික කිරීම සඳහා ක්ෂුද්‍ර ජීව විද්‍යා පරීක්ෂණ අවශ්‍ය වේ. තේ සම්බන්ධයෙන් මෙම අංශය පහත සඳහන් පරීක්ෂණවල නිරත වේ.

- faecal Coliform, E.coli අනාවරණය හා ගණනය කිරීම
- සමස්ත Coliform ප්‍රමාණය අනාවරණය හා ගණනය කිරීම
- පූර්ණ ක්ෂුද්‍ර ජීවී ගහණය සහ ඊස්ට් හා දිලීර ප්‍රමාණය

#### 3.5.3.4. පළිබෝධනාශක අවශේෂ විශ්ලේෂණ ඒකකය

ආනයනික රටවල් විසින් නිමි තේවල තිබිය හැකි උපරිම අවශේෂ මට්ටම් ස්ථාපිතකර ඇති බැවින් තේ වගාකිරීමේ දී භාවිතා කරණ පළිබොධ නාශකවල අවශේෂ තිබේදැයි විශ්ලේෂණය කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් බවට පත්ව ඇත.

මෙම අවශ්‍යතාවය සපුරාගැනීමේ අරමුණ ඇතිව රසායනාගාරය විසින් තේ නියදිවල පහත සඳහන් පළිබොධ නාශකවල අවශේෂ තිබේදැයි හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ සිදුකරනු ඇත.

- Ethion
- Malathion
- Cypermethrin
- Bromopropylate
- Bifenthrin
- Tetradifon
- Endosulfan sulfate
- Beta) Endosulfan

## 3.6 පරිපාලන අංශය

පරිපාලන අංශය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සියළුම මානව සම්පත් කළමනාකරණය සහ සංවර්ධනය කිරීමේ කටයුතු සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම පිළිබඳවත් තොරතුරු තාක්ෂණ සේවාවන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, මණ්ඩලයේ සැලසුම්කරණ කටයුතු, අධීක්ෂණ කටයුතු හා ඇගයීම් කටයුතු සම්බන්ධීකරණය සහ පහසුකම් සැපයීම පිළිබඳවත් සංඛ්‍යාලේඛන තොරතුරු බෙදාහැරීම සහ ශ්‍රී ලංකා තේ මණ්ඩල පුස්තකාලය පවත්වාගෙන යමින් තේ කර්මාන්ත පාර්ශවකරුවන්ට අවශ්‍ය තොරතුරු සේවාවන් සැපයීම, මණ්ඩලයේ නඩත්තු කටයුතු, ප්‍රවාහන පහසුකම් සැපයීමේ කටයුතු, ප්‍රසම්පාදන කටයුතු, ආරක්ෂක කටයුතු හා පවිත්‍රතා කටයුතු අධීක්ෂණය පිළිබඳවත් වගකීම් දරයි.

### 3.6.1. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය

වගුව 3.16: ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 2016 දෙසැම්බර් 31 දිනට

| ප්‍රවර්ගය | සේවක සංඛ්‍යාව | | එකතුව |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 06 | 01 | 07 ( 2.5%) |
| තෘතියික මට්ටම | 18 | 08 | 28 (10.1%) |
| ද්විතියික මට්ටම | 66 | 108 | 174 (62.8%) |
| ප්‍රාථමික මට්ටම | 64 | 06 | 70 (24.6%) |
| **එකතුව** | **154(55.59%)** | **123(44.41%)** | **277 (100%)** |

වගුව 3.17: මානව සම්පත් ගලනය 2016

| විස්තර | සේවක සංඛ්‍යාව |
|---|---|
| ඉල්ලා අස්වීම් | 06 |
| විශ්‍රාම ගැනීම් | 10 |
| සේවය අත්හැරයාම | - |
| සේවය අවලංගු කිරීම | - |
| සේවය නතර කිරීම් | 06 |
| **එකතුව** | 22 |

### 3.6.2. මානව සම්පත් සංවර්ධනය

වගුව 3.18: දේශීය පුහුණු

| ප්‍රවර්ගය | පුහුණු කරන ලද සේවානියුක්තිකයින් සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 00 |
| තෘතියික මට්ටම | 10 |
| ද්විතියික මට්ටම | 35 |
| ප්‍රාථමික මට්ටම | 05 |
| එකතුව | 50 |

### 3.6.3. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විධායක නිලධාරීන් සඳහා ගෘහස්ථ පුහුණු වැඩසටහන

කාර්ය මණ්ඩලය සඳහා ආයතනික ප්‍රතිපල රාමුවක් (ORF) ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව

මෙම ගෘහස්ථ පුහුණු වැඩසටහනේ අරමුණ වූයේ සහභාගි වූවන් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංස්ථාපිත සැලසුමේ වැදගත් මූලිකාංග හඳුනාගැනීම ට සහාය වීමයි. මෙහිදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (KPI's) ගොඩනැගීමට එකඟ විය.

මෙම පුහුණු වැඩසටහන 2016 සැප්තැම්බර් 23 දින විධායක නිලධාරීන් 75 දෙනෙකු සඳහා සංවිධානය කර තිබුණි.

ජායාරූපය 3.45 - 3.46 : කාර්ය මණ්ඩලය සඳහා ආයතනික ප්‍රතිපල රාමුවක් (ORF) ගොඩනැගීම පිළිබඳ වැඩමුළුව



වගුව 3.19 : විදේශීය පුහුණු

| ප්‍රවර්ගය | පුහුණු කරන ලද සේවානියුක්තිකයින් සංඛ්‍යාව |
|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 00 |
| තෘතියික මට්ටම | 08 |
| ද්විතියික මට්ටම | 00 |
| ප්‍රාථමික මට්ටම | 00 |
| එකතුව | 08 |

### 3.6.4. තේ මණ්ඩල දිනය - සාමූහිකත්වය ගොඩනැගීමේ වැඩසටහන

පිළියන්දල වින්රිච් හෝටලයේ, 2016 අප්‍රේල් 02 දින සියළුම කාර්ය මණ්ඩලය සඳහා මෙම උත්සවය සංවිධානය කර තිබුණි.

ජායාරූප 3.47 - 3.48 : තේ මණ්ඩල දිනය ආරම්භ කිරීමේ උත්සව අවස්ථාව



ජායාරූප 3.49 - 3.50 සාමුහිකත්වය ගොඩනගන ක්‍රීඩා



### 3.6.5 සමාජ සත්කාර සේවා

ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2016 දෙසැම්බර් 16 දින ලේ දන් දීමේ වැඩසටහනක් සංවිධානය කළා. සෙවකයන් 50 දෙනෙකු ලේ දන් දීමට ඉදිරිපත්විය.

## 3.7. අභ්‍යන්තර විගණන අංශය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණනය යනු ස්වාධීන ඇගයුම් කාර්යයකි. එමගින් කළමනාකරණයේ සියළු මට්ටම් සඳහා සේවාවක් වශයෙන් ක්‍රියාකාරකම් විමර්ශනය කරයි. එය ආයතනයෙහි සම්පත් කාර්යක්ෂම ලෙස උපයෝගිකර ගැනීමට දායකත්වය ලබා දෙමින් මුල්‍ය හා මුල්‍ය නොවන අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය පිළිබඳ මිනුම් කරන, ඇගයීම් කරන සහ වාර්තා කරන පාලනයකි.
ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ විගණන කමිටුව මගින් 2016 සඳහා අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කරන ලද අතර අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීනත්වය, විෂයානුබද්ධ බව හා කාර්ය සාදනය සහ එහි පවත්නා සම්පත්වල ප්‍රමාණවත් බව පිළිබඳව ද විමර්ශනය කරණ ලදී. කමිටුව වෙත ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සහ එම වාර්තා මගින් ඉදිරිපත් කරන ලද විගණන අනාවරණය කිරීම් සඳහා අවධානම් මට්ටම් මත පදනමව ප්‍රමුඛතාව ලැබිණි.

2016 වසර තුළදී විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වන ලද අතර නිවැරදි පියවර / නිවාරණ පිළියම් යෙදීම සඳහා ඉඩප්‍රස්ථා ලබාගැනීමට හැකිවන අයුරින් කමිටු වාර්තා සමග අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

## 3.8. තොරතුරු තාක්ෂණ අංශය

2016 වසර තුළදී තොරතුරු තාක්ෂණ අංශය විසින් වැදගත් ව්‍යාපෘති කිහිපයක් සම්පූර්ණ කරන ලද අතර දෛනික රාජකාරි කටයුතුවලදී එල්ලවන අභියෝග ජයගැනීම සඳහා සියළුම අංශ වලට සහාය වෙමින් සහ උපදෙස් ලබා දෙමින් තොරතුරු තාක්ෂණ අංශය විසින් අවශ්‍ය කාර්යභාරයක් ඉටු කරන ලදී . තේ පරීක්ෂක මොඩියුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පසුගිය වසර තුළදී ලද ප්‍රධාන ජයග්‍රහණයක් වන අතර එහිදී මෙම පද්ධතිය මගින්, වඩාත් නිවැරදි සහ කාර්යක්ෂම ආකාරයෙන් ටැබ් මගින් පරීක්ෂණ තොරතුරු පද්ධතියට ඇතුල් කිරීමට තේ පරීක්ෂකවරුන් සඳහා පහසුකම් සලසා දෙන ලදී. තවද,ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා වෙබ් පාදක පද්ධතිය හරහා සියළුම ප්‍රාදේශීය කාර්යාල සම්බන්ධ වන්නා වූ, කර්මාන්ත ශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය සහ තේ නැවත වගා සහනාධාර ක්‍රමය සඳහා අයදුම් කිරීම සජීවීව ක්‍රියාත්මක කිරීම පසුගිය වසර තුළදී නිමකරන ලද තවත් ප්‍රධාන ව්‍යාපෘතියක් වේ. තේ වාර්තා වල මුලික අදියර අවසන් කරන ලදී. එබැවින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වෙළඳ පොළ ආශ්‍රිත වාර්තා දැන් නිකුත් කරනු ලැබේ.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට රු. සංශෝධිත |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | F | 813,201,842 | 696,486,417 |
| ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම් | G | 23,113,785 | 26,079,904 |
| අස්පෘශ්‍ය වත්කම් | H | 12,347,346 | 11,228,182 |
| | | 848,662,972 | 733,794,502 |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ තොග | I | 35,538,627 | 34,570,459 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | J | 33,230,235 | 30,509,384 |
| තැන්පතු සහ පෙර ගෙවුම් | K | 53,015,712 | 120,928,205 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | L | 6,139,953,803 | 5,250,628,454 |
| ණය | M(1) | 1,123,463,950 | 492,096,500 |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | M | 65,406,603 | 145,540,847 |
| | | 7,450,608,930 | 6,074,273,849 |
| **මුළු වත්කම්** | | **8,299,271,902** | **6,808,068,351** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| දායක ප්‍රාග්ධනය | | 672,012,202 | 672,012,202 |
| රඳවා ගත් ඉපැයුම් | | (267,880,212) | (272,557,746) |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්ද | N | 5,794,718,308 | 5,512,850,782 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 508,216,543 | 481,933,543 |
| **මුළු හිමිකම්** | | 6,707,066,841 | 6,394,238,781 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ බැඳීම් | O | 63,623,185 | 55,562,838 |
| බැංකු ණය | P | 676,300,000 | - |
| | | 739,923,185 | 55,562,838 |
| **ජංගම වගකීම්** | | | |
| දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් | Q | 110,361,031 | 90,916,543 |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | R | 733,427,052 | 265,069,381 |
| බැංකු ශේෂ | S | 8,493,793 | 2,280,808 |
| | | 852,281,876 | 358,266,732 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **8,299,271,902** | **6,808,068,351** |

පිටු අංක 67 සිට 71 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 72 සිට 80 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශ සැකසීම සහ ඉදිරිපත් කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශ අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලද්දේ.

| | | | |
|---|---|---|---|
| Director Finance | Director General | Chairman | Director |
| අධ්‍යක්ෂ - මූල්‍ය | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති | අධ්‍යක්ෂ |

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## ආදායම් සහ වියදම් ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | සටහන් | 2016 රු. | 2015 රු. |
|---|---|---|---|
| **ආදායම** | A | **444,769,549** | **7,256,493,650** |
| **වියදම** | | | |
| තේ ක්ෂේත්‍ර සංවර්ධන පිරිවැය | B | **(86,381,964)** | (6,817,116,865) |
| පරිපාලන වියදම් | C | **(364,205,491)** | **(357,855,534)** |
| **මෙහෙයුම් අතිරික්තය / (හිගය)** | | **(5,817,906)** | 81,521,251 |
| මූල්‍ය වියදම් | D | **(35,223,182)** | (251,537) |
| මූල්‍ය ආදායම් | E | **54,715,509** | 9,262,257 |
| **කාලපරිච්ඡේදය තුළ මෙහෙයුම් අතිරික්තය/ (හිගය)** | | **13,674,421** | 90,531,971 |
| පොළී ආදායම මත ගෙවූ බදු | | **(8,996,887)** | (4,274,997) |
| | | **4,677,534** | **86,256,974** |

පිටු අංක 67 සිට 71 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 72 සිට 80 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

# හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | දායක ප්‍රාග්ධනය<br>රු. | ප්‍රවර්ධන හා අලෙවි බද්ද<br>රු. | ප්‍රත්‍යාගණන සංචිත<br>රු. | සමුච්චිත ලාභය<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| **2015 ජනවාරි 01 දිනට ශේෂය** | 652,067,602 | 4,904,992,816 | 481,933,543 | (350,567,922) | 5,688,426,038 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන N) | - | 607,857,966 | - | - | 607,857,966 |
| ප්‍රාග්ධන අයිතමයන් සඳහා රජයේ ප්‍රතිපාදන | 19,944,600 | - | - | - | 19,944,600 |
| රඳවාගත් ඉපැයුම් | - | - | - | (8,246,798) | (8,246,798) |
| 2015 වර්ෂය තුළ අතිරික්තය | - | - | - | 86,256,974 | 86,256,974 |
| **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය (සංශෝධිත)** | **672,012,202** | **5,512,850,782** | **481,933,543** | **(272,557,746)** | **6,394,238,781** |
| 2016 ජනවාරි 01 දිනට ශේෂය | 672,012,202 | 5,512,850,782 | 481,933,543 | (272,557,746) | 6,394,238,781 |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද (සටහන N) | - | 281,867,526 | - | | 281,867,526 |
| | - | - | - | - | - |
| රඳවාගත් ඉපැයුම් | - | - | 26,283,000 | | 26,283,000 |
| 2016 වර්ෂය තුළ අතිරික්තය | - | - | - | 4,677,534 | 4,677,534<br>- |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය (සංශෝධිත)** | **672,012,202** | **5,794,718,308** | **508,216,543** | **(267,880,212)** | **6,707,066,841** |

පිටු අංක 67 සිට 71 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 72 සිට 80 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2016 | 2015 සංශෝධිත |
|---|---|---|
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහ** | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ ලාභය** | **4,677,534** | **86,256,974** |
| ගැලපුම්: | | |
| දේපල, පිරියත සහ උපකරණ ක්ෂය වීම | 31,770,939 | 25,880,398 |
| දේපල, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලද ලාභය හෝ පාඩුව | 220,158 | (531,525) |
| කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම | 2,966,119 | 76,386 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම | 900,611 | 879,169 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 18,663,915 | 18,144,513 |
| මූල්‍යමය වියදම් | 35,223,182 | 251,537 |
| මූල්‍යමය ආදායම් | (54,715,509) | (9,262,257) |
| | 35,029,415 | 35,438,221 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | **39,706,949** | **121,695,195** |
| භාණ්ඩ තොග අඩුවීම/ (වැඩිවීම) | (968,168) | 2,302,597 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුත දෑ අඩුවීම /(වැඩිවීම) | (2,720,851) | 4,685,745 |
| තැන්පතු සහ පෙර ගෙවුම් අඩුවීම /(වැඩිවීම) | 67,912,493 | (12,384,909) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවියයුතු දෑඅඩුවීම /(වැඩිවීම) | 487,802,159 | 58,608,931 |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා ණය | (631,367,450) | (492,096,500) |
| | (79,341,817) | (438,884,136) |
| **මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ මුදල්** | **(39,634,868)** | **(317,188,942)** |
| පාරිතෝෂික ගෙවීම් | (10,603,568) | (6,533,899) |
| ප්‍රවර්ධන කටයුතු සඳහා ශුද්ධ වියදම | (1,157,130,158) | (554,081,796) |
| **මෙහෙයුම් කටයුතුවලින් ඉපැයූ ශුද්ධ මුදල** | **(1,167,733,726)** | **(560,615,695)** |
| **මෙහෙයුම් කටයුතුවලදී (භාවිත) මුදල් ප්‍රවාහය** | **(1,207,368,594)** | (877,804,637) |
| **ආයෝජන කටයුතුවලදී (භාවිත) මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද මත ලද පොළිය | 417,952,898 | 40,245,473 |
| මූල්‍ය ආදායම් | 54,715,509 | 9,262,257 |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත් කරගැනීම | (2,019,775) | (288,025) |
| දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම | (122,463,412.00) | (33,467,103) |
| ප්‍රවර්ධන හා අලෙවි බද්ද ඇතුළු ආයෝජන | (889,325,349) | (180,480,349) |
| **ආයෝජන කටයුතුවලදී භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(541,140,129)** | **(164,727,747)** |
| **මූල්‍ය කටයුතුවලදී භාවිත මුදල් ප්‍රවාහය** | | |
| දේපල, පිරියත සහ උපකරණ අලෙවියෙන් ලද මුදල | 39,890 | 1,528,555 |
| මූල්‍යමය වියදම් | (35,223,182) | (251,537) |
| ප්‍රාග්ධන මිලදීගැනීම් සඳහා රජයේ ප්‍රදාන | - | 19,944,600 |
| අපනයනකරුවන්ගෙන් එකතු කරන ලද බදු මුදල් | 1,021,044,786 | 1,121,694,289 |
| බැංකු ණය | 676,300,000 | - |
| **මූල්‍ය කටයුතුවලදී (භාවිත) ශුද්ධ මුදල් ප්‍රවාහ** | **1,662,161,494** | **1,142,915,907** |
| **මුදල් සහ මුදල් සමාන වස්තුවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)** | **(86,347,229)** | 100,383,523 |
| **වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන වස්තු** | **143,260,038** | 42,876,516 |
| **වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන වස්තු** | **56,912,809** | 143,260,038 |

පිටු අංක 67 සිට 71 දක්වා දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 72 සිට 80 දක්වා දැක්වෙන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනුකලන අංගයකි.

## 1. සංස්ථාපිත තොරතුරු

### සාමාන්‍ය කරුණු

1985 අංක 17, 1990 අංක 44, 2003 අංක 29 හා 2006 අංක 44 දරන පනත්වලින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ 1976 ජනවාරි 01 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය ස්ථාපිත කරන ලදි. මෙහි ප්‍රධාන කාර්යාලය අංක 574, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයේ පිහිටා ඇත.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය වාර්තා පිළියෙල කරනු ලබන අතර මෙම මූල්‍ය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබයි.

### ප්‍රධාන කාර්යයන්

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය සංවර්ධනය කිරීම, නියාමනය කිරීම සහ ශ්‍රී ලංකා තේ (සිලෝන් ටී) ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අභිමතාර්ථ වේ. තේ නිෂ්පාදනය, අලුත් ප්‍රදේශවල තේ වගාකිරීම සහ තේ නැවත වගාකිරීම, පැරණි තේවතු පුනරුත්ථාපනය කිරීම, තේ කර්මාන්තශාලා පිහිටුවීම සහ ඒවායේ මෙහෙයුම් යන තේ කර්මාන්තය ආශ්‍රිත කටයුතු නියාමනය කිරීම පිළිබඳ වගකීම දරනුයේද ශ්‍රී ලංකා තේ මණ්ඩලයයි. තවද, තේ වෙන්දේසි පැවැත්වීම නියාමනය කිරීම, ගුණාත්මක තත්ත්වය අධීක්ෂණය කිරීම සහ විකුණුම් නියාමනය කිරීම, අපනයන තැරැව්කරුවන්, ගබඩා සහ තේ නැව්ගත කිරීම ආදි කටයුතු නියාමනය කිරීම ද එමඟින් සිදුකරනු ලබයි. තේ වතු පාලනයේ සහ තේ නිෂ්පාදනයේ සහ අලෙවිකරණයේ නියැලී සිටින සියලුම ආයතන සහ සංවිධාන නියාමනය කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීමද ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සිදුකරනු ලබයි.

## 2. පිළියෙල කිරීම සඳහා පදනම

**2.1 පිළියෙල කිරීමේ පදනම සහ ශ්‍රී.ලං.ගි.ප්‍ර. (ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර.) අනුගමනය කිරීම 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන මූල්‍ය කාලපරිච්ඡේදය සඳහා අදාළ වේ.**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර. වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලපරිච්ඡේදය ද ඇතුළුව ඒ දක්වා වූ සියලුම කාලපරිච්ඡේද සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් එහි මූල්‍ය වාර්තා 2011 දෙසැම්බර් 31 දින දක්වා බලපැවැත්වූ ශ්‍රී.ලං.ගි.ප්‍ර. වලට අනුකූලව පිළියෙල කොට ඇත. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පිළියෙල කරන ලද මෙම මූල්‍ය වාර්තා 2012 ජනවාරි 01 දිනෙන් හෝ එදිනෙන් පසුව ආරම්භ වන කාලපරිච්ඡේදය සඳහා බලපැවැත්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද පළමු වාර්තා වේ.

### 2.2 ගණනය කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.
මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### 3.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් භාවිත කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

### 3.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත හා උපකරණ කිසියම් සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු වෙතොත් ඒවා හැර පිරිවැයට දක්වනු ලැබේ. එම පිරිවැය යන්නට දේපළ, පිරියත සහ උපකරණවල උපාංග කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම් සඳහා දරනු ලබන පිරිවැය සහ හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් දීර්ඝකාලීන ඉදිකිරීම් සඳහා අදාළ වන ණය පිරිවැය ඇතුළත් වේ. දේපළ, පිරියත සහ උපකරණවල වැදගත් කොටස් වරින්වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍යවන විටදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රතිෂ්ඨාපිත උපාංග හඳුනා නොගන්නා අතර නව කොටස් ඒවායේ සඵල ආයු කාලය හා ක්ෂයවීම මත හඳුනාගනී. එසේම ප්‍රධාන පරීක්ෂණයක් සිදුකරන අවස්ථාවකදී එහි පිරිවැය හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලයි නම් ප්‍රතිෂ්ඨාපනයක් වශයෙන් පිරියත සහ උපකරණවල ධාරණ අගය මත හඳුනාගනී. අනෙකුත් සියලුම අලුත්වැඩියා සහ නඩත්තු පිරිවැය දරන ලද පිරිවැයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශවල හඳුනාගනී.

### 3.3 ක්ෂයවීම්

ක්ෂයවීම් සමානුපාතික පදනම මත ගණනය කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| සින්නක්කර ගොඩනැගිලි | අවුරුදු 50 |
| කාර්යාල උපකරණ | අවුරුදු 02-20 |
| ලිබඩු සහ සවිකුරු | අවුරුදු 01-20 |
| මෝටර් රථ | අවුරුදු 10 |
| පරිගණක උපාංග | අවුරුදු 05 |
| පුස්තකාල පොත් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03-10 |

## 3.4 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වර්ෂය තුළදී දරන ලද ශේෂ පත්‍ර දිනය වන විට ප්‍රාග්ධනිත කර නොමැති ප්‍රාග්ධන පිරිවැය කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස දක්වනු ලබන අතර වර්ෂය තුළදී ප්‍රාග්ධනිත කර භාවිතයට ගෙන ඇති ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණවලට මාරු කරනු ලැබේ.

## 3.5 බදු ඉඩම්

පරීක්ෂණය දිනය වනවිට ගිවිසුමෙහි සඳහන් කරුණු මත පදනම්වන බදු ගිවිසුමක් ද, ගිවිසුම සපුරාලීම නිශ්චිත වත්කමක් හෝ වත්කම් භාවිත කරන අයුරු මත රඳාපවතිද යන්න හා ගිවිසුමේ නිශ්චිතවම වත්කම් භාවිතය සඳහා වන අයිතිය පිළිබඳ සඳහන් කර නොමැති වුවද වත්කම් භාවිතය සඳහා ගිවිසුම මගින් අයිතිය පවරනු ලබයිද යන කරුණු නිශ්චය කෙරේ. බදු වත්කම්වල ඇස්තමේන්තු ගත සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

බදු ඉඩම් - අවුරුදු 50යි

## 3.6 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීමේ පිරිවැය මත ගණනය කරනු ලැබේ. ආරම්භක හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකළ සමුච්චිත ක්‍රමක්ෂයට සහ කිසියම් සමුච්චිත හානි පාඩු වෙතොත් ඒ මත අස්පෘශ්‍ය වත්කම් ගණනය කරනු ලැබේ. ප්‍රාග්ධනිත සංවර්ධන පිරිවැය හැර අභ්‍යන්තර වශයෙන් උත්පාදිත අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර පිරිවැය දරනු ලබන වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය තුළ පිරිවැය දක්වනු ලැබේ. අස්පෘශ්‍ය වත්කම්වල සඵල ආයුකාලය පහත සඳහන් පරිදි වේ.

පරිගණක මෘදුකාංග - අවුරුදු 15යි

## 3.7 මූල්‍ය නොවන වත්කම් හානිවීම්

සෑම වාර්තාකරණ දිනයක් වන විට වත්කමක් හානිවන බවට යම් සඳහනක් තිබේද යන්න පිළිබඳව ශ්‍රී ලංකා තේ මණ්ඩලය තක්සේරු කරයි. එබඳු කිසියම් සඳහනක් තිබේනම් හෝ කිසියම් වත්කමක් සම්බන්ධයෙන් වාර්ෂික හානි පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය වේනම් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමෙහි අයකරගත හැකි වටිනාකම තක්සේරු කරනු ලබයි. වත්කමක හෝ මූල්‍ය උත්පාදන ඒකකයක විකුණුමට පිරිවැය අඩුකළ සාධාරණ අගය සහ එහි භාවිත අගය වූ කලි වත්කමක අයකරගත හැකි ඉහළම අගය වන අතර වත්කමක් අනෙකුත් වත්කම් හෝ වත්කම් භාණ්ඩවලින් විශාල වශයෙන් ස්වාධීනව මුදල් ප්‍රවාහයක් උත්පාදනය නොකරන්නේනම් මිස එම වත්කම කේවල වත්කමක් ලෙසට තීරණය කරනු ලැබේ. වත්කමක හෝ මූල්‍ය උත්පාදන ඒකකයක ධාරණ අගය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවා යනවිට වත්කම හානිවූවා සේ සලකනු ලබන අතර එහි අයකරගත හැකි අගයට අඩුකරනු ලැබේ. භාවිතයේ වටිනාකම තක්සේරු කිරීමේදී වත්කමේ නිශ්චිත අවධානම සහ මුදල්වල කාලීන වටිනාකම පිළිබඳ ප්‍රවර්තන වෙළඳපොළ තක්සේරුව පිළිබිඹු කරන බදු පූර්ව වට්ටම් අනුපාතයක් භාවිතා කරමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහය වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුමට පිරිවැය අඩුකළ සාධාරණ අගය නිශ්චය කිරීමේදී මෑතකාලීන වෙළඳපොළ ගණුදෙනු වෙතොත් ඒවා සැලකිල්ලට ගනු ලබන අතර එවැනි ගණුදෙනු හඳුනාගැනීමට නොහැකි වුවහොත් යෝග්‍ය තක්සේරු කිරීමේ ක්‍රමවේදයක් භාවිත කරනු ලැබේ.

## 3.8 බදුකරණය

ශ්‍රී ලංකා තේ මණ්ඩලය, 2006 අංක 10 දරණ දේශිය ආදායම් පනත සහ එහි සංශෝධන වලට අනුව 28% ක අනුපාතයක් සහිතව ආදායම් බදු ගෙවීමටත් ඊට අමතරව ලාභාංශ බදු ගෙවීමටත් බැඳී සිටී. බදු සඳහා ප්‍රතිපාදන සහ බදුගෙවීම් පිළිබඳ විස්තර, මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් (Q) යටතේ ඉදිරිපත් කර ඇත.

## 3.9 භාණ්ඩ තොග

පළමු ගැනුම් පළමු නිකුතු පදනම යටතේ යල්පැනගිය සහ අඩු චලනයක් සහිත අයිතම සඳහා නියමිත දීමනා ගෙවීමෙන් අනතුරුව භාණ්ඩ තොග පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගයන් දෙකෙන් අඩු අගය මත හඳුනාගනී.

## 3.10 මුදල් සහ මුදල් සාමයයන්

මුදල් සහ මුදල් සාම්‍යයන්, අතැති සහ බැංකුවේ ඇති මුදල්, මුලික පරිණත වීම මාස තුනක් හෝ ඊට වඩා අඩු කාලපරිච්ඡේදයක් තුළ වන අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ.

## 4. වගකීම් සහ ප්‍රතිපාදන විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

### 4.1. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව පාරිතෝෂික ගෙවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය බැඳී සිටී. සේවකයෙකුට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් වගකීමක් ඇති වන්නේ එකී සේවකයා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අඛණ්ඩව වසර පහක සේවා කාලයක් සපුරන්නේ නම් පමණි. මෙම වගකීම සපුරාලීම සඳහා ශේෂ පත්‍රය තුළ ප්‍රතිපාදන ඉදිරියට රැගෙන එනු ලැබේ. වර්ෂය ආරම්භයේදී ඉදිරියට රැගෙන ආ ප්‍රතිපාදනයේ සහ වර්ෂය අවසානයේදී ඉදිරියට රැගෙන ගිය ශේෂය අතර වෙනස සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශයේදී කටයුතු කරනු ලැබේ.

ගණනයේදී භාවිත කරනු ලබන ප්‍රධාන උපකල්පන පහත සඳහන් පරිදි වේ.

අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධක අනුපාතය - 1.01% සිට 1.03%

වට්ටම් අනුපාතය/ පොලි අනුපාතය - 12.16%

කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය - 6%

මෙම වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීමක් සිදු නොවේ. මෙය ශේෂ පත්‍රය තුළ ජංගම නොවන වගකීම් යටතේ බාණ්ඩගත කරනු ලැබේ.

### 4.2 නිශ්චිත දායකත්ව සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ රෙගුලාසිවලට අනුකූලව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක මුදල් සපයයි. සේවකයින් ආවරණය වන සැලසුම්වලට දායක මුදල් සැපයීමේ බැඳීම් ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගනී.

**සේවක අර්ථසාධක අරමුදල**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා සේවකයින් විසින් සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 15% ක් හා 10%ක් අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

**සේවක භාරකාර අරමුදල**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සේවක දළ වැටුපෙන් 3% කට සමාන ප්‍රමාණයක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවනු ලබයි.

### 5.ආදායම් ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා පිරිවැය ක්‍රමවේදයේ ක්‍රියාකාරීත්වය සංස්ථාපිත කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණ ලෙස නියෝජනය වන පරිදි අනුගමනය කරනු ලැබේ.

**රජයේ ප්‍රදාන**

ප්‍රාග්ධන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රදාන සංවර්ධන සහනාධාර ගෙවීම සඳහා සම්පූර්ණයෙන්ම භාවිත කෙරේ. පුනරාවර්තන වැය ශීර්ෂය යටතේ පවත්නා රජයේ ප්‍රදාන සේවකයින්ට වැටුප් ගෙවීම සඳහා භාවිත කෙරේ.

**5.1 ආදායම් හඳුනාගැනීම**

ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ආර්ථික ප්‍රතිලාභ ගලා යා හැකි ප්‍රමාණයට සහ ගෙවීම් සිදුකිරීමේදී ඒ පිළිබඳ නොසලකා ආදායම විශ්වසනීය ලෙස ගණනය කළ ප්‍රමාණයට ආදායම හඳුනාගනී. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් පිළිබඳ නියමයන් සැලකිල්ලට ගෙන ලැබුණු හෝ ලැබිය යුතු මුදල්වල සාධාරණ අගයට ආදායම ගණනය කරනු ලැබේ.

ආදායම් හඳුනාගැනීමට පෙර පහත සඳහන් නිශ්චිත හඳුනාගැනීමේ නිර්ණායකද සපුරාලිය යුතුය.

**භාණ්ඩ විකිණීම**

සාමාන්‍යයෙන් භාණ්ඩ සැපයීමේදී භාණ්ඩ හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ භාණ්ඩ ගැනුම්කරු වෙත හිමිවන අවස්ථාවේදී භාණ්ඩ විකිණීමෙන් ලබන ආදායම හඳුනාගනී.

**සේවා සැපයීම**

සේවය සැපයූ හෝ ඉටුකරනු ලැබූ කාලපරිච්ඡේදයේදී සේවා සැපයීමෙන් ලබන ආදායම හඳුනාගනී.

**වෙනත් ආදායම්**

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනී.

**පොළී ආදායම්**

සියලුම මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලබන අතර පොලි දරන මූල්‍ය වත්කම් විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. පොළී ආදායම හෝ වියදම මූල්‍ය වත්කමේ අපේක්ෂිත ආයුකාලය හෝ ඊට අඩු කාලපරිච්ඡේදයක් තුළ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් උචිත පරිදි මූල්‍ය වත්කමේ හෝ ශුද්ධ ධාරණ අගයට වට්ටම් කරනු ලබන සැබෑ අනුපාතය වන ඵලදායී පොළී අනුපාතය භාවිතා කරමින් වාර්තා කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුල පොළී ආදායම ඇතුල්කර ඇත.

### 5.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් වර්ෂය සඳහා අතිරික්තය ගණනය කිරීමේදී ආධායමට එක්කර ඇත. අලුත්වැඩියා සහ අලුත්කිරීම් එම වියදම දරන ලද වර්ෂය තුළදී ආධායමට හා වියදමට ගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් පවත්වාගන යන මොස්කව්, එ. අ. එ. රාජ්‍ය සහ චීනය යන විදේශීය කාර්යාලවල නිලධාරීන් තිදෙනාට වැටුප් ගෙවීමට අමතරව සියළුම දීමනා 2016 වසරේ සිට ප්‍රවර්ධන හා අලෙවි බදු යටතේ නඩත්තු වියදම් ලෙස පවත්වාගෙන යනු ලැබේ.

## 6. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම සහ පසු ගණනය කිරීම්

### 6.1 මූල්‍ය වත්කම්

### 6.1.1 මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 විෂය පථය තුළ මූල්‍ය වත්කම් යෝග්‍ය පරිදි ලාභ හා පාඩු, ණය සහ ලැබිය යුතු, පරිනතිය සඳහා තබා ඇති ආයෝජන සහ විකිණීම සඳහා තබා ඇති මූල්‍ය වත්කම් හරහා සාධාරණ අගයට මූල්‍ය වත්කම් වශයෙන් වර්ග කරනු ලබන අතර මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට නොමැති කල්හි සෘජුවම ගණුදෙනු පිරිවැයට හඳුනාගැනේ.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය වත්කම් යන්නට මුදල් සහ කෙටිකාලීන ආයෝජන, වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු සහ කාර්යමණ්ඩල ණය සහ අනෙකුත් ලැබියයුතු දෑ ඇතුළත් වේ.

### 6.1.2 පසු ගණනය කිරීම්

මූල්‍ය වත්කම්වල පසු ගණනය කිරීම් පහත සඳහන් පරිදි ඒවායේ වර්ගකිරීම් මත පදනම් වේ.

#### 6.1.2.1 මූල්‍ය වත්කම් අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට ගණනය කිරීම

අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් යන්නට වෙළඳාම සඳහා තබාගන්නා ලද මූල්‍ය වත්කම් සහ මූලික හඳුනාගැනීම මත අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට පවතින මූල්‍ය වත්කම් ලෙස තිරණය කරන ලද වත්කම් ඇතුළත් වේ. මූල්‍ය වත්කම් විකිණීම සඳහා හෝ ආසන්න කාලයේදී නැවත මිලදී ගැනීම සඳහා ඇතුළත් කරගන්නේ නම් ඒවා වෙළඳාම සඳහා ලබාගන්නා ලද වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුව පරිනත වීම සඳහා තබාගන්නා ලද ආයෝජන නොතිබුණි.

#### 6.1.2.2 ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා ණය

මූල්‍ය වසර තුලදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය ප්‍රාදේශිය වැවිලි සමාගම් සඳහා පහත සඳහන් පරිදි ණය ප්‍රධානය කර ඇත.

| | ස්වභාවය | ප්‍රධානය කළ දිනය | ගණන | කාල සීමාව | කැබිනට් අනුමැතිය |
|---|---|---|---|---|---|
| උත්සව අත්තිකාරම් ණය | පොලි රහිත ණය | 28.10.2016 | 476,919,500/- | මාස 10 | 15/1693/726/010 |
| වැටුප් වර්ධක ණය | පොළී දරණ ණය | 26.07.2016 | 676,300,000/- | මාස 48 | 16/1234/726/034 |

#### 6.1.2.3 ආයෝජන පරිනතිය සඳහා තබාගැනීම

ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර පරිනතයන් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පරිනත වීම සඳහා තබාගැනීම පිණිස සාධනීය අභිප්‍රායක් සහ ශක්‍යතාවක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතු වනවිට පරිනතිය සඳහා තබාගන්නා ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. මූලික ගණනය කිරීමෙන් අනතුරුව එවැනි මූල්‍ය වත්කම් පසුව ඵලදායි පොලි අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් හානිවීම් අඩුකළ ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරනු ලැබේ. කිසියම් වට්ටමක් හෝ අත්පත් කරගැනීමක් මත වන වාරික සහ ඵලදායි පොලි අනුපාත ක්‍රමවේදයේ අවියෝජනීය කොටසක් වන ගාස්තු හෝ පිරිවැය වේ නම් ඒ පිළිබඳ සැලකිල්ල යොමුකොට ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබේ. ඵලදායි පොලි අනුපාත ක්‍රමවේදය මත ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම්වල ඇතුළත් කරනු ලැබේ. හානිවීම් තුළින් සිදුවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනී.

#### 6.1.2.4 මූල්‍ය ආයෝජන විකිණීම සඳහා තැබීම

විකිණීම සඳහා තබන මූල්‍ය ආයෝජන යන්නට හිමිකම් සහ ණය සුරැකුම් ඇතුළත් වේ. විකිණීම සඳහා තබන ලදැයි වර්ගීකරණය කරන ලද හිමිකම් ආයෝජන යනු වෙළඳාම සඳහා තබන ලදැයි වර්ගීකරණය නොකරන ලද සහ අතිරික්තය හා හිඟය තුළින් සාධාරණ අගයට ගණනය නොකරන ලද ආයෝජනයන්ය. මෙම බාණ්ඩයේදී ණය සුරැකුම් යනු අවිනිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා තබාගැනීමට අපේක්ෂා කරන ද්‍රවශීලි අවශ්‍යතා හෝ වෙනස්වන වෙළඳපොල තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් විකිණිය හැකි දෑය.

මූලික ගණනය කිරීම්වලින් අනතුරුව විකිණීම සඳහා තබා ඇති මූල්‍ය ආයෝජන පසුව අනෙකුත් විස්තීර්ණ ආදායම් වශයෙන් හඳුනා ගනුලබන උපලබ්ධි නොවූ ලාභ හා පාඩු සහිත සාධාරණ අගයට ගණනය කරනු ලැබේ. විකිණීම් සඳහා තබා ඇති ණය සුරැකුම් මත පොළී ගණනය කිරීම ඵලදායි පොලි අනුපාත ක්‍රමවේදය භාවිත කරමින් සිදුකරනු ලබන අතර අතිරික්තය හා හිඟයතුළ හඳුනා ගැනේ. 2016 දෙසැම්බර් 31දිනෙන් අවසන්වන වර්ෂය තුළ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සතුව විකිණීම සඳහා තබන ලද මූල්‍ය ආයෝජන නොතිබුණි.

### 6.1.2.5 හඳුනා නොගැනීම

මූල්‍ය වත්කමක් (අදාළ පරිදි මූල්‍ය වත්කමක කොටසක් හෝ මූල්‍ය වත්කම්වලට සමාන බාණ්ඩයක කොටසක්) පහත සඳහන් අවස්ථාවලදී හඳුනා නොගැනේ.

i.වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබාගැනීමට ඇති අයිතිය අවසන් වී ඇතිවිට

ii.ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය පවරනු ලැබ ඇතිවිට හෝ හුවමාරු ගිවිසුමක් යටතේ සැලකියයුතු තරමේ ප්‍රමාදයකින් තොරව ලැබී ඇති මුදල් ප්‍රවාහ තෙවන පාර්ශ්වයකට ගෙවීම සඳහා බැඳීමක් භාරගෙන ඇතිවිට සහ (අ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ ඇතිවිට හෝ (ආ) ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වත්කමේ සියලුම අවදානයන් සහ ප්‍රතිලාභ ප්‍රමාණවත් පරිදි පවරනු ලැබ හෝ රඳවාගෙන නොමැති වුවත් වත්කමේ පාලනය පවරනු ලැබ ඇතිවිට.

### 6.1.2.6 මූල්‍ය වත්කම් හානිවීම්

ශ්‍රී ලංකා තේ මණ්ඩලය සෑම වාර්තාකරණ දිනයක් වනවිට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් බාණ්ඩයක් හානිවී ඇති බවට කිසියම් වාස්තවික සාක්ෂියක් තිබේද යන්න පිළිබඳ තක්සේරු කරයි. වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසුව සිදුවූ සිදුවීමක් හෝ සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් හානිවීම සිදුවී ඇති බවට සහ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කමේ හෝ මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවලට එකී පාඩු සිදුවීම බලපෑමක් එල්ලකර ඇති බවට වාස්තවික සාක්ෂියක් තිබේනම් පමණක් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවූවා සේ සලකනු ලැබේ.
හානිවීමක් සිදුවී ඇති බවට වන සාක්ෂි යන්නට ණයගැතියන් හෝ ණයගැතියන් කණ්ඩායමක් මූල්‍ය දුෂ්කරතාවයකට, ගෙවීම් හෝ රාජකාරී පැහැරහැරීම්වලට ලක්වී ඇති බවට, ඔවුන් බංකොලොත්භාවයට පත්වීමට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයකට ලක්වීමට ඉඩ ඇති බවට සහ පැහැර හැරීම් හා සම්බන්ධ හිඟ මුදල් හෝ ආර්ථික තත්ත්වයන් වෙනස්වීම වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ ගණනය කළ හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළහැකි දත්ත මගින් පෙන්නුම් කරන කරුණු ඇතුළත් වේ.

### 6.1.2.7මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීම

මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කිරීමේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය පළමුව කේවල වශයෙන් වැදගත්කමක් ගන්නා මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිවීම් පිළිබඳ වෙනම සාක්ෂි පවතීද යන්න හෝ කේවල වශයෙන් වැදගත් නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් සාමූහික වශයෙන් වාස්තවික සාක්ෂි පවතීද යන්න පිළිබඳ තක්සේරු කරයි. කේවල වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සඳහා හානිවීම් සම්බන්ධයෙන් වාස්තවික සාක්ෂි නොමැති බවට ශ්‍රී ලංකා තේ මණ්ඩලය තීරණය කරනු ලැබුවහොත් වැදගත් වුවද නොවුවද එම වත්කම් සමාන ණය අවදානම් ලක්ෂණ පවතින මූල්‍ය වත්කම් සමූහයක් තුළට ඇතුළත් කරනු ලබන අතර ඒවා හානිවීම් සඳහා සාමූහික වශයෙන් තක්සේරු කරයි.
හානි පාඩුවක් පවනිත බවට හෝ අඛණ්ඩව පවතින බවට හඳුනාගන්නා ලද හානිවීම් සඳහා කේවල වශයෙන් තක්සේරු කරනු ලබන වත්කම් සාමූහික හානිවීම් තක්සේරුව සඳහා ඇතුළත් නොකරයි.
හානි පාඩුවක් සිදුවී ඇති බවට වාස්තවික සාක්ෂි පවතිනම් එම පාඩුවේ ප්‍රමාණය වත්කම්වලට ධාරණ අගය සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ (මෙතෙක් සිදුවී නොමැති අනාගතයේ අපේක්ෂිත ණය පාඩු හැර) අතර වෙනස වශයෙන් ගණනය කරනු ලැබේ. ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයේ වර්තමාන වටිනාකම මූල්‍ය වත්කමේ මූලික ඵලදායී පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබේ.

### 6.2 මූල්‍ය වගකීම්

#### මූලික හඳුනාගැනීම සහ ගණනය කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් උචිත පරිදි ලාභ හා පාඩු තුළින් සාධාරණ අගයට ගණනය කරන ලද මූල්‍ය වගකීම්, ක්‍රමක්ෂයට පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වගකීම් හෝ ඵලදායී ඉදිරි රැකුමක් තුළ ඉදිරි රැකුම් උපකරණ ලෙස නම්කරන ලද ව්‍යුත්පන්න ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලය මූල්‍ය වගකීම්වල වර්ගීකරණ ඒවායේ මූලික හඳුනාගැනීමේදී තීරණය කරයි.

සියලුම මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ අගයට හඳුනාගනු ලබන අතර ණය සහ ණය ගැනීම් සම්බන්ධයෙන් වන කල්හි ක්‍රමක්ෂය පිරිවැයට ගණනය කරයි. සෘජුව ආරෝපණය කළහැකි ගණුදෙනු පිරිවැය මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය වගකීම් යන්නට වෙළඳ සහ අනෙකුත් ගෙවීම් ඇතුළත් වේ.

#### පසු ගණනය කිරීම්

මූල්‍ය වගකීම්වල පසු ගණනය කිරීම් ක්‍රමක්ෂය පිරිවැයට සිදු කරනු ලැබේ.

#### හඳුනා නොගැනීම

වගකීම් යටතේ වන බැඳීම් ඉවත්වන, අවලංගු වන හෝ අවසන් වනවිට මූල්‍ය වත්කමක් හඳුනා නොගනී.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය
## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### (A) ආදායම

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| භාණ්ඩාගාර ප්‍රදාන - වැටුප් ගෙවීම | 147,500,000 | 143,000,000 |
| - ප්‍රාග්ධන හා සංවර්ධන කටයුතු | 70,000,000 | 71,000,000 |
| - දළු සහනාධාරය | - | 6,738,000,000 |
| රසායනාගාර ආදායම | 16,862,340 | 13,529,400 |
| ප්‍රවර්ධන සහ අලෙවි බද්දෙන් පොළිය මාරුකිරීම | 30,044,000 | 132,909,000 |
| ලියාපදිංචි සහ අලුත් කිරීමේ ආදායම | 140,807,434 | 137,212,932 |
| වෙනත් ආදායම් | 4,055,454 | 3,773,311 |
| වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | 21,332,077 | 17,069,008 |
| තේ දළු වෙළෙන්දන්ගේ තැන්පතු | 14,168,243 | - |
| | **444,769,549** | **7,256,493,650** |

### (A.1) වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| තේ විකුණුම් | 26,950,893 | 25,209,911 |
| අපනයන ඇසුරුම් විකුණුම් මත කොමිස් | 10,446,272 | 9,689,137 |
| ස්වාධිකාර කුලිය | 1,926,665 | 1,962,499 |
| රෙදි බෑග් අලෙවිය | 48,080 | 68,970 |
| තේ සහ සෞඛ්‍ය පොත අලෙවිය | 4,750 | 8,100 |
| | 39,376,659 | 36,938,616 |
| අඩුකළා: විකුණුම් පිරිවැය | (17,144,036) | (19,219,724 |
| බැර පත්‍රිකා මත කොමිස් | (906,204) | (659,251) |
| විදේශීය ව්‍යවහාර මුදලින් අලෙවි ආදායම | 5,657 | 9,366 |
| වාණිජ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය | **21,332,077** | **17,069,008** |

### (B) තේ ක්ෂේත්‍ර සංවර්ධන වියදම්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| දළු සහනාධාරය | - | 6,738,000,000 |
| නිෂ්පාදන තත්ත්ව සහතික නිකුත් කිරීම | - | 137,358 |
| තේ කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනාක්‍රමය | 25,424,904 | 10,079,088 |
| තේ නැවත වගා සහනාධාර යෝජනාක්‍රමය | 44,575,096 | 60,920,912 |
| පසු අස්වනු හානි අවම කිරීම | - | 4,870,142 |
| යහපත් නිෂ්පාදන පිළිවෙත් වැඩිදියුණු කිරීම | 3,147,541 | 3,109,365 |
| වෙළෙන්දන්ගේ තැන්පතු ආපසු දීම | 435,000 | - |
| තේ ඉඩම් සමීක්ෂණ | 12,799,424 | - |
| | **86,381,964** | **6,817,116,865** |

### (C) පරිපාලන වියදම්

| | | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | | 197,517,428 | 216,571,164 |
| අනෙකුත් පරිපාලන වියදම් | | 44,191,462 | 37,527,026 |
| ගමන් වියදම් | | 9,755,677 | 7,432,960 |
| සැපයුම් සහ ආවශ්‍යක | | 10,493,525 | 12,151,455 |
| අලුත්වැඩියා සහ නඩත්තු | | 25,501,185 | 20,698,182 |
| දේපළ, පිරියත හා උපකරණ ක්ෂයවීම් | F-දේ.පි.උ. | 28,072,677 | 25,880,398 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | F-දේ.පි.උ. | 850,581 | 879,169 |
| කල්බදු දේපල ක්‍රමක්ෂය | F-දේ.පි.උ. | 76,386 | 76,386 |
| උපයෝගිතා සහ වෙනත් වියදම් | | 47,746,571 | 36,638,795 |
| | | **364,205,491** | **357,855,534** |

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය
## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(D) **මූල්‍යමය වියදම්**

**පොළී වියදම්**

| | 2016.12.31 දිනට |
|---|---|
| | රු. |
| මහජන බැංකුව | 25,523,623 |
| ලංකා බැංකුව | 9,189,507 |
| බැංකු ගාස්තු | 510,052 |
| | **35,223,182** |

(E) **මූල්‍යමය ආදායම්**

| | 2016.12.31 දිනට |
|---|---|
| | රු. |
| ආයෝජනයෙන් ලැබූ පොළිය | 19,709,277 |
| ප්‍රාදේශිය වැවිලි සමාගම් වැටුප් ණය මගින් ලැබූ පොළිය | 35,006,231 |
| | **54,715,509** |

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය
## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### (F) දේපළ, පිරියත හා උපකරණ

| | 2016.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතු කිරීම | ප්‍රත්‍යාගණනය | අපහරණ/පැවරීම් | ගැළපුම් | 2016.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|---|
| සින්නක්කර ඉඩම් | 350,017,000 | - | 26,283,000 | - | - | **376,300,000** |
| ගොඩනැගිලි | 265,043,561 | 529,190 | | - | - | **265,572,751** |
| කාර්යාලීය උපකරණ | 74,973,946 | 2,330,264 | | 34,920 | 7,202,574 | **70,066,717** |
| ලිබඩු සහ සවිකුරු | 37,609,222 | 5,078,613 | | 943,131 | 2,427,235 | **39,317,469** |
| මෝටර් රථ සහ වෙනත් වාහන | 54,370,892 | - | | - | - | **54,370,892** |
| පුස්තකාල පොත් | 383,044 | - | | - | - | **383,044** |
| පරිගණක දෘඩාංග | 40,023,995 | 9,333,697 | | 2,863,650 | 5,881,961 | **40,612,080** |
| රසායනාගාර උපකරණ | 98,963,579 | 3,247,240 | | 2,433,513 | 3,890 | **99,773,417** |
| | 921,385,239 | 20,519,004 | 26,283,000 | 6,275,215 | 15,515,659 | 946,396,370 |
| **කෙරීගෙන යන වැඩ** | | | | | | |
| ගොඩනැගිලි/ වෙනත් | **6,099,597** | 106,467,957 | | 4,523,549 | - | **108,044,005** |
| පරිගණක දෘඩාංග | - | - | | - | - | - |
| | **6,099,597** | **106,467,957** | **-** | **4,523,549** | **-** | **108,044,005** |
| | **927,484,836** | **126,986,961** | **26,283,000** | **10,798,763** | **15,515,659** | **1,054,440,375** |

| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | 2016.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම් | වර්ෂය සඳහා අයකිරීම | ප්‍රත්‍යාගණනය | අපහරණ | ගැළපුම් | 2016.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් |
|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | **38,191,388** | 5,365,708 | | - | - | **43,557,096** |
| කාර්යාලීය උපකරණ | **45,583,663** | 6,769,129 | | 34,920 | 7,188,524 | **45,129,349** |
| ලිබඩු සහ සවිකුරු | **19,124,113** | 3,621,093 | | 878,180 | 2,264,270 | **19,602,756** |
| මෝටර් රථ සහ වෙනත් වාහන | **22,735,560** | 5,268,826 | | - | - | **28,004,386** |
| පුස්තකාල පොත් | **383,044** | - | | - | - | **383,044** |
| පරිගණක දෘඩාංග | **26,320,461** | 4,842,995 | | 2,845,569 | 5,881,961 | **22,435,926** |
| රසායනාගාර උපකරණ | **78,660,190** | 5,903,188 | | 2,433,513 | 3,890 | **82,125,975** |
| | **230,998,420** | **31,770,939** | **-** | **6,192,182** | **15,338,644** | **241,238,533** |

| | | |
|---|---|---|
| ශුද්ධ පොත් අගය | **696,486,417** | **813,201,842** |

# ශ්‍රී ලංකා තේ මණ්ඩලය
## මූල්‍යමය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### (G) කල්බදු දේපල

| | 2016.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතුකිරීම් | අපහරණ/ පැවරීම් | ගැලපුම් | 2016.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|
| කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය | 3,819,280 | - | - | - | 3,819,280 |
| කල්බදු දේපල - ටී හවුස් | 28,897,335 | - | - | - | 28,897,335 |
| | 32,716,615 | - | - | - | 32,716,615 |

| ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන | 2016.01.01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය | වර්ෂය සඳහා ක්‍රමක්ෂය | අපහරණ | ගැලපුම් | 2016.12.31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය |
|---|---|---|---|---|---|
| කල්බදු දේපල - ප්‍රධාන කාර්යාලය | 857,244 | 76,386 | - | - | 933,630 |
| කල්බදු දේපල - ටී හවුස් | 5,779,467 | 2,889,733 | - | - | 8,669,200 |
| | 6,636,711 | 2,966,119 | - | - | 9,602,830 |
| ශුද්ධ පොත් අගය | 26,079,904 | | | | 23,113,785 |

### (H) අස්පෘශ්‍ය වත්කම්

| | 2016.01.01 දිනට පිරිවැය හෝ තක්සේරුව | එකතුකිරීම් | අපහරණ/පැවරීම් | ගැලපුම් | 2016.12.31 දිනට පිරිවැය හෝ තක්සේරුව |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග- ප්‍රධාන කාර්යාලය | 12,389,924 | 1,219,775 | | | 13,609,698 |
| පරිගණක මෘදුකාංග- ටී හවුස් | 670,484 | - | - | | 670,484 |
| කෙරීගෙන යන පරිගණක මෘදුකාංග වැඩ | 400,000 | 800,000 | | - | 1,200,000 |
| | 13,460,408 | 2,019,775 | - | - | 15,480,182 |

| ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන | 2016.01.01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය | වර්ෂය සඳහා අයකිරීම් | අපහරණ | ගැලපුම් | 2016.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් |
|---|---|---|---|---|---|
| පරිගණක මෘදුකාංග- ප්‍රධාන කාර්යාලය | 2,136,335 | 850,581 | | | 2,986,915 |
| පරිගණක මෘදුකාංග- ටී හවුස් | 95,891 | 50,030 | - | | 145,921 |
| | 2,232,226 | 900,611 | - | - | 3,132,837 |
| ශුද්ධ පොත් අගය | 11,228,182 | | | | 12,347,346 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

### (G) ඉඩම් සඳහා පෙර ගෙවුම් කල්බදු හිමිකම්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 26,079,904 | 29,046,023 |
| කල්බදු දේපළ එකතුකිරීම | - | - |
| ක්‍රමක්ෂය | (2,966,119) | (2,966,119) |
| **අවසාන ශේෂය** | **23,113,785** | **26,079,904** |

### (H) අස්පෘශ්‍ය වත්කම්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| ආරම්භක ශේෂය | 11,228,182 | 12,485,605 |
| පරිගණක මෘදුකාංග එකතුකිරීම | 1,219,775 | 1,841,475 |
| අඩුකළා: ගැළපුම්/ අපහරණ | | (301,500) |
| ක්‍රමක්ෂය | (900,611) | (667,899) |
| කෙරීගෙන යන පරිගණක මෘදුකාංග වැඩ | 800,000 | (2,129,500) |
| | **12,347,346** | **11,228,181** |

### (I) භාණ්ඩ තොග

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| රසායනාගාර පාරිභෝගික භාණ්ඩ | 5,858,067 | 5,940,928 |
| ප්‍රචාරණ ද්‍රව්‍ය සහ වෙනත් | 5,966,928 | 7,039,392 |
| තේ සහ වෙනත් තොග | 9,080,599 | 7,629,361 |
| වෙනත් | 14,633,034 | 13,960,779 |
| | **35,538,627** | **34,570,459** |

### (J) වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| වෙළඳ ලැබියයුතු දෑ | 2,925,163 | 2,780,125 |
| කාර්ය මණ්ඩල ලැබියයුතු දෑ සහ වෙනත් අත්තිකාරම් | 30,305,072 | 27,729,259 |
| ලැබියයුත දෑ - ජ.න.ව.ස.ම. | 25,000,000 | 25,000,000 |
| **අඩුකළා:** බොල්ණය සහ අඩමාන ණය වෙන්කිරීම ජ.න.ව.ස.ම. | (25,000,000) | (25,000,000) |
| | **33,230,235** | **30,509,384** |

### (K) තැන්පතු සහ පෙර ගෙවුම්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| තැන්පතු සහ පෙර ගෙවුම් | 53,015,712 | 120,928,205 |
| | 53,015,712 | **120,928,205** |

### (L) අනෙකුත් මූල්‍ය වත්කම්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| ආයෝජන | 6,139,953,803 | 5,250,628,454 |
| | 6,139,953,803 | **5,250,628,454** |

### (M) අතැති සහ බැංකුවේ ඇති මුදල්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | 65,406,603 | 145,540,847 |
| | 65,406,603 | 145,540,847 |

### (M (1)) ලැබියයුතු ණය

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා උත්සව අත්තිකාරම් ණය | 427,163,950 | 492,096,500 |
| කොළඹ තේ වෙළඳුන්ගේ සංගමය සඳහා ණය (150 සැමරීම) | 20,000,000 | - |
| ප්‍රාදේශීය වැවිලි සමාගම් සඳහා වැටුප් වර්ධක ණය | 676,300,000 | - |
| | 1,123,463,950 | 492,096,500 |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## (N) ප්‍රවර්ධන සහ අලෙවි බද්ද

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තේ අපනයනය සඳහා අවසර ලබා දෙමින් රේගු භාණ්ඩ ප්‍රකාශය (CUSDEC) සඳහා අනුමැතිය ලබාදුන් පසු සෑම ලියාපදිංචි තේ අපනයනකරුවෙකු විසින්ම සෑම තේ කිලෝග්‍රෑම් එකකට රු. 3.50 ක් බැගින් වූ බද්දක් ගෙවිය යුතුය. රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව එකතු කරනු ලබන සියලුම මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන නියමිත ගිණුමකට බැර කළ යුතු අතර එමගින් මණ්ඩලයේ ප්‍රාග්ධන අරමුදලේ කොටසක් සකස් වේ.

මෙම රෙගුලාසි (2010 ඔක්තෝබර් 27 දිනැති අංක 167714 දරන ගැසට් පත්‍රය) ක්‍රියාවට නැංවීමේදී නියමිත ගිණුමේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයට බැර වී ඇති සියලුම මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාව තුළ හා බැහැරව සිදුකරනු ලබන ප්‍රවර්ධන හා අලෙවි කටයුතුවලට අදාළ කාර්යයන් සඳහා පමණක් භාවිතා කළ යුතුය.

| | | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට රු. |
|---|---|---|---|
| ආරම්භක ශේෂය | | 5,512,850,782 | 4,904,992,816 |
| පෙර වර්ෂයේ පොළී ආදායම මත ගෙවූ බදු සහ වෙනත් ගැලපුම් | | (8,681,565) | (109,895,192) |
| අපනයනකරුවන්ගෙන් රැස්කරගත් මුදල | | 1,021,044,786 | 1,121,694,289 |
| ආයෝජන මත පොළිය | 417,952,898.07 | | 317,892,244 |
| **අඩුකළා:** පොළී ආදායම මත ගෙවූ බදු | (235,211,480.22) | | (144,737,771) |
| ප්‍රධාන කාර්යාලයට මාරු කරන ලද පොළිය* | (30,044,000.00) | 152,697,418 | (132,909,000) |
| ක්‍රිකට් ටී ෂර්ට් විකිණීම | | 940,500 | 2,192,359 |
| භූගෝලීය දර්ශක ලියාපදිංචි කිරීම | | 17,683 | 4,877 |
| ටී හවුස් මගින් ලැබූ ආදායම සටහන N.1 | | - | 34,969,125 |
| | | 6,678,869,604 | 5,994,203,747 |
| දූත මණ්ඩල සඳහා තිළිණ තේ, අනෙකුත් ත්‍යාග තේ සහ පරිත්‍යාග | | 5,892,207 | 5,237,437 |
| දේශීය ප්‍රදර්ශන සහ වෙළඳ සල්පිල් සඳහා සහභාගි වීම | | 13,924,198 | 6,199,999 |
| සන්නිවේදන ද්‍රව්‍ය (ATL/BTL) සඳහා නිෂ්පාදන වියදම් | | 133,462 | 218,534 |
| ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළඳ සල්පිල් සඳහා සහභාගි වීම | | 100,765,771 | 62,371,757 |
| උත්සව කටයුතු | | 5,093,279 | 7,989,601 |
| බුද්ධිමය දේපල කටයුතු, කවුන්සල සාමාජිකත්වය, බුද්ධිමය අනුග්‍රාහකත්වය | | 12,469,055 | 2,611,744 |
| වෙළඳපල පිළිබඳ බුද්ධිමය තොරතුරු සහ පර්යේෂණ | | 4,380,401 | 729,937 |
| බැංකු ගාස්තු | | 86,980 | 77,213 |
| ශ්‍රී ලංකා ක්‍රිකට් සඳහා අනුග්‍රාහකත්වය | | 86,413,625 | 207,793,725 |
| ටී හවුස් මෙහෙයුම් වියදම් සටහන N.1 | | 9,799,269 | 54,655,379 |
| තේ කෞතුකාගාරය සඳහා ප්‍රදාන | | 2,300,000 | 1,500,000 |
| නඩත්තු වියදම් - මොස්කව් කාර්යාලය | | 12,703,543 | 7,470,314 |
| නඩත්තු වියදම් - එක්සත් අරාබි එමීර් රාජ්‍යය කාර්යාලය | | 23,562,490 | 11,827,788 |
| නඩත්තු වියදම් - චීන කාර්යාලය | | 8,892,938 | 259,533 |
| නව විදෙස් කාර්යාල පිහිටුවීම | | - | 441,204 |
| වසරේ වාර්ෂික වතු තේ | | 355,091 | 2,842,041 |
| ගමන් වියදම් - විදේශීය | | 11,336,478 | 5,862,378 |
| අනෙකුත් ජාතික ආයතන සමඟ ඒකාබද්ධ ප්‍රවර්ධනය | | 552,160 | 1,036,219 |
| රූපවාහිනී/ ගුවන්විදුලි/ පුවත්පත් මගින් සිදුකළ ප්‍රචාරණය කටයුතු(ATL) | | 141,124,181 | 69,460,706 |
| එළිමහන් ප්‍රචාරණ කටයුතු(BTL) | | - | 29,438,884 |
| මහජන සම්බන්ධතා වැඩසටහන් | | 1,228,240 | 2,520,823 |
| තානාපති කාර්යාල සමඟ වැඩසටහන් | | 13,327,894 | 933,319 |
| විනිමය වෙනස | | 52,936 | (125,569) |
| ලැයිස්තුගත කිරීමේ ගාස්තු සහ වෙළෙඳ ලකුණ අලෙවිකරණ සහනාධාර ලබාදීම | | 429,679,935 | - |
| හොඳම නිෂ්පාදන හා හොඳම GAP, GMP අධීක්ෂණය හා සම්මාන ක්‍රමය | | 77,164 | - |
| සමස්ත වියදම | | **884,151,296** | **481,352,966** |
| 2016.12.31 දිනට ප්‍රවර්ධන සහ අලෙවි බදු අරමුදල් ශේෂය | | **5,794,718,308** | **5,512,850,782** |

*මූල්‍ය වසර තුළදී ශ්‍රී.ලං.තේ.ම. අයවැය පරිදි ප්‍රධාන කාර්යාලයේ 2016 ආදායම් ගිණුමට රුපියල් 30,044,000 ක් මාරු කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

## (N.1) සිලෝන් ටී හවුස්

| | 2016 | | 2016 | 2015 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | ජනවාරි | පෙබ.-දෙසැ. | එකතුව | |
| ආහාර සහ පානීය වර්ග විකුණුම් | 2,881,101 | - | **2,881,101** | **32,859,715** |
| තේ අපනයන ඇසුරුම් විකිනීමෙන් ලද වට්ටම් (ශුද්ධ) | 151,860 | 8,468 | **160,328** | **1,245,611** |
| ශ්‍රී.ලං.තේ.ම. තේ විකුණුම් (ශුද්ධ) | 10,359 | 79,456 | **89,815** | **83,799** |
| අලෙවි කුටි කුලී ආදායම | 200,000 | 600,000 | **800,000** | **780,000** |
| **දළ මෙහෙයුම් ආදායම** | 3,243,320 | 687,924 | **3,931,244** | **34,969,125** |
| **වියදම්** | | | | |
| වැටුප් සහ දීමනා | **768,436** | **-** | **768,436** | **6,997,871** |
| නාගරික සංවර්ධන අධිකාරියේ කුලිය | 366,962 | 4,149,500 | **4,516,463** | **4,403,419** |
| විදුලිය/ ජලය/ දුරකතන/ ගෑස් | 295,987 | 803,475 | **1,099,462** | **4,187,878** |
| කළමනාකරණ ගාස්තු | 300,000 | - | **300,000** | **3,600,000** |
| වෙළඳ දැන්වීම් | - | - | **-** | **368,603** |
| ප්‍රවාහණ වියදම්/ වෙනත් | 1,580,626 | 5,465,526 | **7,046,152** | **35,097,607** |
| **සමස්ත මෙහෙයුම් වියදම්** | 3,312,011 | 10,418,502 | **13,730,513** | **54,655,379** |
| **ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම** | (68,692) | (9,730,577) | **(9,799,269)** | **(19,686,253)** |

ව්‍යාපාරික සහකරු වන ශ්‍රී ලංකන් කේටරින් සමාගම 2016 ජනවාරි මාසයේදී මෙහෙයුම් කටයුතුවලින් ඉවත්විය. එතැන් පටන් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ අලෙවිසැලක් ලෙස සිලෝන් ටී හවුස් ආයතනය ක්‍රියාත්මක විය.

## (O) සේවක ප්‍රතිලාභ බැඳීම්

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| පාරිතෝෂික ආරම්භක ශේෂය | 55,562,838 | 43,952,223 |
| වර්ෂය සඳහා පාරිතෝෂික අයකිරීම් | 18,663,915 | 18,144,513 |
| | (10,603,568) | (6,533,899) |
| වර්ෂය තුළ ගෙවන ලද/ ගෙවිය යුතු ප්‍රතිලාභ | **63,623,185** | **55,562,838** |

## (P) බැංකු ණය

| | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| ලංකා බැංකුව | 183,300,000 | - |
| මහජන බැංකුව | 493,000,000 | - |
| | **676,300,000** | - |

16/1234/726/034 අංක දරණ 2016 ජූලි 05 දිනැති කැබිනට් පත්‍රිකාව පදනම් කරගනිමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයට ලංකා බැංකුවෙන් සහ මහජන බැංකුවෙන් ණය ලබාගන්නා ලෙස නියම කර ඇත. භාණ්ඩාගාරය මේ සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය තහවුරුකරන ලිපියක් නිකුත් කළා. ඒ අනුව වැවිලි ක්ෂේත්‍රයේ කම්කරුවන්ට රුපියල් 2500 ක වැටුප් වැඩිකිරීමේ අරමු ණින් ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට ණය ලබාදීම පිණිස ශ්‍රී ලංකා තේ මණ්ඩලය ණය ලබාගනු ලැබිය.

## (Q) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

| | | | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|---|---|
| ආදායම් බදු | | | | |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය | සටහන | Q 1 | 2,556,557 | 884,179 |
| ප්‍රවර්ධන සහ අලෙවි බදු | සටහන | Q 1 | 35,063,979 | 31,723,020 |
| ලාභාංශ බදු | | | | |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය | සටහන | Q 1 | 2,863,336 | 1,672,825 |
| ප්‍රවර්ධන සහ අලෙවි බදු | සටහන | Q 1 | 69,877,159 | 56,636,519 |
| ගෙවියයුතු සමස්ත බදු | | | **110,361,031** | **90,916,543** |

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්
## 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| (Q) 1 ආදායම් බදු | ප්‍රවර්ධන සහ අලෙවි බදු රු. | ශ්‍රී ලංකා තේ මණ්ඩලය රු. |
|---|---|---|
| 2016.1.1 දිනට ශේෂය | 31,723,020 | 884,179 |
| වසර සඳහා ප්‍රතිපාදන | 108,697,802 | 4,454,078 |
| අඩුකළා : බදු ගෙවීම් | 67,063,463 | 548,777 |
| රඳවාගැනීමේ බදු | 32,640,819 | 966,741 |
| මතිමාත්‍ර බදු බැර | 5,652,561 | 382,003 |
| 2016.12.31 දිනට ශේෂය | **35,063,979** | **2,556,557** |

| (Q) 2 ලාභාංශ බදු | | |
|---|---|---|
| 2016.1.1 දිනට ශේෂය | 56,636,519 | 1,672,825 |
| වසර සඳහා ප්‍රතිපාදන | 69,877,159 | 2,863,336 |
| 2015 වසර සඳහා ඌන ප්‍රතිපාදන | 5,851,026 | - |
| අඩුකළා බදු ගෙවීම් | 62,487,545 | 1,672,825 |
| 2016.12.31 දිනට ශේෂය | **69,877,159** | **2,863,336** |

| (R) වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| වෙළෙඳ ගෙවීම් | 147,743,125 | 89,326,429 |
| අනෙකුත් ගෙවීම් | 141,575,350 | 140,236,883 |
| උපචිත වියදම් | 444,108,577 | 35,506,070 |
| | **733,427,052** | **265,069,381** |

| (S) බැංකු ශේෂ | 2016.12.31 දිනට රු. | 2015.12.31 දිනට සංශෝධිත රු. |
|---|---|---|
| ලංකා බැංකුව - තේ සහනාධාරය | 6,951,690 | - |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම ගාල්ල | 154,299 | - |
| ලංකා බැංකුව - රැස්කිරීමේ ගිණුම මාතර | 120,200 | - |
| ලංකා බැංකුව -රැස්කිරීමේ ගිණුම රත්නපුර | 942,436 | - |
| ලංකා බැංකුව -රැස්කිරීමේ ගිණුම මතුගම | 320,852 | 94,352 |
| ලංකා බැංකුව -රැස්කිරීමේ ගිණුම බණ්ඩාරවෙල | 4,316 | 226,151 |
| ලංකා බැංකුව - නිදහස් චතුරස්‍රය | - | 1,960,305 |
| | **8,493,793** | **2,280,808** |

### ප්‍රාග්ධන හා සංචිත

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළදී අනුදත් ප්‍රාග්ධනයේ කිසිදු වෙනසක් සිදුවී නොමැත.

### ප්‍රත්‍යාගණන සංචිත

කොළඹ ප්‍රධාන කාර්යාලයේ ඉඩම, ගොඩනැගිලි හා මෝටර් රථ සහ ගම්පොළ ඉඩම ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව මණ්ඩලය විසින් රුපියල් 508,216,543 ක ප්‍රත්‍යාගණන සංචිතයක් ගොඩනගා ඇත.
ගම්පොළ ඉඩම ප්‍රත්‍යාගණනය, තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය තක්සේරුකරුවෙකු විසින් 2016.07.25 දින සිදුකර ඇත.

### දායක ප්‍රාග්ධනය

2016.12.31 දිනට රුපියල් 672,012,201.85 ක් වූ රජයේ ප්‍රධානයන්වලින් දායක ප්‍රාග්ධනය සකස්වී ඇත.

## මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

(T) **බැරකම් සහ ප්‍රතිපාදන**

සමාලෝචිත වර්ෂයේදී බේරුම්කාර විනිශ්චය මණ්ඩලය විසින් අසන ලද නඩුවකදී රු. 15,556,355 ක මුදලක් ගෙවන ලෙස ශ්‍රී ලංකා තේ මණ්ඩලයට එරෙහිව තීන්දුවක් ලබාදෙන ලදී. කෙසේනමුත්, මෙම තීන්දුවට එරෙහිව ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් අභියාචනයක් ඉදිරිපත් කරන ලද අතර නඩුව තවදුරටත් ක්‍රියාත්මක වේ.

2016 දෙසැම්බර් 31 දින වනවිට ඉහත නඩුව ඇතුළුව පවතින නඩු සම්බන්ධයෙන් නීති සභාව ශ්‍රී ලංකා තේ මණ්ඩලයට උපදෙස් දී තිබුණේ බොහෝවිට එම නඩුවලින් තේ මණ්ඩලයට වාසිදායක වියහැකි බවයි. ඒ අනුව, මෙම මූල්‍ය ප්‍රකාශන මගින් ඒ සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසා නොමැත.

(U) **අදාළ පාර්ශව ගණුදෙනු**

(U)1 **රාජ්‍ය සහ රාජ්‍ය යටතේ පාලනයවන ආයතන සමග ගණුදෙනු**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය එහි සාමාන්‍ය මෙහෙයුම් කටයුතුවල දී අදාළ පාර්ශව සමග ගණුදෙනුවලට එළඹේ. ශ්‍රී ලංකා රජය, විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය පාලනය යටතේ පවතින ආයතන අදාළ පාර්ශව යන්නට ඇතුළත් වේ. තේවල වශයෙන් වැදගත්කමක් ඇති අනෙකුත් ගණුදෙනු සම්බන්ධයෙන්, සාමූහික වශයෙන් වැදගත්වන්නාවූත් ගණුදෙනුවල ට අදාළව ශ්‍රී ලංකා තේ මණ්ඩලය රාජ්‍ය හා රාජ්‍ය පාලනය යටතේ පවතින ආයතන සමග එළඹුණු ගණුදෙනු සහ විධිවිධාන පිළිබඳව විස්තර පහත සඳහන් පරිදි වේ.

| **ගණුදෙනුවේ ස්වභාවය** | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| ගණුදෙනු : | | |
| ආදායම | 147,500,000 | **143,000,000** |
| උපයෝගිතා වියදම් | 22,904,813 | **20,494,586** |
| **හිග ශේෂ :** | | |
| **ලැබියයුතු දෑ** | | |
| ජ.න.ව.ස.ම. (වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය) | **25,000,000** | **25,000,000** |

(U.2) **ප්‍රධාන කළමනාකරණ සංයුතිය**

| ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රධාන කළමනාකරුවන් වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| කෙටිකාලීන සේවා නියුක්ති ප්‍රතිලාභ | **2,196,150** | **953,900** |

(V) **ශේෂ පත්‍ර දිනයට පසු සිදුවීම්**

ශේෂ පත්‍ර දිනයට පසු සිදුවූ සියලුම වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී මූල්‍ය ප්‍රකාශවල උචිත ගැලපුම් සහ අනාවරණ කිරීම් සිදුකර ඇත.

# ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ කාර්යාල

**ප්‍රධාන කාර්යාලය**

ශ්‍රී ලංකා තේ මණ්ඩලය,
574, ගාලු පාර, කොළඹ 03,ශ්‍රී ලංකාව.
තැ.පෙ. 1750, කොළඹ, ශ්‍රී ලංකාව
දු.ක. 011 2582121 / 011 2583687
ක්ෂණික ඇමතුම්: 011 2587814
ෆැක්ස්: 011 2582122
විද්‍යුත් තැපැල:teaboard@pureceylonte.com
වෙබ් අඩවිය:www.pureceylontea.com

**සභාපති**

දු.ක.011 2587814/2590968
ෆැක්ස්: 011 2585701
විද්‍යුත් තැපැල:chairman@pureceylontea.com

**අධ්‍යක්ෂ ජනරාල්**

දු.ක.011 2587814/2508991
ෆැක්ස්:011 2582122
විද්‍යුත් තැපැල: dgsltb@pureceylontea.com

**තේ කොමසාරිස්ගේ අංශය**

තේ කොමසාරිස්
දු.ක. 011 2580182/2580152/2502485/2584845/2587814/2587773
ෆැක්ස්:011 2580161
විද්‍යුත් තැපැල: tcd@pureceylontea.com

**තේ ප්‍රවර්ධන අංශය**

අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන)
දු.ක.011 2583343/2587814/2581418
ෆැක්ස්:011 2587341
විද්‍යුත් තැපැල: promotion@pureceylontea.com

**තේ අපනයන අංශය**

නියෝජ්‍ය තේ කොමසාරිස් (අපනයන)
දු.ක. 011 2502485/2584845/2587814/2504090/2587773
ෆැක්ස්:011 2584844
විද්‍යුත් තැපැල: exports@pureceylontea.com

**විශ්ලේෂණ රසායනාගාරය**

අධ්‍යක්ෂ (රසායනාගාර)
දු.ක. 011 2587814/2581576
ෆැක්ස්:011 2581576
විද්‍යුත් තැපැල: lab@pureceylontea.com

# ප්‍රාදේශිය කාර්යාල

| | |
|---|---|
| ගම්පොල | සහකාර තේ කොමසාරිස්<br>ප්‍රාදේශිය කාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>140, අඹගමුව පාර,ගම්පොල<br>දු.ක. / ෆැක්ස් : 081-2352279<br>විද්‍යුත් තැපැල: atcgampola@pureceylontea.com |
| මාතර | සහකාර තේ කොමසාරිස්<br>ප්‍රාදේශිය කාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>46, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, කොටුව, මාතර<br>දු.ක. / ෆැක්ස් : 041-2222636<br>විද්‍යුත් තැපැල: atcmatara@pureceylontea.com |
| බදුරලිය | සහකාර තේ කොමසාරිස්<br>ප්‍රාදේශිය කාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>281, වතුරාන පාර, බදුරලිය<br>දු.ක. / ෆැක්ස් : 034-2247444<br>විද්‍යුත් තැපැල: atcmathugama@pureceylontea.com |
| රත්නපුර | සහකාර තේ කොමසාරිස්<br>ප්‍රාදේශිය කාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>61/1, නව නගරය, රත්නපුර<br>දු.ක. / ෆැක්ස් : 045-2222136<br>විද්‍යුත් තැපැල: atcrathnapura@pureceylontea.com |
| බණ්ඩාරවෙල | සහකාර තේ කොමසාරිස්<br>ප්‍රාදේශිය කාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>විශාඛා මාවත, නව බදුල්ල පාර, බණ්ඩාරවෙල<br>දු.ක. / ෆැක්ස් : 057-2222812<br>විද්‍යුත් තැපැල: atcbandarawela@pureceylontea.com |
| ගාල්ල | සහකාර තේ කොමසාරිස්<br>ප්‍රාදේශිය කාර්යාලය<br>ශ්‍රී ලංකා තේ මණ්ඩලය<br>20, පහළ ඩික්සන් පාර, ගාල්ල<br>දු.ක. / ෆැක්ස් : 091-2232052<br>විද්‍යුත් තැපැල: atcgalle@pureceylontea.com |

# විදේශීය ශාඛා

| | |
|---|---|
| සිලෝන් ටී ප්‍රවර්ධන ඒකකය<br><br>එක්සත් අරාබි එමීර් රාජ්‍යය | අධ්‍යක්ෂ (තේ ප්‍රවර්ධන) - M.E./ගල්ෆ්/N.A.<br>තේ ප්‍රවර්ධන ඒකකය<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොන්සාල් ජනරාල් කාර්යාලය<br>තැ.පෙ. 51528<br>ඩුබායි, එක්සත් අරාබි එමීර් රාජ්‍යය<br><br>දු.ක. 0097143987871<br>දු.ක. (සෘජු): 0097143989349<br>ෆැක්ස් : 0097143987872<br>විද්‍යුත් තැපෑල: ctbureau@emirates.nrt.ae / ceylonte@eim.ae |
| සිලෝන් ටී ප්‍රවර්ධන ඒකකය<br><br>රුසියාව/ CIS | තේ ප්‍රවර්ධන නිලධාරී<br>තේ ප්‍රවර්ධන ඒකකය<br>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ තානාපති කාර්යාලය<br>යුලිට්ස්සා ස්වෙප්කිනා - 24<br>මොස්කව් 129090<br>රුසියාව<br><br>දු.ක.: 007 495 -688-1620<br>495-68811651/495-688-1463<br>ෆැක්ස් : 007-495-688-1757<br>විද්‍යුත් තැපෑල: tea@srilankaembassy.org |
| සිලෝන් ටී ප්‍රවර්ධන ඒකකය<br>චීනය | තේ ප්‍රවර්ධන නිලධාරී<br>තේ ප්‍රවර්ධන ඒකකය,<br>ශ්‍රී ලංකා තානාපති කාර්යාලය,<br>අංක 3, Jlan Hua Lu,<br>බිජිං - 100600,<br>චීන මහජන ජනරජය<br><br>දු.ක.: 00-86-10-65322919<br>ෆැක්ස් :00-86-10-65325426<br>විද්‍යුත් තැපෑල: ceylontea@slemb.com |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ඒ/බී/එස්එල්ටීබී/1/16/08 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2017 නොවැම්බර් 15 දින


SRI LANKA TEA BOARD
16 NOV 2017
SECRETARIAT


සභාපති,

ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

**ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 15(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී . මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත 2017 ඔක්තෝබර් 10 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව, ප්‍රමිත මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙකට හිළව් නොකළ යුතු නමුත් මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට රු. 107,891 ක් වූ ණයගැති ශේෂ දෙකක වටිනාකම රු. 591,011ක් වූ ණයහිමි ශේෂයට හිලව්කර ශුද්ධ අගය රු. 483,120 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 10

ප්‍රමිතයේ 17 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ දිනය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.75,404,030 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තු දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 17

----------------------------------

ප්‍රමිතයේ 35 ඡේදය ප්‍රකාරව, මණ්ඩලය විසින් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන තිබූ ඉඩම්/ගොඩනැගිලි සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37

----------------------------------

මණ්ඩලයට එරෙහිව අධිකරණවල ගොනුකර ඇති නඩුවල වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව ප්‍රවර්ධන හා අලෙවිකරණ අරමුදලෙහි අරමුදල්, එකී අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් යෙදවිය යුතු බවට දක්වා තිබුණි. එහෙත් එම අරමුදලේ ආයෝජන මත පොලී ආදායමින් රු.30,044,000 ක් සමාලෝචිත වර්ෂයේදී තේ මණ්ඩලයේ ආදායම ලෙස සළකා ගිණුම්ගත කර තිබුණද ඒ සඳහා අනුගමනය කල පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ණය ලබාදීමට ලබාගෙන තිබූ බැංකු ණය වෙනුවෙන් ගෙවිය යුතු පොළිය ගිණුම්ගත කිරීමේදී රු.300,310 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ) සිලෝන් ටී ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ පෞද්ගලික සමාගමකට ගෙවා තිබූ රු.195,521,240 ක් අත්තිකාරම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රවර්ධන අරමුදලේ වියදමක් සේ සලකා ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ප්‍රවර්ධන අරමුදලේ වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල රැස්කිරීමේ බැංකු ගිණුම්වල සෘජු තැන්පත් ලෙස ලැබී තිබූ රු.669,182 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බදුරලිය ප්‍රාදේශීය කාර්යාලය වෙනුවෙන් බදු පදනම මත ලබාගත් ඉඩම වෙනුවෙන් ගෙවා තිබූ රු.900,000 ක් වූ එක් වරක් පමණක් ගෙවන වාර මුදල, සම්පූර්ණයෙන්ම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවා තිබූ රු.435,000 ක අමු තේ දළු නියෝජිත තැන්පත්, සංවර්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඊ) රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2004 අගෝස්තු 23 දිනැති අංක 1028/1035 දරන බදු ඔප්පුව මගින් රු.3,435,000 ක වටිනාකමට වසර 50 ක් සඳහා කල්බදු දේපළක් ලබාගෙන ඇතත් ඒ සම්බන්ධයෙන් ගිණුම්වල ඇතුළත්කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ පිහිටි මැදපෙරදිග/ගල්ෆ්/උතුරු අප්‍රිකානු ප්‍රදේශ සඳහා වන ප්‍රවර්ධන කාර්යාංශයේ සමාලෝචිත වර්ෂය අවසානයට අවසාන ගිණුම් අනුව මුදල් හා බැංකු ශේෂය රු.4,499,717 ක් ලෙස දැක්වෙතත් ශේෂ සනාථ කිරීම් අනුව එය රු. 2,470,416 ක් වුයෙන් රු.2,029,301 ක පැහැදිලි නොකළ වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

සමාලෝචිත වර්ෂයේ කම්හල් නවීකරණ සහනාධාර සඳහා ලද අයදුම්පත් හා ඒවායේ ප්‍රගතිය සම්බන්ධ විස්තර සහ රු.1,061,687 ක් වූ ගෙවිය යුතු ප්‍රවර්ධන වියදම්වලට අදාළ විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවිය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ පහකට වැඩි කාලයක සිට ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.25,000,000 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් අයකර ගෙන නොතිබුණි. කෙසේවුවද, 2012 ජුනි 19 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ සටහන් අනුව, ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "සිලෝන් ටී මියුසියම්" හි අයිතිය අත්කර ගැනීම හා ඉහත ශේෂය කපා හැරීමට ජනතා වතු සංවර්ධන මණ්ඩලය හා තේ මණ්ඩලය තීරණයකට එළඹ තිබුණද මෙම ක්‍රියාවලිය විගණිත දිනය වූ 2017 ජුනි 30 දක්වාම අවසන් කර නොතිබුණි.

(ආ) පසුගිය වර්ෂයේ අමු තේ දළු සඳහා රු.80 ක අවම මිලක් පවත්වා ගැනීම සඳහා දළු සැපයුම්කරුවන්ට ගෙවීම පිණිස මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු.6,738,000,000 ක් වූ සහනාධාර මුදලින් ඉතිරි රු.16,453,451 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට රඳවාගෙන තිබුණි.

(ඇ) තේ කම්හල් හිමියන් විසින් හරිත තේ සපයන්නන් වෙත ගෙවීම සඳහා 2000 වර්ෂයේ සිට මණ්ඩලයේ තැන්පත් කර තිබූ රු. 9,690,443 ක් අතුරින් රු. 5,350,080 ක් වර්ෂයක් ඉක්මවා ඇතත් ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වගන්තිය හා 1975 අංක 14 දරන තේ මණ්ඩල පනතේ 25(3) වගන්තිය | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව හා පනතට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් තොරව ලියාපදිංචි ගාස්තු, ලියාපදිංචි අලුත්කිරීමේ ගාස්තු හා බලපත්‍ර ගාස්තු 2010 ජුලි 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලය විසින් වැඩිකර තිබුණි. |
| (ආ) | 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 13 හා 14 වගන්ති | සෙස් අරමුදල පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා පනතේ විධිවිධාන සංශෝධනය කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 759 | සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 ඡේදය | මණ්ඩලය විසින් මානව සම්පත් කළමනාකරණය සඳහා නීති රීති සම්පාදනය කිරීමට අදාළ කාර්ය පටිපාටි අත්පොතක් සකස්කර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

(ඉ) තේ මණ්ඩලයේ තේ කොමසාරිස්ගේ අභ්‍යන්තර චක්‍රලේඛ

---

| | |
|---|---|
| (i) 2001 දෙසැම්බර් 20 දිනැති අංක ටීසී/ඊ/VI/08 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව සියලුම තේ අපනයනකරුවන් වාර්ෂිකව තේ මණ්ඩලයේ ලියාපදිංචිය අළුත් කළයුතු වුවද එසේ නොකරන ලද තේ අපනයනකරුවන් 04 දෙනෙකු සඳහා තේ අපනයනයට අවකාශ සලසා දී තිබුණි. |
| (ii) 2011 ජනවාරි 10 දිනැති ටීසී/සීඅයිආර්/204 දරන චක්‍රලේඛය | සියළුම තේ කර්මාන්තශාලා වාර්ෂිකව සිය ලියාපදිංචිය අළුත් කලයුතු නමුත් සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ දත්ත අනුව කර්මාන්තශාලා 33 ක ලියාපදිංචිය නිසි පරිදි යාවත්කාලීන කර නොතිබුණු නමුත් ඒ සඳහා මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි. |
| (iii) 2015 නොවැම්බර් 01 දිනැති ටීසී/එෆ් එම් එස්එස් දරන චක්‍රලේඛය 5.1සහ 6. III වගන්ති | සහනාධාර ලැබීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන වර්ෂය තුළදී මිලදී ගන්නා ලද යන්ත්‍ර උපකරණ, සුදුසුකම් ලබන නමුත් ඊට පටහැනිව අවස්ථා 04 කදී තේ කර්මාන්ත ශාලා හිමියන් වෙත රු. 3,280,000 ක් ගෙවීම් කර තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිලධාරීන් විශ්‍රාම යාමේදී ඔවුන් විසින් ලබා නොගත් විවේක නිවාඩු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලය විසින් රු.656,030 ක් ගෙවීම් කර තිබූ අතර ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) තේ අපනයන ශාඛාව රාජකාරී වෙලාවෙන් බැහැරව විවෘත කර තැබීම විශේෂ රාජකාරියක් ලෙස සලකා සේවයේ නියුතු කාර්ය මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත

සමාලෝචිත වර්ෂයේදී රු.160,000 ක දීමනා ගෙවා තිබූ නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,677,534 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 86,256,974 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,579,440 ක එනම් සියයට 85ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායම රු.73,724,101 කින් පහත වැටීම සහ මණ්ඩලයේ ආදායමට ප්‍රවර්ධන හා ප්‍රචාරණ අරමුදලේ පොලී ආදායමින් එකතු කරන ලද වටිනාකම වූ රු. 102,865,000 ක් අඩුවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රතිඵලය රු.5,817,906 ක ඌනතාවයක් වූ අතර මූල්‍ය වියදම ඉක්ම වූ මූල්‍ය ආදායම රු.19,492,327 ක් වීම හේතුවෙන් සමාගමේ ශුද්ධ මූල්‍ය ප්‍රතිඵලය රු.4,677,534 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී හැර අනෙකුත් වර්ෂයන්හිදී මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් ලබා තිබූ අතර 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා එම අතිරික්තයේ වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එහෙත් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එම අතිරික්තය සියයට 85 කින් පිරිහී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී මණ්ඩලයේ දායකත්වය අඛණ්ඩව හිතකර අගයක් ගෙන තිබූ අතර 2012 වර්ෂයේදී රු. 158,730,128 ක් වූ එය 2015 වර්ෂය අවසානයට රු. 357,901,755 ක් දක්වා වර්ධනය වී තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසානයට රු.327,131,706 ක් දක්වා අඩුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාත පිළිවෙලින් 8.74 හා 16.9 ක ඉහල අගයක් ගෙන තිබූ අතර කෙටිකාලීන ආයෝජන ස්ථාවර තැන්පතු සහ ප්‍රාදේශීය වැවිලි සමාගම් ණය, මුළු ජංගම වත්කම් වලින් සියයට 88 ක් නියෝජනය වීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තේ කොමසාරිස් අංශය විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ගොඩනැගිල්ලට වූ හානි වෙනුවෙන් හා ඒ හේතු කොටගෙන ගොඩනැගිල්ල වෙනත් පාර්ශවයකට කුලියට දීම සඳහා භූමිය ප්‍රකෘති තත්ත්වයට පත්කිරීමට නොහැකිවීම මත රු.4,900,000 ක මුදලක් ඉල්ලා 2008 ඔක්තෝබර් මාසයේ දී මණ්ඩලයට එරෙහිව තීරකවරයෙක් පත්කර තිබුණි. ඒ අනුව 2012 නොවැම්බර් 14 දිනට ඉහත මුදලට අමතරව සියයට 20ක වාර්ෂික ගාස්තුවක්ද සහිතව රු.13,828,600 ක් ගෙවිය යුතු බවට නියෝගයක් දී තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් මෙම තීරණයට එරෙහිව අභියාචනයක් ගොනු කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට බාහිර ආයතන 5ක් විසින් මණ්ඩලයට එරෙහිව නඩු 6 ක් සහ කාර්ය මණ්ඩලය විසින් නඩු 3 ක් අධිකරණවල ගොනු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය.

### 4.1 කාර්යසාධනය

4.1.1 2003 අංක 29 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල සංශෝධන පනතින් සංශෝධිත 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 4 (1) හා (2) වන උප වගන්ති ප්‍රකාරව ආයතනයේ අරමුණු සංක්ෂිප්ත වශයෙන් පහත සඳහන් පරිදි විය.

(i) අලුත් ප්‍රදේශවල තේ නිෂ්පාදනය කිරීම සහ වගා කිරීම දැනට ඇති වතු සහ කුඩා ඉඩම් වැඩි අස්වැන්නක් ලැබෙන තේ වර්ග යොදා නැවත වගා කිරීම, වතු සහ කුඩා ඉඩම් පුනරුත්ථාපනය කිරීම ,සත්ව පාලන කර්මාන්ත ඇති කොට පවත්වා ගෙන යාමෙන් වතු සහ කුඩා ඉඩම් නානාංගකරණය කිරීම සහ එම වතුවල සහ කුඩා ඉඩම්වල තේ වෙනුවට වෙනත් වගා යෙදීම.

(ii) තේ කර්මාන්තශාලා පිහිටුවීම , පවත්වා ගෙන යාම හා තේ වෙන්දේසි පැවැත්වීම විධිමත් කිරීම.

(iii) ශ්‍රී ලංකාවෙහි දී හා ඉන් පිටත දී තේ අලෙවි කිරීමට සහායවීම, තේ වෙළඳාම හා තේ අපනයනය කිරීම, පිටරටවල දී තේ වෙළඳාම් කිරීමෙහිලා තේ නැව්ගත කිරීම, නැව් ගාස්තු, තැරැව් ගාස්තු , ගුදම් ගාස්තු හෝ වෙන යම් ගාස්තුවලට අදාළ කටයුතු විධිමත් කිරීම.

(iv) තේ වතු කළමණාකරණයහි ද තේ නිපදවීමෙහි හා අලෙවි කිරීමෙහි ද නියුක්ත සියළු ආයතන හා සංවිධාන විධිමත් කිරීම, පාලනය කිරීම සහ මෙහෙයවීම.

(v) ශ්‍රී ලංකාවෙහි තේ කර්මාන්තයේ දියුණුව සඳහා ක්‍රියා කිරීමට ලැබෙනු පිණිස හා එම ක්‍රියා ඒකාබද්ධ කිරීම පිණිස තේ කර්මාන්තය හා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා හා අතර සම්බන්ධය ඇති කිරීම.

ඉහත අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය 2014 වර්ෂයේ සිට ක්‍රමිකව අඩුවෙමින් පැවතුණු අතර සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 292,573,586 ක් සහ ඉකුත් වර්ෂයේදී එය කිලෝ ග්‍රෑම් 328,771,066 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් 36,197,480 කින් එනම් සියයට 11 කින් අඩුවී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අයහපත් කාලගුණික තත්ත්වය ද මේ සඳහා හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකාවේ තේ අපනයන ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි වී තිබුණ ද තේ අපනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 288,770,680 ක් ද ඉකුත් වර්ෂයේ කිලෝ ග්‍රෑම් 306,936,421 ක්ද වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව තේ අපනයන ප්‍රමාණය කිලෝ ග්‍රෑම්

18,165,741 කින් හෙවත් සියයට 3.41 කින් පහළ ගොස් තිබුණි. එසේ වුවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්ධන වියදම් සියයට 83.6 කින් වර්ධනය වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| විස්තරය | 2016 | 2015 | 2014 |
|---|---|---|---|
| තේ ප්‍රවර්ධන වියදම් (රු.) | 884,151,296 | 481,352,966 | 481,352,966 |
| සමස්ත තේ අපනයනය (kg) (ප්‍රති අපනයන ඇතුළුව) | 288,770,680 | 306,936,421 | 327,342,457 |

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මණ්ඩලයේ ප්‍රගති වාර්තාවලට අනුව සංවර්ධන කාර්යයන් වැඩසටහන් 04 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට රු.97,700,000 ක් වෙන්කර තිබුණු අතර තථ්‍ය වියදම රු.86,381,964 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | සංවර්ධන කාර්යය | වෙන්කිරීම | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | මූල්‍ය ඉලක්කය | භෞතික ඉලක්කය | මූල්‍ය | භෞතික |
| | | රු.මිලියන | | රු.මිලියන | |
| (i) | කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය | 35.00 | කම්හල් 35 | 25.424 | කම්හල් 44 |
| (ii) | තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය | 35.00 | හෙක්ටයාර් 200 | 44.575 | හෙක්ටයාර් 267.2 |
| (iii) | GMP /SLSI/SLTB තත්ත්ව නිෂ්පාදන සහතිකය | 3.00 | වැඩසටහන්28 | 3.147 | වැඩසටහන් 28 |
| (iv) | තේ ඉඩම් ලියාපදිංචිය | 24.70 | ප්‍රතිශතය 100 | 12.799 | ප්‍රතිශතය 75 |
| | එකතුව | 97.70 | | 85.946 | |

(i) මණ්ඩලය කම්හල් නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ එක් කම්හලක් සඳහා උපරිමය රු.1,000,000 ක් බැගින් රු. 35,000,000 ක් වෙන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.25,424,904 ක් වැය කර කම්හල් 44 ක් නවීකරණය කර තිබුණු අතර ඉන් සියයට 96 ක් පසුගිය වර්ෂයන්හිදී ලැබී තිබුණු ඉල්ලුම්පත් සඳහා වන අතර මේ සඳහා වෙන් කළ මුදලින් ඉතිරිය තේ නැවත වගා සහනාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා යොදා ගෙන තිබුණි.

(ii) තේ නැවත වගා සහනාධාර වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 35,000,000 ක් වෙන් කර තිබුණි. ප්‍රගති වාර්තා අනුව ඉඩම් හෙක්ටයාර් 267.2 ක් වගා කිරිමට රු.44,575,096 ක් වැය කර තිබූ අතර වැය කිරිමට අපේක්ෂිතව තිබුණු වියදම මෙන් සියයට 27 ක වර්ධනයක් බව නිරීක්ෂණය විය.

(iii) ක්‍රියාකාරි සැලැස්ම අනුව තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරිම සඳහා රු. 24,700,000 ක් වෙන්කර තිබුණු අතර වර්ෂ අවසාන වන විට එම වැඩසටහනේ ඉඩම් හිමියන් ලියාපදිංචි කිරිම සඳහා අයදුම්පත් මණ්ඩලය වෙත ගෙන්වාගෙන තිබුණු නමුත් අදාළ ලියාපදිංචි කිරීමේ කටයුතු සම්පූර්ණ කර නොතිබුණු අතර මේ සඳහා වැයකර තිබුණු මුදල රු.12,799,424 ක් විය.

(ඈ) තේ ප්‍රවර්ධනය සහ වෙළඳපොල උපාය මාර්ග සඳහා 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීම ප්‍රකාරව තේ අපනයන කරුවන්ගෙන් 2010 නොවැම්බර් 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 5,927 ක් ගාස්තුවක්, මණ්ඩලය විසින් උපයා තිබුණි. එම මුදල් හා ඉදිරි වසර 3 තුළ රැස්කිරිමට අපේක්ෂිත බදු මුදලින් රු. බිලියන අටක් යොදවා සිලෝන් තේ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා සැලසුම් කර තිබූ මෙම වැඩසටහන අදාළ කාලපරිච්ඡේදය තුළ ඉටුකිරීමට නොහැකි විම හේතුවෙන් 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දීර්ඝ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ඒ සඳහා රු.195, 521,240 ක් වැයකර තිබුණද මෙම

වැඩසටහනෙහි නිෂ්පාදන නිර්මාණාත්මක කටයුතු අපේක්ෂිත පරිදි සම්පූර්ණ කර නොතිබුණි.

(ii) නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතුවලට අදාළ රූපවාහිනී වෙළඳ දැන්වීමේ නිර්මාණාත්මක කටයුතු 2016 අප්‍රේල් අවසන් වී තිබුණද ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට මාධ්‍ය උපදේශන (Media Consultancy) ආයතනයක් තෝරාගැනීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රවර්ධන කාර්යයන් නිසියාකාරව ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට නොහැකිව තිබුණි. නිෂ්පාදන හා නිර්මාණාත්මක කටයුතු වලට සමගාමීව මාධ්‍ය ආයතනයක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වුවද, මෙම වාර්තාවේ දින වන විටත් ඒ සඳහා සේවා ආයතනයක් තෝරා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයන් අතර තේ ප්‍රචලිත කිරීමේ පරමාර්ථයෙන් 2013 වර්ෂයේ දී රු.58,368,794 ක් වැයකර කොළඹ තුරඟ තරඟ පිටිය ගොඩනැගිල්ලේ ස්ථාපනය කල තේ අලෙවි මධ්‍යස්ථානයේ, පසුගිය වර්ෂ දෙක තුළ රු. 33,195,451 ක සමුච්චිත අලාභයක් ලබා තිබුණි. තේ ප්‍රවර්ධන කටයුත්තක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පූර්වයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබූ අතර වසර 10 ක කාලයක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් රු.4,403,419 ක වාර්ෂික බදු කුලියකට යටත්ව ලබාගෙන තිබූ පරිශ්‍රයක පවත්වාගෙන ගිය මෙම මධ්‍යස්ථානයේ කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී අකර්මන්‍ය වී තිබුණි. ඒ හේතුවෙන් මෙහෙයුම් කටයුතු සඳහා රු.9,799,269 ක ආදායම ඉක්ම වූ වියදමක් දරා තිබුණු අතර 2017 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව මෙහෙයුම් කටයුතු නතර කිරීමට තීරණය කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය සමග එළඹ තිබූ අනුග්‍රාහක ගිවිසුම අනුව, මිලදී ගෙන තිබුණු රු. 2,545,750 ක් වූ ටී ෂර්ට් 2,079 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොවිකිණී ගබඩාව තුළ පැවතුණි. මෙම ටී ෂර්ට් ආයතනයට අලාභයක් නොවන ආකාරයට අලෙවිකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) මණ්ඩලයේ රසායනාගාරයේ භාවිතා කරන ලද ඔටෝමික් ඇබ්සෝප්ෂන් ස්පෙක්ටොමීටර් (ඒ ඒ එස්) යන්ත්‍රය 2005 වර්ෂයේදී ක්‍රියා විරහිත වී තිබීම හේතුවෙන් භාවිතයෙන් ඉවත් කර තිබුණි. ඒ අනුව රසායනාගාර කටයුතු සඳහා එම යන්ත්‍රය වෙනුවට යන්ත්‍රයක් මිලදී ගැනීමට අවස්ථා කිපයකදී මිල කැඳවීම් සිදුකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ අවසානය තෙක්ම යන්ත්‍රයක් මිලදීගැනීමට අපොහොසත්වීම හේතුවෙන් රසායනාගාරය මගින් ඉටුකරමින් පැවති රසායන විශ්ලේෂණ පරීක්ෂාවන් 07 ක් සිදු කිරීම අත්හැර තිබුණි.

(ඈ) 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත, 1957 අංක 51 දරන තේ පාලන පනත හා 1959 අංක 16 දරන තේ (බදු හා පාලන) පනත යන පනත් ඒකාබද්ධ කර නව පනතක් ඇති කිරීම සඳහා 2015 වර්ෂයේදී උපදේශකවරයෙකු සමග ගිවිසුමකට එළඹ ඇතත් සමාලෝචිත වර්ෂය දක්වාම අදාළ කාර්යය ඉටුකර නොතිබුණි.

## 4.3 අරමුදල් ඌන උපයෝජනය

-------------------------------

මණ්ඩලයට අයත් වටිනාකම රු.369,504 ක් වූ විදේශීය බැංකු ගිණුම් 03 ක ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා වූ කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

තේ වල පලිබෝධනාශක අවශේෂ රසායනික සංඝටක විශ්ලේෂණය කර සහතික කර ඉදිරිපත් කිරීම සඳහා 2009 වර්ෂයේදී රු.32,132,088 ක් වැයකර මිලදී ගන්නා ලද පලිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය හා රු.5,592,421 ක් වැයකර මිලදී ගන්නා ලද CP-3800 GAS Chromatography යන්ත්‍රය මිලදී ගත් දින සිට අපේක්ෂිත කාර්යය සඳහා යොදවාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ නියෝජිතයකු නොමැති වීම සහ යන්ත්‍රය ක්‍රියා කිරීම පිළිබඳ පුහුණුවක් සැපයුම්කරුවන් විසින් ලබා දී නොමැති වීම හේතුවෙන් උපකරණය භාවිතා කර පරීක්ෂණ සිදුකිරීමට නොහැකි වී තිබුණි.

**4.5 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව රු.5,000,000 ක් ඉක්මවන කොන්ත්‍රාත්කරුවන් පනත යටතේ ලියාපදිංචි විය යුතු වුවත් කොන්ත්‍රාත් වටිනාකම රු.6,278,036 ක්වූ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල අළුත්වැඩියා කිරීම් කොන්ත්‍රාත්කරු මෙම පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදනය සඳහා ලංසු කැඳවීම් අවසන් කල දින සිට සති 05 ක් ඇතුළත ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කළ යුතු නමුත් මෙම කොන්ත්‍රාත්තුව සඳහා සති 15 ක් ගත කර තිබු අතර 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු මාර්ගෝපදේශ සංග්‍රහයේ දැක්වෙන ආකෘති පත්‍රයට අනුකූලව වාර්තා කර නොතිබුණි. තවද, 7.9.2 ඡේදය ප්‍රකාරව, කොන්ත්‍රාත් වටිනාකම ඇස්තමේන්තුගත පිරිවැයට වඩා අඩු වන අවස්ථාවලදී අදාළ කාර්යය ප්‍රශස්ථ අයුරින් ඉටු කරන බවට කොන්ත්‍රත්කරුගෙන් සහතිකයක්ද ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම් සහ දේපළ වල ව්‍යාපෘති ආරම්භ කිරීම.**

2007 වර්ෂයට පෙර ඉදිකර තිබූ පිරිවැය රු.7,122,915 ක් වටිනා බණ්ඩාරවෙල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණද එම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දින දක්වාම මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 308 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 277 ක් විය. ජ්‍යෙෂ්ඨ, තෘතිය හා ද්විතිය මට්ටමේ තනතුරුවල පිළිවෙලින් 02 ක්, 03 ක් හා 28 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 08 ක පුරප්පාඩු පැවතුණු අතර අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති ජ්‍යෙෂ්ඨ තනතුරක් සහ තෘතිය මට්ටමේ තනතුරක් සඳහා නිලධාරීන් දෙදෙනෙකු ද ද්විතිය මට්ටමේ තනතුරු 04 ක් වෙනුවෙන් නිලධාරීන් 08 දෙනෙකු ද සේවයේ යොදවා තිබුණි.

## 5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

---

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා ගිණුම් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ගිණුම් දින 102 ක් ප්‍රමාදවී 2017 ජුනි 16 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අභ්‍යන්තර විගණනය

---

මණ්ඩලයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර තිබුණද අනුයුක්ත කර තිබූ නිලධාරීන් වෙත අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 5.3 අයවැය පාලනය

---

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය අවස්ථා 03කදී සංශෝධනය කර තිබූ අතර අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 15 සිට සියයට 48 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | ගිණුම් ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත කාර්ය මණ්ඩලයට අන්තර්ගත නොවන තනතුරු සඳහා බඳවා ගැනීම. |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | දීර්ඝ කාලීනව අයකර නොගත් හා නිරවුල් නොකරන ලද ශේෂ පැවතීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ

විගණකාධිපති